53 වන කාණ්ඩය
14 වන කලාපය

සිකුරාදා
1963 සැප්තැම්බර් 13

# පාර්ලිමේන්තු විවාද

## (හැන්සාඩ්)

## නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ

## නිල වාර්තාව

### අන්තර්ගත ප්‍රධාන කරුණු

විසර්ජන කෙටුම්පත් පණත, 1963-64 [විසිවන වෙන් කළ දිනය] : [තී. 3376].

ශීර්ෂ 144-149 ; 115-127 ; 31-34 ; 72-83 ; 133-139 ; 160-162 ; 165-168 සහ දෙවන උප ලේඛනය කාරක සභාව විසින් සලකා බලන ලදී.

සංශෝධිතාකාරයෙන් තුන්වන වර කියවා අනුමත කරන ලදී. [තී. 3694].

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 53
இல. 14

வெள்ளிக்கிழமை
13 செப்டம்பர், 1963

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

## பிரதிநிதிகள் சபை

அதிகாரபூர்வமான அறிக்கை

பிரதான உள்ளடக்கம்

ஒதுக்கீட்டு மசோதா, 1963–64 [*ஒதுக்கப்பட்ட இருபதாம் நாள்*] [ப. 3376]
குழுவில் ஆராயப்பெற்றது
தலைப்புக்கள் 144–149 ; 115–127 ; 31–44 ; 72–83 ; 133–139 ; 160–162 ;
165–168 உம் இரண்டாம் அட்டவணையும்
திருத்தப்பெற்றவாறு மூன்றும் முறை மதிப்பிடப்பெற்று நிறைவேற்றப்பெற்றது [ப. 3694].

---

Volume 53
No. 14

Friday,
13th September, 1963

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## HOUSE OF REPRESENTATIVES

OFFICIAL REPORT

PRINCIPAL CONTENTS

**APPROPRIATION BILL, 1963-64** [*Twentieth Allotted Day*] [c. 3376] :
Considered in Committee
Heads 144-149 ; 115-127 ; 31-44 ; 72-83 ; 133-139 ; 160-162 ;
165-168 and Second Schedule
Read the Third time, as amended and passed [c. 3694]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

## 1963 සැප්තැම්බර් 13 වන සිකුරාදා

පූ. භා. 10 ට මන්ත්‍රී මණ්ඩලය රැස් විය. කථානායකතුමා [ගරු ආර්. එස්. පැල්පොල] මූලාසනාරූඪ විය.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම

சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்

PAPERS PRESENTED

1962-63 අංක 68 දරණ පරිපූරක ඇස්තමේන්තුව.—[ගරු ටී. බී. ඉලංගරත්න.]

සභා මේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.

1962-63 අංක 70 දරණ පරිපූරක ඇස්තමේන්තුව.—[අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති වෙනුවට ගරු එම්. පී. ද සොයිසා සිරිවර්ධන.]

සභා මේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.

1950 අංක 25 දරණ ආහාර පාලන පණතේ 4 (1) (iv) හා 4 (1) (vi) යන වගන්ති යටතේ පනවන ලද අංක 206 සහ 207 දරණ ආහාර පාලන නියෝග.—[ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක.]

සභා මේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.

1962-63 අංක 67, 73 සහ 74 දරණ පරිපූරක ඇස්තමේන්තු.—[ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ ඇමති වෙනුවට ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක.]

සභා මේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.

1962-63 අංක 69 දරණ පරිපූරක ඇස්තමේන්තුව.—[සෞඛ්‍ය හා නිවාස කටයුතු පිළිබඳ ඇමති වෙනුවට ගරු එම්. සමරවීර.]

සභා මේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.

1962-63 අංක 71 සහ 72 දරණ පරිපූරක ඇස්තමේන්තු.—[ගරු එම්. සමරවීර.]

සභා මේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.

(1) පළාත් ආණ්ඩු සහා ආඥාපණතේ (255 වන පරිච්ඡේදය) 130 (බී) සහ 153 යන වගන්ති යටතේ සම්පාදනය කරන ලද අතුරු ව්‍යවස්ථාවක්.

(2) සුළු නගර සහා ආඥාපණතේ (256 වන පරිච්ඡේදය) 129 (බී) සහ 152; හා 152 සහ 156 යන වගන්ති යටතේ සම්පාදනය කරන ලද අතුරු ව්‍යවස්ථා මාලා තුනක්.—[ඩබ්ලිව්. පී. ජී. ආරියදාස මයා.]



## මන්ත්‍රී මණ්ඩලයේ රැස්වීම

சபை அமர்வு

SITTING OF THE HOUSE

**ගරු ටී. බී. ඉලංගරත්න (මුදල් ඇමති)**

(கௌரவ ரி. பி. இலங்கரத்ன—நிதியமைச்சர்)

(The Hon. T. B. Ilangaratne—Minister of Finance)

ගරු සභානායකතුමා වෙනුවෙන් මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"අද දින විසිර යෑමේදී මන්ත්‍රී මණ්ඩලය 1963 සැප්තැම්බර් 17 වන අඟහරුවාදා අ. භා. 2 වන තෙක් කල් තැබිය යුතුය."

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

**ජේ. ආර්. ජයවර්ධන මයා. (දකුණු කොළඹ පළමුවන මන්ත්‍රී)**

(திரு. ஜே. ஆர். ஜயவர்தன—கொழும்புத் தெற்கு முதலாம் அங்கத்தவர்)

(Mr. J. R. Jayewardene—First Colombo South)

17 වන දිනෙන් පසු නැවතත් රැස් වෙන්නේ කවදාද, කී දිනක්ද කියා අපි දැනගන්න කැමතියි. නියෝජිත මන්ත්‍රී මණ්ඩලය රැස්වෙන්නේ කුමන දවස් වලද කියා දන්නේ නැතිව අපට ආරාධනා ආදිය පිළිගැනීම අමාරුයි.

**ගරු ඉලංගරත්න**

(கௌரவ இலங்கரத்ன)

(The Hon. Ilangaratne)

ගිය සතියේදී මේ පිළිබඳව කථා බහ කළා. ඒ අවස්ථාවේදී ඒ ගරු මන්ත්‍රීතුමා නො සිටින්න ඇති. රජයේ වැඩ හුඟක් තිබෙන නිසා මුළු සතියේම රැස්වීම් පැවැත්වීමට අපි තීරණය කරගත්තා.

**ජේ. ආර්. ජයවර්ධන මයා.**

(திரு. ஜே. ஆர். ஜயவர்தன)

(Mr. J. R. Jayewardene)

ඊට පස්සෙ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු ඉලංගරත්න
*(கௌரவ இலங்கரத்ன)*
(The Hon. Ilangaratne)

මුදල් වර්ෂය කෙළවර වන නිසා ලබන 30 වැනිදාට කලින් සම්මත කරගතයුතු වැඩ කීපයක් තිබෙනවා. සිකුරාදා වන විට කෙතෙක් දුරට ඒව ඉතිරි වී තිබෙනවාදැයි බලා ඒ ගැන කල්පනා කරන්ට ඕනෑ.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා. ( කොට්ටාව)**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன—கொட்டாவ)*
(Mr. D. B. R. Gunawardena—Kottawa)

ලබන සතියේ කියන්නෙ අඟහරුවාදද ?

**එම්. තෙන්නකෝන් මයා. (මුදල් කට යුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)**
*(திரு. எம். தென்னகோன்—நிதியமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*
(Mr. M. Tennakoon—Parliamentary Secretary to the Minister of Finance)

ඔව්, 17 වැනිදා සිට 20 වැනිදා දක්වා.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

ඊට පස්සෙ තියෙනවද නැද්ද කියල ඇයි කියන්ට බැරි ?

ගරු ඉලංගරත්න
*(கௌரவ இலங்கரத்ன)*
(The Hon. Ilangaratne)

අනික් සතියෙත් කරන්ට වැඩ තිබෙනවද කියා බලන්න ඕනෑ.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

ගරු කථානායකතුමනි, මට දැනගන්ට ඕනෑ, ඊළඟ සතියෙ රැස්වීම් තියෙනවද නැද්ද කියා.

ගරු ඉලංගරත්න
*(கௌரவ இலங்கரத்ன)*
(The Hon. Ilangaratne)

මා හිතනව අපට වැඩ කරන්ට වෙයි කියල.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

## විසර්ජන කෙටුම්පත් පණත, 1963-64

*ஒதுக்கீட்டு மசோதா, 1963-64*

APPROPRIATION BILL, 1963-64

කාරක සභාවෙහිදී සලකා බලන ලදී—[ප්‍රගතිය සැප්තැම්බර් 12]

[කථානායකතුමා මූලාසනාරූඪ විය.]

**144 වන ශීර්ෂය.—ප්‍රවාහණ අමාත්‍යවරයා**

**1 වන සම්මතය.—කාර්ය මණ්ඩලයේ පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා රු. 2,60,789**

**1 වන උප ශීර්ෂය.—සේවක සංඛ්‍යා සහ වැටුප්, රු. 1,67,967**

*தலைப்பு 144.—போக்குவரத்து அமைச்சர்*

*வாக்குப்பணம் இல. 1.—பணியாளரின் ஆளுக்குரிய வேதனமும் பிறபடிகளும் ரூபா 2,60,789*

*உபதலைப்பு 1.—ஊழியர் கோப்பும் சம்பளங்களும், ரூபா 1,67,967*

HEAD 144.—MINISTER OF COMMUNICATIONS

*Vote No. 1.—Personal Emoluments and other allowances of staff, Rs. 260,789.*

*Sub-head No. 1.—Cadre and salaries, Rs. 167,967.*

ඉදිරිපත් කරන ලද සංශෝධනය—[සැප්තැම්බර් 11]

"That the vote be reduced by Rs. 10 in respect of sub-head 1, item "Minister"—[ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.]

ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.

**ඩබ්ලිව්. දහනායක මයා.** (ගාල්ල)
*(திரு. டப்ளியு. தகநாயக்க—காலி)*
(Mr. W. Dahanayake—Galle)

At what time will you take the Vote ?

**සභාපතිතුමා**
*(அக்கிராசனர்)*
(The Chairman)

After the Minister replies.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක (කෘෂිකර්ම, ආහාර හා සමුපකාර කටයුතු පිළිබඳ ඇමති හා රාජ්‍යාරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)**

*(கௌரவ எப். ஆர். டயஸ் பண்டாரநாயக்க—விவசாய, உணவு, கூட்டுறவு அமைச்சரும், பாதுகாப்பு, வெளி விவகார அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசியும்)*

(The Hon. F. R. Dias Bandaranaike—Minister of Agriculture, Food and Co-operatives and Parliamentary Secretary to the Minister of Defence and External Affairs)

No ; on the whole Debate ?

**සභාපතිතුමා**

*(அக்கிராசனர்)*

(The Chairman)

At 10 'clock.

**ගරු එම්. සමරවීර (ප්‍රවාහණ කටයුතු පිළිබඳ ඇමති)**

*(கௌரவ எம். சமரவீர—போக்குவரத்து அமைச்சர்)*

(The Hon. M. Samaraweera—Minister of Communications)

ගරු සභාපතිතුමනි, මා ඊයෙ රු කථා කර මින් සිටියෙ ගමනාගමන මණ්ඩලය පිළිබඳව ගරු මන්ත්‍රීවරුන් ඉදිරිපත් කළ විවේචන ගැනයි. වැඩි වශයෙන්ම ගමනාගමන මණ්ඩලයට විරුද්ධව කළ චෝදනාව නම්, ඒ ඒ ආසනවල පාරවලට අවශ්‍ය බස් රථ නැත කියන එකයි. මාද ඒ විවේචන පිළිගන්න අතරම කියන්ට සතුටුයි, ඒ අඩු පාඩු සම්පූර්ණ කිරීම පිණිස ගමනාගමන මණ්ඩලයට ගත හැකි හැම පියවරක්ම ගෙන තිබෙන බවත්, ගන්න බවත්. දැනට තිබෙන කාලසටහන අනුව ධාවනය කරන්ට අපට බස් රථ 2,662ක් අවශ්‍යයි. එහෙත් දැනට සාමාන්‍යයෙන් ගමනාගමන මණ්ඩලය විසින් දිනපතා ධාවනය කරනු ලබන්නෙ බස් 2,550 කට කිට්ටු ගණන කුයි. තවත් වැඩිපුර බස් 583ක් පිටරටින් ගෙන්වීම සඳහා ඕඩර් කර තිබෙනව. එයින් සමහරක් දැනටමත් ලංකාවට පැමිණ තිබෙනව. ඉදිරියට ඉතිරි කොට සත් ලැබෙනව ඇති. ඒ ලැබුණු වහාම අඩුපාඩු හා අවශ්‍යතා අනුව ඒවා බෙදී යන විට, සම්පූර්ණයෙන්ම නැති වුවත්, සෑහෙන ප්‍රමාණයකටවත් මේ ප්‍රශ්නය විසඳේය කියා මා බලාපොරොත්තු වෙනව.

තවත් විශේෂ ප්‍රශ්නයක් තිබෙනව. ගම්බද ප්‍රදේශවල ආසනවලින් පත් වූ ගරු මන්ත්‍රීවරු විශේෂයෙන් ඉල්ලා සිටියා, ලොකු බස් ඒ ප්‍රදේශවල පාරවලට ගැළපෙන්නෙ නැත, කුඩා බස් යොදවන්නය, කියා. "ඊ" බස් යොදවන්නයයි කියා සිටිය. 'ඊ' බස් කියන්නෙ ඉතා කුඩා බස්. අපට තිබෙන ඒ කුඩා බස් වර්ගය මදි බව පිළිගන්නව. ඒ වගේම ඉදිරියට බස් සඳහා ඕඩර් කරන අවස්ථාවෙදි ඒ පුංචි බස් සම්බන්ධයෙන් විශේෂයක් කරන්ට මා බලාපොරොත්තු වන බව මේ අවස්ථාවෙදි මා මතක් කරන්ට කැමතියි. ඒ කුඩා බස් රථ ලැබුණු විට, ලොකු බස් රථ ධාවනය කළ නොහැකි ගම්බද පාරවලට ඒ කුඩා බස් රථ යොදවා දැනට ගමන් පහසුව නැති ගම්බද ජනතාවට ගමන් පහසුව සලසන්නට ලංගමය බලාපොරොත්තු වන බව මේ අවස්ථාවෙදි මතක් කරන්ට කැමතියි.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**

*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*

(Mr. D. B. R. Gunawardena)

ඒ බස් ලැබෙන්ට කොච්චර කල් යනවද ?

**ගරු සමරවීර**

*(கௌரவ சமரவீர)*

(The Hon. Samaraweera)

දැන් ඕඩර් කරල තියෙනව. ඒවා ලැබෙන දිනයක් කියන්ට නම් බැහැ. බස් රථ ඕඩර් කරන විට කුඩා බස් රථ ගැන විශේෂ සැලකිල්ලක් දක්වන ලෙස මා දන්වා තිබෙනව.

**කේ. එම්. පී. රාජරත්න මයා.** (වැලිමඩ)

*(திரு. கே. எம். பீ. ராஜரத்ன—வெலிமடை)*

(Mr. K. M. P. Rajaratna—Welimada)

කඳුකර පළාත්වල ලොකු බස් රථ ධාවනය කරන එක කරදරයක්. ඒ නිසා කඳුකර ප්‍රදේශයේ තිබෙන ලොකු බස් රථ තැනිතලා ප්‍රදේශයේ පාරවලට යොදා තැනිතලා ප්‍රදේශයේ තිබෙන කුඩා බස් රථ කඳුකර ප්‍රදේශවලට යොදනවාද ? ඒ ප්‍රදේශවලට කුඩා බස් රථ යෙදුවාට මගින්ට පාඩුවක් නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු සමරවීර**

*(கௌரவ சமரவீர)*

(The Hon. Samaraweera)

පුළුවන් තරමින් ඒ විධියේ වෙනස්කම් ඇති කරගෙන යනව. මේ මාසයේදී කුඩා බස් රථ 42ක් ලැබෙන බව නිලධාරීන් විසින් මට දන්වන්ට යෙදුණා.

**ජී. ඩබ්ලිව්. සමරසිංහ මයා. (රජයේ වැඩ හා තැපැල් කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. ஜீ. டப்ளியு. சமரசிங்க—அரசாங்கக் கட்டுவேலை, தபால் அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. G. W. Samarasinghe—Parliamentary Secretary to the Minister of Public Works and Posts)

ඒ බස් රථ ලැබුණු විට ඒවා අපක්ෂපාතව බෙදා හරිනවාද? මෙතෙක් පක්ෂපාතව වැඩ කර තිබෙන බව මා දන්නව. ඒ බව මට ඔප්පු කරන්ට පුළුවනි.

අ. භා. 10.15

**ගරු සමරවීර**

*(கௌரவ சமரவீர)*

(The Hon. Samaraweera)

පක්ෂපාතව ක්‍රියා කර තිබෙන බව ඔප්පු කරනවා නම් එසේ පක්ෂපාතව වැඩ කරන නිලධාරීන්ට විරුද්ධව කටයුතු කරන්ට මා ලෑස්තියි. ඒ ගැන මා පොරොන්දුවක් දෙනව.

වැලිමඩ ගරු මන්ත්‍රීතුමා කාකි රෙදි ගැන විශේෂ ප්‍රශ්නයක් නගන්ට යෙදුන. චීනයෙන් කාකි රෙදි නොගෙන දකුණු ඉන්දියාවෙන් ගන්නේ මන්ද කියා එතුමා ප්‍රශ්න කළා. ගමනාගමන මණ්ඩලයේ සේවකයන්ට අවශ්‍ය කාකි රෙද්ද අප සාමාන්‍යයෙන් මිළයට ගන්නේ වැල්ල වත්තේ රෙදි මෝලෙන්. නමුත් දැනට එහි පවතින වැඩ වර්ජන නිසා ඒ රෙදි එතැනින් ලබා ගන්ට බැරි තත්ත්වයක් ඇති වී තිබෙනව. මෙහි රෙදි ලබා ගත් මිළ යාරයක් රුපියල් 1.63 යි. නමුත් චීන කාකි යාරයක මිළ රුපියල් 3.20 යි. ඒ නිසා කාකි රෙදි කුමන මිළට සැපයිය හැකිදැයි ඉන්දියාවෙන් විමසන්ට යෙදුණා. එවිට රුපියල් 1.35 බැගින් සැපයිය හැකි බව දන්වා තිබෙනව. යම්කිසි විධියකින් ඉන්දියාවෙන් රෙදි ගන්නවා නම් එසේ ගන්නේ ලාභය සලකාගෙන බව මතක් කරන්ට කැමතියි.

**කේ. එම්. පී. රාජරත්න මයා.**

*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*

(Mr. K. M. P. Rajaratna)

රුපියල් 1.35 ට දකුණු ඉන්දියා කාකි රෙදි යාරයක් ගන්ට පුළුවන් වන්නෙ කම්කරු ඇමතිතුමා විසින් ඊට අදාළ පණතින් එය නිදහස් කළොත් පමණයි. සාමාන්‍ය නීතිය වශයෙන් තිබෙන්නේ පිටරටින් රෙදි ගෙන්වන විට මේ රටේ රෙදි කොටස කුත් ගත යුතුය කියායි. රුපියල් 1.35 මිළ වැටෙන්නේ ඉහත කී නීතියෙන් මෙය නිදහස් කළොත් පමණයි. ඒ අනුව ඒ රෙදිත් මේ රෙදිත් ගන්න කොට චීන කාකිවල මිළම වෙනව. මම කිව්වෙ මෙහෙ තියෙනව. මෙහෙ තියෙන නිසා මෙහෙ රෙදි වියන අයටත් පහරක් ගසා ඇයි මේ ආණ්ඩුව අමතර වශයෙන් තවත් ගන්න යන්නෙ?

**ගරු සමරවීර**

*(கௌரவ சமரவீர)*

(The Hon. Samaraweera)

මෙහෙ තිබුණත් අපි සමුපකාර තොග වෙළඳ ආයතනයෙන් සොයා ගත්ත යාරයක් රුපියල් 3.20 යි කියා.

**කේ. එම්. පී. රාජරත්න මයා.**

*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*

(Mr. K. M. P. Rajaratna)

මෙහෙ රෙදි අරගන්න අතරම ඉන්දියා වෙනුත් ගන්න යන විට——

**ගරු සමරවීර**

*(கௌரவ சமரவீர)*

(The Hon. Samaraweera)

ගන්නවාමය කියා තවම තීරණයක් කර නැහැ.

**කේ. එම්. පී. රාජරත්න මයා.**

*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*

(Mr. K. M. P. Rajaratna)

මේ ගැන ගරු ඇමතිතුමා සැලකිල්ල යොමු කරාවිය කියා මම බලාපොරොත්තු වෙනව. මෙහෙ රෙදි වියන අයටත් මෙයින් පහරක් වදිනව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු සමරවීර**
*(கௌரவ சமரவீர)*
(The Hon. Samaraweera)

තමුන්නාන්සේගේ අදහස ගැන අපි සලකා බලනවා.

ගමනාගමන මණ්ඩලය සිංහල භාෂා ප්‍රතිපත්තිය කෙසේ ක්‍රියාවේ යොදවනවා ද කියා අසා සිටියා. ගමනාගමන මණ්ඩලය විසින් සිංහල භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යොදවන්න යන බව මම ගරු සභාවට මතක් කරන්ට කැමතියි. ඒ අනුව දැනටම වුවමනා මූලික වැඩ කටයුතු කර ගෙන යන බවත් මතක් කරන්ට සතුටුයි. හැමදාම බස් රථයක් පාවිච්චි කිරීම එක රියැදුරු මහත්මයෙකුටම භාර දිය යුතුය කියා ගරු මන්ත්‍රීන් කීප දෙනෙක්ම කියා සිටියා. කොළඹින් පිටපළාත්වල පුළුවන් පුළුවන් ස්ථානවල මේ ප්‍රතිපත්තිය ක්‍රියාවේ යොදවා ගෙන යනව. නමුත් නගර සේවාවන්වල පැය 16ක් පමණ ඒ සේවාවන් තියෙන නිසා මේ ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදීමට අපහසුකම් තිබෙන බව තමුන්නාන්සේලාට පෙනී යනවා ඇති.

අනුරාධපුරයේ වැඩ කරන සේවක මහතුන්ට ආපන ශාලා පහසුකම් නැත කියා අනුරාධපුරයේ ගරු මන්ත්‍රීතුමා විසින් කියන්ට යෙදුණා. ඒ පිළිබඳව ප්‍රමාදයක් වුණා. එය ගොඩනැගිල්ලක් සාදන්ට භාර ගත් කොන්ත්‍රාත්කරුගේ ප්‍රමාද දෝෂයක්. නමුත් දැනට ඒ වැඩ ආරම්භ කර තිබෙන අතර පුළුවන් තරම් ඉක්මනින් එය අවසාන කරන්ට බලාපොරොත්තු වෙනවා.

ගරු මන්ත්‍රීන් කීප දෙනෙක්ම කියා සිටියා, බොහෝ බස්වල සුළු ආබාධයක් ඇති වුණත් ඒවා අළුත්වැඩියා කර ගැනීම සඳහා අවශ්‍ය උපකරණ ඒ බස්වල නැත කියා. ඒ අඩුපාඩුකම් පිරිමැසීම සඳහා ආයුධ උපකරණ පිළියෙළ කර ඒවා දැන් රියැදුරු මහතුන්ට බෙදා ගෙන යන බවත් මතක් කරන්ට කැමතියි. එක්තරා ගරු මන්ත්‍රීවරයෙක් ප්‍රශ්න කළා, එක්සත් ජාතික පක්ෂයට අයිති රැස්වීම් තබන සෑම අවස්ථාවකදීම වගේ ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් සේවය ඇන හිටින්නෙ මොකද කියල. මෙවැනි දේවලට අපෙන් අනුබලයක් ලැබෙන්නෙ නැහැ. එවැනි හිතුවක්කාර දෙයක් සිදු වුණු විට ඒ බව අපට දැනුම් දුන්නොත් පරීක්ෂා කර බලා සුදුසු පරිදි කටයුතු කරන්න පුළුවනි. ඒ ගරු මන්ත්‍රීතුමා එක්සත් ජාතික පක්ෂයේ කෙනෙක් නිසා සමහර විට එහෙම අහන්න ඇති. සමහර විට එවැනි චෝදනා අපේ පක්ෂයෙ ගරු මන්ත්‍රීවරුන්ගෙනුත් ලැබෙන බව කියන්න ඕන. අපේ රැස්වීම් පවත්වන අවස්ථාවන්හිදිත් ලංගම බස් සේවය කුමන ක්‍රමයකින් හරි ඇන හිට තිබෙනවය කියල ඒ අයත් අපට චෝදනා කර තියෙනව. මේව අපි හිතල කරන දේවල් නොවෙයි. නමුත් එවැනි හිතුවක්කාර වැඩ පිළිවෙළක් කවුරු හරි ගෙන යනව නම් අපි ඒ පිළිබඳව සොයා බලා ක්‍රියා කරන්න ලෑස්තියි.

දොම්පෙ පවත්වන ලද දේශපාලන ප්‍රචාරක රැස්වීමක් පිළිබඳ පත්‍රිකාවක් එක්තරා බස් රථයක ගසා තිබුණාය කියා එම මන්ත්‍රීතුමා කිව්ව. එය ඡායාරූපයකුත් සමග එක්තරා ප්‍රවෘත්ති පත්‍රයකත් පළ වී තිබුණු බව කිව්ව. මෙම සිද්ධිය ඇකල ඉස්සෙල්ලම මේ ගැන ප්‍රශ්න කළේ ගමනාගමන මණ්ඩලයට අයිති නිලධාරි මහත්මයෙක් බව මේ අවස්ථාවෙදි මතක් කර දෙන්න ඕන. එම අවස්ථාවෙදි ඒ වාහනය භාරව සිටි රියැදුරු මහත්මය කිව්ව : මෙය කවුරු හරි ආණ්ඩුව අප්‍රසාදයට පත් කිරීම සඳහා කරන ලද හිතුවක්කාර වැඩක්ය කියල. උන්නැහෙ ඒ ගැන කිසිවක් දන්නෙත් නැත කියල කිව්ව. මෙවැනි දෙයක් ප්‍රචාරය කිරීමට සිතාමතා කළා නම් සෑම බස් රථයකම පත්‍රිකා ගහන්න අපට තිබුණා ; නමුත් මෙම පත්‍රිකාව ගසා තිබුණේ එක බස් රථයක පමණක් බවයි, කියන්න තියෙන්නෙ. අර නිලධාරි මහත්මය කළ නියෝගයක් උඩ එම පත්‍රිකාව බස් රථයෙන් ඉවත් කරන්න යෙදුන. ඒකයි, නියම සිද්ධිය. දේශපාලන රැස්වීම් ප්‍රචාරය කිරීම පිණිස මින් පෙර කිසි විටෙක ලංගම වාහන යොදවා නැති බවත්, මින් ඉදිරියටත් එසේ කරන්න කල්පනා කරන්නෙ නැති බවත්, ප්‍රකාශ කරන්න කැමතියි.

බස් සේවාව තිබුණට වැඩිය හොඳ තත්ත්වයක පවතින බව ගරු මන්ත්‍රීවරුන් පිළිගත්ත. බස් සේවාව විවේචනය කළා වාගෙම තිබුණට වැඩිය හොඳ තත්ත්වයක

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු සමරවීර]
පවතින බවත් ඔවුන් කිව්ව. මා මීට පළමුව කිව්ව වාගෙම මේ සම්බන්ධයෙන් දැනුත් කියන්නෙ එවැනි ප්‍රශංසාවක් කළ යුත්තෙ එවැනි ප්‍රශංසාවකට භාජන විය යුත්තෙ, මේ අංශය භාරව මීට පෙර සිටි ගරු ඇමති තුමා සහ ලංකා ගමනාගමන මණ්ඩලයෙ නිලධාරි මහතුන් බවයි. මින් ඉදිරියටත් තමුන්නාන්සෙලාගෙ සාධාරණ විවේචන පිළිබඳව සොයා බලා නිලධාරීන් සමග සාකච්ඡා පවත්වා සුදුසු පරිදි ක්‍රියා කරන බව කියන්න කැමතියි. තමුන්නාන්සෙල අද දවසෙ ලංකා ගමනාගමන මණ්ඩලය වෙනුවෙන් කරන ප්‍රශංසාවලට වඩා ප්‍රශංසා මින් ඉදිරියෙදි ලංකා ගමනාගමන මණ්ඩලයට ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින්, බස් සේවාව පිළිබඳව ඉදිරිපත් කරන ලද අදහස් මෙතෙකින් අවසන් කරනව.

පූ. භා. 10.30

දුම්රිය දෙපාර්තමේන්තුවේ නොයෙක් නොයෙක් අඩුපාඩුකම් ගැන කියා සිටියා. දුම්රිය සමාන්‍යාධිකාරිතුමා ගැනත් කියා සිටියා. එතුමා වෘත්තීය සමිති ව්‍යාපාර-වලට විරුද්ධව ක්‍රියා කරන ඒකාධිපතියෙක්ය යනාදි වශයෙන් එතුමාට යම් යම් ගරු මන්ත්‍රීවරු නොයෙකුත් චෝදනා එල්ලකළා. මා දන්න හැටියට දුම්රිය දෙපාර්තමේන්තුවෙ පමණක් වෘත්තීය සමිති 85 ක් තිබෙනව. ඔය සමිති 85 න්ම ප්‍රශංසා ලබා ගෙන ක්‍රියා කරන්න පුළුවන් සාමාන්‍යාධිකාරිවරයෙකු හෝ වෙනත් කවර තරාතිරමක නිලධරයෙකු හෝ පුද්ගලයෙකු ඇත කියා මම නම් කල්පනා කරන්නෙ නැහැ. මොන විධියට ක්‍රියා කළත් එක් අංශයක දුක්ගැනවිලි ගැන ඇහුම්කන් දෙනවිට අනෙක් අංශය විරුද්ධ අදහස් ඇති කර ගන්න පුළුවනි. හැම අංශයක්ම එක තරමට තෘප්තියට පත් වී ඉන්නවා දකින්න අප කවුරුත් ආසයි. ඒ වුණාට ඒක ඒ තරම් පහසු කාර්යයක් නොවෙයි. යම් යම් කරුණු සම්බන්ධව යම් යම් මතභේද ඇති වීම ස්වාභාවික නිසා හැමෝම සතුටු කරගෙන ක්‍රියා කිරීම දුෂ්කර බව අප කවුරුත් පිළිගන්න ඕනැ. එපමණක් නොව එකම වෘත්තියේ යෙදී ඉන්න උදවිය පවා ඇතැම්විට සමිති කීපයකට බෙදී ගොස් සිටින නිසා එක් සමිතියක් අනෙක් සමිති වලට විරුද්ධ වන අවස්ථාත් ඕනෑ තරම් දකින්න ලැබෙනව. ඔය සමිති 85 ගැනම එතුමා උනන්දුවෙන් වැඩ කරනව. ඒ සමිතිවල නියෝජිතයින් සමග සාකච්ඡා කරමින් නොයෙක් නොයෙක් අවස්ථාවල ඒ ඒ සමිතිවල ඉල්ලීම් සම්බන්ධයෙන් ඇතැම්විට එතුමා මා සමගත් සාකච්ඡා කර තිබෙන බව මට මේ අවස්ථාවේ සඳහන් කරන්න පුළුවනි. ඒ නිසා ඒ චෝදනා යුක්තිසහගත ඒවාය කියා මම කියන්නෙ නැහැ.

සිල්බර කඳන් ගැන ගරු මන්ත්‍රීවරු කීප දෙනෙක්ම කියා සිටියා. සිල්බර කඳන් පිටරටින් ගෙන්වන්න යනවය කියා ඇතැම් මන්ත්‍රීවරු කිව්ව. ඒ විධියට කිව්වා පමණක් නොවෙයි, පිටරටින් සිල්බර කඳන් ගෙන්වන්න යාමට වැරදිකාරයත් දුම්රිය සාමාන්‍යාධිකාරිතුමාය කියාත් කිව්ව. එහෙම නැත්නම් ඒවා පිටරටින් ගෙන්වන්න යාම ගැන වැරදිකාරයා එතුමා හැටියට පෙන්වන්න තැත් කළා. බැලූ බැල්මට කාට වුණත් පෙනී යන්නෙ යම් ආයතනයකින් යම් වරදක් සිදු වෙනව නම් ඊට වගකිවයුත්තා එම ආයතනය භාරව ඉන්න ප්‍රධාන නිලධාරියා හෝ අමාත්‍යවරයා හෝ නිසා ඒ අනුව චෝදනා කිරීම සාමාන්‍යයෙන් කෙරෙන දෙයක් නිසා මම ඒ විධියට කථා කළ ගරු මන්ත්‍රීවරුන්ට දොස් කියන්නෙ නැහැ. එහෙත් එහි යථා තත්ත්වය මෙන්න මේකයි. අද දුම්රිය දෙපාර්තමේන්තුවට ස්ලීපර්ස් 3,75,000 ක් අවශ්‍ය වී තිබෙනව. ඇතැම් ගරු මන්ත්‍රීවරු කියනව, මේ කැලේ මෙච්චර තියෙනව, ඇයි ඉතින් ඒවා නොගන්නෙ යනාදි වශයෙන්. කැලෑවල ලී තිබෙනව. එහෙත් සාමාන්‍යාධිකාරිතුමා කටයුතු කරන්න ඕන යම් යම් නීතිරීති වලට අනුවයි. උන්නැහෙට වුවමනා විධියට ලංකාවේ තිබෙන කැලෑවලින් ලී ලබා ගන්න බැහැ. කැලෑ දෙපාර්තමේන්තුවෙනුයි, උන්නැහෙට ලී ලබා ගන්න තියෙන්නෙ. කැලෑ දෙපාර්තමේන්තුවෙන් උන්නැහෙට දන්වා තියෙනව 1,50,000 කට වැඩිය සපයන්න බැරිය කියා.

**පී. සී. ඉඹුලාන මයා.** (රුවන්වැල්ල)
*(திரு. பீ. ஸீ. இம்புலான—ருவான்வெல்ல)*
(Mr. P. C. Imbulana—Ruwanwella)
ඔය අවුරුද්දකට වුවමනා කරන ප්‍රමාණයද ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු සමරවීර**
*(கௌரவ சமரவீர)*
(The Hon. Samaraweera)

අපට වුවමනා කර තිබෙන ප්‍රමාණයයි මම කිව්වෙ. 3,75,000 ක් අද වුවමනා කර තිබෙනව. එයින් 1,50,000 ක් පමණයි කැලෑ දෙපාර්තමේන්තුවෙන් සපයන්න පුළුවන්ය කියන්නෙ.

**ජේ. ආර්. ජයවර්ධන මයා.**
*(திரு. ஜே. ஆர். ஜயவர்தன)*
(Mr. J. R. Jayewardene)

මොන ලී ජාතිද ?

**ගරු සමරවීර**
*(கௌரவ சமரவீர)*
(The Hon. Samaraweera)

ඒක කියන්න අමාරුයි. අනුමත කරන ලද ලී වර්ග ගණනාවක් තියෙනව. ඒ ලී වර්ගවලින් කැලෑ දෙපාර්තමේන්තුවට සපයන්න පුළුවන් මෙපමණයිලු.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

ගරු සභාපතිතුමනි, එතකොට සාමාන්‍යාධිකාරිතුමා කියල තියෙන්නෙ ලී 3,75,000 ක් වුවමනාය කියලයි. ඒ ගැන කොයි තරම් දුරට පරීක්ෂා කර බලා තිබෙනවද කියා දැනගන්න කැමතියි. රජයේ කැලෑවෙන් රුපියල් 3.75 බැගින් ගෙන්වා ගැනීම පිටරටින් රුපියල් 35 බැගින් ගෙන්වීමට වඩා පහසු වෙන්නෙ නැද්ද ? නිකරුණේ දහස් ගණන් ලී දිරා යනව. ඒවා ගන්න වැඩ පිළිවෙළක් ඇති කරන්න බැරිද කැලෑ දෙපාර්තමේන්තුවත් එක්ක සාකච්ඡා කරල ? ඒක කරන්නෙ නැහැ.

**ගරු සමරවීර**
*(கௌரவ சமரவீர)*
(The Hon. Samaraweera)

සාකච්ඡා කළා. එහි ප්‍රතිඵලය තමයි ඔය කිව්වෙ. තවත් විස්තර දෙන්නම්. ලංකාවට වුවමනා ප්‍රමාණයම කැලෑ දෙපාර්තමේන්තුවෙන් ගන්න බැරි නිසා බුරුමයෙන් 75,000 ක් ගන්න බලාපොරොත්තු වෙනව. ඔස්ට්‍රේලියාවෙන් තවත් තොගයක් ගෙන්වා ගන්න බලාපොරොත්තු වෙනව. තවම ලැබිල නැහැ. පිලිප්පයින් වලිනුත් ලබා ගන්න පුළුවන් වේවි. මේවා ගෙන්වන්නෙ සාමාන්‍යාධිකාරිතුමාය කියල චෝදනාවක් කළා. ඒවා ගෙන්වන්න සාමාන්‍යාධිකාරිතුමාට ඒ විධියේ අදහසක් තිබුණෙත් නැහැ, ඉදිරියට එහෙම අදහසක් පහළ වෙන්නත් නැහැ කියා කියන්න කැමතියි.

**ඉඹුලාන මයා.**
*(திரு. இம்புலான)*
(Mr. Imbulana)

පිටින් ගෙනෙන ලී වර්ග මොනවද කියා මම දැනගන්න කැමතියි.

**ගරු සමරවීර**
*(கௌரவ சமரவீர)*
(The Hon. Samaraweera)

ඒ ඒ රටවලට අනුමත කළ වගී තිබෙන වලු. ඒව තමයි ගෙනෙන්නෙ.

**ඩී. ජී. එච්. සිරිසේන මයා.** (අකුරණ පළමුවන මන්ත්‍රී)
*(திரு. டீ. ஜீ. எச். சிறிசேன—அக்குறணை முதலாம் அங்கத்தவர்)*
(Mr. D. G. H. Sirisena—First Akurana)

රුපියල් තුන් ලක්ෂයටත් වැඩි මුදලක් උපයන්න පුළුවන් ලී කන්දරාවක් පුච්චා දමනව.

**ගරු සමරවීර**
*(கௌரவ சமரவீர)*
(The Hon. Samaraweera)

වෙන්න පුළුවන්. ගන්න තිබෙන තැන් වලින් ඉල්ලුවාම අපට ලැබෙන පිළිතුරුයි මේ. කැලෑ දෙපාර්තමේන්තුවට පිටින් සාමාන්‍යාධිකාරිතුමා ලී ගත්තොත් එතකොට තවත් චෝදනාවක් එන්න පුළුවන්.

**ඒ. ෂිවසුන්දරම් මයා.** (කිලිනොච්චි)
*(திரு. ஏ. சிவசுந்தரம்—கிளிநொச்சி)*
(Mr. A. Shivasunderam—Kilinochchi)

There is a lot of timber rotting——

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

ස්ලීපර කරන්න පුළුවන් ලක්ෂ ගණනක ලී කඳන් දිරාපත් වෙවී යනව. කැබිනට් මණ්ඩලයට බැරිද මේ සම්බන්ධයෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.]
ඒකාබද්ධ වැඩ පිළිවෙළක් ඇති කරන්න මහජනතාව සතු ජාතික වස්තුව නේද නැති වෙන්නෙ?

**ගරු සමරවීර**
*(கௌரவ சமரவீர)*
(The Hon. Samaraweera)
තවත් චෝදනාවක් ඊයේ ඉදිරිපත් කළා, ඩිස්ටිල්ඩ් වතුර සැපයීම පිණිස යන්ත්‍රයක් සෑදීමට දැනට අවුරුදු පහකට කලින් යම් කිසි නිලධාරියෙක් රුපියල් 3,000 ක් ඉල්ලුවය, ඒ මුදල නොලැබුණ නිසා එහි ප්‍රතිඵලයක් වශයෙන් අවුරුද්දකට රුපියල් 10,000ක පමණ ඩිස්ටිල්ඩ් වතුර ගෙන්වනවය කියා. එම චෝදනාව ගැන මම කියන්න කැමතියි, මේ මොහොත වන තුරු ඩිස්ටිල්ඩ් වතුර ගෙන්වීම වෙනුවෙන් ශතයක්වත් යොදා නැති බව. ඒ නිසා ඒ චෝදනාවෙද කිසිම සත්‍යයක් නැහැ.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)
එහෙම නම් මෙතෙක් කල් ඩිස්ටිල්ඩ් වතුර ලබා ගත්තෙ කොහොමද?

**ගරු සමරවීර**
*(கௌரவ சமரவீர)*
(The Hon. Samaraweera)
එතැන හරි ගස්සනව. එතැන තිබෙන යන්ත්‍රයෙන්——

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)
එහෙනම් කිව්වෙ යන්ත්‍රයක් සෑදීම පිණිස රුපියල් 3,000ක් ඉල්ලුවය කියා.

**ගරු සමරවීර**
*(கௌரவ சமரவீர)*
(The Hon. Samaraweera)
ඒ ඉල්ලුවෙ දැනට හරි ගස්සන විධියට නැතුව වෙනත් විධියකට හරි ගස්සන්නයි. දැනට එතැන සාදන ක්‍රමය අනුව පිටට සල්ලි නොදී එතැනම කරගෙන යනව.

මැද කොළඹ දෙවැනි මන්ත්‍රීතුමා (පී. ජී. බී. කේනමන් මයා.) ඩීසල් එන්ජින් ගැන ඊයේ ප්‍රකාශයක් කළා. ඒ ගැන මම කියන්න කැමතියි, කැනේඩියන් එන්ජින් ලැබුණෙ ඔය Brush Engineering Company කියන සමාගමෙන් ලැබුණාට පසුව බව. ඒ සමාගමෙන් ඒව ගත්තෙත් ටෙන්ඩර් කැඳවා "ක්‍රවුන් ඒජන්ට්ස්" ලාගෙන් ලැබුණ උපදෙස් අනුවයි. මෙම සමාගමත් ඇතුළුව සමාගම් 10ක් පමණ ටෙන්ඩර් ඉදිරිපත් කළා. ඒ ටෙන්ඩර් පත්‍ර අනුව Brush Engineering Company කියන සමාගමෙන් ගැනීම සුදුසුය කියා "ක්‍රවුන් ඒජන්ට්ස්" ලාගෙන් ලැබුණ උපදෙස් අනුවයි ඒ කටයුතු කර තිබෙන්නෙ.

**පී. ජී. බී. කේනමන් මයා** (මැද කොළඹ දෙවන මන්ත්‍රී)
*(திரு. பீ. ஜீ. பி. கெனமன்—கொழும்பு மத்தி இரண்டாம் அங்கத்தவர்)*
(Mr. P. G. B. Keuneman—Second Colombo Central)
The Hon. Minister will please excuse me. He has obviously not had time to study the subject and is now speaking on information supplied to him last night. I invite him to pay attention to our request to set up a commission to inquire into the matters mentioned. I do not want to blame the Hon. Minister because, as I said, he is relying on information given to him. I have a lot of information here which is contrary to that, but I do not want to take up his time now.

**ගරු සමරවීර**
*(கௌரவ சமரவீர)*
(The Hon. Samaraweera)
ගරු මන්ත්‍රීවරුන් කීප පළක්ම කියා තිබියා, රේල්වේ ක්‍රොසින් නැතිනම් දුම්රිය මාර්ගය හරහා මාර්ග වැටී ඇති ස්ථාන ගැන. මෙම ස්ථානවල නියම අන්ද මේ ආරක්ෂාවක් ස්ලසා නැති හෙයින් හදිසි අනතුරු සිදු වී තිබෙනවාය කියා ප්‍රකාශකළා. ගරු මන්ත්‍රීවරුන් කීප පළක්ම මගෙන් පෞද්ගලික වශයෙන් මේ පිළිබඳ ව ඉල්ලීමක් කළ අවස්ථාවේදී මම පෙන්නා දුන්නා, මේ පිළිබඳ වගකීම මූලික වශයෙන් ම ඒ ඒ ප්‍රදේශවල ඇති පළාත් පාලන ආයතනවලට පැවරී ඇති බව. ඒ සඳහා යන වියදමින් කොටසක් ඒ ප්‍රදේශයේ පළාත් පාලන ආයතනය භාරගත යුතු අතර අනික් කොටස පළාත් පාලන කොමසාරිස් දෙපාර්තමේන්තුව භාරගෙන, ඒ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මුදල් දෙපාර්තමේන්තුවට දුන්නාම දෙපාර්තමේන්තුව මගින් ක්‍රියා කරනවා මිස වෙනත් වැඩ පිළිවෙළක් නැහැ. එම නිසා මේ ස්ථාන ආරක්ෂා කිරීම සඳහා වැය වන මුදල් ඒ ඒ අංශවලට භාර දී ඇති බව කියන්න කැමතියි.

**ටී. සිවසිතම්පරම් මයා.** (වවුනියාව)
(திரு. ரி. சிவசிதம்பரம்—வவுனியா)
(Mr. T. Sivasithamparam—Vavuniya)

Will the Hon. Minister please tell us whether the question of railway gates within the shunting limits of the railway station is a matter to be taken up by the railway ?

**ගරු සමරවීර**
(கௌரவ சமரவீர)
(The Hon. Samaraweera)

Yes, if it is within the shunting limit. In that case, wherever possible, we will try to provide the necessary protection.

**ෂිවසුන්දරම් මයා.**
(திரு. சிவசுந்தரம்)
(Mr. Shivasunderam)

What about the question of recurrent expenditure, keeping a man there and so on ?

**ගරු සමරවීර**
(கௌரவ சமரவீர)
(The Hon. Samaraweera)

That will be the responsibility of the Railway.

**ෂිවසුන්දරම් මයා.**
(திரு. சிவசுந்தரம்)
(Mr. Shivasunderam)

I think in such a case the local authority will bear a proportionate cost.

**ගරු සමරවීර**
(கௌரவ சமரவீர)
(The Hon. Samaraweera)

මේ හැරෙන්නට ගරු මන්ත්‍රීවරුන් කියා සිටියා, දුම්රිය ගමනාගමනයේ තිබෙන අපහසුකම් රාශියක් ගැන. ඇත්ත වශයෙන් මේ අපහසුකම් ගැන අපත්, නමුන්නාන්සෙලාත් හොඳින් දන්නවා. අප පුළුවන් තරම් දුරට මේ අපහසුකම් නැති කිරීමට උත්සාහ දරනව. නමුත් මෙය දෙපාර්තමේන්තුවට පමණක් ඉෂ්ට කරන්න පුළුවන් දෙයක් නොවෙයි. දුම්රිය සේවය දියුණු කිරීමට අප මහජනතාවගේ සහායත්, නමුන්නාන්සේලාගේ මාර්ගයෙන් ඉල්ලා සිටිනව. මක්නිසාද ? අවාසනාවකට මෙන් දුම්රියේ ගමන් කරන ඇතැම් දෙනා, නොයෙක් අවස්ථාවලදී දුම්රිය මැදිරිවල ඇති බල්බ්, කුෂන් ආදිය ගලවාගෙන, කපාගෙන යනව, වෙනත් නොයෙකුත් අලාභහානි කරනව. මෙය පොදු මහජනතාවට අයත් වස්තුවක් ලෙස, ආරක්ෂා කළ යුතු දෙයක් ලෙස, කල්පනා කරන්නෙ නැහැ. පිත්තල කෑබැල්ලක් හෝ වෙනත් වටිනා දෙයක් තිබුණොත් කඩාගෙන යනව. මේ අන්ද මට මහජන සන්තක දේවල් නාස්ති කරනව.

**ෂිවසුන්දරම් මයා.**
(திரு. சிவசுந்தரம்)
(Mr. Shivasunderam)

All this is done by the people at the running sheds. I do not think the travelling public will do damage.

**ගරු සමරවීර**
(கௌரவ சமரவீர)
The Hon. Samaraweera)

Whoever it is, there are cases where people in the service have been involved and they have been dealt with when they were caught. There have also been cases where the public have been involved and they also have been caught and dealt with.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
(திரு. டீ. பி. ஆர். குணவர்தன)
(Mr. D. B. R. Gunawardena)

හොඳටම අඩි ගහල පළමුවැනි පන්තියෙ යන මිනිසුන් හුඟක් මේව නරක් කරනව.

**ගරු සමරවීර**
(கௌரவ சமரவீர)
(The Hon. Samaraweera)

ඒ හැර භාෂා ප්‍රතිපත්තිය ගැන ප්‍රශ්න කළා. භාෂා ප්‍රතිපත්තියද ආණ්ඩුවේ ප්‍රතිපත්තිය අනුව ක්‍රියාවේ යොදවන්න බලාපොරොත්තු වන බව මේ අවස්ථාවේදී මතක් කරන්න කැමතියි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පූ. භා. 10.45.

**කෙනමන් මයා.**

*(திரு. கெனமன்)*

(Mr. Keuneman)

As the Hon. Minister is moving away from the question of the Railway, may I know what his view is on the desirability of appointing a commission? Will he kindly examine that?

**ගරු සමරවීර**

*(கௌரவ சமரவீர)*

The Hon. Samaraweera)

I will examine it. I will have to discuss it with the Cabinet.

**කෙනමන් මයා.**

*(திரு. கெனமன்)*

(Mr. Keuneman)

Naturally. I know the Hon. Minister will have to discuss it with the Cabinet. He cannot give an assurance to the House without discussing it with the Cabinet. Let him discuss it with the Cabinet.

**ආර්. ඩබ්ලිව්. තෙන්නකෝන් මයා.** (මිනිපෙ)

*(திரு. ஆர். டப்ளியு. தென்னகோன்—மினிப்பே)*

(Mr. R. W. Tennekoon—Minipe)

The morning express train leaving Kandy at 7 A.M. is drawn by a steam engine. I believe there was a request made by hon. Members that it be replaced by a diesel engine. Will the Hon. Minister kindly consider that?

**ගරු සමරවීර**

*(கௌரவ சமரவீர)*

The Hon. Samaraweera)

Oh yes, those details will be considered by us. All speeches of hon. Members will be examined by me and the officials and wherever possible the suggestions will be acted upon.

ඒ හැර ලංකා ගුවන් සේවාව ගැන ප්‍රශ්න කීපයක් ඉදිරිපත් කරන්න යෙදුණ. සෞඛ්‍ය කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් ගුවන් සේවාවන් ගැන පරීක්ෂා කිරීමට කාරක සභාවක් පත් කර තිබෙන බව, ඒ සම්බන්ධයෙන් මම කියන්න කැමතියි. ඒ කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් වූ පසු සුදුසු ප්‍රතිසංවිධාන කරනවා ඇති. අහස් යාත්‍රාවක් ගැන කියා සිටිය. ඒ අහස් යාත්‍රාව ගන්න අවස්ථාවක් ඇවිල්ල නැහැ. එවැනි අවස්ථාවක් ආවොත් මොන අහස් යාත්‍රාවක් ගන්නවද යන්න තීරණය කරන්නෙ ඒ ගැන හොඳින් දන්න විශෙෂඥයකුගේ වාර්තාවක් අනුව පමණයි. කටුනායක අහස් යාත්‍රා තොටුපොළ ගැන කීව. ඒ ගැන වැඩ කරගෙන යනව. දැනට අපි ටෙන්ඩර් පත්‍ර කැඳවා තිබෙනව. පුළුවන් ඉක්මනින් වැඩ ආරම්භ කරන්න බලාපොරොත්තු වෙනව.

කන්කසන්තුරේ වරාය ගැන නොයෙක් නොයෙක් අදහස් ඉදිරිපත් කළා. උඩුප්පිඩියේ ගරු මන්ත්‍රීතුමා මටම චෝදනාවක් එල්ල කරන්න වගේ කීව, "මේ ගමනාගමන ඇමතිතුමා ආ හැටියෙ මේකෙ තිබු මුදල් නැති වුණා" ය කියා. මා මේ අංශය භාර ගන්න කලින් මේ පිළිබඳව මූලික වශයෙන් ප්‍රශ්නය ඉදිරිපත් කළේ භාණ්ඩාගාරයේ නිලධාරින් බවට හිටපු ගරු ඇමතිතුමා සාක්ෂි දරාවි. වියදම් කරන මුදලේ හැටියට නියම සේවයක් ලැබේවිද කියා භාණ්ඩාගාරයේ නිලධාරින් ප්‍රශ්න කළා. ඒ අනුව වාර්තාවක් ඉදිරිපත් කිරීම පිණිස දැනට විශේෂ කාරක සභාවක් පත් කරල තියෙනව. ඒ කාරක සභාවෙ වාර්තාව කැබිනට් මණ්ඩලය සාකච්ඡා කර, ඒ වරාය ඇති කරන්නය කියා තීරණයක් ගත්තොත් ඒ අවස්ථාවෙදි පරිපූරක ඇස්තමේන්තුවක් මම මේ ගරු සභාවට ඉදිරිපත් කරනව. දැනට තියෙන තත්ත්වයයි, මා මේ කියා සිටියෙ.

**එම්. බාලසුන්දරම් මයා.** (කෝපායි)

*(திரு. எம். பாலசுந்தரம்—கோப்பாய்)*

(Mr. M. Balasunderam—Kopai)

May I know from the Hon. Minister who put the idea that the harbour should be an adjunct of the Cement Factory? It is a wrong way of looking at the development of the harbour. Who put that idea into the heads of Hon. Ministers of the Cabinet and others?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු සමරවීර
(கௌரவ சமரவீர)
The Hon. Samaraweera)

I do not know who put the idea. It has been examined on that basis from the beginning.

බාලසුන්දරම් මයා.
(திரு. பாலசுந்தரம்)
(Mr. Balasunderam)

From the beginning of what? When? It is an absurd way of looking at it that the harbour should be looked at as an adjunct of the factory. On the contrary, it might be utilized by the factory for cheaper transport. The harbour should be examined on its merits. For a number of years it was considered desirable. Who considered it undesirable?

ගරු සමරවීර
(கௌரவ சமரவீர)
The Hon. Samaraweera)

It is not considered undesirable now. It is being examined by a committee.

බාලසුන්දරම් මයා.
(திரு. பாலசுந்தரம்)
(Mr. Balasunderam)

For how long? Why should you examine something that was decided long ago, a few years ago?

ගරු සමරවීර
(கௌரவ சமரவீர)
The Hon. Samaraweera)

On objections raised by the Treasury.

බාලසුන්දරම් මයා.
(திரு. பாலசுந்தரம்)
(Mr. Balasunderam)

What are the objections? We would like to find them out.

ගරු සමරවීර
(கௌரவ சமரவீர)
(The Hon. Samaraweera)

Whether it was an economic proposition.

බාලසුන්දරම් මයා.
(திரு. பாலசுந்தரம்)
(Mr. Balasunderam)

What do you mean by "economic proposition"? When did the Treasury become experts on economics in this matter?

ගරු සමරවීර
(கௌரவ சமரவீர)
(The Hon. Samaraweera)

This will involve an expenditure of about Rs. 40 million.

ශිවසුන්දරම් මයා.
(திரு. சிவசுந்தரம்)
(Mr. Shivasunderam)

I was told that it was only Rs. 24 million.

ගරු සමරවීර
(கௌரவ சமரவீர)
(The Hon. Samaraweera)

Rs. 24 million, but with capital investment on special clinker carrying coastal vessels and handling facilities such as aerial ropeways, and so on, it is estimated to cost about Rs. 40 million. Without that Rs. 40 million investment——

කේ. තුරෙයිරත්නම් මයා. (පේදුරු තුඩුව)
(திரு. கே. துரைரத்னம்—பருத்தித்துறை)
(Mr. K. Thurairatnam—Point Pedro)

That is the amount you are really losing on the Railway.

සභාපතිතුමා.
(அக்கிராசனர்)
(The Chairman)

Order, please! Please sit down. Let the Hon. Minister reply. Then you can take the matter up.

ගරු සමරවීර
(கௌரவ சமரவீர)
(The Hon. Samaraweera)

Without any additional investment of this nature, the Railway feels that it can transport this for the same price.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තුරෙයිරත්නම් මයා.
(திரு. துரைரத்னம்)
(Mr. Thurairatnam)
With how much additional loss?

ගරු සමරවීර
(கௌரவ சமரவீர)
(The Hon. Samaraweera)
With no loss.

තුරෙයිරත්නම් මයා.
(திரு. துரைரத்னம்)
(Mr. Thurairatnam)
How can that be?

ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பி. ஆர். குணவர்தன)
(Mr. D. B. R. Gunawardena)
වතුරෙන් යම් දෙයක් ගෙන යන විට—ඇළකින් නැත්නම් මුහුදින්—එය ගෙන යන්නට යන වියදම සියයට 90 කින් වගේ අඩු වන බව තමුන්නාන්සෙ පිළිගන්නවද? නැද්ද?

ගරු සමරවීර
(கௌரவ சமரவீர)
(The Hon. Samaraweera)
ගරු සභාපතිතුමනි, මට ලැබුණු ගණන් අනුවයි මම කියන්නෙ. එහෙම අලාභයක් පෙනෙන්නට නැහැ. ඒ කෙසේ නමුත්, දැන් කාරක සභාවක් පත් වී තිබෙනවා. එහි වාර්තාව ලැබුණාට පසු තීරණයක් ගන්නවා.

ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பி. ஆர். குணவர்தன)
(Mr. D. B. R. Gunawardena)
ඕනෑම ලීයක් අරගෙන "ස්ලීපර්ස්" හදන්නට එය "චිරිච්" කරන්නට යන්ත්‍රයක් පසුගිය කාලවලදී පිළියෙළ කළා නේද? එය අද වන තුරු ක්‍රියාවෙ යොදන්නෙ නැත්තෙ මන්ද? ඒ සමගම තවත් කරුණක් අහන්න කැමතියි. පාරවල් අයිනෙ වට දහයෙ පහළොහේ මාර ගස් තිබෙනවා නේද? ඒවා චිරිච් කර ගත්තොත් අවුරුදු 10 ක් 15 ක් "ස්ලීපර්ස්" හැටියට පාවිච්චි කරන්න බැරි මන්ද?

ගරු සමරවීර
(கௌரவ சமரவீர)
(The Hon. Samaraweera)
I have passed on to another subject and the officials have also gone.

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)
The desirability of developing a harbour must depend not on one project alone but on its total merits, how far the harbour will really help the development of the whole region and the total economy of Ceylon. Will the Hon. Minister give us an assurance that the Committee that he has set up will examine the matter in that light and not solely in the restricted and topsy-turvy way of looking at the development of the Kankesanturai Harbour purely as an outlet for the products of the cement factory?

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)
It is an accepted fact all over the world that water transport is the cheapest mode of transport.

ගරු සමරවීර
(கௌரவ சமரவீர)
(The Hon. Samaraweera)
The matter is being looked into; the aspect you mention will be kept in mind.

බාලසුන්දරම් මයා.
(திரு. பாலசுந்தரம்)
(Mr. Balasunderam)
My main theme is that this question has already been decided upon by a number of Government experts.

එම්. ඊ. එච්. මොහමඩ් අලි මයා. (මුතූර් පළමුවන)
(ஜனாப் எம். ஈ. எச். முகம்மது அலி—மூதூர் முதல் அங்கத்தவர்)
(Mr. M. E. H. Mohamed Ali—First Mutur)
Before the Hon. Minister switches on to other subjects, will he kindly, tell us whether he will consider banning liquor in trains?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු සමරවීර**

*(கௌரவ சமரவீர)*

(The Hon. Samaraweera)

I will be considering that. This matter has been brought up by several hon. Members; allegations were also made against the contractor. I will look into this matter.

**කේ. එම්. පී. රාජරත්න මයා.**

*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*

(Mr. K. M. P. Rajaratna)

ගාලු වරාය දියුණු කිරීමට වැඩ පිළිවෙළක් ගන්නෙ නැද්ද කියා ගරු අමතිතුමාගෙන් දැනගන්නට කැමතියි.

**ගරු සමරවීර**

*(கௌரவ சமரவீர)*

(The Hon. Samaraweera)

දැනටම ඒය කරගෙන යනවා.

**ඩබ්ලිව්. දහනායක මයා.**

*(திரு. டப்ளியு. தகநாயக்க)*

(Mr. W. Dahanayake)

එක බස්එකක් පමණක් ධාවනය කරන පාරවලට අඩු ගණනෙ බස් දෙකක් වත් දෙනවද කියා දැනගන්න කැමතියි.

**ගරු සමරවීර**

*(கௌரவ சமரவீர)*

(The Hon. Samaraweera)

ගරු සභාපතිතුමනි, බස් ලැබුණු හැටියට ක්‍රියා කරනවාය කියා මම කිව්ව. ඒ හැර මෝටර් රථ කොමසාරිස් දෙපාර්තමේන්තුව ගැනත් සඳහන් වුණා. එහි තිබෙන අඩුපාඩුකම් ගැන අලුතෙන් පත් වූ කොමසාරිස්තුමා ක්‍රියා කරගෙන යන බව කියන්න කැමතියි.

වරායේ යම් යම් අඩුපාඩුකම් ගැනත් කියා තිබෙනවා. මූලික වශයෙන් යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) දැනට සිටින සාමාන්‍යාධිකාරී පෙරේරා මහතා යැවූ චක්‍රලේඛනයක් ගැන කියා හිටියා. ඒ චක්‍ර ලේඛය පිළිබඳව සාමාන්‍යාධිකාරීතුමාට දොස් කීමෙන් වැඩක් නැහැ. එහි සම්පූර්ණ වග කීම මම බාරගන්නවා. එය වෘත්තීය සමිතියකට හෝ පුද්ගලයකුට විරුද්ධව යවන ලද චක්‍ර ලේඛයක් නොවෙයි. අපි ඒ සමිති වලින් ඉල්ලා සිටිනවා, මහජන යහපත සඳහා හිතුවක්කාර වැඩ වර්ජන කරන්නට එපාය කියා. එසේ කළොත් නීත්‍යානුකූලව වැඩ කරන බවයි, අපි කියන්නේ.

යම් යම් ප්‍රමාද දෝස ගැන මන්ත්‍රීවරු කිව්වා. ගාල්ලේ ගරු මන්ත්‍රීතුමාත් ඒ පිළිබඳව කිව්වා. 'යම් අවශ්‍යතාවයන් අනුව කුමන නැව් පළමුව වරායට ඇතුළු කරගත යුතුදැයි තීරණය කරන්නේ නැංගුරම් පහසුකම් කමිටුවයි. එම කමිටුවට ආහාර දෙපාර්තමේන්තුවේත් සතොසේ ආයතනයේත් නිලධාරීන් ඇතුළත් වෙනවා. ඒවායේ යම් අඩු පාඩුකම් තිබෙනවා නම් ඒවා පිළිබඳව කටයුතු කිරීමට සලස්වන් නම්. [බාධා කිරීමක්.]

මූදු කැම පිළිබඳව කොට්ටාවේ ගරු ගරු මන්ත්‍රීතුමා අහනවා. එය ඉතා වැදගත් ප්‍රශ්නයක්. ලංකාවේ සිටින දක්ෂ ඉංජිනේරු පිරිසක් මේ කටයුත්ත බාරව සිටිනවා. වෙනදා කවදාවත් වෙන් නොකළ ප්‍රමාණයේ මුදලක් අපි ඒ කටයුත්ත සඳහා වෙන් කර තිබෙනවා. දකුණු පළාතේ පමණක් නොවෙයි, මීගමු ප්‍රදේශය වැනි මේ ප්‍රශ්නය බලපවත්වන අනික් ප්‍රදේශවලද ඇති අවශ්‍යතාව්යන් බලා සුදුසු වැඩ කිරීමට දැන් ක්‍රියා කර ගෙන යනවා.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**

*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*

(Mr. D. B. R. Gunawardena)

අවුරුදු 30 ක් 40 ක් පමණ කාලයක් තිස්සේ ගාලු මුවදොර ඇති වෙරළ බැම්මක් බැඳීම නිසා ආරක්ෂා වී තිබුණා. ඒ නිසා නිකම්ම කළුගල් අතහරින්නේ නැතිව ඒ විධියේ බැම්මක් දැම්මොත් මීට වඩා ආරක්ෂා වෙන්නේ නැද්දැයි ඒ පිළිබඳ විශෙෂඥයින් අසා බලන්නය කියා මම ඉල්ලනවා.

**ගරු සමරවීර**

*(கௌரவ சமரவீர)*

(The Hon. Samaraweera)

දැන් සිටින නිලධාරීන් ඉතා හොඳින් මේ කටයුත්ත කරගෙන යනවා. ඒ අයට මම ඒ ගැන ස්තුති කරනවා. ඔවුන් වුව මනා දේ හරියාකාර කරනවා ඇති.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තුරෙයිරත්නම් මයා.

(திரு. துரைரத்னம்)

(Mr. Thurairatnam)

The Point Pedro lighthouse is about to collapse because of sea erosion. Will the Hon. Minister look into the matter?

ගරු සමරවීර

(கௌரவ சமரவீர)

(The Hon. Samaraweera)

I will look into it.

කෙනමන් මයා.

(திரு. கெனமன்)

(Mr. Keuneman)

I would like to mention one point. The hon. Member for Deniyaya raised the question of the G. M. R. being involved in a matter of contempt of Court and he wanted to know why no action had been taken against that officer. I have here a document which reads as follows:

"IN THE SUPREME COURT OF THE ISLAND OF CEYLON

In the matter of an application to take cognizance of and to try an offence of contempt committed against or in disrespect of the authority of the District Court of Colombo under Section 47 of the Courts Ordinance (Cap. 6).

The Ceylon Railway Uniform Staff Union of Drieberg's Avenue, Colombo .................. Petitioner.

S. C. Application No. 470 of 1961 Vs

(1) K. M. G. de Silva, Station Master, Galle, (2) B. D. Rampala, General Manager, Ceylon Government Railway, Colombo .. Respondents.

This matter having come up...... It is ordered that in view of the apology tendered by the 2nd respondent and the extenuating circumstances of the case of the 1st respondent the respondents be and they are hereby warned and discharged. ...."

I would like the Hon. Minister to give us a statement as to what has been done about this matter.

ගරු සමරවීර

(கௌரவ சமரவீர)

(The Hon. Samaraweera)

I really do not know what has been done but I will look into the matter.

එස්. එම්. රාසමානික්කම් මයා. (පද්දිරිප්පු)

(திரு. எஸ். எம். இராசமாணிக்கம்—பட்டிருப்பு)

(Mr. S. M. Rasamanickam—Paddiruppu)

I would like the Hon. Minister to tell us when an express train service to Batticaloa will be started.

ගරු සමරවීර

(கௌரவ சமரவீர)

(The Hon. Samaraweera)

That is under consideration.

රාසමානික්කම් මයා.

(திரு. இராசமாணிக்கம்)

(Mr. Rasamanickam)

Will it be started in October?

ගරු සමරවීර

(கௌரவ சமரவீர)

(The Hon. Samaraweera)

I cannot tell you just now.

රාසමානික්කම් මයා.

(திரு. இராசமாணிக்கம்)

(Mr. Rasamanickam)

The first thing is to shift the regional office from Bandarawela to Batticaloa.

ගරු සමරවීර

(கௌரவ சமரவீர)

(The Hon. Samaraweera)

That matter will be looked into.

පූ. භා. 11.00

ඒ. එච්. මාකන්-මාකර් මයා. (මඩකලපුව දෙවන මන්ත්‍රී)

(ஜனாப் ஏ. எச். மாக்கன் மாக்கர்—மட்டக்களப்பு இரண்டாம் அங்கத்தவர்)

(Mr. A. H. Macan Markar—Second Batticaloa)

In regard to the recruitment of minor staff to the C. T. B., I have urged that such recruitment should be at a local level rather than at a national level.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## 144 වන ශීර්ෂය.—ප්‍රවාහණ අමාත්‍යවරයා

### 1 වන සම්මතය.—කාර්ය මණ්ඩල පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා, රු. 2,60,789

*தலைப்பு 144.—போக்குவரத்து அமைச்சர்*

*வாக்குப்பண இல. 1.—பணியாளரின் ஆளுக்குரிய வேதனமும், பிறபடிகளும், ரூபா 2,60,789*

HEAD 144.—MINISTER OF COMMUNICATIONS

*Vote No. 1.—Personal Emoluments and other allowances of staff, Rs. 260,789*

"144 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය සඳහා රු. 2,60,789 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

144 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

### 2 වන සම්මතය.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම, රු. 43,885

*வாக்குப்பணம் இல. 2.—பரிபாலனச் செலவுகள்—மீண்டுவருஞ் செலவு, ரூபா 43,885*

*Vote No. 2.—Administration Charges —Recurrent Expenditure, Rs. 43,885*

"144 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය සඳහා රු. 43,885 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

144 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

## 145 වන ශීර්ෂය.—දුම්රිය දෙපාර්තමේන්තුව

### 1 වන සම්මතය.—කාර්ය මණ්ඩල පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා, රු. 3,63,04,995

*தலைப்பு 145.—புகைவண்டித் திணைக்களம்*

*வாக்குப்பணம் இல. 1.—பணியாளரின் ஆளுக்குரிய வேதனமும் பிறபடிகளும், ரூபா 3,63,04,995*

HEAD 145.—RAILWAY

*Vote No. 1.—Personal Emoluments and other allowances of staff, Rs. 36,304,995*

"145 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය සඳහා රු. 3,63,04,995 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

145 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

### 2 වන සම්මතය.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම, රු. 3,87,53,310

*வாக்குப்பணம் இல. 2.—பரிபாலனச் செலவுகள்—மீண்டுவருஞ் செலவு, ரூபா 3,87,53,310*

*Vote No. 2.—Administration Charges —Recurrent Expenditure, Rs. 38,753,310*

"145 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය සඳහා රු. 3,87,53,310 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

145 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

### 3 වන සම්මතය.—පාලන ගාස්තු—මූලධන වියදම, රු. 1,85,500

*வாக்குப்பணம் இல. 3.—பரிபாலனச் செலவுகள்—ஆக்கப்பொருட் செலவு ரூபா 1,85,500*

*Vote No. 3.—Administration Charges —Capital Expenditure, Rs. 185,500*

### 10 වන අළුත් උප ශීර්ෂය.—මහනුවර කම්කරු නිවාස යෝජනා ක්‍රමය, රු. 32,500

*புதிய உபதலைப்பு 10.—கண்டியிலுள்ள தொழில் அதிகாரிக்கான வீடமைப்பு ரூபா 32,500*

*New Sub-head 10.—Housing Scheme for Labour Staff at Kandy, Rs. 32,500*

මතු පළ වන යෝජනාව සභාසම්මත විය :

"That the vote be increased by Rs. 32,500 in respect of new sub-head 10, Housing Scheme for Labour at Kandy ".—[ගරු ඉලංගරත්න]

"145 වන ශීර්ෂයෙහි 3 වන සම්මතය සඳහා රු. 2,18,000 ක වැඩි කරන ලද මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

145 වන ශීර්ෂයෙහි 3 වන සම්මතය, සංශෝධිත කාරයෙන්, උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**4 වන සම්මතය.—දෙපාර්තමේන්තුව විසින් සපයන සේවා—පුනරාවර්තන වියදම, රු. 1,01,500**

*வாக்குப்பணம் இல. 4.—திணைக்களத்தால் அளிக்கப்படும் சேவைகள்—மீண்டுவருஞ் செலவு, ரூபா 1,01,500*

*Vote No. 4.—Services provided by the Department—Recurrent Expenditure, Rs. 101,500*

"145 වන ශීර්ෂයෙහි 4 වන සම්මතය සඳහා රු. 1,01,500 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

145 වන ශීර්ෂයෙහි 4 වන සම්මතය උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**5 වන සම්මතය.—දෙපාර්තමේන්තුව විසින් සපයන සේවා.—මූලධන වියදම, රු. 1,18,750**

*வாக்குப்பணம் இல. 5.—திணைக்களத்தால் அளிக்கப்படும் சேவைகள்—ஆக்கப் பொருட் செலவு, ரூபா 1,18,750*

*Vote No. 5.—Services provided by the Department—Capital Expenditure, Rs. 118,750*

"145 වන ශීර්ෂයෙහි 5 වන සම්මතය සඳහා රු. 1,18,750 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

145 වන ශීර්ෂයෙහි 5 වන සම්මතය උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**6 වන සම්මතය.—ආර්ථික සංවර්ධනය—පුනරාවර්තන වියදම, රු. 3,88,40,195**

*வாக்குப்பணம் இல. 6.—பொருளாதார அபிவிருத்தி—மீண்டுவருஞ் செலவு, ரூபா 3,88,40,195*

*Vote No. 6.—Economic Development—Recurrent Expenditure, Rs. 38,840,195*

"145 වන ශීර්ෂයෙහි 6 වන සම්මතය සඳහා රු. 3,88,40,195 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

145 වන ශීර්ෂයෙහි 6 වන සම්මතය උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**7 වන සම්මතය.—ආර්ථික සංවර්ධනය—මූලධන වියදම, රු. 2,15,95,153**

*வாக்குப்பணம் இல. 7.—பொருளாதார அபிவிருத்தி—ஆக்கப்பொருட் செலவு, ரூபா 2,15,95,153*

*Vote No. 7.—Economic Development—Capital Expenditure, Rs. 21,595,153*

"145 වන ශීර්ෂයෙහි 7 වන සම්මතය සඳහා රු. 2,15,95,153 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

145 වන ශීර්ෂයෙහි 7 වන සම්මතය උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**146 වන ශීර්ෂය.—සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුව**

**1 වන සම්මතය.—කාර්ය මණ්ඩල පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා, රු. 16,82,200**

*தலைப்பு 146.—குடியியல் விமானப் போக்குவரத்து*

*வாக்குப்பணம் இல. 1.—பணியாளரின் ஆளுக்குரிய வேதனமும் பிறபடிகளும், ரூபா 16,82,200*

HEAD 146.—CIVIL AVIATION

*Vote No. 1.—Personal Emoluments and other allowances of staff, Rs. 1,682,200*

"146 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය සඳහා රු. 16,82,200ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

146 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**2 වන සම්මතය.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම, රු. 4,27,400**

*வாக்குப்பணம் இல. 2.—பரிபாலனச் செலவுகள்—மீண்டுவருஞ் செலவு, ரூபா 4,27,400*

*Vote No. 2.—Administration Charges—Recurrent Expenditure, Rs. 427,400*

"146 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය සඳහා රු. 4,27,400ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

146 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය උපලේඛන යෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**3 වන සම්මතය.—පාලන ගාස්තු—මූලධන වියදම, රු. 4,28,700**

*வாக்குப்பணம் இல. 3.—பரிபாலனச் செலவு கள்—ஆக்கப்பொருட் செலவு, ரூபா 4,28,700*

*Vote No. 3.—Administration Charges —Capital Expenditure, Rs 428,700*

**9 වන උප ශීර්ෂය.—ගගන මාර්ග පණිවුඩ ක්‍රමය, රු. 1,40,000**

*உப தலைப்பு 9.—வானவழிப் போக்குவரத்து முறைமை, ரூபா 1,40,000*

*Sub-head 9.—Airways Communications System, Rs. 140,000*

මතු පළ වන යෝජනාව සභාසම්මත විය :

"That the vote be increased by Rs. 98,200 in respect of sub-head 9".— —[ගරු ඉලංගරත්න]

"146 වන ශීර්ෂයෙහි 3 වන සම්මතය සඳහා රු. 5,26,900ක වැඩි කරන ලද මුදල උපලේඛන යට ඇතුළත් කළ යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

146 වන ශීර්ෂයෙහි 3 වන සම්මතය, සංශෝධිතා කාරයෙන්, උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**7 වන සම්මතය.—ආර්ථික සංවර්ධනය—මූලධන වියදම, රු. 52,27,737**

*வாக்குப்பணம் இல. 7.—பொருளாதார அபிவிருத்தி—ஆக்கப்பொருட் செலவு, ரூபா 52,27,737*

*Vote No. 7.—Economic Development —Capital Expenditure, Rs. 5,227,737*

"146 වන ශීර්ෂයෙහි 7 වන සම්මතය සඳහා රු. 52,27,737ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

146 වන ශීර්ෂයෙහි 7 වන සම්මතය උපලේඛන යෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**147 වන ශීර්ෂය.—මෝටර් රථ ප්‍රවාහණ කොමසාරිස්**

**1 වන සම්මතය.—කාර්ය මණ්ඩල පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා, රු. 11,64,860**

*தலைப்பு 147.—மோட்டார் போக்குவரத்து ஆணையாளர்*

*வாக்குப்பணம் இல. 1.—பணியாளரின் ஆளுக்குரிய வேதனமும் பிறபடிகளும், ரூபா 11,64,860*

HEAD 147.—COMMISSIONER OF MOTOR TRAFFIC

*Vote No. 1.—Personal Emoluments and other allowances of staff, Rs. 1,164,860*

"147 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය සඳහා රු. 11,64,860ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

147 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය උපලේඛන යෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**2 වන සම්මතය.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම, රු. 1,15,250**

*வாக்குப்பண இல. 2.—பரிபாலனச் செலவுகள் —மீண்டுவருஞ் செலவு, ரூபா 1,15,250*

*Vote No. 2.—Administration Charges —Recurrent Expenditure, Rs. 115,250*

"147 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය සඳහා රු. 1,15,250ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

147 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය උපලේඛන යෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**148 වන ශීර්ෂය.—කොළඹ වරාය කොමිෂන් සභාව**

**1 වන සම්මතය.—කාර්ය මණ්ඩල පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා, රු. 1,08,68,220**

*தலைப்பு 148.—கொழும்பு கப்பற்றுறை ஆணைக்குழு*

*வாக்குப்பணம் இல. 1.—பணியாளரின் ஆளுக்குரிய வேதனமும் பிறபடிகளும், ரூபா 1,08,68,220*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

HEAD 148.—COLOMBO PORT COMMISSION

*Vote No. 1.—Personal Emoluments and other allowances of staff, Rs. 10,868,220*

"148 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය සඳහා රු. 1,08,68,220ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදී.

කටහඬවල් අනුව "පක්ෂ" මන්ත්‍රීන්ට ජය බව සභාපති විසින් ප්‍රකාශ කරන ලදී.

**ජේ. ආර්. ජයවර්ධන මයා.**
*(திரு. ஜே. ஆர். ஜயவர்தன)*
(Mr. J. R. Jayewardene)
Divide !

කාරක සභාව 48 වන ස්ථාවර නියෝගය යටතේ—පක්ෂව 29 ; විරුද්ධව 22 ; යනුවෙන්—බෙදුණේ ය.

148 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**2 වන සම්මතය.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම, රු. 79,50,685**

*வாக்குப்பணம் இல. 2.—பரிபாலனச் செலவுகள்—மீண்டுவருஞ் செலவு, ரூபா 79,50,685*

*Vote No. 2.—Administration Charges —Recurrent Expenditure, Rs. 7,950,685*

"148 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය සඳහා රු. 79,50,685ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

148 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**3 වන සම්මතය.—පාලන ගාස්තු—මූලධන වියදම, රු. 8,87,545**

*வாக்குப்பணம் இல. 3.—பரிபாலனச் செலவுகள்—ஆக்கப்பொருட் செலவு, ரூபா 8,87,545*

*Vote No. 3.—Administration Charges —Capital Expenditure, Rs. 887,545*

**13 වන උප ශීර්ෂය.—ලේඛනාගාරයට රෝල් ස්ටෝර් රාක්ක, රු. 24,114**

*உப தலைப்பு 13.—பதிவுச்சுவடி அறைக்கு உருள்பண்டப் பொருள் ஏந்தானம், ரூபா 24,114*

*Sub-head 13.—Roll Store Racks for Record Room, Rs. 24,114*

මතු පළවන යෝජනාව සභාසම්මත විය :

" That the vote be increased by Rs. 6,586 in respect of sub-head 13."—[ගරු ඉලංගරත්න]

**27 වන උප ශීර්ෂය.—ප්‍රවාහණය :—වෑන් රථ 1, පැට්‍රෝල්වලින් ක්‍රියා කරන වෑන් රථ 3, ඩීසල් ලොරි 2, රු. 1,12,000**

*உப தலைப்பு 27.—மோட்டார் போக்குவரத்துச் சாதனம்—ஒருவான் வண்டி, மூன்று பெற்ரோலில் ஓடும் வான்கள், இரண்டு டீசல் லொறி, ரூபா 1,12,000*

*Sub-head 27.—Motor Transport—One Van, Three Petrol driven Vans, Two diesel Lorries, Rs. 112,000*

මතු පළවන යෝජනාව සභාසම්මත විය :

"That the vote be increased by Rs. 75,000 in respect of sub-head 27".—[ගරු ඉලංගරත්න]

**38 වන අළුත් උප ශීර්ෂය.—පුළුල් ටෙලිෆෝන් හුවමාරු ස්ථානය, රු. 35,000**

*புதிய உப தலைப்பு 38.—தொலைபேசி இணைப்பு விஸ்தரிப்பு, ரூபா 35,000*

*New Sub-head 38.—Enlarged Telephone Exchange Rs. 35,000*

මතු පළවන යෝජනාව සභාසම්මත විය :

"That the vote be increased by Rs. 35,000 in respect of new sub-head 38".—[ගරු ඉලංගරත්න]

"148 වන ශීර්ෂයෙහි 3 වන සම්මතය සඳහා රු. 10,04,131ක වැඩි කරන ලද මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය," යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

148 වන ශීර්ෂයෙහි 3 වන සම්මතය, සංශෝධිතාකාරයෙන්, උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**4 වන සම්මතය.—දෙපාර්තමේන්තුව විසින් සපයන සේවා—පුනරාවර්තන වියදම, රු. 14,22,000**

*வாக்குப்பணம் இல. 4.—திணைக்களத்தால் அளிக்கப்படும் சேவைகள்—மீண்டுவருஞ் செலவு, ரூபா 14,22,000.*

*Vote No. 4.—Services Provided by the Department—Recurrent Expenditure, Rs. 1,422,000*

"148 වන ශීර්ෂයෙහි 4 වන සම්මතය සඳහා රු. 14,22,000 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

148 වන ශීර්ෂයෙහි 4 වන සම්මතය උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**5 වන සම්මතය.—දෙපාර්තමේන්තුව විසින් සපයන සේවා—මූලධන වියදම, රු. 1,67,210**

*வாக்குப்பணம் இல. 5.—திணைக்களத்தால் அளிக்கப்படும் சேவைகள்—ஆக்கப் பொருட் செலவு, ரூபா 1,67,210*

*Vote No. 5.—Services provided by the Department—Capital Expenditure, Rs. 167,210*

"148 වන ශීර්ෂයෙහි 5 වන සම්මතය සඳහා රු. 1,67,210ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

148 වන ශීර්ෂයෙහි 5 වන සම්මතය උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**6 වන සම්මතය.—ආර්ථික සංවර්ධනය—පුනරාවර්තන වියදම, රු. 38,78,884**

*வாக்குப்பணம் இல. 6.—பொருளாதார அபிவிருத்தி—மீண்டுவருஞ் செலவு, ரூபா 38,78,884*

*Vote No. 6.—Economic Development—Recurrent Expenditure Rs. 3,878,884*

**18 වන උප ශීර්ෂය.—ඔර්ලෝසු සාදන්නන්ගේ ලියවන පට්ටලයක් හා උපකරණ රු. 2,000**

*உப தலைப்பு 18.—கடிகாரம் செய்வோர் உபகரணங்கள், ரூபா 2,000*

*Sub-head 18.—Watch Makers Lathe and accessories Rs. 2,000.*

මතු පළවන යෝජනාව සභාසම්මත විය:

"That the vote be increased by Rs. 4,200 in respect of sub-head 18."—[ගරු ඉලංගරත්න]

"148 වන ශීර්ෂයෙහි 6 වන සම්මතය සඳහා රු. 38,83,084 ක වැඩි කරන ලද මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

148 වන ශීර්ෂයෙහි 6 වන සම්මතය, සංශෝධිත කාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**7 වන සම්මතය.—ආර්ථික සංවර්ධනය—මූලධන වියදම, රු. 1,61,05,256.**

*வாக்குப்பணம் இல. 7.—பொருளாதார அபிவிருத்தி—ஆக்கப்பொருட் செலவு, ரூபா 1,61,05,256*

*Vote No. 7.—Economic Development—Capital Expenditure Rs. 16,105,256*

**36 වන උප ශීර්ෂය.—කොන්ක්‍රීට් මිශ්‍රකයක්, රු. 12,600.**

*உப தலைப்பு 36.—ஒரு கொங்கிறீற் கலக்கும் கருவி, ரூபா 12,600*

*Sub-head 36.—One Concrete Mixer, Rs. 12,600*

මතු පළවන යෝජනාව සභාසම්මත විය:

"That the vote be increased by Rs. 5,400 in respect of sub-head 36."—[ගරු ඉලංගරත්න]

**125 වන අළුත් උප ශීර්ෂය.—බඩු බාන හා පටවන යන්ත්‍රාගාර සඳහා බැටරි 60ක්, රු. 1,52,875**

*புதிய உப தலைப்பு 125.—சரக்குப் பரிகரண இயந்திரத்துக்கான பட்றிகள் 60, ரூபா 1,52,875*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

*New Sub-head 125.—60 Batteries for Cargo Handling Plant, Rs. 152,875*

මතු පළවන යෝජනාව සභාසම්මත විය :

"That the vote be increased by Rs. 152,875 in respect of new sub-head 125, 60 Batteries for cargo handling plant".—[ගරු ඉලංගරත්න]

**126 වන අළුත් උප ශීර්ෂය.—ඇඹරුම් උපකරණ, රු. 15,000**

*புதிய உப தலைப்பு 126.—அரைக்கும் கருவி, ரூபா 15,000*

*New Sub-head 126.—Grinding Equipment, Rs. 15,000*

මතු පළවන යෝජනාව සභාසම්මත විය :

"That the vote be increased by Rs. 15,000 in respect of new sub-head 126, Grinding equipment."—[ගරු ඉලංගරත්න]

**127 වන අළුත් උප ශීර්ෂය.—නැංගුරම් පළට නැව් අදින වග් යාත්‍රාවක් (සිංහබාහු ආකාරයේ), රු. 3,00,000**

*புதிய உப தலைப்பு 127.—ஓர் இழுவைக் கப்பல், (சிங்கபாகு தன்மையது) ரூபா 3,00,000*

*New Sub-head 127.—One Berthing Tug (Sinhabahu Type), Rs. 300,000*

මතු පළවන යෝජනාව සභාසම්මත විය :

"That the vote be increased by Rs. 300,000 in respect of new sub-head 125, one berthing tug (Sinhabahu type)".—[ගරු ඉලංගරත්න]

"148 වන ශීර්ෂයෙහි 7 වන සම්මතය සඳහා රු. 1,65,78,531 ක වැඩි කරන ලද මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

148 වන ශීර්ෂයෙහි 7 වන සම්මතය, සංශෝධිතාකාරයෙන්, උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදි.

**149 වන ශීර්ෂය.—වෙරළබඩ පහන් සේවය**

**1 වන සම්මතය.—කාර්ය මණ්ඩල පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා, රු. 1,01,360**

*தலைப்பு 149.—கரையோர வெளிச்சம்*

*வாக்குப்பணம் இல. 1.—பணியாளரின் ஆளுக்குரிய வேதனமும் பிறபடிகளும், ரூபா 1,01,360*

HEAD 149.—COAST LIGHTS

*Vote No. 1.—Personal Emoluments and other allowances of staff, Rs. 101,360*

"149 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය සඳහා රු. 1,01,360 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

149 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදි.

**2 වන සම්මතය.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම, රු. 30,700**

*வாக்குப்பணம் இல. 2.—பரிபாலனச் செலவுகள்—மீண்டுவருஞ் செலவு, ரூபா 30,700*

*Vote No. 2.—Administration Charges —Recurrent Expenditure, Rs. 30,700*

"149 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය සඳහා රු. 30,700 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

149 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදි.

**3 වන සම්මතය.—පාලන ගාස්තු—මූලධන වියදම, රු. 70,000**

*வாக்குப்பணம் இல. 3.—பரிபாலனச் செலவுகள்—ஆக்கப்பொருட் செலவு, ரூபா 70,000*

*Vote No. 3.—Administration Charges —Capital Expenditure Rs. 70,000*

"149 වන ශීර්ෂයෙහි 3 වන සම්මතය සඳහා රු. 70,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

149 වන ශීර්ෂයෙහි 3 වන සම්මතය උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදි.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

සභාපතිතුමනි, දැන් සාකච්ඡා කරන්නේ අධ්‍යාපන අමාත්‍යාංශය ගැනද ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**සභාපතිතුමා**
*(அக்கிராசனர்)*
(The Chairman)
ඔව්. අධ්‍යාපන අමාත්‍යාංශය.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)
සභාපතිතුමනි, එහෙම නම්——

**පර්සි වික්‍රමසිංහ මයා.** (කඹුරුපිටිය)
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ—கம்புறுப் பிட்டிய)*
(Mr. Percy Wickremasinghe—Kamburupitiya)
සභාපතිතුමනි,

**සභාපතිතුමා**
*(அக்கிராசனர்)*
(The Chairman)
වැලිමඩ ගරු මන්ත්‍රීතුමා ටිකක් ඉන්න, කඹුරුපිටියේ ගරු මන්ත්‍රීතුමා යෝජනාව ඉදිරිපත් කර අවසාන වනතුරු.

PUBLIC LIBRARY
JAFFNA.

**කේ. එච්. ජී. ඇල්බට් මයා.** (බෙන්තර-ඇල්පිටිය)
*(திரு. கே. எச். ஜீ. அல்பேட்—பெந்தற-எல் பிட்டிய)*
(Mr. K. H. G. Albert—Bentara-Elpitiya)
වැලිමඩ මන්ත්‍රීතුමායි කලින් නැගිට්ටෙ.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)
මම නැගිට්ටෙ ඉස්සරවෙලා. මම කථා කරනවට තමුන්නාන්සෙ කැමති නැද්ද?

**සභාපතිතුමා**
*(அக்கிராசனர்)*
(The Chairman)
කරුණා කර නිශ්ශබ්ද වෙන්න. [බාධා කිරීම්] කඹුරුපිටියේ මන්ත්‍රීතුමාට පසුව තමුන්නාන්සේට කථා කරන්ට පුළුවනි.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)
තමුන්නාන්සෙ කැමති නැහැ, අපි කථා කරනවට. ඔන්න ඒ නිසා අපි යනව යන්ට.

**සභාපතිතුමා**
*(அக்கிராசனர்)*
(The Chairman)
කඹුරුපිටියෙ මන්ත්‍රීතුමාට පසුව කථා කරන්ට පුළුවනි. [බාධා කිරීම්]

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்கிரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)
සභාපතිතුමනි, මා දැන ගන්ට කැමතියි, මේ අමාත්‍යාංශය පිළිබඳව සාකච්ඡා කිරීමෙ දිත් වෙලාව සීමා කර තිබෙනවාද කියා. ඕනෑ වෙලාවක් කථා කරන්ට පුළුවන්ද, නැත්නම් විනාඩි 10 ට සීමා කර තිබෙනවාද ?

**සභාපතිතුමා**
*(அக்கிராசனர்)*
(The Chairman)
වෙලාව නම් විනාඩි 10 ට සීමා කර තිබෙනව. සමහර මන්ත්‍රීවරු ඒක සලකනව. සමහර මන්ත්‍රීවරු සලකන්නෙ නැහැ. ඒ ගැන මට මොකවත් කියන්ට බැහැ. මන්ත්‍රීතුමා එය සලකනව නම් විනාඩි 10 කින් නවත්වන්න.

**115 වන ශීර්ෂය—අධ්‍යාපන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යවරයා**

**1 වන සම්මතය.—කාර්ය මණ්ඩල පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා රු. 4,29,109**

**1 වන උප ශීර්ෂය.—සේවක සංඛ්‍යා සහ වැටුප්, රු. 2,67,273**

*தலைப்பு 115.—கல்வி கலாச்சார விவகார அமைச்சர்*

*வாக்குப்பணம் இல. 1.—பணியாளரின் ஆளுக்குரிய வேதனமும் பிற படிகளும், ரூபா 4,29,109*

*உப தலைப்பு 1.—ஊழியர் கோப்பும் சம்பளங்களும், ரூபா 2,67,273*

HEAD 115—MINISTER OF EDUCATION AND CULTURAL AFFAIRS

*Vote No. 1.—Personal emoluments and other allowances of staff, Rs. 429,109.*

*Sub-head 1—Cadre and salaries, Rs. 267,273*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**පර්සි වික්‍රමසිංහ මයා.**

*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*

(Mr. Percy Wickremasinghe)

පහත සඳහන් යෝජනාව මම ඉදිරිපත් කරනවා:

"That the Vote be reduced by Rs. 10 in respect of sub-head 1, item 'Minister'."

සභාපතිතුමනි, මන්ත්‍රීවරුන් බොහෝ දෙනෙක් කථා කරන්ට බලාපොරොත්තුව සිටින නිසාත්, අයවැය ලේඛනය තුන්වෙනි වර කියවීමේ විවාදයේ අවසාන දිනය අද නිසාත් කාලය වැඩිපුර ගන්ට මා බලාපොරොත්තු වෙන්නෙ නැහැ. අධ්‍යාපනය පිළිබඳවත් අධ්‍යාපන අමාත්‍යාංශය පිළිබඳවත් නොයෙක් අවස්ථාවල මේ ගරු සභාවේ සාකච්ඡා ඇති වී තිබෙන නිසා, වැඩිපුර කථා කරන්ට වුවමනා කරන්නෙ නැහැ. ජාතික අධ්‍යාපන ක්‍රමය ආරම්භ කර එහි මූලික පියවර වශයෙන් පාසැල් රජයට ගත්ත. ඊට පසු අපට නොයෙක් අවස්ථාවල මේ ගරු සභාවේදීත්, පිටතදීත් දැනගන්ට ලැබුණා, තවම ජාතික අධ්‍යාපන ක්‍රමය ආරම්භ කළා පමණය, එය සම්පූර්ණ කිරීම පිණිස ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවක් පත් කර තිබෙනවාය, එහි වාර්තාව නිකුත් වුණාට පසුව එහි දෙවෙනි පියවර ගන්නවාය කියා. අධ්‍යාපන කොමිෂන් සභාවෙ වාර්තා දැන් පිට වී තිබෙන බව අපට දැනගන්ට ලැබී තිබෙනවා. ඒ වාර්තා පිළිබඳව මේ අවස්ථාවේදී මා දීර්ඝ ලෙස කථා කරන්ට යන්නෙ නැහැ. අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාවන් පිළිබඳව සාකච්ඡා කිරීමට වෙන අවස්ථාවක් සලසා දෙන ලෙස ගරු අධ්‍යාපන ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා, ඒවා ක්‍රියාත්මක කිරීමට පෙර. ජාතික අධ්‍යාපන ක්‍රමය සම්පූර්ණ කිරීමෙහිලා ඒ කොමිෂන් සභා වාර්තා ඉතාමත් අදාළ නිසා ඒවා මේ ගරු සභාවේ ඉතාමත්ම තියුණු අන්දමට සාකච්ඡා කළ යුතුව තිබෙනවා. අපට එකඟවන්ට පුළුවන්කමක් නැති තීරණ මෙන්ම අපට එකඟවන්ට පුළුවන් තීරණත් ඒ වාර්තාවල අඩංගුවී තිබෙනවා.

සභාපතිතුමනි, අපේ අලුත් ඇමතිතුමාත් පාර්ලිමේන්තු ලේකම්තුමාත් මේ ලඟදී තීරණයක් ගෙන තිබෙනව, ගුරු හිඟය මකා දැමීම පිණිස ආධුනික ගුරුවරුන් 10,000 ක් පත් කර ගැනීමට. ඒ පිළිබඳව ගැසට් නිවේදනයක් නිකුත් කර ඉල්ලුම්පත්‍රත් කැඳවා තිබෙනවා. ඒ උදවියට දෙන වැටුප රුපියල් 100 යි කියන එකයි, දැනට ප්‍රකාශ කර තිබෙන්නෙ. දැනට මේ වැටුප රුපියල් 100 ට තීරණය කර තිබුණත්, ආධුනික ගුරුවරුන් පත් කළාට පසු ඔවුන්ගේ වැටුප් ක්‍රමය අනිකුත් ජ්‍යෙෂ්ඨ සමතුන්ගේ වැටුප් ක්‍රමය අනුව සකස් කරන්ට කියා මා ඉල්ල සිටිනවා. මා එසේ කියන්නෙ, තමුන්නාන්සෙලා දැන් තිබෙන මුදල් තත්ත්වය අනුවයි, මේ රුපියල් 100 වැටුප් ක්‍රමය සකස් කර තිබෙන්නෙ. දැනටත් ජ්‍යෙෂ්ඨ සමතුන් ගණනාවක් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගුරු වෘත්තියේ යෙදී සිටිනවා. ඒ උදවිය පුහුණු අය නොවෙයි; නුපුහුණු අයයි. එකම සහතික දරන එක කොටසකට රුපියල් 100 කුත්, තව කොටසකට වැඩිපුර මුදලකුත් ගෙවීම යුක්ති නොවන නිසා මුදල් තත්ත්වය කෙසේ හෝ සතුටුදායක කර ගෙන මේ අයගේ පඩි ක්‍රමයත් දැනට සේවයේ යෙදී සිටින ජ්‍යෙෂ්ඨ සමතුන්ගේ වැටුප් ක්‍රමයේ තත්ත්වයට සකස් කරන මෙන් මා ඉල්ලා සිටිනවා.

පූ. භා. 11.15

ආධුනික ගුරුවරුන් පත් කිරීමෙන් ගුරු හිඟය සම්පූර්ණ වන්නෙ නැහැ. අද ගුරුවරුන් 19,000 කගේ විතර හිඟයක් තිබෙනවා. ආධුනික ගුරුවරුන් වශයෙන් බඳවා ගන්න ගුරුවරුන්ගෙන් විද්‍යා ගුරුවරු, ඉංග්‍රීසි ගුරුවරු වශයෙන් කොටසක් පත් වෙනවා. අවසානයේ ස්වභාෂා ගුරුවරුන් වශයෙන් ඉතුරු වෙන්නෙ ඉතා ස්වල්පයයි. එම නිසා මේ 10,000 න් ගුරු හිඟය මකා ගන්ට පුළුවන්කමක් නැහැ. සභාපතිතුමනි, ජ්‍යෙෂ්ඨ විභාගයට වඩා ඉහළ විභාග, ජී. සී. ඊ. ඇඩ්වාන්ස් ලෙවල් විභාගය, විශ්ව විද්‍යාලයේ ප්‍රථම වර්ෂ පරීක්ෂණය, ආදි විභාග සමත් රක්ෂා නැති විශාල පිරිසක් රටේ සිටිනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ජී. සී. ඊ. ඇඩ්වාන්ස් ලෙවල් විභාගයෙන්—ඉන්ටර් ආට්ස් විභාගයෙන්—සමත් වූ අයටත් පත්වීම් ලබා ගැනීමට නම් අර ආධුනික ගුරු විභාගයට පෙනී සිටින්න ඕනෑලු. මේකෙ යුතුකමක් තිබෙනවද? ජ්‍යෙෂ්ඨ විභාගයට වඩා උසස් විභාග සමත් වූවන්ටත් ආධුනික ගුරු විභාගයට පෙනී සිටින්න ඕනෑලු. ගුරු හිඟයක් තිබෙන නිසා මධ්‍යම පරීක්ෂණයෙන් සමර්ථ වූවන්ට ගෙවන පඩි ක්‍රමය මත මේ අයට කෙළින්ම ගුරු පත්වීම් දෙන වැඩ පිළිවෙළක් සකස් කරනව නම් ඊට වඩා නරකද? ගුරු පත්වීම් සම්බන්ධයෙන් තවත් ප්‍රශ්නයක් තිබෙනව. නොයෙකුත් දුෂ්කර ප්‍රදේශවල පාසැල් නොතිබුණු නිසා නොයෙක් පුද්ගලයන් හා ග්‍රාම සංවර්ධන සමිති මගින් පාසැල් පිහිටෙව්වා. මේ පාසැල්වලට කියන්නෙ යෝජිත පාසැල් කියායි. මේ යෝජිත පාසැල් රජයට ගැනීමෙදි යම්කිසි චක්‍ර ලේඛනයක් අනුව පැමිණීමෙ සාමාන්‍ය ගණන අනුවයි ඒ පාසැල්වලට ගුරුවරුන් පත් කරන්නෙ. සෑම යෝජිත පාසැලක්ම රජයට පවරා ගන්න විට විශාල සංඛ්‍යාවකට ගුරු පත්වීම් නොලැබී යනව; ඔවුන්ට රාජකාරි තත්ත්වය නොලැබී අස් වී යන්නට සිද්ධ වෙනව. පැමිණීමෙ සාමාන්‍ය ගණන අනුව පත්වීම් දෙන නිසයි, ඒ. මේ විධියට රක්ෂාව අහිමි වී යන සමහර ගුරුවරුන්ට අවුරුදු දෙකක තුනක සේවයක් තිබෙනව. මේ පාසැල් රජයට ගැනීම නිසා රක්ෂාව අහිමි වී ගිය ගුරුවරුන් අප්‍රමාණවත් මේ රටේ සිටිනව. එම නිසා මේ අය ගැන දෙපාර්තමේන්තුව විශේෂ සැලකිල්ලක් දක්වන්නට ඕනෑ. ඇතැම් ගුරුවරු පඩි නොමැතිව නොයෙක් දුෂ්කර ප්‍රදේශවල, ගිරුවාපත්තුව වැනි කඳුකර ප්‍රදේශවල, අවුරුදු දෙකක් තුනක් සේවය කර තිබෙනව; නමුත් ඒ පාසැල් රජයට පවරා ගන්න විට මේ ගුරුවරුන්ට අඬ අඬා ගෙදර යන්න සිද්ධ වී තිබෙනව. මේ අය ගැන විශේෂ සැලකිල්ලක් දක්වන මෙන් මම ගරු ඇමතිතුමාගෙන් නැවතත් ඉල්ලා සිටිනව. ආධාර ලබන පාඨශාලාවල අවුරුද්දකට වඩා සේවය කර තිබෙන අයගෙ ලැයිස්තුවක් අධ්‍යාපන දෙපාර්තමේන්තුව තබා ගන්න නමුත්, මේ යෝජිත පාසැල් රජයට පවරා ගැනීමෙදි රක්ෂාව නැතිව යන අවුරුදු දෙකක තුනක පළපුරුද්දක් තිබෙන ගුරුවරුන්ගෙ ලැයිස්තුවක් තබා ගන්නෙ නැහැ. අඩු ගණනේ නම් ලේඛන තබා ගන්නවත් ඕනෑ. අළුතෙන් ගන්න යන මේ ආධුනික ගුරුවරුන්ට වඩා දැනීමක් ඒ ගුරුවරුන්ට නැද්ද? ගුරු පත්වීම් ගැන එපමණයි මා කියන්ට බලාපොරොත්තු වෙන්නෙ.

අද මේ රටේ තිබෙන වැදගත්ම ප්‍රශ්නය කුමක්ද? අද මේ රටේ දොස්තරවරුන්, ඉංජිනේරුවන් හිඟයි. විද්‍යා විෂයයන් උගත් අය හිඟයි. ලංකාවේ තිබෙන දැවෙන ප්‍රශ්නය එයයි. සිංහල භාෂාව රජයේ භාෂාව කිරීමෙන් ගම්බද සාමාන්‍ය මහජනතාවගේ දරුවන්ටත් උසස් විද්‍යාත්මක දැනීමක් ලබා ගන්න අවස්ථාවක් සලසා දුන්නා. නමුත් ඒ අවස්ථාවෙන් ප්‍රයෝජනයක් ලැබෙනවද? අද උදේ අධ්‍යාපන කටයුතු පිළිබඳ ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා ප්‍රකාශ කළා, මේ රටේ විද්‍යා විෂයයන් උගත් අයත් උපාධිධාරීනුත් හිඟය කියා. මීට හේතු මොකක්ද? විද්‍යාව ඉංග්‍රීසියෙන් ඉගැන්වීම නිසා විද්‍යාත්මක දැනීමක් ලබා ගැනීම එක්තරා කොටසකට පමණක් සීමා වී තිබෙනව. ජාතික අධ්‍යාපන ක්‍රමය අනුව සෑම ගම්බද පාඨශාලාවකම ළමයින්ට විශ්ව විද්‍යාලවලට ඇතුළත් වීමට අවස්ථාවක් දෙන්න ඕනෑ. විශ්ව විද්‍යාල තුනේම විද්‍යා අංශවල සිංහල මාධ්‍යයෙන් උගන්වන්න ඕනෑ. ජර්මනියේ ශිෂ්‍යයකුට ජර්මන් භාෂාවෙන් හොඳ විද්‍යාත්මක දැනීමක් ලබාගෙන දොස්තර කෙනෙකු හෝ ඉංජිනේරුවකු වීමට පුළුවන්. පෝලන්තයේ පෝලිෂ් භාෂාවෙන් විද්‍යා විෂයයන් ඉගෙන ගන්න පුළුවන්. ඒ වාගේම එංගලන්තයේත් රුසියාවේත් ඒ ඒ භාෂාවලින් ඉගෙන ගෙන විද්‍යා විෂයයන් පිළිබඳ උසස් දැනීමක් ලබා ගැනීමට පුළුවන්කම තිබෙනවා. එසේනම් ලංකාවෙ සිංහල ළමයින්ට සිංහල භාෂාවෙන් විද්‍යා විෂයයන් ඉගෙන ගන්න බැරි මන්ද කියා මම ප්‍රශ්න කරනව. සිංහල භාෂාවෙන් විද්‍යා විෂයයන් උගන්වන්න බැරිය කීමෙන් විශ්ව විද්‍යාලයේ පාලකයන් කරන්නෙ ගම්බද ජනතාවගේ ළමයින්ට මරු පහරක් ගැසීමයි. කොළඹ හතේ උසස්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පර්සි වික්‍රමසිංහ මයා.]

පවුල්වල අයට පමණක් විද්‍යා අංශයෙන් උසස් දැනීමක් ලබා ගැනීමට ඉඩ ප්‍රස්තාව සලසා තිබීමේ වැඩ පිළිවෙළ සම්පූර්ණයෙන්ම කඩාකප්පල් කරන්ට ඕනෑ. ඉතාමත් දක්ෂ ළමයින් ගම්බද ප්‍රදේශවල සිටිනවා. සමහර ළමයින්ට ජ්‍යෙෂ්ඨ විභාගයේ විෂයයන් අටටම සම්මාන තිබෙනවා. කැලේ පර වෙන මල් මෙන් ඒ ගම්බද ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට කවදාවත් තමන්ගේ දක්ෂකම් ඔප්පු කරන්ට අවස්ථාවක් ලැබෙන්නෙ නැහැ. මේ පිළිබඳව ගරු අධ්‍යාපන ඇමතිතුමා විශේෂයෙන් සලකා බලන්න ඕනෑ. විශ්ව විද්‍යාලයේ ආචාර්යවරුන්, විශේෂඥයන් එහෙම පසුගිය දිනවල කියා තිබුණා, විද්‍යාව සිංහලෙන් උගන්වන්න බැරිය කියල. සාමාන්‍ය මහජනයට තියෙන දේශපාලන අයිතිවාසිකමක් පැහැර ගැනීම නිසයි එහෙම කියන්නෙ කියල මේ අවස්ථාවෙදි ප්‍රකාශ කරන්න කැමතියි. විද්‍යාව සිංහලෙන් උගන්වන්න මේ වර්ෂය තුළදීවත් ස්ලස්වන්න ඕනෑ. ගම්බද පාසැල්වලට විද්‍යාගාර දෙන්න ඕනෑ; විද්‍යා ගුරුවරුන් පත් කරන්න ඕනෑ. බෝඩ්වලින් පමණක් "මහා විද්‍යාල" කියා නම් කළාට වැඩක් නැහැ. බොහොමයක් "මහා විද්‍යාල" තියෙන්නෙ බෝඩ්වලටම පමණක් සීමා වෙලයි. මහා විද්‍යාලවලටත් විද්‍යා ගුරුවරුන් වුවමනා කරනව; විද්‍යාගාර වුවමනා කරනව; ක්‍රීඩා භූමි වුවමනා කරනවා. ක්‍රීඩාභූමි සකස් කිරීමේදී අර ඉඩම් ගැනීමේ ආඥා පණත හරස් වන බව පෙනෙන්න තියෙනව. තමුන්නාන්සෙගෙ අවධානය ඊට යොමු කරන හැටියට මා ඉල්ලනව. ගම්බද මහා විද්‍යාලවලට විද්‍යාගාර සහ අනිකුත් පහසුකම් ඇතිකිරීම සඳහාත්, විද්‍යා ගුරුවරුන් පත් කිරීම සඳහාත් විශේෂ උනන්දුවකින් ක්‍රියා කරන්න ඕනෑ.

පාසැල් ගොඩනැගිලි ගැන කියන්න කැමතියි. ගම්බද පාසල් ගොඩනැගිලි අබලන් තත්ත්වයකයි තියෙන්නෙ. මහා විද්‍යාල ගොඩනැගිලි පවා කඩා වැටෙන තත්වයෙනුයි තියෙන්නෙ. මේ අධ්‍යාපන ඇමතිතුමාත්, පාර්ලිමේන්තු ලේකම්තුමාත් ටිකක් වාසනාවන්ත දෙන්නෙක්ය කියල මට කියන්න පුළුවනි. මේ වර්ෂයේ අධ්‍යාපන අංශයට විශාල මුදලක් වෙන් වෙලා තියෙන නිසයි, මා එහෙම කිව්වෙ. දිගට හරහට වියදම් කරන්න පුළුවනි. මුදල් නැහැ කියන්න බැහැ. එම නිසා ගම්බද පාසැල් ගොඩනැගිලි සෑදීමටත්, ඒවා නඩත්තු කිරීමටත් විශේෂ උනන්දුවක් ගෙන ක්‍රියා කරන හැටියට මා ඉල්ලනව. මන්ත්‍රී කොට්ඨාශ අනුවත්, මිත්‍රකම් අනුවත්, දේශපාලන පක්ෂ අනුවත් නොවෙයි, මෙවැනි කටයුතු කළ යුත්තෙ. අවස්ථාවට වුවමනා කරන හැටියටයි, මෙවැනි කටයුතු කළ යුත්තෙ. අවශ්‍ය ස්ථානවලට නිසි පරිදි ගොඩනැගිලි පහසුව සලසා දෙන ලෙස මා නැවතත් මතක් කරනව.

ඊළඟට මගෙ කොට්ඨාශය පිළිබඳව වචන ස්වල්පයක් කතා කරන්න කැමතියි. මගේ කොට්ඨාශයෙ සෑම පළාතකටම වාගෙ අළුත් පාසැල් ගොඩනැගිලි අවශ්‍ය කරනව. දවසින් දවස ජනගහනය වැඩි වෙනව. එම නිසා පාසැල්වලට යන ළමුන්ගේ ප්‍රමාණයත් වැඩි වෙනව. වැඩි වන ශිෂ්‍ය සංඛ්‍යාවෙ හැටියට ගොඩනැගිලිත් අවශ්‍යයයි. එසේ ම ගුරුවරුන් අවශ්‍යයයි. අධ්‍යාපන කටයුත්ත මේ රටේ සෑම වැදගත් කරුණකටම වඩා වැදගත් වෙන බව කියන්න පුළුවනි. අපේ රටේ අනාගතය තියෙන්නෙ අපේ බාල පරම්පරාව අතෙයි. එම නිසා නිසි අන්දමින් අධ්‍යාපන පහසුකම් සලසා දිය යුතුයි. එසේ නොකළොත් මේ රටේ අනාගතය සම්පූර්ණයෙන්ම අඳුරට වැටෙන්න පුළුවනි. එම නිසා පාසැල් ගොඩනැගිලි ආදිය ඉක්මනින් තනා දෙන්න ඕනෑ. ගිය වර්ෂයෙ ගොඩනැගිලි සඳහා වෙන් කළ මුදල්වලින් රුපියල් නව ලක්ෂයක්ද කොහෙද ආපසු භාණ්ඩාගාරයට ගිය බව හිටපු ඇමතිතුමා කිව්ව. මොකද ඒකට හේතුව කියල මා ප්‍රශ්න කරනව. ගොඩනැගිලි තැනීම සඳහා කොන්ත්‍රාත් ක්‍රමයට පවරා දෙනව. නමුත් නිසියාකාර වැඩ කටයුතු ක්‍රියාත්මක වෙන්නෙ නැහැ. විවිධ සේවා සමුපකාර සමිතිවලටයි, මූලික වශයෙන් මෙවැනි ගොඩනැගිලි තැනීමේ කොන්ත්‍රාත් පවරන්නෙ. නමුත් සමහර සමිති ඒව හරියාකාර කරන්නෙ නැහැ. භාර ගන්න වැඩේ හරියාකාර කරන්න හැකි පුද්ගලයන් නැතිකම නිසාත් එසේ වෙනව. මේ හේතුව නිසයි, මුදල් ආපසු යන්නෙ. විවිධ සේවා සමුපකාර සමිති මගින් මෙවැනි කොන්ත්‍රාත් වැඩ නිසි විධියට කරන්නෙ නැති නම් පුද්ගලික කොන්ත්‍රාත්කාරයන්ටවත් පවරා දෙන්න ඕනෑ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මා එසේ කියන්නෙ මේවා අත්‍යවශ්‍ය කරුණු නිසයි. මාතර දිස්ත්‍රික්කයේ පාසැල් ගොඩනැගිලි රාශියක වැඩ අත් සිටුවල තියෙනව. ඇස්තමේන්තු පිළියෙළ කර තිබුණත් ඒ විධියට වෙලා තියෙනව. මේ හේතුවෙන් පාසැල්වලට කරදර ඇති වෙනව. මෙවැනි ප්‍රශ්න නිසියාකාර විසඳිය යුතු බවයි, මා කියන්නෙ. විවිධ සේවා සමිති මේව නිසියාකාර නොකරනව නම් පුද්ගලික අය ලවාවත් කරවන්න ඕනෑ. මේව ප්‍රමුඛස්ථානය ලැබිය යුතු ප්‍රශ්න නිසයි, මා එසේ කියන්නෙ.

කඹුරුපිටිය ඡන්දදායක කොට්ඨාශයේ පවතින ගුරු හිඟය ගැන මම මුලින්ම කිව්ව මෙය ලංකාව පුරාම වගේ තිබෙන තත්ත්වයක්. ඊටත් වඩා සැලකියයුතු දෙයක් තියෙනව. දැන් අවුරුද්දක් ගතවෙලා තියෙනව කඹුරුපිටිය මණ්ඩලයට පාඨශාලා පරීක්ෂකවරයෙකු නැතිව. ඉතින් කොහොමද හැඹදාම අල්ලපු කොට්ඨාශය භාර පාඨශාලා පරීක්ෂකවරයා කොටස් දෙකක වැඩ කරන්නෙ? තමන්ගෙ කොටසෙ වැඩ කරමින් තවත් කොටසක වැඩ බලන්න අමාරුයි. මෙය ඉතා වැදගත් ප්‍රශ්නයක්. පාසල් 54ක් පමණ තියෙනව. පරීක්ෂක මහත්මයකු පත් කරන්න අමාරුද? පරීක්ෂකවරයෙකු නැත්නම් ඒ ප්‍රදේශයේ අධ්‍යාපන කටයුතු සම්පූර්ණයෙන්ම පාහේ අත් හිටිනව. ඒ නිසා වහාම මේ පුරප්පාඩුව සම්පූර්ණ කරන ලෙස මම කරුණාවෙන් ඉල්ලනව.

මේ රජයේ පැවැත්මට විශාල වශයෙන් ආධාර කළ පිරිසක් හැටියට ගුරුවරු ගණන් ගනු ලැබිය යුතුය යන අදහසට විරුද්ධ වන කෙනෙකු නැත කියා මම කල්පනා කරනව. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ රජය බිහි කිරීමට ගුරුවරුන් බොහොම උනන්දු වූ නමුත් දැන් ඒ අය මේ රජයට කලකිරිලයි ඉන්නෙ. මොකක්ද හේතුව? පාසල් රජයට ගන්න අවස්ථාවෙ ආධාර ලබන පාසල් වශයෙන් තිබුණු ඉස්කෝලවල සිටි ගුරුවරුන්ට දේශපාලන අයිතිවාසිකම් තිබුණා. ඒ කාලෙ සම්පූර්ණ දේශපාලන අයිතිවාසිකම් භුක්ති වින්ද නමුත් එහි ප්‍රතිඵලයක් වශයෙන් කාටවත් හානියක් වුණාය කියා කියන්න බැහැ. එයින් අධ්‍යාපනයට කිසිම හානියක් වුණෙත් නැහැ. දැන් පාසල් රජයට ගැනීමෙන් පසු ඒ ගුරුවරුන්ට දේශපාලන අයිතිවාසිකම් අහිමිවෙලයි තියෙන්නෙ. ඉතින් ප්‍රජාචාරය, දේශපාලන විද්‍යාව, භූගෝල විද්‍යාව, ඉතිහාසය, ආණ්ඩු ක්‍රම ආදි විෂයයන් උගන්වන ගුරුවරුන්ට ඒ කාර්යය හරියාකාර කරන්න පුළුවන්ද? දේශපාලන අදහස් ඉදිරිපත් නොකර මේ පාඩම් උගන්වන්න පුළුවන්ද? ඇයි ඒ ගුරුවරුන්ගෙ කට වහන්නෙ? යම්කිසි රටක උසස්ම ගණයේ ලා සැලකිය හැකි පුද්ගලයා තමයි ගුරුවරයා. ඕනෑම දියුණු රටක ගුරුවරුන්ට තරම් උසස් තැනක් වෙන කිසිම රජයේ සේවකයෙකුට නැහැ ලැබෙන්නෙ. අප සියලු දෙනාම ගුරුවරුන්ගෙන් අධ්‍යාපනය ලබාගෙන ඇවිත් ඉන්න අයයි. ඇයි ගුරුවරුන්ගෙ පමණක් නිදහස නැතිකර දමන්නෙ? නිදහස් අදහසක් ප්‍රකාශ කරන්න ශක්තියක් නැති ගුරුවරුන්ගෙන් අධ්‍යාපනය ලබන අනාගත පරම්පරාවට නිදහස් අදහස් පහළ වේවිද? ඒ අය හිරගෙවලින් බිහි වන පිරිසක් වගේ වේවි නේද? නිදහස් අදහස් ප්‍රකාශ කරන්න බැරි ගුරුවරුන් විසින් උගන්වනු ලබන ශිෂ්‍යයන් වහලුන් වැනි පිරිසක් වීම රටට මහත් හානියක් බව පිළිගත යුතුව තිබෙනව. ඒ නිසා සියලුම ගුරුවරුන්ට දේශපාලන අයිතිවාසිකම් දෙන ලෙස මම ඉල්ලනව.

මෙහිදී තවත් ප්‍රශ්නයක් මතු වෙනව වෙන්න පුළුවනි. රජයේ සේවකයන්ට දේශපාලන නිදහස් දුන්නම ඒ උදවිය නියෝජිත මන්ත්‍රී මණ්ඩලයටත්, නගර සභා ආදි පළාත් පාලන ආයතනවලටත් මහජන නියෝජිතයන් වශයෙන් තෝරා පත් කරනු ලැබීම සඳහා ආසනවලට තරඟ කිරීමට විශාල වශයෙන් ඉදිරිපත් වේය කියා කෙනෙකුට තර්ක කරන්න පුළුවනි. දේශපාලන නිදහස දීම එකක්, එහෙත් රජයේ සේවකයන් වශයෙන් කළ යුතු දේවල් මේවාය, නොකළ යුතු දේවල් මේවාය යනුවෙන් විනය නීති මාලාවක් ඇති කරන්න බැරිකමක් නැහැ. ඒ සම්බන්ධයෙන් සීමාවල් යොදන්න බැරිද? ඒ නිසා සම්පූර්ණ දේශපාලන අයිතිවාසිකම් නතර කිරීමෙන් මේ රටේ අනාගත පරම්පරාවට විශාල හානියක් සිදුවිය හැකි බව මම ප්‍රකාශ කරනව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පර්සි වික්‍රමසිංහ මයා.]

අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ කථා කරන විට සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව ගැනත් වචනයක් දෙකක් කථා කරන්න පුළුවන් ය කියල මම හිතනව. මේ රටේ දහම් පාසල් පාලනය කරන්නෙ සංස්කෘතික දෙපාර්තමේන්තු වෙනුයි. මේ ආණ්ඩුව බිහි වුණාට පසුවයි සංස්කෘතික අමාත්‍යාංශය යටතේ පාලනය වන දහම් පාසල්වලට දෙන ආධාරය වැඩි කර, දහම් පාසල් පිළිගෙන ඒ හා සම්බන්ධ වැඩ කටයුතු ක්‍රමවත් කිරීමේ වැඩ පිළිවෙලක් ඇති වුණේ. ඒ ගැන මේ රජයට මම ප්‍රසංශා කරනව. අද දහම් පාසල් බොහොමයක් ඉතාම උසස් තත්ත්වයට වැඩ කරගෙන යනව. එහෙත් ඇතැම් දහම් පාසල්වලට දෙන ආධාර මුදල මදිය කියා බොහෝ විට අසන්න ලැබෙනව. සියේට 60කට වැඩි පිරිසක් බෞද්ධයන් සිටින මේ රටේ දහම් පාසල් මගින් තමයි ආගමික හැඟීම් ඇති හොඳ පුරවැසියන් බිහි කරන්න පුළුවන්කම තිබෙන්නෙ. එම නිසා දහම් පාසල් සම්බන්ධයෙන් මීට වඩා වැඩි සැලකිල්ලක් දක්වා, රජයේ ආධාර මීට වැඩියෙන් දීමට ඇමතිතුමා කල්පනා කරනව ඇත කියා මම බලාපොරොත්තු වෙනව.

පූ. භා. 11.30

ඒ එක්කම මම පෙන්වා දෙන්න කැමතියි, පෙරහැරවල් සඳහා සැරසිලි, පාරෙ කොඩි දැමීම් ආදි වුවමනා නැති දේවලට සංස්කෘතික දෙපාර්තමේන්තු වෙන් වියදම් කරන බව. ඒ මුදල් සියල්ලම ඊට වඩා ප්‍රයෝජනවත් දේවලට වියදම් කරන්න පුළුවන් නමුත් පසුගිය කාලයෙ වැඩි හරියක්ම වියදම් කර ඇත්තෙ උත්සවවලටයි. දැන් මේ සභාවෙදි ගරු ඇමතිතුමාටම දැනගන්න ලැබුණ, හාමුදුරු නමක් ඇමතිතුමාගෙ ඡායාරූපයක් අරගෙන තිබෙන බව. ඒ ඡායාරූපය ගත් කැමරාව අරගෙන තිබෙන්නෙ පොත් ගැනීම සඳහා සංස්කෘතික දෙපාර්තමේන්තුවෙන් දුන් මුදලින් බවයි ප්‍රසිද්ධ වී තිබෙන්නෙ. ඒ නිසා සංස්කෘතික දෙපාර්තමේන්තුවෙන් දෙන ආධාර මුදල් දෙපාර්තමේන්තුවෙ අදහස් පරිදි නිසි දේවලටම වියදම් කරනවද කියා විශේෂ සැලකිල්ලකින් පරීක්ෂාකර බැලිය යුතුයි.

සභාපතිතුමනි, මේ රටේ ජාතික කලාව දියුණු කිරීම භාරව තිබෙන්නෙ සංස්කෘතික දෙපාර්තමේන්තුවටයි. ජාතික නාට්‍ය කලාව ආදිය දියුණු කිරීම පිණිස අත දී සම්පූර්ණ යෙන්ම ආධාර කළ යුත්තෙ සංස්කෘතික දෙපාර්තමේන්තුවටයි. ඒ නිසා පහත රට නාට්‍ය පිළිබඳ අද ඇති වැඩ පිළිවෙල එදා තිබුණ වැඩ පිළිවෙලමද, එසේ නැත්නම් එය වෙනස් කර තිබෙනවද කියා ගරු ඇමතිතුමාගෙන් මා දැනගන්න කැමතියි. ඒ කලා අංශවල සිටින ප්‍රධානීන්ට ඒ ස්ථාන දීම ගැන නොයෙක් මතභේද තිබෙනව. සුදුස්සාට සුදුසු තැන දෙන්නෙ නැත කියා ඒ ගැන නොයෙක් මතභේද තිබෙන නිසා නැටුම් කලාව දියුණු කිරීමට ඇති වැඩ පිළිවෙලට නොයෙක් බාධක සිදු වී තිබෙනව. එම නිසා මේ කරුණු ගැන ඇමතිතුමා විශෙෂ සැලකිල්ල යොමු කර ඉදිරියට යනව ඇත කියා මම බලාපොරොත්තු වෙනව.

**සුමනපාල දහනායක මයා.** (දෙණියාය)

*(திரு. ஸுமனபால தகநாயக்க—தெனியாய)*

(Mr. Sumanapala Dahanayake—Deniyaya)

**සභාපතිතුමනි,** අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ වචන සවල්පයක් කථා කිරීමට ලැබුණ මේ අවස්ථාවෙදි මම පළමු වෙන්ම කනගාටු වෙනව ඇමතිතුමා මෙහි නොසිටීම ගැන. නමුත් නියම හැඟීමකින් සහ උනන්දුවකින් වැඩට ආශාවක් ඇතිව වැඩ කරන උප ඇමතිතුමා මෙහි සිටීම ගැන ඒ එක්කම මම සන්තෝෂ වෙනව.

මට පළමුව කථා කළ ගරු මන්ත්‍රීතුමා කිව්ව වාගෙ ජාතික අධ්‍යාපන ක්‍රමයක් ගැන කථා කර, එහි පළමු පියවරක් වශයෙන් ආධාර ලබන පාඨශාලා රජයට ගෙන කොමිෂන් සභා පත්කර, ඒ කොමිෂන් සභාවල වාර්තා පවා පිට වී තිබෙන මේ අවස්ථාවෙදි මහජනයා විශාල විමසිල්ලකින් සහ බලාපොරොත්තුවකින් සිටිනව, මේ රටේ ඇති වන ජාතික අධ්‍යාපන ක්‍රමය මොකක්ද කියා දැන ගැනීමට. එසේ බලවත් විමසිල්ලෙන් සිටින්නෙ, ජාතික අධ්‍යාපන ක්‍රමය කියන්නෙ ආධාර ලබන පාසල් රජයට ගැනීම පමණක්ද කියා මහජනතාව තුළ යම්කිසි සැකයක් ඇති වී තිබෙන නිසයි. ඒ මොකද ? මේ රජය කළ යම් යම් ක්‍රියා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගැන කල්පනා කර බලන විට මේ ජාතික අධ්‍යාපන ක්‍රමය ඇති කිරීමත් ඒ වාගෙමද කියා මහජනතාව අද විමසිල්ලෙන් බලා ගෙන සිටිනවා. අද අධ්‍යාපන දෙපාර්ත මේන්තුවේ වැඩ පිළිවෙල ගැන බලන විට අධ්‍යාපනය අවුල් තත්ත්වයක පවතින බව පෙනී යනවා. ගරු සභාපතිතුමනි, මම නියෝජනය කරන ප්‍රදේශය නොදියුණු ප්‍රදේශයක්. මේ අනුව සලකා බලන විට අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නැතිනම් රජයේ යුතුකමක් නගරබද ප්‍රදේශවල පමණක් නොවෙයි, මෙබඳු ගම්බද ප්‍රදේශ වලද අධ්‍යාපන තත්ත්වය දියුණු කිරීම සඳහා උනන්දුවීම. අද නගරබද ප්‍රදේශවල අධ්‍යාපන තත්ත්වය ගැන පමණක් සලකා ගම්බද ප්‍රදේශවල අධ්‍යාපන තත්ත්වය ගැන නොසලකා හැර තිබෙන බව විශෙෂ යෙන් තමුන්නාන්සේට කියන්න ඕනෑ.

අප දන්නා හැටියට, දැනට පාසැල්වලට නව ගුරුවරුන් දහඅට දහකට වඩා අවශ්‍ය බව ප්‍රකාශ කර තිබුණා. ඇත්ත වශයෙන් එබඳු විශාල සංඛ්‍යාවක් අවශ්‍යව තිබෙද්දී ගුරුවරුන් දහ දාහක් පමණක් බඳවා ගැනීමෙන් ඒ අඩුපාඩුව පිරිමසාගන්න බැහැ. කෙසේ වුවත් ගුරුවරුන් දස දහක් බඳවා ගැනීමට රජය අදහස් කර ගෙන සිටීම ගැන අප සන්තෝෂ වෙනවා. නමුත් පාසැල්වලට අවශ්‍ය ගුරුවරුන් ලබාදීමට රජය කටයුතු කරන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, සාමාන්‍යයෙන් කල්පනා කර බලන විට, රටක ජනතාවට අවශ්‍ය ආහාර පාන, ඇඳුම් පැලඳුම් සහ වෙනත් නොයෙක් දේවල් අවශ්‍ය ප්‍රමාණ යට නොලැබුණත් අපට තරමක් සෑහීමකට පත් වෙන්න පුළුවනි. නමුත් අධ්‍යාපනය කියන දෙය අඩුවෙන් දෙන්න පුළුවන් කමක් නැහැ. වෙන දේවල් වාගේ කල් දමන්නට හෝ අඩුවෙන් දෙන්නට හෝ පුළුවන් දෙයක් නොවෙයි, අධ්‍යාපනය. කාලයට, අවසථාවට ගැළපෙන ආකාරයෙන් සම්පූර්ණ අධ්‍යාපනයක් ලබාදිය යුතුයි. එම නිසා ගුරුවරුන් 18 දාහක් අවශ්‍ය තැනට ගුරුවරුන් දහදහක් බඳවා ගැනීමෙන් නියම අන්දමට අධ්‍යාපනය දෙන්නට පුළු වන් වෙන්නෙ කොහොමද කියා මම ප්‍රශ්න කරන්න කැමතියි. ඒ වාගේම සෑහෙන ප්‍රමාණයක් ගුරුවරුන් නොසිටීම නිසා අධ්‍යාපනය දුර්වල තත්ත්වයකට වැටෙනවා. ගරු සභාපතිතුමනි, අද අධ්‍යා පන දෙපාර්තමේන්තුව විශාල වශයෙන් මුදල් නාස්ති කරනවා. දෙපාර්තමේන් තුවේ ක්‍රමවත් වැඩ පිළිවෙළක් නැතිකම නිසා විශාල මුදලක් අපතේ යවනවා. මේ මුදල් එසේ අපතේ යාම වළක්වා, වෙනත් දේවල් සඳහා වැය කරන මුදල් හෝ ලබා ගෙන, මෙය අවශ්‍යම කටයුත්තක් සේ සලකා අවශ්‍ය ගුරුවරුන් සංඛ්‍යාව නො අඩුව බඳවා ගැනීමට කටයුතු යොදන ලෙස ගරු ඇමතිතුමාගෙනුත්, රජයෙනුත් මා ඉල්ලා සිටිනවා. එසේ කළොත් පමණයි, තමුන්නාන්සෙලාගේ අරමුණ ක්‍රියාත්මක කළ හැක්කෙ. එසේ නැතිව ජාතික අධ්‍යා පනයක් දෙනවාය කියා කොයි විධියේ වැඩ පිළිවෙළක් තමුන්නාන්සෙලා ක්‍රියාත් මක කළත් එය සාර්ථක වෙන්නෙ නැති බව මතක් කරන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, අලුතෙන් බඳවා ගැනීමට අදහස් කරන ගුරුවරයකුට පඩිය වශයෙන් ගෙවීමට අදහස් කරන්නෙ රුපියල් සියයයි. තමුන්නාන්සෙලා සමාජ වාදය කරා ගමන් කරනවාය කීවත්, පන්ති භේදය නැති කර දමනවාය කිවත්, මේ අන්දමට සුලු වැටුපක් ගෙවීමෙන් වෙන්නේ ගුරුවරුන් අතර පන්ති භේද යක් ඇති කිරීමට මුල පිරීමක් බව මේ අවසථාවේදී මට පෙන්නා දෙන්න පුළුවනි. අද රක්ෂාවක් ලබාගැනීමේ ආශාවෙන් පසු වන ජ්‍යෙෂ්ඨ සමතුන් විශාල සංඛ්‍යාවක් සිටිනවා. ඒ අය මෙයට වඩා අඩු මුදලකට වුණත් ගුරුවරුන් වශයෙන් සේවයට බැඳී මට අකමැති වෙන්නෙ නැහැ. නමුත් ගුරු වරුන් වශයෙන් සේවයට බැඳුනාට පසුව මේ මුදලින් ජීවිකාව ගෙන යාමට අපහසු බව ඔවුන්ට වැටහෙනවාට අනුමානයක් නැහැ. ඒ වාගේම ගුරුවරුන් වශයෙන් ආත්ම ගරුත්වය රැක ගෙන ජීවත්වීමට අපහසුයි. ඒ නිසා අවශ්‍ය වියහියදම් දරන්න මේ මුදල ප්‍රමාණවත් වේද කියන ප්‍රශ්නය ඊළඟට මතු වෙනවා. එම නිසා මේ ගුරුවරුන්ට තාවකාලික වශයෙන් රුපියල් සියය ගණනෙ දෙන්න බලාපො රොත්තු වුණත්, ජ්‍යෙෂ්ඨ සහතිකය දරණ දෙපාර්තමේන්තුවේ අනිකුත් ගුරුවරුන්ට දෙන පඩියම මොවුන්ටත් පුළුවන් පමණ ඉක්මනින් දෙන ලෙස මම ඉල්ලා සිටිනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සුමනපාල දහනායක මයා.]

ගරු සභාපතිතුමනි, මේ ගුරුවරුන් 10,000 බඳවා ගැනීමේ පිළිවෙළ සම්බන්ධයෙන් රජය කෙරෙහි සාධාරණ සැකයක් අද මහජනයා තුළ ඇති වී තිබෙනවා. මේ ගුරුවරුන් 10,000 මොන අන්දමට තෝරා ගන්නවද යන්න ගැන සෑහෙන පැහැදිලි ප්‍රකාශයක් මේ වන තෙක් රජයෙන් කර නැහැ. පසුගිය කාලය තුළ නොයෙක් අවස්ථාවලදී පළමුවැනි ශ්‍රේණියේ සහ දෙවන ශ්‍රේණියේ විද්‍යාලයාධිපතිවරුන් තේරූ අවස්ථාවේදීත්, දිස්ත්‍රික් පාඨශාලා පරීක්ෂකවරුන් තේරූ අවස්ථාවේදීත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව අනුගමනය කළ පිළිවෙළ සම්බන්ධව නොයෙකුත් විවේචන ඇති වුණා. දිස්ත්‍රික් පාඨශාලා පරීක්ෂකවරුන් තේරූ අවස්ථාවේදීත් දැනට සතියකට පමණ පෙර, මේ ගරු සභාවේ ඒ පැත්තෙනුත් මේ පැත්තෙනුත් නොයෙක් විවේචන ඇති වුණා. මාස ගණනකට පෙර පළමුවැනි ශ්‍රේණියේ සහ දෙවන ශ්‍රේණියේ විද්‍යාලයාධිපතිවරුන් පත් කිරීම සම්බන්ධවත් බලවත් විවේචන ඇති වුණා. මේ සම්බන්ධව මා ඇසූ ප්‍රශ්නයකට පිළිතුරු නොලැබුණු බව කනගාටුවෙන් කියන්න සිදු වී තිබෙනවා. මේ අය පත් කළේ මොන විධියේ සුදුසුකම් උඩද කියා මම ප්‍රශ්න කළා ; නමුත් පිළිතුරු ලැබුණේ නැහැ. ඔය විධියේ ක්‍රියා නිසා දෙපාර්තමේන්තුවේ වැඩ ගැන මහජනයා තුළ සෑහෙන සැකයක් ඇති වී තිබෙනවා. ඒ නිසා මේ ගුරුවරුන් 10,000 තෝරා ගන්නා විට නියම විධියට සුදුස්සන්ම තෝරා ගන්න ලෙස අපි ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, අපේ පළාත්වල යෝජිත පාඨශාලා තිබෙනවා. අධ්‍යාපන දෙපාර්තමේන්තුව මේ යෝජිත පාඨශාලා සම්බන්ධයෙන් නොයෙක් නොයෙක් චක්‍රලේඛ පිට කරල ඒ පාඨශාලාවල ඉගැන්වූ බොහොමයක් ගුරුවරුන්ට ස්ථිර පත්වීම් නොදී තිබෙනවා. මේ ගුරුවරුන් 10,000 ගන්න අවස්ථාවේදී තමුන්නාන්සෙලාට පුළුවන්කමක් තිබෙනව නම්, යෝජිත පාඨශාලා රජයට ගන්න අවස්ථාවේදී රක්ෂා නොලැබුණු ගුරුවරුන් ගැනත් කල්පනා කර ඔවුන්ටත් අවස්ථාවක් දෙන්න පුළුවන් නම් ඒ අවස්ථාව දෙන ලෙස මම ඉල්ලා සිටිනවා.

ඊ ළඟට මගේ ආසනය සම්බන්ධවත් කරුණු කීපයක් මතක් කරන්න කැමතියි. මගේ කොට්ඨාශයේ පාඨශාලා රාශියක්ම අද ගුරුවරුන් නැතිව, ගොඩනැගිලි නැතිව, උපකරණ නැතිව තිබෙනවා. අද ඩෙස්ක් බංකු සැපයීම පිළිබඳව අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙ ක්‍රමවත් වැඩ පිළිවෙළක් නැහැ. අද තියෙන වැඩ පිළිවෙළ සතුටුදායක නැහැ. මගේ කොට්ඨාශයේ දැරංගල ජනපදයේ කිරිවැල් කැලේ පාඨශාලාවක් පටන් ගත්ත අවුරුදු දෙකකට පමණ පෙර. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවෙනුයි, ඒ ගොඩනැගිල්ල හැදුවෙ. කලකට පෙර ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවත් දිසාපතිතුමාත් දෙපාර්තමේන්තුවට කීව, අහවල් දවසෙ ගොඩනැගිල්ල හදා භාර දෙන්නම්, එය රජයට භාර ගෙන කට යුතු කරන්න සූදානම් වන්නය කියා. ගොඩනැගිල්ල හදා සෑහෙන කාලයක් නිකම් තිබුණා. ඊට පසු අධ්‍යාපන දෙපාර්තමේන්තුව තීරණය කළා, රජයට ගන්න ඕනෑය කියා. එතැනට මේ සතියේ ඩෙස්ක් බංකු ලැබුණද මම දන්නෙ නැහැ. අවුරුදු එකහමාරක දෙකක කාලයක් තිස්සෙම ඩෙස්ක් බංකු ලැබුණෙ නැහැ. ගුරුවරුන්ට වාඩි වෙන්න පුටුවක්වත් නැහැ. අපි අවුරුද්දකට වතාවක් නැත්නම් දෙකක් මේ කරුණු ඉදිරිපත් කරනවා. ඩෙස්ක් බංකු සැපයීම පිළිබඳ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ වැඩ පිළිවෙළ හැමදාම ප්‍රමාදයි. දැන් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විමධ්‍යගත කර තිබුණත් පළාත්බද සහකාර අධ්‍යාපන නිලධාරීන්ට ඩෙස්ක් බංකු සැපයීම පිළිබඳ තනි බලයක් තිබෙනවද යන්න මම දන්නෙ නැහැ.

ඒ පළාත්වල පාසැල්වලට අවශ්‍ය ඩෙස්ක් බංකු ඒ පළාත්වලම සාදවා ගැනීමට බලයක් සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ට තිබෙනවාද කියා මම දන්නෙ නැහැ. ඒ පළාත්වල සිටින සහකාර අධ්‍යක්ෂවරුන්ට මේ බලය දෙතොත් ඒ ඒ පළාත්වල තිබෙන පාඨශාලාවලට හිඟ ඩෙස්ක් බංකු ඔවුන්ගේ තීරණය අනුව ඒ ඒ පළාත්වලින්ම සාදාගෙන ඒ අඩුව සම්පූර්ණ කරන්නට පුළුවන් වෙනවා.

පූ. භා. 11.45

ඊළඟට ගුරුවරුන් සම්බන්ධවත් මතක් කරන්නට ඕනෑ. දෙපාතීමේන්තුවෙන් ක්‍රම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වත් අන්දමට ගුරුවරුන් බෙදා හරින්නට ඕනෑ. මගේ කොට්ඨාශයේ කොඩිකාර ගොඩ රඹුකන කියා පාසැලක් තිබෙනවා. ඒ පාසැලෙහි ගුරුවරුන් 7 දෙනෙක් සිටි නව; නමුත් පිරිමියෙකුට ඉන්නේ මුල් ගුරුවරයා පමණයි. අනික් 6 දෙනාම කාන්තා ගුරුවරුන්. මේ විධියට කාන්තා වන් පමණක් සිටින විට පාඨශාලාවෙන් පිටස්තර අධ්‍යාපනය නැත්නම් ක්‍රීඩා, ශාරීරික අභ්‍යාසය, වැනි දේවල් කරන්නට පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. අනික් අතින් නොයෙකුත් විධියේ අඩුපාඩු මෙ වැනි ගුරු මණ්ඩල සිටීමෙන් ඇති වෙනවා. මේ සම්බන්ධව මා විසින් දෙපාර්තමේන්තු වට දැනුම් දුන්නා. නමුත් අද වන තුරුත් කිසිම වෙනසක් ඇති වී නැහැ. මා හිතන හැටියට දැන් තාවකාලික වශයෙන් ගුරු මාරු කිරීම් නතර කර තිබෙනවා. ඒ නිසා මෙවැනි දේවල් හරිගැස්සීමට සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ට බලය දෙන් නට පුළුවන් නම් අඩුපාඩුකම් හුඟක් දුරට අඩු කර ගන්න පුළුවන්.

මගේ කොට්ඨාශයේ තිබෙන බෙරනපතා තර පාසැල මහා විද්‍යාලයක් බවට පත් කළා, මේ ළඟදී. ඒ අවස්ථාවේදී අපි බලාපොරොත්තු වුණා අංග සම්පූර්ණ මහා විද්‍යාලයක් ඇති වේය කියා. නමුත් දැන් එය මහා විද්‍යාලයක් හැටියට බෝඩ් ලෑල්ලට පමණක් සීමා වී තිබෙනවා. දැනට සිටින පාර්ලිමේන්තු ලේකම්තුමා අධ්‍යාපන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම් වන්නට කලින් ඒ පළාතට ගොස් ඒ පළාතේ තත්ත්වය පිළිබඳ සෑහෙන අවබෝධයක් ඇති කර ගත්තා. මා මතක් කරන්න කැමතියි බෙරනපතා තර මහා විද්‍යාලයට බෝඩ් ලෑල්ල පමණක් දම්මාට මදි, හැකි තරම් ඉක්මණින් ගොඩ නැගිලි හා ගුරුවරුනුත් ලබාදෙන්නය කියා. එපමණක් නොවෙයි, ඒ ස්ථානයට විද්‍යාගාරයක් අවශ්‍යයි. දෙපාර්තමේන්තු වට මුදල් නැත්නම්, සම්පූර්ණයෙන්ම විද්‍යාගාරය සඳහා වියදම් කිරීමට මුදල් දෙපාතීමේන්තුවට නැත්නම්, ඒ පළාතේ මහජනයා, ගුරු-දෙගුරු සමිති, සූදානම් වේවි රජයෙන් දෙකෙන් කොටසක් වියදම් කරතොත් ඉතිරි දෙකෙන් කොටස වියදම් කිරීමට.

ඔය විධියේ තවත් ප්‍රශ්නයක් තිබෙ නවා. පාඨශාලා ප්‍රතිසංවිධානය කරනවායයි කියා තිබුණා; නමුත් ඒ වැඩ පිළිවෙළ තවම අපේ පළාත්වල ක්‍රියාත්මක වී නැහැ. එය නවත්වා තිබෙන්නේ දෙපාර්ත මේන්තුවේ නියෝගයක් උඩද කියා මා දන්නේ නැහැ. එය වැදගත් දෙයක්. ඒ අන්දමින් ප්‍රතිසංවිධානය කළ පළාත් කීපයකම නියම ආකාරයේ වැඩ පිළිවෙළක් ගෙන යන්නට පුළුවන්කම ලැබී තිබෙ නවා. ඒ මොකද කියතොත්, ගොඩනැගිලි ගුරුවරු අතින් නියම බෙදීමක් ඇතිව ක්‍රමවත් වැඩ පිළිවෙළක් ගෙන යන්නට පුළුවන් නිසයි.

කුඹුරුපිටියේ ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා වගේ දෙනියාය ආසනය භාරව සිටි පාඨශාලා පරීක්ෂකවරයා දැන් එහි නැහැ. ඔහු ඒ පළාතට නැති වී දැනට අවුරුද්දක් පමණ වෙනවා. ඒ නිසා, ඒ පළාතට පුළුවන් තරම් ඉක්මණින් පරීක්ෂක වර යෙක් එවන්නය කියා මා ඉල්ලනවා.

මාතර දිස්ත්‍රික්කය ගැන, දකුණු පළාත ගැන, කථා කරනවා නම් මොරවක් කෝර ළයට වඩා නොදියුණු පළාතක් නැහැ. රජයෙන් රුපියල් 50,000 බැගින් ආසන බද්ධ ගොඩනැගිලි සඳහා වෙන් කර තිබෙනවා. ඒ අන්දමින් හැම ආසනයකටම එක සමානව රුපියල් 50,000 බැගින් වෙන් කරන්නේ ඇයි කියා මා අහනවා. මේවා කරන විට නොදියුණු පළාත් සම්බන්ධව විශේෂයෙන් කල්පනා කර බලන්න. සමහර පළාත්වල පාසැල් සඳහා අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් මුදල් වියදම් කරන අතරම, උඩරට ගැමි කොමිෂමේ මාර්ගයෙ නුත් අධ්‍යාපන අංශය වෙනුවෙන් විශාල මුදලක් වියදම් කරනවා. නමුත් අපේ පළාත්වලට අධ්‍යාපන දෙපාර්තමේන්තු වෙන් ලැබුණොත් මිස වෙන මොකවත් නැහැ.

මීට පසු මෙසේ මුදල් වෙන් කරන විට සෑම ආසනයකටම එක සේ මුදල් වෙන් කරන්නෙ නැතිව නොදියුණු ආසන සඳහා—දෙනියාය වැනි නොදියුණු ප්‍රදේශ සඳහා—වැඩිපුර මුදල් වෙන් කරන මෙන් මම ඉල්ලා සිටිනවා. ගිය අවුරුද්දේ රුපියල් 50,000 ක් වෙන් කළා පාසල් ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම සඳහා. ඒ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සුමනපාල දහනායක මයා.]

මුදල ඊට වඩා ප්‍රයෝජනවත් විධියට වැය කරන්න තිබුණා, දෙපාර්තමේන්තුවෙන් ඒ සඳහා අනුමැතිය ලැබුණා නම්. දෙනියායේ ගුරු දෙගුරු සමිති රාශියක් සූදානමින් සිටියා සියයට 50 කොන්දේසිය උඩ අළුත් ගොඩනැඟිලි සෑදීමට. ඒ කියන්නේ, යම් ගොඩනැඟිල්ලක් සඳහා රුපියල් 10,000ක් යනවා නම් ඉන් 5,000 ක් දෙපාර්තමේන්තුවෙනුත් අනික් 5,000 ගුරු දෙගුරු සමිතියෙනුත් යොදවා වැඩ කිරීමටයි. මේ සම්බන්ධයෙන් ගරු ඇමතිතුමා කල්පනා කර බලනවා ඇතැයි මම විශ්වාස කරනවා.

මම කලින් කී ප්‍රතිසංවිධානය ගැන මට තවත් වචනයක් කියන්න තිබෙනවා. අද මහා විද්‍යාල තත්ත්වයට උසස් කළ යුතු පාසල් රාශියක් තිබෙනවා. මගේ කොට්ඨාශයේ තිබෙන මාරඹ, පිටබද්දර, පල්ලෙගම පාසල් පුළුවන් ඉක්මනින් මහා විද්‍යාල තත්ත්වයට උසස් කරන හැටියට මම ඉල්ලා සිටිනවා. එසේ කළොත් ඒ සඳහා වැය කරන මුදල්වලින් විශාල ප්‍රයෝජනයක් අත් වෙනවා. ඒ නොදියුණු ප්‍රදේශවල සිටින දක්ෂ ළමයින්ගේ සහජ හැකියාවන්ගෙන් ප්‍රයෝජන ගැනීමට එයින් පුළුවන් වෙනවා.

තවත් වැදගත් කාරණයක් කියන්න තිබෙනවා. මෑතක සිට පාසල් ශිෂ්‍යයන්ට පොලීසියෙන් නොයෙකුත් අඩන්තේට්ටම් සිදු වන බව පෙනෙනව. මාතර දිස්ත්‍රික්කයේ හල්ලල සිදුවූ කාරණය ගැන තමුන්නාන්සේ දන්නවා ඇති. ඒ පිළිබඳව ලොකු පරීක්ෂණයකුත් පැවතුණා. පසුව ඒ කාරණය උසාවියටත් ගියා. ගිය සෙනසුරාදා තවත් එවැනි සිද්ධියක් ඇති වුණා. ගිය 7 වන දා කොටපොල මහා විද්‍යාලයේ මොරවක කෘෂිකර්ම මහා ප්‍රදර්ශනයක් පැවැත්තුනා. ඒ ප්‍රදර්ශනයේ සංවිධායකයින් විසින් එහි වැඩ කිරීම සඳහා දෙනියාය මධ්‍ය මහා විද්‍යාලයේ බාලදක්ෂ කණ්ඩායම කැඳෙව්වා. ඒ කණ්ඩායම උදේ සිට සවස 6 වන තුරු එහි වැඩ කළා. සවස ප්‍රදර්ශනය අවසන් වුණාට පසුව එහි ප්‍රදර්ශන භාණ්ඩ මුර කරන්නයයි ඒ බාල දක්ෂ කණ්ඩායමට පළාතේ ඞී. ආර්. ඕ. මහත්මයා අණ කළා. ඒ අනුව ඔවුන් එහි ඇති ප්‍රදර්ශන භාණ්ඩ මුර කරන අවස්ථාවේදී වරල්ල පොලීසියේ උප පොලිස් පරීක්ෂකවරයා තවත් කාන්තාවන් කිහිප දෙනෙකුත් සමඟ එහි අවුත් ඇතුළු වෙන්න හදා තිබෙනවා. මෙය වැදගත් කාරණයක්. පොලීසිය ශිෂ්‍යයින්ට අඩන්තේට්ටම් කරන හැටි මෙයින් හොඳ හැටිම පෙනෙනවා. මේ අවස්ථාවේදී එහි සිටි බාල දක්ෂ කණ්ඩායමේ නායකයා, ඞී. ආර්. ඕ. තුමාගේ අණ පරිදි ඔවුන් ක්‍රියාකරන නිසා, මේ පිරිසට ඇතුළු වෙන්න ඉඩ දෙන්න බැරියයි කිව්වා. නමුත් පොලිස් උප පරීක්ෂකවරයාට වුවමනා නම් ඔහුට පමණක් ඇතුළු වෙන්නයයි කියා තිබෙනවා. එවිට අර අළුගෝසු පොලිස් පරීක්ෂකවරයා අර අහිංසක බාලදක්ෂ නායකයාට පහර දුන්නා. එවැනි අවස්ථාවලදී දෙපාර්තමේන්තුව ගන්නා වැඩ පිළිවෙල කුමක්දැයි මම අහනවා. ඔහු සංවිධායක කොමිටියේ කවුරුවත් නොවෙයි. ඔහු පාසැල් ශිෂ්‍යයෙක්. බාල දක්ෂ කණ්ඩායමේ නායකයෙක් හැටියට, ඒ ශිෂ්‍යයා පළාතේ ආදායම් පාලන නිලධාරිතුමාගේ ආරාධනාවක් පිටයි, ඒ ස්ථානයට ආවේ. එසේ පැමිණි ඒ බාල දක්ෂයා තමන්ට අයත් රාජකාරිය කරමින් සිටින විට ඔය විධියේ අයුතු අසාධාරණ පහරදීමක් පොලීසියෙන් ලැබුණ නම් ඒ ගැන පරීක්ෂණයක් පැවැත්විය යුතුයි. මේ අවස්ථාවෙදි පොලීසිය භාර රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්තුමා මේ ස්ථානයේ නැතිවීම ගැන කනගාටුයි. අපි දැනටමත් මේ සම්බන්ධයෙන් මාතර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂතුමාට දන්වා තිබෙනව. ඒ වගේම පොලිස් දෙපාර්තමේන්තුවටත් දන්වා තිබෙනවා, පරීක්ෂණයක් කරන්ට කියා. මාතර දිස්ත්‍රික්කයේ මෙවැනි සිද්ධියක් ඇති වූ දෙවෙනි වතාවයි මේ. දැනට මේ ගරු සභාවේ සිටින අකුරැස්සේ ගරු මන්ත්‍රීතුමා හල්වල සිද්ධිය මේ ගරු සභාවට මතක් කර තිබෙනව. පාඨශාලා ශිෂ්‍යයන්ට මේ අන්දමට කරන අයුතු පහරදීම් වළක්වන්ට ඇමතිතුමා වග බලාගත යුතුයි.

ගරු සභාපතිතුමනි, තවත් එක කාරණයක් මතක් කරන්ට තිබෙනව, මාතර අධ්‍යාපන කාර්යාලය සම්බන්ධයෙන්. මාතර අධ්‍යාපන කාර්යාලය මේ මෑතක සිට සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරයෙකුගේ පාලනය යටතට පත් කර තිබෙනව. ඒ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කාර්යාලය ඒ තත්ත්වයට පත් කිරීම ගැන අපි ස්තුතිවන්ත වෙනව. දැනට වැඩ කරගෙන යන පිළිවෙළ අනුව නම් ඒ සහකාර අධ්‍යක්ෂවරයා බොහොම හොඳයි. උන්නැහේ විශාල වැඩ කොටසක් කරගෙන යනව. එහෙත් ඒ නිලධාරියාට නමින් පමණයි, සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරයෙක් වශයෙන් කටයුතු කරන්ට සිඬ වී තිබෙන්නෙ· ඒ ස්ථානයේ ඉන්නෙ එක පාඨශාලා පරීක්ෂකවරයෙක් පමණයි. සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාලයක අධ්‍යපන නිලධාරියෙකුත්, දිස්ත්‍රික්ක පාඨශාලා පරීක්ෂකවරයෙකුත් සිටිය යුතුයි. එහෙත් මෙතැන සිටින්නේ සාමාන්‍ය පරීක්ෂකවරයෙකු පමණයි. බෝඩ් ලැලිවලින් නැත්නම් නාම පුවරුවලින් පමණක් උසස් කළාට මදි. ඒ නිසා මාතර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගේ කාර්යාලයට අවශ්‍ය නිලධාරීන් වහාම පත් කරන මෙන් ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනව. එසේ නොකළොත් ඒ නිලධාරියාට හරියාකාර කටයුතු කරන්ට ලැබෙන්නේ නැහැ· දැනට සිටින සහකාර අධක්ෂවරයා ඉතා උනන්දුවෙන් කටයුතු කරනව. කොළඹ අධ්‍යාපන කාර්යාලයේ "fප්ලයිං ස්ක්වොඩ්" කියා වෙනම අංශයක් පිහිටුවා තිබෙනව, "සර්ප්‍රයිස් චෙක්" හෙවත් හදිසියේ පාඨශාලාවලට ගොස් පරීක්ෂණ පවත්වන්න. මේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරයා මාතර පළාතට ගිය හැටියෙම වගේ ඒ "ප්ලයිං ස්ක්වොඩ්" නමැති පරීක්ෂකයන්ගෙන් කෙරෙන වැඩත් කළා. එතුමා එසේ වැඩ කිරීම නිසා යහපත් ප්‍රතිඵල ලැබී තිබෙනව. අනික් නිලධාරීන් පත් කර නොදෙනවා නම් මේ නිලධාරියාට ඒ ආකාරයට තව දුරටත් කටයුතු කරන්ට ලැබෙන්නෙ නැහැ. ඒ නිසා වහාම අධ්‍යාපන නිලධාරිතුමෙක් හා දිස්ත්‍රික්ක පරීක්ෂකවරයෙක් ඒ කාර්යාලයට පත් කරන ලෙස ඉල්ලමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනව·

**ස්ටැන්ලි මොල්ලිගොඩ මයා.** (නිවිතිගල)
*(திரு. ஸ்டான்லி மொல்லிகொட—நிவிதிகல)*
(Mr. Stanley Molligoda—Niwitigala)

ගරු සභාපතිතුමනි, මේ අවස්ථාවේදී වචන ස්වල්පයක් කථා කරන්ට අවස්ථාව ලබාදීම ගැන තමුන්නාන්සේට මා ස්තුතිවන්ත වෙනව. නව ඇමතිවරයෙකුත් පාර්ලිමේන්තු ලේකම්වරයෙකුත් ඒ අමාත්‍යාංශයට පත් වී සිටින මේ අවස්ථාවේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවත්, ඒ වගේම ජාතික අධ්‍යාපනයත්, අද වෙනස් වීගෙන යනව. සභාපතිතුමනි, මා පළමුවෙන් බලාපොරොත්තු වෙන්නෙ සංස්කෘතික අංශය ගැන වචන ස්වල්පයක් කියන්ටයි. මා කියන්ට අදහස් කරන්නෙ අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් සහ සංස්කෘතික දෙපාර්තමේන්තුවෙන් සිදු වන යම් යම් කරුණු කීපයක් ගැනයි.

රජයේ කලායතනය තිබෙන බව තමුන්නාන්සෙ දන්නව· ඒ ආයතනයේ අවුරුදු 4 ක හෝ 5 ක හෝ පුහුණුවක් ලැබෙනව එක් එක් අංශවල ඉගෙනීම ලබන උදවියට. සංගීතය, විශේෂයෙන්ම නැටුම්, හදාරන ශිෂ්‍යයන්ට මෙවැනි පුහුණුවක් ලැබෙනව. ඒ පුහුණුව ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් පැමිණ සිටින්නේ ඉතා දුරබැහැර ප්‍රදේශවලින් නිසා ඉතා විශාල මුදලක් බෝඩිං ගාස්තු වශයෙන් ගෙවමිනුයි, ඔවුන්ට ඒ අධ්‍යාපනය නැත්නම් පුහුණුව ලබාගන්ට සිදු වී තිබෙන්නෙ. එසේ වුවත් ඒ ආයතනයේ පුහුණුවෙන් පසු සහතික ලබාගන්න උදවියට අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් පත්වීම් ලැබෙන්නෙ නැහැ. සංගීත අංශයේ වේවා නාට්‍ය අංශයේ වේවා අවුරුදු හතරක් හෝ පහක් පුහුණුව ලැබුවා නම් ඔවුන්ට ගුරු පත් වීමක් දීම ඉතාමත්ම යුක්තිසහගතයි. අද නාට්‍ය හෝ සංගීත ගුරු පත්වීම් ලැබෙන්නෙ ජ්‍යෙෂ්ඨ විභාගයෙන් ඒ විෂයයන් සමර්ථ වූ අයට පමණයි. එය කිසිසේත්ම යුක්තිසහගත නැහැ. රජයේ කලායතනය තිබෙන්නෙ අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතෙයි. මේ විෂයයන්ගෙන් ජ්‍යෙෂ්ඨය සමර්ථ වූවන්ට පත්වීම් දෙනව නම් ප්‍රතිපත්තියක් වශයෙන් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට කියන්ට පුළුවනි, කලායතනයට බැඳෙන ශිෂ්‍ය ශිෂ්‍යාවන් ජ්‍යෙෂ්ඨය සමර්ථ විය යුතුය කියා. කලායතනයේ මේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් කොළඹට පැමිණ සිටින්නෙ ඉතා දුර බැහැර ප්‍රදේශවල සිටයි. කලායතනය සඳහා රජය අවුරුද්දකට රුපියල් ලක්ෂ ගණනක් වැය කරනවා. සංගීත හා නාට්‍ය අංශ සඳහා දැන් එහි අළුත් ගොඩනැගිල්ලක් සාදා ගෙන යනව· කලායතනයේ ගුරුවරුන් ඉතාමත්ම දක්ෂ අයයි. ඒ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ස්ටැන්ලි මොල්ලිගොඩ මයා.]

ගුරුවරුන් බොහෝ දෙනෙක් ඉන්දියාවේ සංගීත ආයතනවල උපාධි ලබාගෙන මෙහි පැමිණ උගන්වන අයයි. ඒ අයටත් පඩි ගෙවන්නෙ රජයමයි. එහි නාට්‍ය අංශයෙ සිටින ගුරුවරුන් මේ රටේ ඉතාමත් දක්ෂ නැටුම්කරුවෝයි. එසේ වුවත් කලායතන යේ සංගීත හා නාට්‍ය කලා පිළිබඳවත් අනිකුත් විෂයයන් පිළිබඳවත් පුහුණුව ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට කිසිම අනාගත යක් නැහැ. රජය තවම ඒ ගැන කල්පනා කර නැහැ. ඊට හේතුව කුමක්ද? අපේ අධ්‍යාපන කටයුතු පිළිබඳ ගරු පාර්ලි මේන්තු ලේකම්තුමා කලාව පිළිබඳව හොඳ දැනීමක් තිබෙන කෙනෙක්. මන්ත්‍රීවරයකු වීමට පෙර සිටම එතුමා මේ රටේ කලාව දියුණු කිරීමට ඉතාම උනන්දුවෙන් කට යුතු කළ කෙනෙක්. එතුමා මේවා ගැන හොඳට දන්නවා ඇති. එම නිසා අවුරුදු පතා රජයේ මුදල් ලක්ෂ ගණනක් වැය කරමින් පවත්වාගෙන යන මේ කලායත නයේ ඉගෙනගන්නා ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ඒ පුහුණුවෙන් පසුව රජයේ අනිකුත් දෙපාර්තමේන්තුවල පත්වීම් ලබා දීමට යම් කිසි වැඩ පිළිවෙළක් සකස් කරන මෙන් මම එතුමාගෙන් ඉල්ලා සිටිනවා. ගෘහ කර්මාන්ත දෙපාර්තමේන්තුවෙත් එවැනි රජයේ අන් කාර්යාංශවලත් පුරප්පාඩුවලට කලායතනයේ පුහුණුව ලැබූවන් පත් කරන්ට පුළුවනි. එසේ කිරීම ඉතාමත් අවශ්‍යයි.

දහවල් 12

ඊළඟට අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නාට්‍ය හා සංගීත අංශ ගැන වචන ස්වල්ප යක් ප්‍රකාශ කරන්ට කැමතියි. මේ නාට්‍ය අංශයේ පත්වීම් දෙන්නෙ කොහොමද කියා මම ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාට කියන්ට කැමතියි. මේ සම්බන්ධයෙන් ගරු අධ්‍යාපන ඇමතිතුමාට ඉදිරිපත් කළ සන්දේශයක පිටපතක් මට ලැබී තිබෙනවා. කරුණු රාශියක් ගැන එහි සඳහන් වෙන වා. මෙහි තිබෙන චෝදනා සමහරක් මම කියවන්න කැමතියි. මේ ගැන ගරු පාර්ලි මේන්තු ලේකම්තුමා දන්නව.

1. රජයේ විභාග දෙපාර්තමේන්තුවේ පරීක්ෂක වරයා හැටියට තමන්ම පරීක්ෂණ පවත් වන විභාගවලට ඉදිරිපත් වන ශිෂ්‍යශිෂ්‍යා වන් සඳහා ගාස්තු අය කර උගන්වන සංගීත පන්ති තමන් විසින්ම පවත්වා ගෙන යාම.

2. එසේ තමන්ට මුදලක් ගෙවා තමන්ගේ පන්තියේ ඉගෙන ගන්නා ශිෂ්‍යශිෂ්‍යා වන් සමත් කිරීමේ වරප්‍රසාදය ලැබීමෙන් පසු තමන් විසින්ම එම ශිෂ්‍යයන්ට ගුරු වරුන් හැටියට පත්වීම් දීමේ සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමේ මණ්ඩලයේද ප්‍රමුඛ ලෙස ක්‍රියා කිරීම.

3. මෙසේ පත්වීම් දීමේදී තමන් මුදලක් උපයන පන්තිවල සාර්ථකත්වය තහවුරු වන අයුරු තමන්ගෙන් අධ්‍යාපනය ලත් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ඔවුන් අභිමත ස්ථානත්, තමන්ගෙන් අධ්‍යාපනය නොලත් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට තමන් අභිමත ස්ථානත් දීමට නිර්දේශ කිරීමේ වරප්‍රසාද තමන් සතුව තිබීම.

මෙයට ප්‍රබල සාධකයක් වශයෙන් ප්‍රධාන සංගීත පරීක්ෂක මහතාගේ නිර්දේශ මත දෙන ලද පත්වීම් අතරෙන් තමන්ගේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගෙන් ස්ථාන මාරු වීමේ ඉල්ලුම් පත් සියල්ලක්ම පාහේ ඉදිරිපත් වී ඇත්තේ තමන්ගේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් නොවූ සංගීත ගුරුවරුන්ගෙන් බවත්, මේ පිළිබඳව පරීක්ෂා කිරීමේදී ඔබට පැහැදිලි වෙනවා ඇත.

4. සංගීත ගුරුවරුන් පත් කිරීමේ ඉතාමත්ම වග කිව යුතු රාජකාරිය ඉටු කිරීමේදී කිසිම අයුරකින් සාධාරණ හෝ යුක්තිගරුක නොවූ අතිශයින්ම අත්තනෝමතික වූ නිර්දේශයන් ප්‍රධාන සංගීත පරීක්ෂක වරයා ක්‍රියාත්මක කර තිබෙන බවට ඉදිරි පත් කරන නිදසුන් රාශියකින් කීපයක් පමණක් මෙහි පහත දැක්වේ.

ඔන්න ඔය ආකාරයටයි, මෙහි කරුණු සඳහන් කර තියෙන්නෙ. මා දන්නෙ නැහැ මෙහි තිබෙන කරුණු ඇත්තද බොරුද කියල. මේ කරුණු ඇත්ත කරුණුමය කිය ලත් මා කියන්නෙ නැහැ. එසේ වුණත්, මේ අන්දමේ චෝදනා ඉදිරිපත් වී තිබෙන විට—මේවා ඉතා දරුණු චෝදනා නිසයි, මා මෙහෙම කියන්නෙ—අධ්‍යාපන අමා ත්‍යාංශය මගින් වහාම පරීක්ෂණයක් පැවැත් විය යුතුය කියල මා කල්පනා කරනව. හිටපු ඇමතිතුමා මේ පිළිබඳ ව දන්නව ඇති. එම නිසා මේ පිළිබඳව වහාම පරීක්ෂ ණයක් පවත්වන ලෙස මා ඉල්ලනව. තමන්ම ඉගැන්වීම කරමින්, තමන්ම පරීක්ෂකද වෙලා, තමන්ම සමර්ථවීම් දෙමින් තමන්ම පත්වීම්ද දෙමින් කටයුතු කරන කෙනෙක් ලෝකයෙ කොයිම රටක වත් මා දැක නැහැ. අධ්‍යාපන අමාත්‍යාං ශයේ ස්ථිර ලේකම්තුමා සහ අනිකුත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමහර විට මේ බව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නොදන්නව වෙන්න පුළුවනි. ඒ මහත් මයට පුද්ගලිකව පත්ති පැවැත්වීමෙ වර ප්‍රසාදය ලැබුණෙ කොහොමද ?

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

නම කියන්න පුළුවන්ද ?

**ස්ටැන්ලි මොල්ලිගොඩ මයා.**
*(திரு. ஸ்டான்லி மொல்லிகொட)*
(Mr. Stanley Molligoda)

මකුලොළුව මහත්මය. හැව්ලොක්ටවුන් විද්‍යාලයෙ පුද්ගලික පන්ති පවත්වන්නෙ කොහොමද, එයා ?

**ඇල්බට් මයා.**
*(திரு. அல்பேட்)*
(Mr. Albert)

හොරෙන් කරනව.

**ස්ටැන්ලි මොල්ලිගොඩ මයා.**
*(திரு. ஸ்டான்லி மொல்லிகொட)*
(Mr. Stanley Molligoda)

පෞද්ගලික පන්ති පවත්වන්න හැව්ලොක්ටවුන් විද්‍යාලයෙ ඉඩ දීල තියෙනව. මේ චෝදනා ඉතාම බරපතල චෝදනා බව කියන්න පුළුවනි.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

ශාන්ති නිකේතනයෙ ඉගෙන ගත්ත එක්කෙනාද ?

**ස්ටැන්ලි මොල්ලිගොඩ මයා.**
*(திரு. ஸ்டான்லி மொல்லிகொட)*
(Mr. Stanley Molligoda)

ඔව්. මේ චෝදනා ගැන පරීක්ෂණයක් පවත්වන්න ඕන වහාම. එතුමා අධ්‍යාපන නිලධාරි තත්ත්වයට උසස් කරන්න යනව කියල මට ආරංචියක් ලැබුණා. රාජ්‍ය සේවා කොමිෂන් එකෙන් ඉල්ලුම් පත්‍ර නොකැඳවා ඔවැනි උසස් තනතුරු දෙන්නෙ කොහොමද ?

**ඇල්බට් මයා.**
*(திரு. அல்பேட்)*
(Mr. Albert)

දැන් කරන තනතුර දීල තියෙන්නෙත් එහෙම වෙන්න ඇති.

**ස්ටැන්ලි මොල්ලිගොඩ මයා.**
*(திரு. ஸ்டான்லி மொல்லிகொட)*
(Mr. Stanley Molligoda)

ඉස්සෙල්ල වැඩ බැලීමට පත් කරනව. ඊට පස්සෙ ඒ තනතුර ස්ථිර කරනව. ගරු සභාපතිතුමනි, මේ වර අළුත් ඇස්තමේන්තුවලින් පෙනෙනව, ඔක්තෝබර් මස 1 වන දින සිට සංගීත සහ නාට්‍ය අංශයෙ අධ්‍යාපන නිලධාරි තනතුරක් ඇති කර තිබෙන බව. මේ විධියෙ ඕනෑම උසස් තනතුරක් සඳහා පත් කර ගන්නකොට රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් ඉල්ලුම් පත් කැඳවා කිරීමයි ප්‍රතිපත්තිය.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

එයාගෙ පුද්ගලික පන්තිවලට ගිය කට්ටිය විතරයි සමත් වෙන්නෙ.

**ස්ටැන්ලි මොල්ලිගොඩ මයා.**
*(திரு. ஸ்டான்லி மொல்லிகொட)*
(Mr. Stanley Molligoda)

කොට්ටාවෙ ගරු මන්ත්‍රීතුමා හරි. ඒ කට්ටියට විතරයි පත්වීම් දෙන්නෙ. එවැනි තත්ත්වයක් ඇති වීම කොතරම් නරකද? ඔහුට විරුද්ධව චෝදනා රාශියක් තියෙනව. මේ මහත්මයා සුදුසුද නැත්නම් නුසුදුසුද කියල මම කියන්නෙ නැහැ. රජයේ වෙනත් උසස් තනතුරුවලට අපේක්ෂකයන් තෝරා ගැනීමේ ක්‍රියා මාර්ගයක් ඇති නිසා ඊට අනුකූලව පොදු සේවා කොමිෂන් සභාව මගින් ඉල්ලුම් පත්‍ර කැඳවා නියමිත සුදුසුකම් තිබෙන උදවිය පත් කළ යුතුය කියලයි මම කියන්නෙ. එහෙම නොකර, තමන්ට කැමති පුද්ගලයකු තෝරාගෙන ඔහුට ඉස්සරවෙලා උසස් තැනක වැඩ බලන්න දීලා ඊට පස්සෙ ඒ තනතුරට ස්ථිර වශයෙන් ඒ තැනැත්තාව ගැනීම නොවෙයි යුක්ති සහගත. සංගීතය ගැන මෙන්ම නාට්‍ය කලාව ගැනත් උසස් දැනුමක් ඇති අය මේ රටේ ඉන්න පුළුවනි. සමහර අයගෙ දැනුම මේ මහත්මයගෙ දැනුමට වඩා ඉහළ


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ස්ටැන්ලි මොලිගොඩ මයා.]

වෙන්නත් පුළුවනි. ඒ වගේම මේ මහත්මයගෙ දැනුම අනෙක් උදවියට පහත් වෙන්නත් බැරිකමක් නැහැ. ඒ නිසා පොදු සේවා කොමිෂන් සභාව තමන් සතු කාර්යය වෙනත් තනතුරු සම්බන්ධයෙන් ඉටු කරන ආකාරයට කරනු ඇතැයි අපේක්ෂා කරන බව සඳහන් කරන්න මහත්මයකු බව කියන්න පුළුවනි. එතුමා සපීර ලේකම්තුමා ඉතාම අපක්ෂපාත මහත්මයකුබව කියන්න පුළුවනි. එතුමා ගැන අපි හොඳට දන්නව. ඒ නිසා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලනව සපීර ලේකම්තුමාගෙ මාර්ගයෙන් පොදු සේවා කොමිෂන් සභාවට කියන්න කියල මේ උසස් ස්ථානාන්තරයට ඉල්ලුම්පත්‍ර කැඳවා සුදුසු අයෙකු පත් කරන ලෙස. ඉදිරිපත් කරන ලද චෝදනාව අමාත්‍යාංශයේ හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ උසස් නිලධාරීන් ලවා පරීක්ෂා කරවන්න වහාම විධිවිධාන සලස්සවන්න ඕනෑ. ඊට පස්සෙ චෝදනාව ඇත්ත නම් වැරදිකාරයට දඬුවම් කරන්න. ඒකයි මම කියන්නෙ.

අධ්‍යාපන දෙපාර්තමේන්තුව ශුද්ධ කර ගෙන යන මේ මොහොතේ එය කිලිටි කරන්න කාටවත් ඉඩ තියන්න එපා. කාලයක් තිස්සෙ නරක දේවල් සිදුවුනාය කියා පැමිණිලි ලැබී තිබෙන නිසා එය පිරිසිදු කිරීමට අදහස් කරනව නම් එය කිලිටි වන්න ඉඩ දෙන්න බැහැ. ඉතාම හොඳ ඇමතිවරයෙකුත්, ඒ වගේම හොඳ පාර්ලිමේන්තු ලේකම්වරයෙකුත් අපට ඉන්නව. අමාත්‍යාංශය භාරව ඉන්න ස්ථාවර ලේකම්තුමා ඇතුළු උසස් නිලධාරි මණ්ඩලයකුත් අපට ඉන්නව. ඒ අය අතර ඉතා දක්ෂ, එමෙන්ම රට ගැන ආදරයක්, ඇල්මක් ඇති බොහොම දෙනෙක් ඉන්න බව ආඩම්බරයෙන් මතක් කරන්න කැමතියි. මේ සියලු දෙනාගෙන්ම නිසි පරිදි සේවයක් කරවා ගැනීමට හැකියාවක් තිබෙන හොඳ ආණ්ඩුවකුත් අපට තිබෙනව. ඉතින් ඒ තරම් අගනා අවස්ථාවක ඉන්න අපි ඉතාමත් ඉවසිල්ලකින් යුක්තව උනන්දු වෙන් අපේ වැඩ කටයුතු කරන්න ඕනෑ. එහෙම වෙලාවක මේ දෙපාර්තමේන්තුව කිලිටි කරන්න ඉඩ දෙන්න බැහැ. ඒ නිසා වහාම පරීක්ෂණයක් පවත්වන ලෙස මම ගෞරවයෙන් ඉල්ලා සිටිනව. එය ඉතා අවශ්‍යයි. මා මීට කලිනුත් කිව්ව වගේ ඉතා කණගාටුදායක සිද්ධියක් තමයි මේ පත්වීම් ලබා ගන්න බොහෝ දෙනෙක් පෞද්ගලික පංක්තිවලට ගිහිල්ල ඒ පෞද්ගලික පංක්ති භාර තැනැත්තගෙ උදව්වෙන් ඒවා ලබා ගැනීම. රජය මගින් පවත්වන කලායතනවල කොයි තරම් වෙහෙස මහන්සි වී සාර්ථක ලෙස ඉගෙනීම කළත් ඒ අයට මේ පත්වීම් ලබා ගැනීමේ වරප්‍රසාදය ලැබෙන්නෙ නැත්නම් එය මොන අපරාධයක්ද? අන්න ඒ නිසා මේ ගැන වහාම පරීක්ෂණයක් පවත්වන්න ඕනෑ. පරීක්ෂණයක් පැවැත්වීමෙන් නියම තත්ත්වය සොයා ගන්න පුළුවන් වෙනව. සමහර විට අප චෝදනා කරන මේ නිලධාරියා සම්පූර්ණයෙන්ම නිර්දෝෂ පුද්ගලයකු හැටියට ඒ පරීක්ෂණයේදී ඔප්පු වෙන්න පුළුවනි. එහෙම නැත්නම් වරදක් කළ තැනැත්තකු හැටියට හඳුනා ගන්න පුළුවනි. වෙනත් වචනවලින් කියතොත්, මේ කාරණය ගැන පරීක්ෂණයක් පැවැත්වීමෙන් ඒ නිලධාරියා නිර්දෝෂද නැද්ද යන්න ගැන කරුණු ඉදිරිපත් කිරීමට ඒ නිලධාරියාට මෙන්ම වෙනත් අයටත් අවස්ථාවක් ලැබෙනව. නියම තත්ත්වය රටට පෙන්වීමට අවස්ථාවක් කාට කාටත් ලැබෙන නිසා ඒ මහත්මයා ආරක්ෂා කිරීම සඳහාත්, මහජන අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහාත් ගත යුතු නියම මාර්ගය නම් අප්‍රමාදව පරීක්ෂණයක් පැවැත්වීමයි. එය ඉතාමත් යෝග්‍ය පියවර හැටියට මතක් කරන්න කැමතියි. ඒ ගැන කියන්නෙ එපමණයි.

" ඩ්‍රාමා පැනල් " යනුවෙන් ඉංග්‍රීසියෙන් හඳුන්වන නාට්‍ය මණ්ඩලයක් තියෙනව. ඒක මොකක්ද කියන්න මම හරියට දන්නෙ නැහැ. ඒක කවුරුන් විසින් පත් කළාද දන්නෙත් නැහැ. නාට්‍ය තෝරා ගත්තෙ කොහොමද කියන්නත් මම දන්නෙ නැහැ. ඉතා හොඳ නාට්‍ය ඕනෑ තරම් තිබියදී යම් යම් බලපෑම් නිසා දෝ වෙනත් නාට්‍ය තෝරාගෙන තිබෙන බව පෙනෙනවා. අමු අමුවෙ කුණු හරුප තමයි සමහර නාට්‍යවලින් එළියට එන්නෙ. " රන්තෝඩු " කියල එකක් ළඟදි පෙන්නුව. මුදලාලි කෙනෙකුයි ආයාකෙනෙකුයි ගැන ගෙතුණු කථාවක් ඒක. ඒකද කලාව කියල මම අහන්න කැමතියි. ඒ අවස්ථා වෙදි අපේ මුදල් ඇමතිතුමා එහි සිටිය. එතුමාත් මේ රටේ දක්ෂ නාට්‍යකරුවෙක්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එදා එතුමා කළ කථාවේදී ඔය මම කියන කරුණු ඔප්පු වුණා. සංස්කෘතික දෙපාර්තමේන්තුවෙන් මීට වඩා විශාල සේවයක් මේ රටට සිදු වෙනවා ඇතැයි බලා පොරොත්තු වෙනව.

අ. භා. 12.15

මගේ කොට්ඨාශයේ ඉතාම පැරණි ඓතිහාසික විහාරස්ථානයක් තිබෙනව, පොත්ගුල් විහාරය කියා. පොත්ගුල් විහාරය ඒ තරම් පොහොසත් විහාරස්ථාන යක් නොවෙයි. ඒ විහාරයට අවුරුදු පතා දහස් ගණන් වන්දනාකරුවෝ එනව. ඒ එන වන්දනාකරුවන්ට ගිමන් හැරීමට එහි තැනක් නැහැ. එම නිසා එහි විශ්‍රාම ශාලාවක් සෑදීම ඉතාම අවශ්‍යයි. ඒ එන වන්දනාකරුවන්ට කෑම ටිකක් කන්න වත් තැනක් නැහැ. පොත්ගුල් විහාරය වළගම්බා රජු කාලයේදී ඉදි කරන ලද විහාරයක්. ශ්‍රීපාද වන්දනාවෙ යන කාලෙට මේ විහාරයට දහස් ගණන් සෙනග නැවතීමට එනව. ඒ මොකද? ශීත දේශ ගුණය හේතුකොටගෙන ශ්‍රීපාද කන්ද උඩ ඉන්න බැරි නිසා මේ ස්ථානයට පැමිණෙ නව. ඒ වාගෙම කුකුලව විහාරයත් දහස් ගණන් වන්දනාකරුවන් පැමිණෙන ස්ථානයක්. ඒ නිසා රත්නපුරේ අසල විශ්‍රාම ශාලාවක් පිහිටුවීම ඉතාමත් අවශ්‍යයි. මම හිතනව සංස්කෘතික දෙපාර්තමේන්තුවෙන් ඒ ගැන යම් කිසි දෙයක් කරයි කියා.

ඒ වාගේම සංස්කෘතික දෙපාර්තමේන්තුවෙන් දෙනු ලබන ආධාර මුදල් නියම අන්දමට ලැබිය යුතුයි. මුදල් දෙන විටද නියම විධියට පරීක්ෂණ පවත්වා දීම ඉතා මත් අවශ්‍යයි කියා මා අදහස් කරනවා. පන්සල් වෙහෙර විහාරවලට වේවා, කලා යතනවලට වේවා, දෙනු ලබන ආධාරවලින් අපේ රටේ සංස්කෘතිය නගා ලීමට සංස් කෘතික දෙපාර්තමේන්තුවෙන් යම් කිසි සේවයක් සිදු වන බව මම පිළිගන්නව. ඒ අනුව දැන් සිදු වන සේවයට වඩා විශාල සේවයක් නුදුරු අනාගතයේදී ඇති වෙනවා ඇත කියා මා බලාපොරොත්තු වෙනව.

ඊ ළගට අධ්‍යාපන දෙපාර්තමේන්තුව ගැන කරුණු කීපයක් මගේ කොට්ඨාශයට සීමාකර කියන්න බලාපොරොත්තු වෙනව. ගරු සභාපතිතුමනි, නිවිතිගල මැතිවරණ කොට්ඨාශයට අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් විශාල සේවයක් ඉටු වී තිබෙන බව මම පළමුවෙන්ම සඳහන් කරන්න කැමතියි. කිසිම මැතිවරණ කොට්ඨාශයක තිබෙන සියලුම අඩු පාඩු එහෙමපිටින්ම නැති කිරීමට අපට හැකි වන්නෙ නැහැ. මම එය පිළිගන්නවා. එය ක්‍රම ක්‍රමයෙන් කළ යුතු දෙයක්. විද්‍යා ගාර, පාසල් ගොඩනැගිලි, පිට්ටනි ආදී බොහෝ දේවල් සම්බන්ධයෙන් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගේ කොට් ඨාශයට ආධාර දී තිබෙනව. නමුත් තවත් සැලකිය යුතු අඩු පාඩු කීපයක් තිබෙනව. විශෙෂයෙන්ම පාසලක් මහා විද්‍යාලයක තත්ත්වයට උසස් කළාට පසුව ඒ සඳහා විද්‍යාගාර ආදී අතිකුත් අවශ්‍ය අංග බොහෝමයක් තිබෙනව. එසේ නැතිව නාම පුවරුව පමණක් තිබීමෙන් ප්‍රයෝ ජනයක් නැහැ. කහවත්ත විද්‍යාලය දැනට අවුරුද්දකට පමණ උඩදී මහා විද්‍යාලයක තත්ත්වයට උසස් කළා. එහි ගොඩනැගිලි කීපයක් තිබෙනව. ගොවිකම් රසායනාගාර යක්ද තිබෙනව. එහි පහසුකම් ඇත්තේ ගොවිකම් ඉගෙනීමට පමණක් නිසා එයින් ලැබෙන ප්‍රයෝජනය ඉතාමත් මදි. එම නිසා නව වර්ෂයේදී රෙදි වියන ස්ථානය කුත්, වඩු වැඩ කම්හලකුත්, විද්‍යාගාරය කුත්, දෙන්නය කියා අපි අමාත්‍යාංශයෙන් ඉල්ලා සිටිය. ඒ වාගේම පිට්ටනියක් සඳහා යම් මූලික ආධාර මුදලක්ද අවශ්‍යයි. මම මුදල් වැඩි වශයෙන් ඉල්ලන්නෙ නැහැ. මම කවදාවත් අසාධාරණ ඉල්ලීම් ඉල්ලන්නෙ නැහැ. මම කවදත් සාධාරණයි. ඒ නිසා පිට්ටනියක් සඳහා යම් මූලික පියවරක් ගැනීමට මූලික ආධාරයකුයි බලාපොරොත්තු වන්නෙ. එතකොට අපට පුළුවන් වෙනව කහවත්ත මහා විද්‍යාලයට යම් කිසි තත්ත්වයක් ඇති කර දීමට. රත්නපුර දිස්ත්‍රික්කයේ තිබෙන පාසල්වලින් කහවත්ත මහා විද්‍යාලය ඉතාම උසස් තත්ත්වයක තිබෙන විද්‍යාලයක් බව මම කියන්න කැමතියි. විශ්ව විද්‍යාල ප්‍රවේශයෙනුත් ඒ විද්‍යාලයේ ශිෂ්‍යයන් බොහෝ ගණනක් සමත් වුණා. ඉගෙන ගැනීමට හැකියාවක් තිබෙන ළමයින් සිටින ගම්බද පාසලකට එවැනි තත්ත්වයක් ඇති කර දීම යුක්ති සහගතය කියා මම අදහස් කරනව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ස්ටැන්ලි මොල්ලිගොඩ මයා.]

එම නිසා කහවත්ත මහා විද්‍යාලයේ තිබෙන අඩුපාඩුකම් සියල්ලක්ම ලබන මුදල් වර්ෂය තුළදී සම්පූර්ණ වේවායි සාර් එක වේවායි මම ප්‍රාර්ථනය කරනවා. ඒ වාගේම තවත් මහා විද්‍යාලයක් තිබෙනවා, හංගොමුව මහා විද්‍යාලය කියා. ඇත්තෙන්ම මේ මහා විද්‍යාලයට කිසිම දෙයක් නැහැ; ගොඩනැගිලි පමණයි තිබෙන්නෙ. සාමාන්‍ය පැමිණීම ළමයින් හයසියයකට වැඩියි. නමුත් විද්‍යාගාරයක් නැහැ, වැඩ පොළක් නැහැ, පිට්ටනියක් නැහැ. සිටින ගුරු මණ්ඩලයත් ප්‍රමාණවත් නැහැ. ගුරු මණ්ඩලයේ සිටින සංඛ්‍යාව බොහොම අඩුයි. ගරු සභාපතිතුමනි, මහා විද්‍යාලයකට ප්‍රධාන අංග තුනක් තිබෙනවා. විද්‍යාගාරයක්, වැඩ පොළක් හා ක්‍රීඩා පිටියක් මහා විද්‍යාලයකට තිබිය යුතුයි. හංගොමුව මහා විද්‍යාලයට මෙයින් එකක්වත් නැහැ. අඩු වශයෙන් මෙයින් එකක්වත් මේ මහා විද්‍යාලයට ලබාදීමට ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාත් උනන්දුවෙනවා ඇතැයි මම කල්පනා කරනවා.

මෙම මහා විද්‍යාලයට විද්‍යාගාරයක් තිබීම වැදගත් යයි කියන්නෙ මන්ද? ඇත්ත වශයෙන්ම රත්නපුර දිස්ත්‍රික්කයේ පාසැල්වල අධ්‍යාපනය ලබන ශිෂ්‍යයින් තුළ විද්‍යාව ඉගෙනීමේ පුදුම හැකියාවක් තිබෙනවා; පුදුම උනන්දුවක් තිබෙනවා. එම නිසා ඒ ශිෂ්‍යයන්ට පුළුවන් තරම් ඉගෙනීමට ධෛර්යය දෙන්න ඕනැ. නමුත් මේ ශිෂ්‍යයින් තුළ තිබෙන උනන්දුව, ධෛර්ය කාන්තාරයේ පිපෙන මල් වගේ අපතේ යනවා. අප හැම ශක්තියක්ම හැම ධෛර්යයක්ම, හැම උනන්දුවක්ම දක්වන්න ඕනැ, ගම්බද ළමයින්ගේ අධ්‍යාපනය නගා සිටුවීම සඳහා. එම නිසා නගරබද ළමයින්ට ටිකක් අඩු වුණත් කමක් නැහැ, සහජ හැකියාවක් ඇති ගම්බද ළමයින් ගැනත් කල්පනා කර බලන්න ඕනැ. මෙයට පෙර ගම්බද ළමයින්ට වරප්‍රසාද ලැබුණේ නැහැ. දැන් ක්‍රම ක්‍රමයෙන් ලැබී ගෙන එනවා. එම නිසා ඒ ළමයින්ගේ දක්ෂකම්වලින් ප්‍රයෝජනය ගැනීම පිණිස ධෛර්යය දීම, උනන්දුවීම රජය සතු යුතුකමක්. එසේ දැක්වුවහොත් මේ රටේ සියලුම වගකිව යුතු ස්ථාන, ශ්‍රෙෂ්ඨාධිකරණයේ අග්‍රවිනිශ්චයකාර පදවිය පවා ගම්බද පාසැලක අධ්‍යාපනය ලැබූවකුට ලබා ගැනීමට හැකි වෙනවාට කිසිම සැකයක් නැහැ. ඒ වාගේම වෛද්‍ය විද්‍යාලවල මහාචාර්ය පදවි පවා උසුලන පුද්ගලයන් ගම්බද ප්‍රදේශවලින් බිහි වෙන්න පුළුවනි. ඒ වාගේම මේ රටට වුවමනා කරන ඉංජිනේරුවන්, වෛද්‍යවරුන් සියලු දෙනාම අපේ ගම්බද පාසැල්වලින්ම බිහිකර ගන්න පුළුවන් වෙනවාට කිසිම සැකයක් නැහැ. ගම්බද ළමයින් තුළ උනන්දුවක් තිබෙනවා, හැකියාවක් තිබෙනවා, ඥාණය තිබෙනවා. ඔවුන්ට අවශ්‍යව තිබෙන්නෙ ඒ සඳහා උපකරණ හා ගුරුවරුන් පමණයි. මේවා සපයා දුන්නොත් ඔවුන්ගේ සේවය මේ රටේ ජනතාවට ලබාගන්න පුළුවනි, රටේ සංවර්ධනයට ඔවුන් යොදා ගන්ට පුළුවනි.

ගරු සභාපතිතුමනි, මහා විද්‍යාල හැරුණු විට තවත් පාසැල් රාශියක්ම තිබෙනවා. ගොඩනැගිලි සෑහෙන සංඛ්‍යාවක් ලැබී තිබුණත් එය ප්‍රමාණවත් මදි. විශෙෂයෙන්ම කඳු මුදුන්වල ගොඩනගා තිබෙන පාසැල්වල ගොඩනැගිලි ප්‍රමාණවත් මදි. තවත් සැලකිය යුතු සංඛ්‍යාවක් අවශ්‍යයි. අපි විශාල ගොඩනැගිලි මේවාට ඉල්ලා සිටින්නෙ නැහැ. අපේ ප්‍රදේශයේ ඉන්න ජනතාවත් ඒ අන්දමට ඉල්ලන්නෙ නැහැ. මා වගේම කොට්ඨාශයේ උදවියත් සාධාරණයි. ලොකු ගොඩනැගිලි ඉල්ලන්නෙ නැහැ. හැටේ විස්සෙ ගොඩනැගිලි පහළොවක් විස්සක් තිබුණාම ඇති. [බාධා කිරීමක්] මේක සුළු ගණනක්. හිටපු ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාගේ කොට්ඨාශයට යාව පන්නිල ගමේ සෑහෙන ජනගහනයක් ඉන්නවා. ඒ ප්‍රදේශයේ ඇති පාසැලේ ළමයින් තුන් සියයකට වැඩි සංඛ්‍යාවක් ඉන්නවා. මෙම පාසැලට අසූවෙ—විස්සෙ ගොඩනැගිල්ලක් දුන්නාම ටික කාලයකටවත් පිරිමසාගන්න පුළුවන්.

ගුරු අඩුපාඩුකම් ගැනත් වචනයක් කිව යුතුයි. මේ අන්දමට ගුරු අඩුපාඩුවක් ඇති වෙන්නෙ මොකද? අද මේ රටේ විශාල ගුරු හිඟයක් පවතිනවා. මේ රටේ ගුරුවරුන්ගේ හිඟයක් තිබෙනව. නමුත් සමහර පළාත්වල ගුරුවරුන් රාශියක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සිටිනව. කියන්නට කනගාටුයි, මගේ කොට්ඨාශයේ ස්ථිර මුල් ගුරුවරු නැහැ. නමුත් මේ රටේ සමහර ප්‍රදේශවල ස්ථිර මුල් ගුරුවරු, මුල් ගුරු පඩිය ගනිමින් උප ගුරුවරුන් වශයෙන් වැඩ කරනව. මොකක්ද මේකෙ තියෙන යුක්තිසහගත කම ?

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

ඒ කොට්ඨාශයෙ ස්ථිර මුල් ගුරුවරු ඉන්නව.

**ස්ටැන්ලි මොල්ලිගොඩ මයා.**
*(திரு. ஸ்டான்லி மொல்லிகொட)*
(Mr. Stanley Molligoda)

සමහර තැන්වල ටික දෙනෙක් ඉන්නව. ස්ථිර මුල් ගුරුවරුන් වශයෙන් පත් වීම් ලබා, මුල් ගුරු පඩියම ගනිමින් උප ගුරු තනතුරේ කටයුතු කරන අය සමහර පළාත්වල ඉන්නව. ඒ අයට මුල්ගුරුකමේ වගකීමක් නැහැ. නමුත් සමහර පාසල් වල මුල් ගුරුවරුන් වශයෙන් වැඩ බලන උප ගුරුවරු ඉන්නව. ඒ අයට සම්පූර්ණ වගකීම තියෙනව. නමුත් ඒ අයට ලැබෙන්නෙ උප ගුරු පඩියයි. මොකක්ද මේකෙ තියෙන සාධාරණකම ? මම ඊයෙ අධ්‍යාපන කාර්‍යාලයට ගිය වෙලාවෙ වැඩ බලන මුල් ගුරුවරු කීප දෙනෙක් ඇවිත් හිටිය, අධ්‍යාපන කටයුතු පිළිබඳ පාර්ලි මේන්තු ලේකම්තුමා හමු වන්න. මමත් පොඩි වුවමනාවකට ඒ කාර්යාලයට ගියාම ඒ ගුරු මහත්වරු මට මේ කාරණාව කීව. ඇත්තෙන්ම ලොකු අයුක්තියක් මේ අයට කරල තියෙන්නෙ. ස්ථිර මුල් ගුරුවරු මේ රටේ ඕනෑම ප්‍රදේශයක මුල් ගුරුවරුන් වශයෙන් කටයුතු කිරීමට සූදානම් නැත් නම්, අධ්‍යාපන අමාත්‍යාංශයට හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුවට තිබෙන්නෙ උප ගුරුවරුන් වශයෙන් කටයුතු කිරීමට ඔවුන් පාසල්වලට දැමීම නොවෙයි, ඔවුන් ගේ මුල් ගුරු තනතුර සම්පූර්ණයෙන්ම අහෝසි කර ඔවුන් උප ගුරු තනතුරුවලට පත් කිරීමයි. අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගුරුවරයකු වශයෙන් සේවයට බැදෙන විට ඔවුන් බැදෙන්නෙ මේ රටේ ඕනෑම තැනක සේවය කිරීමටයි. ඒ ප්‍රතිපත්තිය උඩයි, රජය ඕනෑම සේවකයකු බඳවා ගන්නෙ. ඒ අයට විශේෂ වරප්‍රසාද දී වගකීම් නැතිව කටයුතු කිරීමට ඉඩ දීම යුක්තිසහගත නැහැ.

ඊ ළඟට උපාධිධාරී ගුරුවරුන් සම්බන්ධ වත් කිය යුතු කාරණයක් තියෙනව. මා හිතන විධියට මගේ කොට්ඨාශයෙ ඉන්නෙ උපාධිධාරී ගුරුවරුන් 6 දෙනයි. පසුගිය මැයි මාසයේදී පේරාදෙනි විශ්ව විද්‍යාල යෙන් සමත් වූ උපාධිධාරීන්ගෙන් සබර ගමු පළාතෙ රත්නපුර දිස්ත්‍රික්කය වැනි තැන්වලට යැව්වෙ ගැහැණු අයමයි. සබර ගමු පළාතෙ සමහර මහා විද්‍යාල තියෙනව. ඒ මහා විද්‍යාලවල සේවය කරන්න මේ ගැහැණු උපාධිධාරීන් කැමති නැහැ. එසේ අකැමති වන්නෙ ඔවුන්ට වුවමනා විධියට නැවතීමේ පහසුකම් ඒ පළාත්වල නැති නිසයි. පිරිමි කීප දෙනකු යැව්ව නම් ඔවුන් කවදාවත් මාරු වන්න ඉල්ලන්නෙ නැහැ. මේ කරුණු සියල්ල ගැනම ගරු පාර්ලි මේන්තු ලේකම්තුමාගේ අවධානය යොමු කරන ලෙස ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසාන කරනව.

අ. භා. 12.30

**සභාපතිතුමා**
*(அக்கிராசனர்)*
(The Chairman)

රැස්වීම අ. භා. 2 වන තුරු තාවකාලිකව අත් හිටුවනව. නැවත පටන් ගන්නා විට කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනය ගන්නවා ඇති.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ. භා. 2 ට කාරක සභා නියෝජ්‍ය සභාපති තැන්පත් ඩී. ඒ. රාජපක්ෂ මහතාගේ සභාපතිත්ව යෙන් නැවත පවත්වන ලදි.

**බාලසුන්දරම් මයා.**
*(திரு. பாலசுந்தரம்)*
(Mr. Balasunderam)

Mr. Deputy-Chairman, I shall be very brief indeed, because the hon. Member for Welimada has very graciously allowed me to speak now.

I rise mainly to congratulate and to thank the Hon. Minister of Education for the act of justice, which was long overdue but which he promptly and

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

very gracefully has done for the benefit of the Tamil trained teachers.

When the Tamil Training Colleges were taken over by the Government in 1960, those who had passed out of the Training Colleges were left high and dry without employment. In 1961 there were no less than 250 trained teachers, who had passed out of the various Training Colleges, who found no hope of employment. They formed an association with an extremely pathetic and unique name, an association of unemployed Tamil trained teachers. I was invited to the inaugural meeting.

Thereafter, on behalf of these unfortunate teachers, I have been sending appeal after appeal to the former Minister of Education and to the Education Department. The Department moved very slowly indeed. They absorbed only a few and left the rest. So that by the beginning of this year more than a hundred Tamil trained teachers from the Jaffna peninsula were left without any kind of hope of employment. Some of them had been waiting from 1959.

I know the instance of a girl whose parents had mortgaged their dwelling land for the purpose of her education. She was waiting for an appointment until now. The mortgagee would not wait until the girl earned ; he put the bond in suit and had the land sold ; and the girl and her parents had to find refuge in a temple land.

On behalf of those unfortunate teachers and on behalf of the teaching profession in the Northern province, I sincerely thank the Hon. Minister of Education for this act of justice gracefully done. From the utterances he has made on education, it is clear that the Hon. Minister of Education is sincerely concerned with the progress of education in this country. I am sure that his sense of fair play, his impartiality and freedom from communal and religious prejudice will influence the future conduct of the officers of the Education Department.

In this connection I would like to mention two matters before I sit down. At the time when Swabasha was made the medium of instruction, Sinhala was the medium at the Government Technical College, Colombo. At that time the then Prime Minister accepted and initiated the necessary steps for the establishment of a technical college in Jaffna of equal status with the one in Colombo. Unfortunately, they started a junior technical college in Jaffna. But, during the late Prime Minister's tenure of office, the then Minister of Education, now the hon. Member for Galle, made an order that that junior technical college should be up-graded and raised to the status of the Technical College in Colombo. I am sorry to say that the Permanent Secretary to the Ministry of Education had been from all reports, and from his subsequent conduct it seems to me, moved by communal and racial prejudice, obstructed the implementation of the direction of the then Minister of Education. I think two years ago I raised the same question on the Floor of this House, and requested the Hon. Minister of Education to consider the up-grading of this institution which was promised as early as 1956. The Minister said that he would do so. Nothing has been done so far. Instead, last year an attempt was made by this Permanent Secretary even to reduce the status of this institution by writing a letter that the Preliminary Engineering Class should be abolished. I had protested strongly against it, and the Minister's order was that that should be restored.

I would like to remind the Hon. Minister of Education that the Tamil people had been waiting for a full fledged technical college promised by the late Prime Minister Bandaranaike in 1956. I hope the Hon. Minister will very soon make it possible for the Junior Technical College in Jaffna to be restored to the status of the Technical College in Colombo.

The next matter I wish to bring to the notice of the Hon. Minister is this. Whilst in the Training College

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

commercial training was given for the students who had passed out in the Sinhala medium or trained in the Sinhala medium, no such training was given to teachers in the Tamil medium. On this matter I had a good deal of correspondence both with the Minister and the Permanent Secretary. I do not want to go into the details. There was, I think, an advertisement in the Gazette some time ago that the Government proposed to start commercial classes for Tamil teachers. I find that nothing has been done so far. I would request the Hon. Minister of Education to look into the matter and remove this grievance of the Tamil people as well.

Finally, there has been a good deal of dissatisfaction over the transfer of teachers in the middle of the year according to what is known as the "point system". The Hon. Minister has himself expressed his views on the matter of transfers. I may respectfully agree with the views he has expressed, that he is opposed to transfers in the main except for special reasons. If I may say so, with all respect to the Hon. Minister, this is in accordance with sound principles of education. I would, therefore, request him to consider the resolution that was submitted to him by the All Ceylon Tamil Teachers' Union on this matter.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමතිතුමාගේ වැය ශීර්ෂය යටතේ කථා කිරීමට මට නියමිතව ඇති කාලයෙන් වැඩි හරියක්ම—ඇමතිතුමාගේත්, පාර්ලිමේන්තු ලේකම්තුමාගේත්, මේ ගරු සභාවේත්, මහජනතාවගේත් දැනගැනීම පිණිස—සංස්කෘතික කටයුතු සම්බන්ධයෙන් යොදවන්ට මා කැමතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඉතා හොඳ පරමාර්ථයකින් ආරම්භ කළ සංස්කෘතික දෙපාර්තමේන්තුව නැත්නම් සංස්කෘතික වැඩ පිළිවෙළ, අද ඉතා නරක අතට හැරී තිබෙන බව ඉතා කණගාටු වෙන් මතක් කරන්ට සිදු වී තිබෙනවා. දැන් එය සංස්කෘතියත් නැති හංග කරන තැනට හැරී තිබෙනවා. මේ රටේ තරුණ පරම්පරාව, හැදෙන වැඩෙන උදවිය, පාසැල් ශිෂ්‍යයින්, නොමග යවන අන්දමින්, සංස්කෘතික දෙපාර්තමේන්තුවේ අනුග්‍රහය යටතේ නැත්නම් සංස්කෘතික අමාත්‍යාංශයේ අනුග්‍රහය යටතේ වැඩ කටයුතු කෙරී ගෙන යනවා. සිංහල භාෂාවෙන් වැඩ කටයුතු කිරීමේ උද්ඝෝෂණය ආරම්භ කළ දා සිට, රජයේ වැඩ කටයුතුවලදී සිංහලයට තැනක් ඉල්ලූ දා සිට, එමෙන්ම අධ්‍යාපනය සිංහල මාධ්‍යයෙන් ආරම්භ කළ දා සිට, දවසින් දවස, පංක්තියෙන් පංක්තිය හා ඉහළ අධ්‍යාපනය ආදී වශයෙන් සිංහලෙන් වැඩ කටයුතු කිරීම පටන් ගැනීමෙන් පසු සිංහල පොත් පත් බහුල වශයෙන් වුවමනා වී තිබුණු බව ඔබතුමා දන්නා කාරණයක්. නමුත් මේ අවශ්‍යතාවය පිරිමැසීමේදී සිදු වී තිබෙන්නේ ඉතා භයානක දෙයක්. ඒ අවශ්‍යතාවය පිරිමැසීමේදී මේ රටේ බාල පරම්පරාව, මේ රටේ තරුණ පරම්පරාව, විනාශ මුඛයට යන පරිදි වැඩ කටයුතු සිදු වී තිබෙනවා.

මා විසින් සවිස්තරව කරුණු කියන විට සමහර විට අධ්‍යපන ඇමතිතුමා කියන්ට පුළුවන් නැත්නම් මගෙන් අහන්ට පුළුවන්, මා මේ කියන කරුණුවලට ආණ්ඩුව නැත්නම් ඇමතිතුමා වගකියන්නේ කොහොමද කියා. කරුණු ඉදිරිපත් කරන්ට කලින්ම එයට උත්තරයත් දෙන්න කැමතියි. මේ සම්බන්ධව ආණ්ඩුව වගකියන්න ඕනෑ. මම කියන්ට යන මේ කරුණුවලට ආණ්ඩුව මගින් පිහිටවූ සංස්කෘතික දෙපාර්තමේන්තුව සම්පූර්ණයෙන්ම වගකිව යුතුයි. ඒ කාරණය මුලින්ම කීමෙන් පසුව දැන් සවිස්තරව කරුණු කීපයක් ඉදිරිපත් කරන්න කැමතියි.

නියෝජ්‍ය සභාපතිතුමනි, මා කියා සිටින්නේ මේ රටේ බාල පරම්පරාව විනාශ මුඛයට හරවන කුණුහරුප පොත් පත්, අසභ්‍යවාදයේ අන්තිම කෙළවරට ගොස් තිබෙන පොත් පත්, නියෝජ්‍ය සභාපතිතුමනි, සාහිත්‍යයේ නාමයෙන් අද බිහි කර තිබෙන බවයි. මේවා බිහි කර තිබෙන්නේ සාමාන්‍ය පුද්ගලයින් නොවෙයි; සුළු පුද්ගලයින් නොවෙයි. මේ රටේ හැම තැනම උදන් අනන උසස් විද්‍යා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කේ. එම්. පී. රාජරත්න මයා.]

පීඨයන්ගෙන් උසස්ම විද්‍යා පීඨය හැටියට පෙන්නුම් කරන්ට හදන පේරාදෙනියේ විශ්ව විද්‍යාලයේ සිංහල අංශය මගිනුයි මේ කාර්ය කරගෙන යන්නේ. ඒ අංශයේ මහාචාර්යවරයෙක් ඉන්නවා එදිරිවීර සරත්චන්ද්‍ර කියා. ඒ මහත්මයාගේ ප්‍රධානත්වයෙන් සිරි ගුණසිංහ, ගුණදාස අමරසේකර යනාදී වශයෙන් සිටින ඒ මහත්මයාගේ ගෝල පිරිසයි ඔක කරන්නේ. පිටින් සිට ගෙන ඒ අයට උදව් පදව් කරන්නෙ කවුද? ආණ්ඩුවෙන් පිරිනමන්ට පුළුවන්, සංස්කෘතික දෙපාර්තමේන්තුවෙන් පිරිනමන්ට පුළුවන්, උසස්ම නම්බුනාමය පිරිනමා තිබෙන —ඕ. බී. ඊ. නාමය ප්‍රදානය කර තිබෙන— උසස් පෙළේ සාහිත්‍යධරයෙක් හැටියට සලකන, දැන් සමාජවාදියෙක් හැටියටත් සලකන, මාර්ටින් වික්‍රමසිංහ මහත්මයායි. මේකට ඇත්ත වශයෙන්ම කියන්නේ සාහිත්‍ය කොල්ලයක් කියායි. මේ සරත්චන්ද්‍ර කල්ලිය මොන වාගේ පොත්පත් බිහි කර තිබෙනවාද? අද පාසල් යන ශිෂ්‍යයින්ට, තරුණ වියෙහි සිටින්නවුනට, ඒ වාගේම අනික් උදවියට කියවන්න තිබෙන මේ පොත්පත් මොනවාද? මොනවාද, මේ පොත්පත්වල තිබෙන්නේ? ඉතාමත් නින්දිත කුණුහරුප. මිනිසාගේ පහත්ම ගති උත්සන්න කරවීමට දරා ඇති වෑයමක් බවයි, අපට පෙනෙන්නේ. මේ විධියට ඇත්තේ එක පොතක් දෙකක් නොවෙයි. මෙය ක්‍රමානුකූලවම කෙරෙන දෙයක්. මේ මහාචාර්යවරයාගේ ප්‍රධානත්වයෙන් තිබෙන සිංහල අංශයෙන් උගන්වන්නේ, නූතන සිංහලය කියා උගන්වන්නේ, නව කථා කියා උගන්වන්නේ, මේ විධියේ සිංහලකම, අපේ ශිෂ්ඨාචාරය, අපේ සංස්කෘතික නැති කර දමන දේයි.

අ. භා. 2.15

මම මේ පොත්පත් කොටස් තුනකට බෙදනවා. ඉන් එක කොටසක් කෙලින්ම අසභ්‍ය පොත්, කුණුහරුප, කාමය අවුස්සන පොත්, ඉතාම පහත් ගති අවුස්සන පොත්. නමුත් ඒවා ඉතාම උසස් කෘතීන් හැටියටයි, ඔවුන් සලකන්නේ. අපේ පාසැල් ශිෂ්‍යයින්ට කියවන්න දෙන්නේ ඒවායි. දෙවන කොටස බෞද්ධ විරෝධී පොත්. බුද්ධාගම පරිභවයට ලක් කර, නැති නම් බුද්ධාගම එපා වන විධියට, ලියා ඇති පොත්. ඒවා ක්‍රමානුකූලව, හිතාමතා ලියන ලද ඒවා. තුන්වන කොටස සදාචාරයට පහර වදින ලෙස ඉදිරිපත් කර ඇති කරුණුයි.

මම පොත්පත් කිහිපයකින් කරුණු කීපයක් ඉදිරිපත් කරන්න කැමතියි. මේ සමහර පොත්පත්වලට සංස්කෘතික දෙපාර්තමේන්තුවෙන් තෑගි ලැබී තිබෙනවා. ඊට වගකියයුත්තා කවුදැයි මම පසුව කියන්නම්. මෙන්න, විශ්ව විද්‍යාලයේ කථිකාචාර්ය, සංස්කෘතික දෙපාර්තමේන්තුවේ ශිෂ්‍යත්ව තුන හතරක් ලබාගෙන පිට රට ගිය තැනැත්තකු වන සිරි ගුණසිංහ කියන තැනැත්තාගේ පොතක්. අභිනිෂ්ක්‍රමණය. මෙය කවි පොතක්. අළුත් තාලෙ කවි පොතක්. එය ලියා ඇති සම්ප්‍රදාය ගැන මම යමක් කීමට අදහස් කරන්නේ නැහැ. එය මෙතැනට අවශ්‍ය කරුණක් නොවෙයි. මෙහි තිබෙන කවි දෙකක් මම කියවන්නම්, මේවා කුණුහරුප. නමුත් ඒවා පාසල්වල උගන්වන නිසා, විභාග ප්‍රශ්න පත්‍රවලට එන නිසා, හැංගි හොරා කෙරෙන දෙයක් නොවන නිසා මම කියවන්නම්. මේ කවි තිබෙන්නේ අභිනිෂ්ක්‍රමණයේ.

"පාලු ලිදේ දියසෙවල ගොඩයි
ජීවිතයේ එය එකම සැපයි
බිහිවුනු හැටි ඔබ මේ කලු ලෝකෙට
යටි බඩ සුදු මිරිකා මිරිකා"

තවත් එකක් මෙන්න:

"වදෙන් පොරෙන් ඔබ ඇයිද බිහි වුණේ
පාලු ලිදේ පල් වතුර ගොඩේ
දුගඳ හමන මේ ජීවිතයේ
ඔබ ඇයිද බිහි උනේ"

තවත් එකක් ඒ පොතේම—

"හිත පිරිසිදු පිරිමියෙක්මි
පෙම් කළ මුත් අන් බිරියට"

විශ්ව විද්‍යාලයේ කථිකාචාර්යවරු උගන්වන්නෙ මෙහෙමයි. මෙහි ප්‍රතිඵල ශිෂ්‍යයන් අරගෙන තිබෙන්නෙ කොහොමද ශිෂ්‍යයින් මේක ධාරණය කර හොඳ සින්දු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

චකුත් හදා තිබෙනව. මම ඒ සින්දුවත් මේ ස්ථානයෙදි කියන්ට කැමතියි :

"බෝතලෙ බෝතලෙ බෝතලේ—
අප්පුව රජවුණ බෝතලේ—
"අම්මත් එපා මට තාත්තත් එපා—
බෝතලේ ඇත්නම් ගැනිත් එපා"
"දන්නෝ දනිති අපි—කොල්ලො තමායි
අර—ත්‍රෛලෝක පූජිත—වාසිටියේ"
"කොල්ලෝ සොයා යති—කෙල්ලෝ මුළාවෙති—
කඳුගැට අතරේ—හන්තානේ"
"බල්ලෝ මරා හරි—සල්ලි සොයා අපි—
විස්කි ගහන්නෙත් කෙල්ලො නිසයි"
"හැන්දෑ වෙලාවට—කෙල්ලො අරන් අපි—
යන්නෙ විනෝදෙට හන්තානේ"
"අනම් මනම් වානා—අපිට අරක්කු තමයි ඕනා—
අප්පට වැඩියෙ මේ පුතා—
විස්කිද බැන්ඩිද බී ඇත"

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගුරුවරයා කියන විට "පෙම් කළ මුත් අන් බිරියට" කියා, ගෝලයන් "බල්ලො මරා හරි—සල්ලි සොයා අපි—විස්කි ගහන්නෙත් කෙල්ලො නිසයි", "හැන්දෑ වෙලාවට—කෙල්ලො අරන් අපි—යන්නෙ විනෝදෙට හන්තානේ" කියන එක පුදුමයක් නොවෙයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සමහරවිට මේ උදවියට නම් අන් බිරියන්ට පෙම් කරන්ට පුළුවන්කම ඇති. ගුරුන්නාන්සෙලගෙ බිරියන්ටත් සමහරවිට පෙම් කරනව ඇති. පුද්ගලික ජීවිතයෙදි එහෙම කිරීම වෙනම ප්‍රශ්නයක්. මේක ලොකු දෙයක් හැටියට, තාත්වික දෙයක් හැටියට පෙන්නුම් කරන්ට ලැහැස්ති වෙනවා. ඒ කියන්නෙ කෙරෙන හැටියට පෙන්නුම් කරන්ට ඕනෑය කියා, ඒ අය අන් බිරියන්ට පෙම් කරන නිසා, අනුන්ගේ බිරියන්ට පෙම් කිරීම ඉතා හොඳ දෙයක් හැටියට අනික් අයටත් පෙන්නුම් කරන්ට හදනව.

මෙන්න තවත් එකක්. ඒක ගුණදාස අමරසේකර මහත්මයාගෙ "යළි උපන්නෙමි" කියන පොතේ තිබෙන්නෙ. මෙන්න එයින් එක පාඨයක් :

"එදින බුදුගෙය තුළ වූයේ අම්මාත් මාත් පමණකි. චචේම වූ පිළිමවලට වඳිමින් පැමිණි අම්මා සැතපෙන පිළිමය අසලට පැමිණ මුහුණ දෙ පතුල් මත ඔබා වැන්දාය. ඉක්බිතිව ඇ දෙ අත් දඹු දෙ පතුල් වටා යවා මුහුණ ඒ මත තබාගෙන බලා උන්නාය. ඇ එසේ උන්නේ මා ඒ අවට නොසිටියාක් වැනි හැඟුමකිනි."

"එවේලෙහි මා තුළ වූයේ එක්තරා ලජ්ජාවක් හා කෝපයකි. දිනක් දහවල් කාමරය තුළ නිදා උන් අම්මාගේ මුහුණ තාත්තා සිඹිනු මා දැක තිබේ. ඒ වේලෙහි මා තුළ ඇති වූ කැලඹීම හා ලජ්ජාව වැනි හැඟුමකි, මා තුළ මේ වේලෙහිද ඇති වූයේ.

අම්මා මා ගැන නොතකා මෙන් අතැනම රුඳු වූ මුහුණින් යුතුව උන්නාය. මා තුළ වූ කෝපය කොතරම්දයත් අසල වූ හිස් බෝතලය ගෙන බුදු රුවෙහි දෙ පතුල කුඩු වන සේ ගැසීමට මට සිතිණ. අම්මා එතැනින් නැගිට්ටේ කඳුලින් තෙත් වූ ඇසින් යුතුවය"

බුදුන් වදින්නට ගිය අම්මාගේ අත බුඩ රූපයේ ගෑවුනාය කියා මෙයින් පෙන්වන්න යන්නෙ ඉතා වනචර අශීලාචාර අදහසක්.

**පී. බී. බාලසූරිය මයා.** (ගලිගොමුව)
*(திரு. பீ. பி. பாலசூரிய—கலிகொமுவ)*
(Mr. P. B. Balasuriya—Galigomuwa)
තාත්විකකමක් එතැන නැහැ.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)
මෙතැන තාත්විකත්ත්වයක් නැහැ. මෙය මනඃකල්පිතයි.

**බාලසූරිය මයා.**
*(திரு. பாலசூரிய)*
(Mr. Balasuriya)
කුපාඩි තත්ත්වයක්.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)
ඔව්. කුපාඩි මනඃකල්පිත එකක්.

සිරි ගුණසිංහ මහතාගේ "මස් ලේ නැති ඇට" නමැති පොතේ එක ස්ථානයක් කියවන්ට කැමතියි. සංස්කෘතික දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂවරයකු වූත්, ගුවන් විදුලි දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරුන්ගේ හිටපු ප්‍රධානයා වූත්, දැනට අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයා වූත්, සංස්කෘතික කට යුතුවල යෙදෙන එක්තරා මහත්මයෙක් මේ පොතේ මා කියවන මේ කවිය ගැන ලොකු වර්ණනාවක් ලියා තිබෙනවා. ඔහුගේ නම පසුව කියන්නම්. මෙන්න මා කියවන්ට බලාපොරොත්තු වන කොටස.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කේ. එම්. පී. රාජරත්න මයා.]

"මඳ විවර අඳුරින් අඳුර වැලැඳින
අඳුරින් අඳුර; සෙලුවෙන් සෙලුව
සිසිල් නල කිහිරකට පමන ඉඩකොඳ
මිරිකි මොහොත මසින් මස
මැනික, ඔබ දෙතොල නොවතල
අඟලකුදු මා සිරුර කොඳ
කොඳ ඒ මිහිර ඒ උනුසුම
ඒ සෙලුව"

ලොකුම සමාජවාදියායයි කියන, ලොකුම සමාජවාදියකු ලෙස රුසියාවේ පවා ප්‍රසිද්ධියක් ඇති, මාර්ටින් වික්‍රමසිංහ මහතාගේ "උපන්දා සිට" නමැති පොතට සංස්කෘතික දෙපාර්තමේන්තුවෙන් ලොකුම තෑග්ගක් පිරිනමා තිබෙනවා. හොඳයි, ඒ පොතෙන් කොටසකුත් මා දැන් කියවන්ට කැමතියි

"සිය මවගේ හෝ සහෝදරියගේ සෙළු කයෙන් ඇබිත්තක් දැකීමෙන් දරුවන් සියයට අනූනව දෙනකුගේ යටි සිත්වල ඡායාමාත්‍ර කාම සංවේදනයක් හට ගැනේ යයි මම විශ්වාස කරමි."

මේක නම් මොන දර්ශනවාදයක් ඇයි මා දන්නේ නැහැ. අම්මගෙ දියරෙද්ද ගැන අප නම් හිතලවත් නැහැ. ඒ වගේම මෙහෙම දේවල් ගැන අප අහලවත් නැහැ. මේවා ගැන හිතන්ටත් අමාරුයි. අම්මලාගෙ අක්කලාගෙ දිය රෙදි ගැන අප නම් හිතන්නෙ නැහැ. මෙහෙම දේවල් හිතන්ට අමුතුම පසුබිමක් තිබෙන්ට ඕනෑ. පුදුම අමානුෂිකකමක් තිබෙන්ට ඕනෑ. මේ පොතේ 357 වැනි පිටුවේ මේ විධියට සඳහන් වෙනවා :

"ආයාවක ඇතැම් විට තොටිල්ලේ නිදන කුඩා දරුවාගේ රහසඟද හසුවන සේ පහළ කය අතගායි. කුඩා දරුවාගේ රහසඟ කෙළින් වෙයි."

මෙවැනි දේවල් අඩංගු මේ පොතට ආණ්ඩුවෙන් තෑගි පිරිනමා තිබෙනවා. ඒ වගේම මෙවැනි පොතක් ලියූ මාර්ටින් වික්‍රමසිංහ මහතාගේ ගෙය සාංස්කෘතික වස්තුවක් හැටියට අරගෙන තිබෙනවා. එංගලන්තයේ සිටි ෂේක්ස්පියර්ගේ ගෙය ඉංග්‍රීසි ආණ්ඩුව විසින් සාංස්කෘතික වස්තුවක් හැටියට ගත්තා වගේ තමුන්නාන්සේලාත් මේ මහත්මයාගේ ගෙය අරගෙන තිබෙනවා. මේ පොත සඳහා තෑගි පිරිනැමුණේ පසුගිය අවුරුද්දේද ඊට එහා අවුරුද්දේ දැයි මට මතක නැහැ.

**පී. බී. තෙන්නකෝන් මයා. (අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. ரி. பி. தென்னகோன்—கல்வி, கலாச்சார விவகார அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. T. B. Tennekoon—Parliamentary Secretary to the Minister of Education and Cultural Affairs)

මේවා ලියපු අයත්, භාර ගත්ත අයත්, හිටව පස් ගහන්න ඕනෑ. තෑගි දුන්න නම්, ඒ තෑගි දීමට කටයුතු කළ නිලධාරීන්ගෙන් ඒවා ආපසු ලබා ගන්න ඕනෑ.

**ඩී. එස්. සමරසිංහ මයා. (ප්‍රවාහණ කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. டி. எஸ். சமரசிங்க—போக்குவரத்து அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. D. S. Samarasinghe—Parliamentary Secretary to the Minister of Communications)

දඬත් සමග.

**කේ. එම්. පී. රාජරත්න මයා.**

*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*

(Mr. K. M. P. Rajaratna)

ඔව්, මේ රටේ ඉන්න උසස්ම විවේචකයා යයි කියන නැනැත්තා පොත් ලියල තියෙන්නෙ ඔය විධියටයි.

ඊළඟට ගුණදාස අමරසේකරගේ "අමල් බිසෝ" නමැති පොතේ මෙවැන්නක් සඳහන් වෙනවා.

"මූට නමක් තියාපියෝ—සැබියා යයි කියාපියෝ
මූට නමක් තියාපියෝ—හොර දෙටුවයි කියාපියෝ
මුගේ බරවේ—නව ගඳ එන්නේ
මූ කොහොමද එය—උසුලා ගන්නේ
මුගේ සෙළුව—කොතැනද බලපන්නේ
ඇඟට ගිලීලද—නැත අප දන්නේ
මැලිවෙලා එය—මැලවී ගොස්දෝ
උපන් ගෙයිම එය—නැති වී වත්දෝ"

**සිරිසේන මයා.**

*(திரு. சிறிசேன)*

(Mr. Sirisena)

ඕවා, ඔය අනුමත කළ පොත්ද ?

**කේ. එම්. පී. රාජරත්න මයා.**

*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*

(Mr. K. M. P. Rajaratna)

ඔව්, ඔව්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**සිරිසේන මයා.**
*(திரு. சிறிசேன)*
(Mr. Sirisena)
දෙයියෝ සාක්කි!

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

මං ඔය කිව්වෙ ටිකයි. තව හුඟක් තියෙනවා. නමුත් වෙලාව නැති නිසා ඒවා ඔක්කොම ගැන කියන්ට අදහසක් නැහැ. ආගමට පහර ගසන කොටස්, බෞද්ධා ගමට පහර ගසන කොටස් ඔය පොත්වල ඕනෑ තරම් තියෙනවා.

සිරි ගුණසිංහ මහත්මයගෙ "සෙවනැල්ල" නමැති පොතේ තිබෙන කොටසක් මා දැන් කියවන්ට කැමතියි:

"මේ වෙලාවට හාමුදුරුවො ඉන්නෙ මොකටද? තවම දහය වුනෙත් නැහැ. අම්මගේ වැඩක්. මේ හදන්නෙ තවත් බන ටිකක් කියවන්න. මං අහල තියන බන ඇති. බනේ තමයි මට ගහල තියෙන හෙනේ. හාමුදුරුවන්ට නිදා ගන්නෙයි කියනවා. බන, බන. යේසුස් වහන්සේ, ක්‍රිස්තුස් වහන්සේ. බුදුහාමුදුරුවො. අපොයි. නිර්වානේ. දෙයියන් වහන්සෙ. ඔලු ගෙඩිය. ලෝකෙ කන්නෙ උඹලා තමයි. මිනිස්සු පිස්සො කරන්නෙ. උඹලා තමයි. ගෙවල් දොරවල් හදනව වගේ අපායවල් හදල මිනිස්සු ඒවට අරින්නෙ උඹල තමයි. මේක අම්මගෙ වැඩක්. අහුඋනොත් විනාසයි. ලංවන්න ලංවන්න ලොකු වෙන කහපාට ජීනදාසට පෙනුනේ දහඅට සන්නිවලින් එකක් මෙනි. කිසිම හැඩක් රුවක් නැති කහපාට පව් කන්දක්. ඒ එන්නෙ දඬුවමක්ද?" (122 පිටුව)

අ. භා. 2.30

මෙන්න "අභිනික්මන" කියන පොතේ තියෙන තවත් එකක්:

"නයි, පොලඟුන්, පනුවන්
මෙන් පොලොවේ
මුනින් වැටීගෙන ඇඹරෙනවා;
දිගින් දිගට සැඳැහෙන් දඟලනවා
හොඹු හොඩ ඔක්කොම එකට දමාගෙන
කසල ගොඩක් වට පොරකන, දඟලන,
ඌරු රැලක් බලු රැනක් මෙන්
ගොරවනවා බුරමින් පනිමින් හපමින්"

මේ බුදුන් වඳින්න ගිය පිරිසක් ගැන කරන වර්ණනාවක්.

මෙන්න තවත් එකක්:

"ජයරත්නගේ කල්පනා ශක්තිය දියුණු තීයුනු වන්නේ අරක්කු වීදුරු තුනක් විතර අවසාන කලාට පසුය. ජීනදසගේ ධාරන ශක්තිය දියුණු වෙන්නේද එවිටය. සමහර විට අරක්කු වීදුරු දෙකක් පමන බිව් පසු ජීනදසට සුරාමේරය මජ්ජපමාදට්ඨානා... වේ. එහෙත් එය නිසරු මුසාවකැයි ඒ සමගම සිහියට නැගේ"

මෙන්න "ගඟ ළඟ බුදුරුව" කියන පොතේ බෞද්ධ දර්ශනය සම්බන්ධයෙන් ලියා තිබෙන හැටි:

"කකුලේ මඩ ගෑවේය බියෙන්
දෙපතුල උස්සා එරමිණිය ගොතන්
ගලනා දිය කඳ වෙත යොමා නුවන්
ඔබ ඉන්නේ දුකකින් නේද කියන්

ඒ මදිවට දැන් කියනව
අපිටත් ඒ කළුගල උඩ
අපේ කකුල් දෙක උස්සා
වාඩිවෙලා බලන් ඉන්න

කළු ගල උඩ වාඩි වෙලා
සුන්දර දිය කඳ නොබලා
පතුලේ ඇති මඩම බලා
මන් වාගේ ඉඳපල්ලා

මගෙ බුදුනේ අපිට එපා
කළු ගල් මත නැගී ඉන්න
අපි ආසයි මඩ ගාගෙන
ඒ නදියේ බැස කෙළින්න

සුවඳ සඳුන් හිස ගාගෙන
උපුල කමල ඇඟ ලාගෙන
හාදු දිදී වැළඳ ගන්න

අනිත්තියේ ලොම් ගියදා
දැත දෙපය පණ නැතිදා
අපිත් ඔහොම ගල් උඩ ඉඳ
අව්ව තපින්නට එන්නම්

අනිත්තියේ මස් නැති ඇට
කටේ දාන ලොඹු කර කර
හක්කෙන් හක්කට දාමින්
එතකොට බාවනා කරමු

එතකන් ආසයි අපි මේ
නදී පතුල කිමිද කිමිද
දෙපතුල්වල මඩ ගාගෙන

සුවඳ සඳුන් හිස ගාගෙන
උපුල කමල ඇඟ ලාගෙන
වැළඳ වැළඳ ආදරයෙන්
නදී ජලේ දිය කෙළින්න

නාකි වෙලා ලොම් ගියදා
අව්ව තපින්නට එන්නම්"

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේවා කියවන්ට ලැබෙන්නෙ අපේ පාසැල් ළමයින්ටයි. එයින් සිදු වන්නෙ මොකක්ද? අද තියෙන ඉහළම සාහිත්‍ය පොත් හැටියට මේව තමයි ගණින් ගන්නෙ. මේ සම්ප්‍රදාය පටන් ගෙන දැන් අවුරුදු කීපයක් වෙනව.

එපමණක් නොවෙයි. "රන්තෝඩු" නම් නාට්‍යයක් වේදිකා ගත කර තිබෙනව. අපේ මේ ගරු මුදල් ඇමතිතුමාත් එය බලන්න ගියා. එතුමා දන්නව ඒකෙ මොන වදු තිබුණෙ කියා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரி. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)
තමුන්නාන්සෙත් ඒක බලන්න ගියාද?

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)
නැහැ. මට ඔවා පිළිකුල්. ඒ නාට්‍යය වේදිකාගත කළාට පසු මහජනයාගෙ ඇස් ඇරුණා. එතනදීම ඒ නාට්‍යය ගැන මහජනයා පිළිකුල දැක්වූවා. "රන්තෝඩු" නාට්‍යය ගැන ගරු මුදල් ඇමතිතුමාත් පිළිකුල ප්‍රකාශ කර තිබුණා. ඒ ගැන අපි සන්තෝෂ වෙනවා. නමුත් මුදල් ඇමතිතුමාට කරන්ට තිබුණු යුතුකම නම් ඒ වෙලාවෙම ඒ වනචර නාට්‍යය නොබලා එළියට යන්නයි. දැන් ඒ නාට්‍යය තහනම් කර තිබෙන බව ආරංචියි. "රන් තෝඩු" නාට්‍යය තහනම් කළාට මදි. එම නාට්‍යය පෙන්වන්න ඉඩ දුන්න අය අද බේරෙන්න හදනවා. රෝයල් කොලීජියෙ ප්‍රධානාචාර්යවරයා හැටියට ඉන්න සුගතපාල මහත්මයත් මේ කල්ලියට අයිති—සරච්චන්ද්‍ර කල්ලියට අයිති—ප්‍රධාන පෙළේ කෙරුම් කාරයෙක්. මේ නාට්‍යය මණ්ඩලය අස් කරන්න ඕනැ. මේ නාට්‍ය මණ්ඩලය වහාම අස් කරන්නය කියල මා ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් ඉල්ලනවා. මෙවැනි කැත, නින්දිත, වනචර වැඩ කරන අය—

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரி. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)
බොහොම හොඳයි.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)
මීට ඉස්සෙල්ල තිබුණ "මූදු පුත්තු" කියල නාට්‍යයක්. එම නාට්‍යය ගැන මහා දීර්ඝ විවේචන පළ වුණා. එය ඉතා වැදගත්, අළුත් සම්ප්‍රදායයට අයිති එකක්‍ය කියල තිබුණ. නමුත් ඒක මේකට නොදෙවෙනියි. ඒ ගැන මේ තරම් විරෝධයක් ආවෙ නැහැ. එයට වර්ණනාව ආව නිසායි, මේ වර "රන් තෝඩු" නාට්‍යය ආවෙ. මේව ගැන සුදුසු පරිදි වැඩ කටයුතු කළොත්

නරකයි. අපි මේවට දොස් කියන්නෙ සංස්කෘතික දෙපාර්තමේන්තුවෙ මෙහෙය වීමෙන් කරන නිසයි. ඕනැ කෙනෙකුට ලියන්න නිදහස තියෙනවා. ලියන්න තියෙන නිදහස සීමා කරන්නය කියල අපි කියන්නෙ නැහැ. නමුත් වනචර දේවල් ලියනව නම් මොකද කරන්න වෙන්නෙ? මේ රටේ මහජනයගෙ රුචිය අපි දන්නව. ශිෂ්ඨත්වය නැති පිරිසක් මේ රටේ නැහැ. මේ රටේ ඉන්න ශිෂ්ඨ පිරිසක්. ආගම ධර්මය අනුව ගමන් කරන, ශිෂ්ඨත්වය තියෙන පිරිසක් මේ රටේ ඉන්නෙ. එම නිසා ඔය පොත් පත් යනව කුණු කූඩෙට. නමුත් මෙතන සිදු වෙන්නෙ මොකක්ද? ඒ අය පොත් ලියනවා. විභාගවලට දෙන ප්‍රශ්න පත්‍ර සකස් කරල තියෙන්නෙ, ඒ අය ලියන පොත්වලින්. එම නිසයි ඔක්කොම ළමයි ඒ පොත් කියවන්නෙ. ලංකාවෙ තියෙන හැම ස්කෝලෙකම ළමයි මේ පොත් කියවන්න ඕනැ. මේ පොත් කියෙව්වෙ නැතිනම් විශ්ව විද්‍යාලයට ඇතුළු වෙන්න බැහැ.

ගරු කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමනි, තමුන්නාන්සෙට මා පෙන්වන්නම් ප්‍රශ්න කීපයක්. "සාහිත්‍ය කොල්ලය" නමැති පොතේ මේක හොඳට විස්තර කරල තියෙනවා. පාර්ලිමේන්තු ලේකම්තුමා මේ පොත කියවල තියෙනවද? වංශනාථ දේශබන්ධු මහතාගෙ "සාහිත්‍ය කොල්ලය" කියවා බලන ලෙස මා එතුමගෙන් ඉල්ලනවා. මේ පොත කියවා බලා මෙහි සඳහන් කරුණු හොඳට ධාරණය කරගෙන මේ කරුණු පිළිබඳව එකින් එකට පරීක්ෂණයක් පවත්වන්නය කියල මා ආණ්ඩු පක්ෂයෙ අයගෙන් ඉල්ලා සිටිනවා. එසේ පරීක්ෂණයක් පවත්වා වැරදිකාරයන්ට හංවඩු ගසා ඔවුන් නිලතලවලින් පන්නා දමන්න ඕනැ. මේ පොතේ එක තැනක පෙන්න දීල තියෙනව ප්‍රශ්න දෙන හැටි. සරච්චන්ද්‍ර කල්ලියෙ පොත් පිට කරන්න පටන් ගත්ත දවසෙ ඉඳල විශ්ව විද්‍යාල ප්‍රවේශ පරීක්ෂණයෙ ප්‍රශ්න පත්‍රවලින් කියනව මේ කල්ලියෙ මිනිසුන්ගෙ පොත් පිළිබඳ විවේචන කරන්නය කියල. සරච්චන්ද්‍ර නමැති කුණුහරුපවාදියාගෙ පොත්වලින් කුණුහරුප උපුටා ගෙන සඳහන් කරල තියෙනව, එම ප්‍රශ්න පත්‍රවල. ඒවට උත්තර ලියන්න වෙනව විභාගාපේක්ෂකයන්ට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අද ලංකා විශ්ව විද්‍යාලයට යන්න වුවමනා නම්, "සිංහල" විෂයයක් හැටියට සමත් වෙන්න වුවමනා නම්, මේ සරච්චන්ද්‍ර කල් ලියෙ කුණුහරුප පොත් කියවන්න ඕනෑ. කුණුහරුප පොත් විතරක් නොවෙයි, එයාගෙ නාට්‍ය බලන්නත් ඕනෑ. කුණු හරුප පොත් විතරක් කියවල මදි. රන් තෝඩුත් බලන්න වෙයි, අනික් අවුරුද්දෙ ප්‍රශ්න පත්‍රවලට උත්තර දීම සඳහා සැර සෙන්න. මම පෙන්නුම් කරන්නම් සරච් චන්ද්‍ර උන්නැහෙගෙ නාට්‍යවලින් දී තිබෙන ප්‍රශ්න. ඒව තමුන්නාන්සෙ දැක් කොත් පුදුම වෙයි, මෙහෙමත් කොල්ල යක් තියෙනවද කියල.

"සාහිත්‍ය කොල්ලය" නමැති පොතේ 137 වන පිටුවෙ පාඨ 5ක්—අ, ආ, ඉ, ඊ, උ යනුවෙන් පාඨ 5ක්—පෙන්නුම් කරල තියෙනව. මෙම පාඨ 5 ප්‍රශ්න පත්‍රයකින් උපුටා ගන්නා ලද ඒවායි. මෙම පාඨ 5ම අරගෙන තියෙන්නෙ එයාගෙ "මනමේ", "පබාවතී" වැනි නාට්‍යවලිනුයි. මේ ප්‍රශ්න වලට උත්තර ලියන්න නම් එම නාට්‍ය බලන්න ඕනෑ. එසේ නැති නම් එම නාට්‍ය සම්බන්ධයෙන් ලියා පළ කර තිබෙන පොත් කියවන්න ඕනෑ. එසේ නොකළොත් විභාගයෙන් සමත් වන්න බැහැ. මේක මහ ලොකු කොල්ලයක් ; දූෂණයක්.

මේ පොතේ තවත් දෙයක් විස්තර කරල තියෙනව. සරච්චන්ද්‍ර තමයි,—එදිරිවීර සරච්චන්ද්‍ර තමයි—මේ ලොකු කුණුහරුප වාදිය. "මනමේ" නමින් මෙයා නාට්‍යයක් බිහි කළා. එම නාට්‍යය පිළිබඳව ලංකා ගුවන් විදුලි සේවයෙන් විවේචනයක් දුන්න. ලංකා ගුවන් විදුලි සේවය මගින් කරන ලද ගුණදොස් විවේචනයකින් කියල තියෙනව නාට්‍යය බොහොම හොඳයි කියා. මේ විවේචනය අසා සිටි කෙනෙක් ඊට විරුද්ධව පැමිණිල්ලක් කළා. මොකක්ද ඒ පැමිණිල්ල? ඒ පැමිණිල්ල ඉදිරිපත් කළ නැනැත්තා කියා සිටියෙ සිරි ගුණසිංහ මහත්මයා ඔය විවේචනය දුන්නට මොකද ඇත්ත වශයෙන්ම එය ලියා දුනනෙ සරත්චන්ද්‍ර බවයි. ඒ සම්බන්ධ යෙන් පරීක්ෂණයක් කරන ලෙස ඉල්ලූ නිසා පරීක්ෂණයකුත් තිබුණා. ඒ පරීක්ෂණ යෙදී පුදුම කරුණක් එළිවෙලා තියෙනව. ඒ ගුණසේස් විවේචනය ලියාපු කොළයේ ඡායාරූපයකුත් මේ මා ළඟ තිබෙන පොතේ දමා තිබෙනව. ලියවිල්ලෙ ඡායාරූප පිටපත බලන ඕනෑම කෙනෙකුට පෙනේවි ලියවිල්ලෙ අත් අකුරු එදිරිවීර සරත්චන්ද්‍ර උන්නැහෙගෙ අත් අකුරු බව. ඒ පරීක්ෂණ යෙදි ඔප්පු වුණා එදිරිවීර සරත්චන්ද්‍ර උන්නැහෙ තමන්ගෙ අත් අකුරින්ම ලියා දුන් විවේචනයක් එයාගෙ ගෝලයකු වන සිරි ගුණසිංහ ලංකා ගුවන් විදුලි සේවා කාර්යාලයට අරන් ගිහිල්ල ගුවන් විදුලි යෙන් ප්‍රචාරය කර තිබෙන බව. එය ඉතාම දක්ෂ ලෙස පිළියෙල කරන ලද නාට්‍යයක්ය කියලයි ගුවන් විදුලියෙන් ප්‍රචාරය කර තිබෙන්නෙ. ලියමනේ ඡායාරූපය මෙන්න මා ළඟ තිබෙනව.

"සාහිත්‍ය කොල්ලය" නමැති පොතේ 45 වැනි පිටුවෙ ගුණසිංහගේ එම විවේචනය පිළිබඳව ලියා එවූ අත් පිටපත ගැන පරීක්ෂණයක් පවත් වන ලද බවත් සඳහන් කරන එල්. එම්. ඒ. සිල්වා තව දුරටත් "විචාර විවරණ" යෙන් මෙන්න මේ අන්දමට කියන බව සඳහන් කර තිබෙනව :

> "පළ කරන ලද විරෝධයේ ප්‍රතිඵලයක් වශයෙන් ඉහත කී විවේචනය සම්බන්ධයෙන් පවත්වන ලද කිසියම් පරීක්ෂණයකදී හෙළි වුණේ කුමක්ද? 'මනමේ' නාටකය සම්බන්ධව පුන පුනා වන වණ අනෙක් නාඩගම්වල අඩුපාඩු පෙන්න පෙන්නා කෙරුණු මේ විවේචනයේ අත් පිටපත නිරීක්ෂණයට කැපකොට බැලුවත්ට පෙනී ගියේ කුමක්ද? යථෝක්ත විවේචනය 'මනමේ' නාටකයේ නිර්මාතෘ වරයා විසින්ම නිර්මාණය කර ඇති බවය. 'මනමේ' කාරයාම 'මනමේ' නාඩගමට විවේචනයක් ලියා තිබෙන බවය. සිරි ගුණසිංහයන් එය ගුවනින් ප්‍රචාරයට පත් කළ නමුදු මනමේ නිෂ්පාදක සරච් චන්ද්‍රයන් විසින් මෙම විවේචනය තමාගේ අත් අකුරින්ම ලියා ඇති බවය."

මේක ලොකුම දූෂණයක්, වංචාවක්. මේකට සල්ලිත් ගෙවන්න ඇති අඩුම ගණ නේ රුපියල් සීයක් දෙසීයක්වත්. අනුමාන යක් නැතුව මේ වැඩේට රුපියල් සීයක් දෙසී යක් සල්ලි ගන්න ඇති. මට මෙන්න මේක කියන්න පුළුවනි. මේ සරච්චන්ද්‍ර කියන මිනිහ විශ්ව විද්‍යාලයේ මහාචාර්යයකු හැටියට ඉන්න එක ලොකු ලජ්ජාවක්. කණෙන් ඇදල දෙට්ට දමන්න ඕනෑ විශ්ව විද්‍යාලයෙන්. ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ උසස් තනතුරක යෙදී ඉඳගෙන අපේ රටේ තරුණ පරම්පරාව විනාශමුඛයට දමන්න හදනව. එයා එතන විනයාචාර්යවරයකු හැටියටයි අද ඉන්නෙ. වෝඩ්න් ඔෆ්ප්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කේ. එම්. පී. රාජරත්න මයා.]

ඩිසිප්ලින් හැටියට ඉන්න තියෙන සුදුසුකම මොකක්ද? හොඳ විනයක් එයාට තියෙනව. පළමුවන පෙළේ විනයක් එයාට තියෙනව. මහාචාර්යවරයන් අයින් කරන්න බලයක් ආඥපනතේ හැටියට ගරු අධ්‍යාපන ඇමතිවරයට නැති බව මාත් දන්නව. ගරු පාර්ලිමේන්තු ලේකම්වරයට ඒ ගැන බලයක් නැති එකත් ඇත්තයි. ඒ වුණත් මා කියන දේ ගරු ඇමතිතුමාට දන්වන්න එතුමට පුළුවන් වේය කියා මා විශ්වාස කරනව. මෙවැනි උදවිය විශ්ව විද්‍යාලයේ හිටවගෙන මේ රටේ තරුණ පරම්පරාව නොමග යවනව නම් විශ්ව විද්‍යාලයට එහි නඩත්තුව සඳහා දෙන මුදල දෙන්නෙ නැහැ කියන්න ඕනෑ. ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාගෙ අදහස කුමක්දැයි කියන්න මා දන්නෙ නැහැ. බලය නැති වුණත් ගරු ඇමතිතුමා එතුමගෙ බලය පාවිච්චි කරන්න ඕනෑ.

මේ මිනිහ—සරත්චන්ද්‍ර—මොනවද කරන්නෙ? සිංහල ප්‍රශ්න පත්තර බලනව. විශ්ව විද්‍යාල ප්‍රවේශ පරීක්ෂණයට පෙනී සිටින ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගෙ සිංහල උත්තර පත්‍ර බලනව. උත්තර පත්‍ර කියවා බලන පරීක්ෂකවරුන්ගෙන් බලාපොරොත්තු වෙනව තමන් කියවා බැලූ උත්තර පත්‍ර සම්බන්ධයෙන් පරීක්ෂක වාර්තාවක්. පරීක්ෂකවරුන් ඉදිරිපත් කරන වාර්තා භාර ගැනීමට මණ්ඩලයකුත් තියෙනව. ඒ මණ්ඩලයට වාර්තාවක් යැවීමේ සිරිතක් තියෙනව. හැම පරීක්ෂකවරයම ඒ මණ්ඩලයට වාර්තාවක් සපයන්න ඕනෑ. ඒකයි විභාග සම්බන්ධයෙන් තිබෙන සිරිත. ඉතින් නොයෙක් කරුණු ඒ වාර්තාවල අඩංගු කිරීම පරීක්ෂකවරුන්ගෙ සිරිත. සමහර අය උත්තර සැපයූ ආකරය ගැනත්, තවත් සමහරු ශිෂ්‍යයින්ට උගන්වා තිබෙන අන්දම ගැනත්, තවත් සමහරෙක් ලියූ උත්තරවල අඩංගු කරුණු ගැනත් අඩුපාඩු තිබෙනව නම් ඒවත්, වෙනත් කියයුතු දේවල් තිබෙනව නම් ඒවත් තමන්ගෙ වාර්තාවල අඩංගු කරනව. මෙයාගෙ වාර්තාවල මොකක්ද තියෙන්නෙ? සමන් මුද්‍රණාලයේ පොත් පත් මේ ළමයි කියවලා නැහැ තවම කියලයි එයා කියන්නෙ. මහරගම තිබෙන සමන් මුද්‍රණාලයේ තමයි ලංකාවේ තිබෙන කුණුහරුප පොත් මුද්‍රණය කරන්නෙ. ආසියා පදනම හෙවත් ඒසියා ෆවුන්ඩේෂන් කියන ඇමෙරිකානු ආයතනයෙන් ඊට ආධාර එනව. විභාගයට පිළිතුරු ලියන ළමයින් තවම සමන් මුද්‍රණාලයෙන් පිට වන පොත් කියවන්නෙ නැත කියන එකයි මෙයාගෙ වාර්තාවල නිතරම පාහෙ සඳහන් කරන ලොකුම කාරණය. එය ඇමරිකන් ප්‍රචාරක කටයුතු ගෙන යන මධ්‍යස්ථානයක්. නමුත් අනික් ආයතන එසේ නොවෙයි. අනික් ප්‍රකාශන ආයතනවල අඩුපාඩුකම් නැත කියා මම කියන්නෙ නැහැ. නමුත් ඒ අයට නම්බු දීමක් වශයෙන් මම කියන්න කැමතියි, ඔය ගුණසේන ආදි ප්‍රකාශන ආයතනවලින් කවදාවත් එකම එක කුණුහරුප පොතක්වත් පිට කරන්නෙ නැති බව. ඒ අය කුණුහරුප පොත් භාර ගැනීමට බැහැ කියනව. ඊ ළඟට යන්නෙ කොහාටද? සමන් මුද්‍රණාලයට. සරච්චන්ද්‍ර උන්නැහෙ විශ්ව විද්‍යාලයට කියනව, සමන් මුද්‍රණාලයෙ පොත් කියවන්නය කියා. ඒ මොකද? ඒකෙ මුද්‍රණය කරන්නෙ සරච්චන්ද්‍ර කල්ලියෙ ගෝලයින්ගෙ පොත් නිසා.

අ. භා. 2.45

සරච්චන්ද්‍ර කියන පුද්ගලය සමන් මුද්‍රණාලයෙන් පඩි ගන්නව. කොහොමද? පොතක් මුද්‍රණය සඳහා භාර ගැනීමේදි එය මුද්‍රණයට සුදුසුද නැද්ද කියා පරීක්ෂා කර බැලීමට මණ්ඩලයක් පත් කරනව. ඒ මණ්ඩලයෙ ප්‍රධානයා තමයි සරච්චන්ද්‍ර. පොතටත් ගණනක් ලැබෙනව. වෙනම පඩියකුත් ලැබෙනව. මට අමතක වෙන්න කලින් සමන් මුද්‍රණාලය ගැන තවත් කරුණක් කියන්න ඕනෑ. අද සමන් මුද්‍රණාලයෙ පාලක මණ්ඩලයෙ ප්‍රධානය එන්. ඊ. වීරසූරිය මහතායි. එහි වැඩ කටයුතු සීමා වී තිබෙන්නෙ එයාගෙ පවුලට පමණයි. සේවකයින්ගෙ නොයෙකුත් අඩුපාඩුකම් තිබෙනව. හරියට පඩි ගෙවන්නෙ නැහැ. ඒ සේවකයන්ට හරි සේවා තත්ත්වයක් නැහැ. ඔවුන් තුළ ලොකු කලකිරීමක් තිබෙනව. කොට්ටාවෙ ගරු මන්ත්‍රීතුමා ඒ ගැන කරුණු හොඳින් දන්නව ඇති. ඒම නිසා එතුමා ඒ ගැන සභාවට කියාවි.

කුණුහරුප පොත් මුද්‍රණය කරන එකම මුද්‍රණාලය සමන් මුද්‍රණාලයයි. ඇප් උප ඇමතිතුමත් පෙන්නුම් කරන්න හදනව, කුණුහරුප කල්ලියට විරුද්ධයි කියා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එහෙම නම් මෙන්න මේ කරුණ ගැන හොඳින් සිත යොමු කරන ලෙස මම එතුමාගෙන් ඉල්ලනවා. එය මේ කුණුහරුප කල්ලියට ගසන මරු පහරක්. එය මුලින් උදුරා දැමීමක්. ඒ මොකක්ද? දැන් සංස්කෘතික දෙපාර්තමේන්තුවට මුද්‍රණාලයක් අවශ්‍යයි. පොත් පත් ලියන නමුත් මුද්‍රණය කරවා ගන්න බැරි, ප්‍රසිද්ධ කරවා ගන්න බැරි, අලෙවි කර ගන්න බැරි, අපේ උප ඇමතිතුමා වැනි දුප්පත් සාහිත්‍යධරයෝ අද රටේ ඉන්නවා. ඒ අයගෙ පොත් අද මුද්‍රණකර ගන්න පිළිවෙළක් නැහැ. එම නිසා ඒ අයට උපකාර කිරීමක් වශයෙනුත්, ආණ්ඩුවේ කටයුතුවලට උපකාරයක් වශයෙනුත්, සමන් මුද්‍රණාලය සංස්කෘතික දෙපාර්තමේන්තුවට ගන්නය කියා මම ඉල්ලා සිටිනවා. මම සන්තෝෂ වෙනවා උප ඇමතිතුමා ප්‍රීතිය ප්‍රකාශ කරමින් අත් පොළසන් දීම ගැන. එසේ නම් කොහොම හරි මේ අවුරුද්ද අවසාන වෙන්නට කලින් එය කරන ලෙස මම ඉල්ලනවා.

මේකයි සාහිත්‍ය කොල්ලය. එදිරිවීර සරච්චන්ද්‍ර, සිරි ගුණසිංහ, ගුණදාස අමරසේකර වැනි අයගෙ සාහිත්‍ය කොල්ලයයි මේ. ගුණදාස අමරසේකර ගැන තවත් කාරණාවක් කියන්න තිබෙනවා. මම දැක්ක දැන් මාස තුන හතරකට උඩදී ඔය කුණුහරුප ලියන එක්කෙනා කථාවක් පවත්වමින් කියා තිබෙනවා, බුත්සරණ, අමාවතුර, ආදි පොත් පුච්චන්න ඕනෑය කියා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
එයා ඒව කියවන්න නැතුව ඇති.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)
එයා මේ කුණු හරුප කට්ටියෙ ප්‍රධානයෙක්, නොම්මර එකේ තැනැත්තෙක්. සංස්කෘතික දෙපාර්තමේන්තුවෙන් නොයෙකුත් සංස්කෘතික කටයුතුවලට ආධාර දෙන "ආට්ස් කවුන්සිල්" නමැති කලා මණ්ඩලයෙ ඉන්නෙත් මේ අයයි. මම උප ඇමතිතුමාගෙන් අහන්න කැමතියි—නිලධාරින් සිටින නිසා අසා බලන්න පුළුවනි—සිරි ගුණසිංහ කියන එක්කෙනා

ශිෂ්‍යත්ව කීයක් දී තිබෙනවද කියා. පර්යේෂණයක් කරන්නය කියා රුපියල් දහ පහළොස් දාහක ශිෂ්‍යත්වයක් දුන්නා. පර්යේෂණය කොහොම වුණත් පිටරට ගිහිල්ල රවුමක් ගහල ආවා. හැබැයි, එයා සරච්චන්ද්‍රගෙ ගෙදර නම් පර්යේෂණයක් කරනවා සරච්චන්ද්‍ර ගෙදර නැති වෙලාවට.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
ඒ මොකක්ද?

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)
ඒක තමයි මම කිව්වෙ "අන් බිරියට පෙම් කිරීම සුදුසුය" කියන පොත ගැන. ඒක තමයි දර්ශනය. ඇයි, හරි. තාත්වික වාදය ගැනනෙ ලියන්නෙ. ඒක තමයි තාත්වික වාදය. කරන දේ ලියනවා. ලියන දේ කරනවා. මම උප ඇමතිතුමාට කියනවා, කරුණා කර ඔය සිටින නිලධාරීන්ගෙන් අහන්න, මේ කල්ලියෙ මිනිසුන්ට සංස්කෘතික දෙපාර්තමේන්තුවෙන් කොපමණ මුදල් දී තිබෙනවද කියා. මේ රටේ ලොකුම සංස්කෘතික කරුවා හැටියට පෙන්වන්නෙ එදිරිවීර සරච්චන්ද්‍රයි. ගුවන් විදුලියෙත් ඉන්නවා; කලා මණ්ඩලයෙත් ඉන්නවා; නාට්‍යයක් බලන්න ගියත් ඉන්නවා; අරකෙත් ඉන්නවා; මේකෙත් ඉන්නවා. කක්කුස්සි අස්සට ගිහින් බැලුවත් කවුද ඉන්නෙ? සරච්චන්ද්‍ර. මේ අසභ්‍යවාදය බෝ කළ, අසභ්‍ය වාදයේ පීතෘවරයාත්, එයාගෙ ගෝලයනුත්, කල්ලියේ අයත් අපේ සංස්කෘතික වැඩ කටයුතුවලට සම්බන්ධ කර නොගෙන, මේ අය සියලු දෙනාම තුරන් කර දමන ලෙස මේ අවස්ථාවේදී මම තමුන්නාන්සෙගෙන් ඉල්ලා සිටිනවා. හැබැයි, පාර්ලිමේන්තු ලේකම්තුමා මේ ගරු සභාවේදී ඒ ගැන අත්පොළසන් දීමෙන් පමණක් සෑහෙන්න බැහැ. හෙට සාහිත්‍ය දිනය පටන් ගන්නවා. ඔබතුමා දන්නවද මේ සාහිත්‍ය දිනය ආරම්භයේදී කථා කරන්න ඉන්න කවිකයන් කව්ද කියා? තමුන්නාන්සෙගෙ දැනගැනීමට මම ඒ අයගෙ නම් කියවන්නම්: ඒ. ජේ. ගුණවර්ධන, සරත් අමුණුගම, සිරි ගුණසිංහ, හේමපාල

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කේ. එම්. පී. රාජරත්න මයා.]

විජේවර්ධන, සුගතපාල ද සිල්වා යන අයයි කථා කරන්නෙ. මෙයට පසුව කථා කිරීමට තවත් තුන් දෙනකු සිටින බව සඳහන් වෙනවා. ඒ ගරු පාර්ලිමේන්තු ලේකම් තුමා කථා කළාට පසුව කථා කරන අයයි. මේ සියලු දෙනාම කවුද? මේ හැම දෙනාම සරත් චන්ද්‍රගෙ කල්ලියේ මිනිස්සු. සරත් චන්ද්‍රගෙ කල්ලියේ මිනිසුන් සාහිත්‍ය දිනයේදී කථාවල් පවත්වනවා. එම නිසා මා තමුන්නාන්සෙගෙන් ඉල්ලා සිටිනවා, ආණ්ඩුව ආධාර දී මෙය පවත්වනවා නම් මේ සියලු දෙනාගේම නම් ටික කපා දමා, ආණ්ඩුව මගින් වැඩ කටයුතු ගෙන යන ලෙස. මේ අයට කථා කරන්න ඉඩ දෙන්න එපා. මහජන පිළිකුල, අප්‍රසාදය, පළ කරන්න ඕනෑ. ගරු පාර්ලිමේන්තු ලේකම් තුමා මේ අදහස් පිළිගන්නවාද? එසේ නම් මේ වැය ශීර්ෂය අවසාන වෙන්නට පෙර මේ ගැන පොරොන්දුවක් දෙන ලෙස ඉල්ලා සිටිනවා. මේ කුණුහරුප වාදය බෝ කරපු මිනිසුන්ට කථා කරන්න දෙන්න එපාය කියන එකේ තේරුම මොකක්ද? අනුග්‍රහය දෙන්න එපාය කියන එකයි. මේ අයට අනුග්‍රහය දැක්වීමෙන් රජය ඒ පුද්ගලයන් සාහිත්‍යධරයන් ලෙස පිළිගෙන ඇති බවයි හැඟෙන්නෙ. එහෙම නැතුව පෞද්ගලිකව බල පාන කරුණක් නිසා නොවෙයි මේ අන්දමට කථා කරන්නෙ. රජයේ ආයතනයකින්, රජයේ ආධාර දෙන තැනකින්, මෙබඳු පුද්ගලයන්ට කථා පැවැත්වීමට ඉඩ දීමෙන්, ඒ අයට උසස් තැනක් දීමෙන්, මෙවැනි අයට රජයෙන් උපකාර කරන බව හැඟී යාමෙන් ඒ අය ගේ තත්ත්වය තව තවත් තහවුරු වෙනව. එම නිසා මේ පිරිසට කථා පවත්වන්නට ඉඩ නොදෙන ලෙස මා තමුන්නාන්සෙ ගෙන් ඉල්ලා සිටිනවා. ඇත්ත වශයෙන් මේ පිළිබඳව ස්ථිර වචනයක් ඕනෑ කරන නවා. ගරු සභාපතිතුමනි, මේ රටේ වෙනත් සාහිත්‍යධරයන් සිටිනවා. හැබැයි, ඒ උදවිය දුප්පත්. නමුත් යමක් කමක් ලියන්න පුළුවන් උදවිය. පොත් පළ කර ගන්න බැරි වුණත් මේ අය හොඳ සාහිත්‍යධරයන්. ඒ මිනිසුන් සොයා ඒ අයට කථා කරන්න දෙන්න. එහෙම නැති නම් තමුන්නාන් සෙලා කථා කරන්න. අපේ ඇති වරදක් නැහැ. නමුත් මේ කුණුහරුපකාරයන්ට නම් කථා කරන්න ඉඩ දෙන්න එපා.

ඊළඟට අපි අනික් අංශය ගැනත් කල්පනා කර බලමු. මෙවැනි පුද්ගලයන්ට ආණ්ඩුවෙන් උදව් දෙන්නේ කවුද? ආණ්ඩුවෙන් උදව් දෙන පුද්ගලයාගේ නම මම කියන්නම්. සභාපතිතුමනි, මේ අයගේ ආරම්භයේ පටන් අද වන තුරුත් මේ අයට උදව් දෙන්නෙ, ආණ්ඩුවේ ප්‍රධාන තැනක සිටින, මර්මස්ථානයක සිට උදව් දෙන, එම්. ජේ. පෙරේරා කියන සිවිල් නිල ධාරියායි. මේ පුද්ගලයා ගුවන් විදුලි සේවයේ පාලන අධ්‍යක්ෂක වශයෙන් කටයුතු කළා. ඒ කාලයේදීත් මේ කල්ලියට යටවෙලා, ඒ අයට උදව් කළා. සංස්කෘතික දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක වශයෙන් සිටි කාලයේදීත් මේ කල්ලියට උදව් උපකාර කළා. හැම මාර්ගයකින්ම මේ අයට උදව් උපකාර කළා. අද ඉන්නවා, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් වශයෙන්. එතැන ඉන්නෙ මොකද? ඒ මහත්මයාගෙ සහෝදරය ස්ථාවර ලේකම් වශයෙන් ඉන්නවා. දැන් මාරුවුණු හැටියේම ස්ථිර ලේකම් වෙන්නෙ. හරියට නරියට බොක්ක හෝදන්න දුන්න ටත් වඩා දරුණුවට හිටියි. කුණුහරුප වාදයට අනුබල දුන් මේ පුද්ගලයා අද මර්මස්ථානයක ඉන්නෙ. සංස්කෘතික දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක වශයෙන් සිටි කාලයෙදි කොයි අන්දමේ වැඩ පිළිවෙළක්ද ගෙන ගියේ?

ගරු සභාපතිතුමනි, මේ සම්බන්ධයෙන් වැදගත් කාරණයක් තමුන්නාන්සෙට මතක් කර දෙන්නම්. දැනට අවුරුද්දකට පමණ උඩදී පැවැත්වුණු ආණ්ඩු පක්ෂයේ එක්තරා රැස්වීමකදී කෑස්බෑවේ මන්ත්‍රීවරයා (සෝමවීර චන්ද්‍රසිරි මයා.) "යළි උපන්නෙමි" නැතිනම් "හෙවනැල්ල" කියන පොතකින්—මේ පොත් දෙකින් කොයි පොතද කියා හරිහැටි මතක නැහැ—උපුටා ගත් කොටසක් කියවා තිබෙනවා. ඒ අවස්ථාවෙදි මූලාසනය ගෙන හිටියෙ ගරු අගමැතිණිය යයි මම හිතනවා. මට ආරංචියි මේ පොතෙන් උපුටා ගත් කොටස් කියවන විට අගමැතිණිය කන වසාගත් බව. ගරු අගමැතිණිය, අධ්‍යාපන අධ්‍යක්ෂකවරයාට නියෝග කර තිබෙනවා, මේ පොත තහනම් කරන්නට, නමුත් මේ වන තෙක් තහනම් කර නැහැ. මේ පොත ඉස්කෝලවල භාවිතයට අධ්‍යාපන අධ්‍යක්ෂතුමා තහනම් කරන කොට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සංස්කෘතික දෙපාර්තමේන්තුවෙන් දන්වා එවා තිබෙනව, මේක ඉතා උසස් සාහිත්‍ය කෘතියක්ය කියා. අදත් මේ පොත එදා වාගේම භාවිතා කරනවා. තවමත් පාසැල්වලින් මේ පොත ඉවත් වී නැහැ. ඒ පොත පාසැල් ළමයින් කියවන්න ඕනැ, විශ්ව විද්‍යාල ප්‍රවේශ විභාගයේදී ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමට. තමුන්නාන්සේට වුවමනා නම් ඒ පොතින් සකස් කළ ප්‍රශ්න ඇතුළත් ප්‍රශ්න පත්‍ර ගෙනත් පෙන් වන්න පුළුවන්. ගිය අවුරුද්දේදීත් ඒ පොත්වලින් ප්‍රශ්න ආවා.

කව්ද මේව කරන්නෙ? එම්. ජේ. පෙරේරා මහත්මයා. හොඳට මතක තියා ගන්න නම. මේ හැම දේකටම වග කියන්න ඕනැ. මේ නෑගි දීමට—කුණුහරුප පොත් ඉතා උතුම් සාහිත්‍ය කෘතීන් හැටි යට නම් කරල අවුරුද්දක් ගණනෙ නෑගි දෙන්න උනන්දු කිරීම ගැන—වග කියන්න ඕනැ, එම්. ජේ. පෙරේරා මහත් මයයි. මේ පොත කියවන්න මට වෙලා නැහැ. ඇත්ත වශයෙන්ම මේ පොත හැන්සාඩ් වාර්තාවට ඇතුළත් වන්න ඕනැ. එම්. ජේ. පෙරේරා මහත්මයා සාහිත්‍ය කොල්ලයට දුන් උපකාර මේ පොතේ මනා ලෙස විස්තර කරල තියෙනව. මම දැනගන්න කැමතියි මෙවැනි නැනැත් තකු අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ යේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් හැටියට පත් වී සිටිද්දී මේ සාහිත්‍ය කොල්ලය නතර කරන්නෙ කොහොමද, කියා. මේ නිලධාරියා සම්බන්ධයෙන් එක ඉල්ලීමක් මම කරන්න කැමතියි. සිවිල් සේවයේ හෝ පරිපාලන සේවයේ හෝ ඕනෑම තැන කට මේ නිලධාරියව පත් කළාට කමක් නැහැ, සංස්කෘතික වැඩ පිළිබඳව තියෙන එකම තැනකවත් උසස් නිලධාරියකු හැටි යට මේ මහත්මයා තියන්න එපා. එහෙම තිබ්බොත් කවදාවත් කුණුහරුප වාදය නතර කරන්න පුළුවන් වෙන්නෙ නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා මේවා ගැන නොදන්නෙ නැහැ, දන්නව. එතුමා මේව ගැන කථා කරල තියෙනව. නමුත් කථා කළාට මදි. ඇමතිතුමාගෙ පිට කොන්දට ඉන්ජෙක්ෂන් එකක් වත් දීල—බෙහෙත් ටිකක්වත් දීල—මේ නිලධාරියා වහාම ඉවත් කරන්න ඕනැ. මේ නැනැත්තා ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් පදවියේ සිටීම ලොකු තර්ජන යක්; බොහොම භයානක දෙයක්. ඔහු ඉවත් කිරීම කොහොම හරි කරන්න ඕනැ. මේ වැය ශීර්ෂය පිළිබඳ සාකච්ඡාව අවසාන වන්න පෙර අපට ඒ පිළිබඳවත් උත්තරයක් ඕනැ

මේ පොතේ තව කෑල්ලක් මම කිය වන්න කැමතියි. මේ පොතේ අන්තිම පිටුවෙ මෙහෙම තියෙනව:

"ජාතියක් වැනසීමේ ඉතාම සාර්ථක ක්‍රමය වූකලී තරුණ පරපුරේ ජාති මමත්වයත්, දේශ වාත්සල්‍යයත්, ගුණ ගරුක භාවයත්, ආගමික භක්තියත්, වැඩිහිටියන්, කුල දෙටුවන් පිදීමේ පුරුද්දත් විනාශ කර දැමීමය. හන්තාන කල්ලියේ තුප්පහින් විසින් අනුගමනය කරනු ලබන්නේ ද සිංහල ජාතිය එබඳු විනාශයට පත් කර ලීමේ සැහැසි ක්‍රියා මාර්ගයකි. මේ බව අපේ රජයටත්, විශ්ව විද්‍යාල තුනේ පාලකයන්ටත් කල් ඇතිව පෙනු නොත් එය ජාතියේ භාග්‍යයකි."

අද මොකක්ද මේකෙ ප්‍රතිඵලය? මේ ළමයි මේ පොත් කියවනවා. මම දැක්ක තවත් පොතක්. කතෘවරයගෙ නම මට මතක නැහැ. පොතේ නම: "පාසැල් ගුරුවරියට පෙම් පුවතක්". මේ පොත් තමයි, අපේ ගැටවර වයසෙ ළමයි—අවුරුදු 15, 16, 17, 18 ළමයි කිය වන්නෙ. "පාසල් ගුරුවරියට පෙම් පුව තක්" කියන මාතෘකාවෙන් පොතක් කියවනව නම්—ගුරුවරියට පෙම් පුවතක් අරිනව නම්—අල්ලපු මේසෙ ඉන්න ගැහැණු ළමයට පෙම් පුවතක් ලිවීමෙ වරද මොකක්ද? අද මේව ස්කෝලවල වෙනව. අපට ලැබී තිබෙන ආරංචිවල හැටි යට අපට කනගාටුයි. මම ළමයින්ට දොස් කියන්නෙ නැහැ. ස්කෝල හදන්නෙ, ආගම ධර්මය තියෙන්නෙ, ගුණ දහම තියෙන්නෙ, අධ්‍යාපන ක්‍රමය තියෙන්නෙ, කුඩා දරුවන්, යහ මග යවන්නයි, ඔවුන්ට පාර පෙන්වන්නයි. මේ වගේ කුණුහරුප පොත් කියවන විට කොහොමද පාර පෙන්වන්නෙ? අම්මගෙ තෙත රෙද්ද ගැන හිතන්න ළමයින්ට පුරුදු කරන විට කොහොමද යහ මග යවන්නෙ? අපි කවදාවත් හිතල තියෙනවද අම්මගෙ දිය රෙද්ද ගැන? ගරු නියෝජ්‍ය සභාපති තුමනි, ඔබතුමා හිතල තියෙනවද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**බාලසූරිය මයා.**
*(திரு. பாலசூரிய)*
(Mr. Balasuriya)
දිය රෙද්ද නොවෙයි, ඇතුල් පැත්තයි, බලල තියෙන්නෙ.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)
ඊට එහා කියන්න මට අමාරු නිසයි, මම එතැනට කියෙව්වෙ. මට අමාරුකමක් තියෙන නිසා මම එතැනින් නැවැත්තුව. මෙහෙම අදහස්, මෙහෙම සිතිවිලි ළමයින්ට එනව නේද?

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)
මේ තැන්වල කථා කරල ඔය අයට පිළිතුරු දෙන්න බැහැ. ගම්වලට ගෙනැවිත් තළවන්න ඕනෑ.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)
වැඩි කල් යන්න ඉස්සෙල්ල ඒක තමයි, වෙන්නෙ. දැන් පටන්ගෙන තියෙනව, මේ අයගෙ පොත් පුච්චන්න. ඇත්ත වශයෙන්ම මමත් ගෙනාව පොතක් පුච්චල දමන්න. ඔබතුමාගෙ අවසරය තියෙනව නම් මේ පොත මම පුච්චන්න කැමතියි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
පුච්චන්න, පුච්චන්න.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)
මම පුච්චන්නද? පුච්චන්නද?

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகனாயக்க)*
(Mr. W. Dahanayake)
පුච්චන්න, පුච්චන්න.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ හැටි දෙයක් නොවෙයි, මේකට ගිනි කූරක් ගහන්නම ඕනෑ, මේ රටට තේරුම් යන්න. මේ පොත "මස් ලේ නැති ඇට".

**බාලසූරිය මයා.**
*(திரு. பாலசூரிய)*
(Mr. Balasuriya)
ඔය පොත අද මෙතන පිච්චුවොත් හෙට දහස් ගණනින් විකිණෙයි.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)
ඒක තමයි. හැම තැනම රැස්වීම් තියා මේක විවේචනය කළා. මේ පොත වැරදිය කීව. නමුත් රජයට මේව කීම බිරි අලින්ට වීණා වාදනය කරන්න වගෙයි. ඇයි රජයට බැරි මේවා පාසල්වලින් ඉවත් කරන්න? රජය මේවා පාසල්වලින් ඉවත් කරන්න ඕනෑ. හැබැයි, රජයට ඒක අමාරුවක් තියෙනව. විශ්ව විද්‍යාලයෙ ප්‍රශ්නපත්‍ර නියම කරන්නෙ මේ පොත්වලින්. ඒකට මොකක්ද රජය කරන්නෙ? ඒකට කල්පනා කරල බේතක් දෙන්න ඕනෑ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ විශ්ව විද්‍යාලවලට ස්වාධීනත්වයක් දීම බොරු වැඩක්. ස්වාධීනත්වය තිබෙන්න ඕනෑ මේ කුණු හරුප බෝකරන්න නොවෙයි. ජාතික අධ්‍යාපනය කියන විට සියල්ලම රජය මගින් පාලන වන්න ඕනෑ. විශ්ව විද්‍යාලවලට නිදහස තිබෙනවාය කීම බොරු. විශ්ව විද්‍යාලවලින් මේ වැඩ කරන අයට කිසිවක් කරන්නේ නැහැ. බණ්ඩා කියා ගමේ ගොඩේ සිට පැමිණි අහිංසක ශිෂ්‍යයෙක් විදුලි පහනක් එහාට මෙහාට දැම්මාය කියා ජයතිලක ශාලාවෙන් පිට කර දැන් උපවාසයක් කරනවා. නිවාසාගාරයෙන් පිට කර දැන් විභාගවලට පෙනී සිටින්න ඉඩ දෙන්නේ නැහැ. මේ අය මිනීමරුවන්ටත් වඩා දරුණුයි. මිනීමරුවෙක් මරන්නේ එක්කෙනයි නැත්නම් දෙන්නයි. නමුත් මේ අය පරම්පරාවක්ම මරනවා. මේ අයගේ පොත් තිබෙන්න තිබෙන්න හැදෙන හැදෙන හැම පම්පරාවම මැරී යනව. ජාතිය මැරී යනව. ඒ නිසා මේ අය භයානක මිනීමරුවෝ. මේ අය රටේ තියන්න වටින්නේ නැහැ. මේක ලෙහෙසියෙන් අත්හරින්න පුළුවන් දෙයක් නොවෙයි. භය නැතිව තදින් වැඩ කරන්න ඕනෑ. දඩුවම් කරන්නට නීති රීති නැත්නම් අවශ්‍ය නීති රීති පනවන්න. එසේ කර මේ අය අයින් කර දමන්නට වැඩ කටයුතු කරන ලෙස මා ඉල්ලනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 3

ඔය එක කොටසක්. ඔය සාහිත්‍ය කොල්ලය. තවත් කොටසක් තිබෙනව නාට්‍ය කොල්ලය කියා. එයින් එකක් තමයි "රන්තෝඩුව". මෙන්න තවත් එකක් : "කාටත් නොකියා". අමතක වෙන්න කලින් තවත් එකක් කියන්න ඕනැ. මේ සාහිත්‍ය කොල්ලයේ ප්‍රධාන තැනැත්තා තමයි මාර්ටින් වික්‍රමසිංහ උන්නැහේ. ඔහු එසේ මෙසේ එක්කෙනෙක් නොවෙයි. 'ලංකාවේ පමණක් නොවෙයි රුසියාවේත් නම ගිහින්. දැන් ඔහු සමාජවාදියෙක් වෙලා. මේ කුණුසරප කාරයෝ නරක් කරන්න එක හේතුවක් ලංකාවේ රුසියන් තානාපති කාර්යාලයක් තිබීම. මට කණගාටුයි මේ ගැන. මෙයට අවුරුදු කීපයකට උඩදී—මට මතක හැටියට 1957 දී පමණ—රුසියන් ජාතික දිනයේදී එදා සිටි රුසියානු තානාපතිවරයා මට නම නම් මතක නැහැ—කථාවක් පවත්වා කිව්වේ මොකක්ද? ලංකාවේ සිටින සාහිත්‍යධරයන්ගෙන් උසස්ම සාහිත්‍යධරයා මාර්ටින් වික්‍රමසිංහය කියායි. ගිය අවුරුද්දේ නොවැම්බර් මාසයේ කොළඹ කලා මන්දිරයේ තිබුණා රුසියන් ජාතික කවියෙකුගේ ගුණානුස්මරණ සභාවක්. ඒ සඳහා තවත් ජීවමාන රුසියන් කවියෙක් ඇවිත් හිටිය. ඒ රුසියන් කවියා මොකක්ද කිව්වෙ? එදිරිවීර සරත්චන්ද්‍ර, සිරි ගුණසිංහ, ගුණදාස අමරසේකර, මාර්ටින් වික්‍රමසිංහ ආදීන් මේ රටේ සිටින උසස් කවීන් ය කිව්ව. මේ වගේ අදහස් ප්‍රකාශ කරන මේ අයට දැන් සමාජවාදී නාමයකුත් පට බැඳී තිබෙනව. අර ආයගෙ කථාවයි, රන්තෝඩුවේ කථාවයි, මේ අනිත් කියන කුණුහරුපයි මේ රටේ තිබෙන ප්‍රශ්නද? සමාජවාදය මේක නම් දෙවි හාමුදුරුවනේ සමාජවාදය අපට එපා. මෙය සමාජවාදය නොවෙයි. පොත් පත් විකිණීමට මේ අයට තැන දීමටයි මේක කරන්නේ.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

ආණ්ඩුව සමාජවාදී කියනවා වගෙයි.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

කොට්ටාවේ මන්ත්‍රීතුමා කියනවා ආණ්ඩුව සමාජවාදී කියනවා වගේය කියලා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේක මහා සූක්ෂම ව්‍යාපාරයක්. සුළු එකක් නොවෙයි. මෙන්න නාට්‍ය කොල්ලය. දැන් මාස 1 1/2 කට පමණ උඩදී කිසිම කෙනෙක් දන්නේ නැතිව, කිසිම විභාගයක් පවත්වන්නේ නැතිව, කිසිම තරඟයක් පවත්වන්නේ නැතුව, සංස්කෘතික දෙපාර්තමේන්තුව රුසියාවට නාට්‍ය කණ්ඩායමක් ඇරියා. නාට්‍ය සම්බන්ධව නිපුනත්වයක් ඇති අය තවත් ඉන්නවා. ඔවුන්ට දැන්වන්නේවත් නැතිවයි ඇරියේ. එම්. ජේ. පෙරේරා මහත්මයා ඉන් එක්කෙනෙක්. අනික් එක්කෙනා ඔස්ටින් ජයවර්ධන මහත්මයා—එතන සිටින දෙවැනියා. පාලිත වීරමන් මහත්මයා නම් සංස්කෘතිය සම්බන්ධව කිසිවක් දන්නේ නැහැ.

කවුද මේ චිත්‍රසේන නාට්‍ය කණ්ඩායම තෝරාගත්තේ? මෙන්න ඔවුන්ගේ නාට්‍ය පිළිබඳව රුසියාවෙන් පැමිණ ඇති වාර්තාවක සඳහන් වන හැටි. අගෝස්තු මාසෙ 30 වන දා පත්‍රයේ මෙහෙම තිබෙනවා. මෙහි මුලින් තිබෙන ශීර්ෂ තලය නම් හොඳයි. නමුත් ඊට පසුව කියා තිබෙන දේ බලන්න.

"**Chitrasena wins praise in Leningrad**
Yuri Grigorovich, the well known ballet master of Leningrad said : 'In our guest performers' art their closeness to the sources of the Ceylonese folk dance is most noteworthy. That is precisely the line they should go on observing and promoting. Some of the ballet scenes show that the choreo-grapher was influenced by the European classical dance. I think that is a pity. The movements following the European pattern do not fit in at all with the enchanting plasticity of Ceylonese choreo-graphy. On the whole, however, Chitrasena's ballet company's tour here is a happy event. I am sure it will be remembered not only by professional artists here, but will also serve to strengthen still more the mutual understanding between the friendly peoples of both countries'."

මොකක්ද කියන්නෙ? යුරෝපීය සම්ප්‍රදාය ඒකට ගාවලාලු. රුසියානු විචේචකයකුම එය හෙළා දකිනවා. එසේ වීම කනගාටුදායකයයි කියනවා. ඇයි අපට ආවේණික වූ නාට්‍ය නැද්ද? පිටරටක ගොස්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කේ. එම්. පී. රාජරත්න මයා.]

පෙන්විය යුත්තේ අපේම දේයි. අපේ සංස්කෘතියට අයිති අපේම ආවේණික දේයි. එසේ නැතිව අපේ රටින් පිට රට ගොස් පෙන්විය යුත්තේ යුරෝපයෙන් ලැබුණු ආභාසයන් නොවෙයි. යුරෝපීය ඉමිටේෂන් නොවෙයි. අපට ආවේණික වූ නැටුම්, ගැයුම්, වැයුම් තිබෙනවා. ඒ නිසා සංස්කෘතික කණ්ඩායම් පිටරට යවන විට මීට වඩා සොයා බලා යැවිය යුතුයි. යාළුකමට නැති නම් දේශපාලන හේතූන් උඩ යවන්නේ නැතිව, ඒ ඒ දේ පිළිබඳව ඉතාමත්ම සුදුසු අය සොයා බලා යැවිය යුතුයි. මා ඔය කිව්වේ නාට්‍ය කොල්ලය ගැනයි. තවත් බොහෝ දේ කීමට ඇතත් වෙලා නැති නිසා සංස්කෘතික දෙපාර්තමේන්තුව ගැන මම එතෙකින් නවත්වනවා.

අධ්‍යාපන දෙපාර්තමේන්තුව ගැනත් වචන කිහිපයක් කියන්න තිබෙනවා. ගුරු විද්‍යාල අවසාන පරීක්ෂණය සම්බන්ධයෙන් ලොකු අකටයුත්තක් සිදු වී තිබෙනවා. මෙපමණ කල් ගුරු විද්‍යාල අවසාන පරීක්ෂණය පැවැත්තුවේ ගුරු විද්‍යාලයාධිපතීන්මයි. එසේ විභාග පවත්වා පුහුණු වූ කාලය තුළ ශිෂ්‍යයින්ගේ වැඩ ගැනත් සලකා ඔවුන් සමත් කිරීම හෝ අසමත් කිරීම සිද්ධ වුණා. නමුත් ගිය අවුරුද්දේ මේ වැඩ පිළිවෙල වෙනස් කර තිබෙනවා. ගිය අවුරුද්දේ මේ සඳහා පොදු විභාගයක් පවත්වා එහි ප්‍රතිඵල අනුව පමණක් සමත් කිරීම හෝ අසමත් කිරීම කර තිබෙනවා. ගුරු විද්‍යාලයාධිපතීන් කී දේ ගැනවත් ඇහුම්කන් දී නැහැ. මේ පිළිබඳව අම්බලන්ගොඩ ගරු මන්ත්‍රීතුමාත් ඇතුළු නියෝජිත පිරිසක් ගිහින් තිබෙනවා ඇමතිතුමා හමු වීමට. 1963 අගෝස්තු 13 වන දින ලංකාදීපයේ තිබෙනවා ඒ ක්‍රමය අවලංගු කළාය කියා. ලබන අවුරුද්දේ සිට ඒ ක්‍රමය අවලංගු කිරීමට ඇමතිතුමා පොරොන්දු වී තිබෙනවා. මෙයින් මොකක්ද සිද්ධ වුණේ ? ගිය අවුරුද්දේ පරීක්ෂණයට පෙනී සිටි අය අමාරුවේ වැටුණා. ඊට කලින් අවුරුද්දේ අයට ඉන් කරදරයක් සිදු වූයේ නැහැ. ලබන අවුරුද්දේ අයටත් කරදරයක් සිදු වන්නේ නැහැ. ඒ නිසා ගරු ඇමතිතුමා ගිය අවුරුද්දේ මේ පොදු විභාගයෙන් අසමත් වූ අය පිළිබඳව නැතිනම් ඌණ සාමාර්ථ්‍යය ලත් අය පිළිබඳව ගුරු විද්‍යාලයාධිපතීන් ගෙනුත් විමසා පුහුණු වූ අවුරුදු දෙක තුළ හොඳින් වැඩ කළ අය සමත් කිරීමට කටයුතු කරන මෙන් මම ඉල්ලා සිටිනවා. ගුරු පුහුණුවට යන අය සමත් කිරීමේදී හෝ අසමත් කිරීමේදී හෝ ඔවුන් පුහුණු වූ කාලය තුළ ඔවුන්ගේ වැඩ කෙසේද යන්න මුල් තැනක් ගන්නවා. ඒක මහ විකාර වැඩක්, ළමයින් ජ්‍යෙෂ්ඨ විභාගයෙන් අසමර්ථ කරන්න වගේ. ඒ උදවිය අභ්‍යාස විද්‍යාලවලට ඇතුළත් වන්නෙ තරඟ විභාගයකින් නිසා එක්කෙනෙක් වත් අසමර්ථ කරන්ට නරකයි. ඒ උදවිය ඔක්කොම සමර්ථවන්ට ඕනෑ. මේ පිරිසට සහනයක් දෙන ලෙස මතක් කරන්ට කැමතියි.

විශ්ව විද්‍යාල කොමිෂන් සභා වාර්තාව ලොකු බොරුවක්. එය පුච්චා දැමිය යුතු දෙයක්. ඒකෙ විද්‍යාලංකාර හා විද්‍යොදය විශ්ව විද්‍යාල අහෝසි කිරීමට කර තිබෙන නිර්දේශ පිළිගන්ට එපා.

නියෝජ්‍ය සභාපතිතුමනි, තවත් එක කාරණයක් පමණක් මතක් කරන්ට තිබෙනව. මොරටු විද්‍යාලයේ හිටිය, එදිරිසූරිය කියා ගුරුවරයෙක්. දැන් අවුරුදු 3කට 4කට පමණ උඩදී මේ ගුරුවරයාට විරුද්ධව අභූත චෝදනා වගයක් ඉදිරිපත් වුණා. ඒ චෝදනා ඉදිරිපත් වුණාට පසු ඔහුට විභාගයකට එන්ට කිව්ව. ඒ ඉදිරිපත් කළ කාරණා අධ්‍යාපන නීති සංග්‍රහය යටතේ චෝදනා නොවන නිසා ඒ ගුරුවරයා විභාගයට ගියේ නැහැ. මේ ගුරුවරයා නැතුව විභාගය පැවැත්තුව. විභාගය පවතිද්දි මොරටු විද්‍යාලයේ හිටපු කළමනාකරු අභූත චෝදනා වගයක් ඉදිරිපත් කළා. පරීක්ෂණයට ගිය මහත්මයා ඒ කරුණු උඩ මේ ගුරුවරයා අස් කළ යුතු යයි තීරණය කළ නමුත් බස්නාහිර පළාතේ අධ්‍යාපන නිලධාරීතුමා කිව්ව, ඒ වාර්තාව පිළිගන්ට බැහැ කියා. නැවත වතාවක් පරීක්ෂා කර බලන්නය කිව්ව. දෙවෙනි වතාවටත් පරීක්ෂා කර බලා ඔහු අස් කළ යුතුයයි දැන්නුව. බස්නාහිර පළාතේ අධ්‍යාපන නිලධාරීතුමා ඒ වතාවෙත් එය පිළිගත්තෙ නැහැ. එහෙත් අධ්‍යාපන අධ්‍යක්ෂවරය පිළිගත්තා. ඉන්පසු ගුරුවරයාව අස් කළා. ඒ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගුරුවරයා එදා සිට පැමිණිලි කරනව, අසාධාරණ ලෙස තමාව අස් කළාය කියා. ඒ ගුරුවරයාගේ පෞද්ගලික ජීවිතයට කැළැල් වන අන්දමේ ඉතා භයානක චෝදනා වගයක් මොරටු විද්‍යාලයේ හිටපු කළමනාකාරයකු වන—මා හිතන්නෙ—සල්ගාදු නමැත්තෙක් ඉදිරිපත් කර තිබෙනව. ඒ ගුරුවරයා ඒ චෝදනා සඳහන් ලිපියේ පිටපතක් ඉල්ලා සිටිය, තමාගේ ගෞරවය ආරක්ෂා කරගන්ට නඩු දාන්න. අවුරුදු 2 ක් ගත වනතුරු ඉල්លු නමුත් ලැබුණේ නැහැ. අවුරුදු 2 ක් ගත වුණාට පසු නඩු දාන්ට පුළුවන්කමක් නැහැ. දැන් ඒ ගුරුවරය ආපසු රක්ෂාව ඉල්ලනව, පසුගිය කාලයේ පඩිත් සමග. ඔහුට නැවත රක්ෂාව දෙන්ට අධ්‍යාපන ඇමතිතුමා කැමතියි. එහෙත් ස්ථාවර ලේකම්තුමා කැමති නැහැ. කලින් මගේ සැලකිල්ලක් තිබුණා, ස්ථාවර ලේකම්තුමා අවංකව කටයුතු කරන නිලධාරියෙක්ය කියා. මේ සිද්ධියෙන් පසු ඒ සැලකිල්ල නැති වුණා. මෙවැනි සුළු දෙයකට එතුමා ඇඟිලි ගැසීම ගැන මා කනගාටු වෙනව. මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් අපි අධ්‍යාපන ඇමතිතුමා හමු වුණා. එතුමා කිව්ව දෙපාර්තමේන්තුවට ඒ ගුරුවරයාට පත්වීමක් දෙන්නය කියා. මොකක්ද සිඬ වුණේ. මේ ඊයෙ පෙරේද පත්වීමක් ලැබුණා. උපකෘත පාඨශාලාවක්ය කියන කතෝලික පාසැලක සිටි ගුරුවරයෙක් ආණ්ඩුවේ පාසැලකට දමා එදිරිසූරිය මහත්මයාට ඒ කතෝලික උපකෘත පාඨශාලාවට පත්වීමක් එව්ව. එතැන සිටි ගුරුවරයාව ආණ්ඩුවෙ පාසැලකට දැම්ම. ඔහු එතැන ගිහින් ඔළු පලාගත්ත. අධ්‍යක්ෂ පාලිත කතෝලික පාඨශාලාවක ගුරුවරයෙක් ආණ්ඩුවේ පාඨශාලාවකට මාරු කරන්ට පුළුවන් නම්, ඇයි මේ ගුරුවරයට ආණ්ඩුවේ පාසැලක පත්වීමක් දෙන්ට බැරි.

මේ ඉදිරිසූරිය ගුරු මහත්මයාගෙ පඩි ගැන කථා කරන විට ස්ථාවර ලේකම්තුමා නිවේදනය කර තිබෙනව, උපකෘත පාඨශාලාවක හිටපු ගුරුවරයෙකුට පසුගිය කාලයට වැටුප් ගෙවන්ට බැහැ කියා. ආණ්ඩුවට පාඨශාලා පවරාගන්ට යන විට කතෝලික ගුරුවරුන් 200 ක් පමණ ඊට විරුද්ධය පෑව. ඒවාට ඇතුල් වන්ට බැහැ කිව්ව. ආණ්ඩුවේ ප්‍රතිපත්තියට විරුද්ධව සටන් කළා. කලක් ඒ ගුරුවරුන්ගේ වැඩ තහනම් කර තිබුණා. පසුව ඒ උදවියට නැවත වැඩ දුන්න. කැබිනට් මණ්ඩලයේ තීරණයක් අනුව වැඩ නොකළ කාලයට පඩිත් ඇතිවයි ඔවුන් නැවත බඳවා ගත්තෙ. ඒ පිරිසට දෙන්ට හොඳයි. මේ එදිරිසූරිය ගුරුවරයාට දෙන්ට නරකයි. ඔහුට පඩි දෙන්ටත් බැහැ ; රක්ෂාව දෙන්ටත් බැහැ. මේ කරුණ මේ ගරු සභාවේ 10 වරකටත් වඩා ඉදිරිපත් කර තිබෙනව. ගලිගමුවේ මන්ත්‍රීතුමා හතර පස් වතාවක් මේ ප්‍රශ්නය අසා තිබෙනව. තවත් ගරු මන්ත්‍රීවරුන් මේ සභාවේ මේ ප්‍රශ්නය ඇසුව. ආණ්ඩු පක්ෂයේත්, විරුද්ධ පාර්ශ්වයේත් මන්ත්‍රීවරුන් 20 දෙනෙකුගේ අත්සන් ඇතුව මේ සම්බන්ධයෙන් මා පෙත්සමක් ඉදිරිපත් කළා, මේ ප්‍රශ්නය නිරාකරණය කරන්ටය කියා. අද වනතුරු එය නිරාකරණය කර නැහැ. මා අධ්‍යාපන ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනව මේ ප්‍රශ්නය විසඳන්නය කියා. අධ්‍යාපන ඇමතිතුමා අපට පොරොන්දු වුණා, මේ ගුරුවරයාට නැවත රක්ෂාව දෙනවාය කියා. එසේ නම් අද ස්ථිර වශයෙන් කියන්න, මේ මහත්මයා හිටපු පාසැලේ තත්ත්වයට සුදුසු පාසැලකට ඔහු පත් කර පසුගිය කාලයේ පඩියත් ගෙවනවාය කියා. ඒ විධියේ වැඩ පිළිවෙළක් යොදන හැටියට ඉල්ලමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනව.

අ. භා. 3.15

**ආර්. ජී. සේනානායක මයා.** (දඹදෙණිය)
*(திரு. ஆர். ஜீ. சேனாநாயக்க—தம்பதெனிய)*
(Mr. R. G. Senanayake—Dambadeniya)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ වැය ශීර්ෂය ගැන වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලැබීම ගැන මා සන්තෝෂ වෙනවා. අප මුලින් අදහස් කළ පරමාර්ථ අනුව ජාතික අධ්‍යාපන ක්‍රමය ක්‍රියාත්මක වෙනවාදැයි සොයා බැලීමට දැන් කාලය පැමිණ තිබෙන බවයි, මගේ හැඟීම. තමුන්නාන්සෙල මේ රටේ පාලනය භාර ගන්නා අවස්ථාවෙදි ජාතික අධ්‍යාපනය ගැන මේ රටේ ලොකු උනන්දුවක් තිබුණා. මේ රටෙහි ජාතික අධ්‍යාපන ක්‍රමයක් ඇති කරනවායයි දුන් පොරොන්දුව නිසයි, තමුන්නාන්සෙලාට මේ රටේ පාලන බලයක් ලබා ගන්ට පුළුවන් වුණේ. "ජාතික අධ්‍යාපනය"

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යයි කියන විට අපේ හදවත් තුළ එක්තරා විධියක හැඟීමක් ඇති වෙනවා. ඒ අනුව දැන් අපේ ජාතික අධ්‍යාපන ක්‍රමය සකස් වී තිබෙනවාදැයි පරීක්ෂා කර බැලීමට කාලය පැමිණ තිබෙනවා. දෙවුන්දර තුඩුවේ සිට පේදුරු තුඩුව දක්වා වූ සෑම තැනම එකම සැලැස්මක් අනුව, එකම විෂය මාලාවක් අනුව, අනුමත කරන ලද එකම පොත් ලැයිස්තුවක් අනුව අධ්‍යාපනයක් දෙනවාය යන අදහස තමුන්නාන්සෙල එදා ප්‍රකාශ කළා. එය ඉතාමත් වැදගත් අදහසක් බව කවුරුත් පිළිගන්නවා. ජාතියක් ගොඩ නගා ගැනීම සඳහා වුවමනා කරන ප්‍රධාන කාරණය නම් ජාතික අධ්‍යාපනයක් ඇති කිරීමයි. ජාතිය කොටස් වශයෙන් බෙදී තිබෙන අවස්ථාවක ඒ ඒ කොටස එක එක පැත්තට අදින කොට, අනාගත පරපුර ගැන බලාපොරොත්තුවක් තබාගෙන, අනාගත පරපුර පිළිබඳ සම්පූර්ණ වගකීම පවරාගෙන, "ජාතියක් ගොඩ නගමු" යන පරමාර්ථය පෙරදැරි කොටගෙන, එකම සැලැස්මක් අනුව ජාතික අධ්‍යාපනයක් ඇති කිරීමේ අදහස ගැන ප්‍රශංසා කළ යුතුයි. නමුත් ඒ පරමාර්ථය අනුව, ඒ අදහස අනුව, අද දින වැඩ කටයුතු කෙරීගෙන යනවාද? ජාතියය කියන කොටම අපේ හද තුළ ඇති වන්නේ කුමන හැඟීමක්ද? භාෂාව පිළිබඳ හැඟීමක්. භාෂාවක් නැතිව නියම ජාතික අධ්‍යාපනයක් දෙන්ට බැහැ. ජාතික අධ්‍යාපනය දිය යුත්තේ එක් භාෂාවකින්. නමුත් දැන් ඒ අදහසට පහර වැදීගෙන යනවා නේද? මේ පිළිබඳව දැන් කරදර ඇති වී තිබෙනවා නේද? එක සැලැස්මක් අනුව, එකම විෂය මාලාවක් අනුව, එකම පොත්පත් ලැයිස්තුවක් අනුව එකම ක්‍රමයකට ජාතික අධ්‍යාපනය දෙනවා, යන්නෙහි ප්‍රධාන අදහස එකම භාෂාවකින් අධ්‍යාපනය දීමයි. නමුත් දැන් මේ අදහස පරාජය වී තිබෙනවා.

ඊළඟට ජාතික අධ්‍යාපන ක්‍රමයෙහි ප්‍රධාන ස්ථානයක් හිමි විය යුත්තේ ආගමටයි. බටහිර රටවල් ඒ රටවල තිබෙන ක්‍රිස්තියානි ආගම අනුව ඒ රටවල අධ්‍යාපනය සකස් කරගෙන තිබෙනවා. අරාබි ලෝකයේ රටවල් ඉස්ලාම් ධර්මය අනුව ඒ රටවල අධ්‍යාපනය සකස් කරගෙන තිබෙනවා. ඉන්දියාව හින්දු ධර්මය අනුව එහි අධ්‍යාපනය හැඩ ගසාගෙන තිබෙනවා.

ඉන්දියාවේ හින්දු ආගම වැදගත් ලෙස සලකා ඒ ආගමේ පදනම උඩ අධ්‍යාපනය යොදා තිබෙනවා. මේ රටේ ජාතික අධ්‍යාපන ක්‍රමයක් ඇති කිරීමේදී බෞද්ධාගමේ පදනම උඩ අධ්‍යාපන ක්‍රමය සකස් වේයයි විශ්වාසයක් අප තුළ තිබුණා නොවේද? නමුත් ජාතික අධ්‍යාපනයක් සකස් කිරීමේදී මුලින්ම භාෂාව අස් කිරීමට අද සිද්ධ වී තිබෙනවා නොවේද? ජාතික අධ්‍යාපනයට දැන් භාෂාවක් නැහැ. ඒ වාගේම ආගම් හතරක් තිබෙනවා. ඒවා අතර තිබෙන මත භේද නිසා දැන් ජාතික අධ්‍යාපනයට ආගමකුත් නැහැ. මේ කරුණු අනුව එකම මාලාවක්, එකම අච්චුවක්, එකම සැලැස්මක් මත ජාතික අධ්‍යාපනයක් දෙන්න පුළුවන්ද? නිකම් ජාතික අධ්‍යාපනය, ජාතික අධ්‍යාපනය කියා ප්‍රචාරය කරනවා.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னகோன்)*
(Mr. M. Tennakoon)

ඒ ඒ ආගම්වල ළමයින්ට ඒ ඒ ආගම්වල පරිසරයක් ඇතිව අධ්‍යාපනය දෙනවා.

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)

නමුත් එහෙම කරන්ට බැහැ නොවැ. ආගම් හතරක් තිබෙනවා. ඒ ආගම් හතර උඩ බෙදුණු ජාතික අධ්‍යාපනයක් දෙන්න වෙනව.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னகோன்)*
(Mr. M. Tennakoon)

ආගමික පදනමක් උඩ ඒ ඒ අයගේ විශ්වාසය හා ආගම් අනුව අධ්‍යාපනයක් දෙනව.

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)

එහෙම කළොත් ආගම් හතරක් උඩ බෙදුණු ජාතික අධ්‍යාපනයක් දෙන්න

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වෙනව. එතකොට එකම සැලැස්මලක් අනුව, එකම අච්චුවක් අනුව, එකම මාලාවක් අනුව ජාතික අධ්‍යාපනයක් දෙන්නෙ කොහොමද? එතකොට ජාතික අධ්‍යාපනය හතර ආකාරයකට බෙදෙනවා.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னகோன்)*
(Mr. M. Tennakoon)
මේ රටේ ආගමික නිදහස තිබෙනව.

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)
ආගමික නිදහස ගැන නොවෙයි මම කියන්නෙ, ජාතික අධ්‍යාපනය ගැනයි. ජාතික අධ්‍යාපනය යනුවෙන් අපි අදහස් කළේ බෞද්ධ පරිසරයක් උඩ පිළියෙළ කරන අධ්‍යාපන ක්‍රමයකුයි. කිසිම භේදයක් නැතිව එකම සැලැස්මක් අනුව පිළියෙළ වූ අධ්‍යාපන ක්‍රමයකුයි, මහජනතාව බලා පොරොත්තු වුණේ. ජාතික අධ්‍යාපනයක් කියනවා නම්, එය බෞද්ධ සිංහල අධ්‍යාපනයක් විය යුතුයි. තමුන්නාන්සේලා මුලදී කිව්වෙ එහෙමයි. තමුන්නාන්සේලා ඡන්දය අර ගත්තෙ එහෙම කියලයි. නමුත් භාෂා දෙකක් තිබෙන නිසා, ජාතික අධ්‍යාපනය එකම මට්ටමකින්, එකම සැලැස්මක් අනුව ගොඩගන්න බැහැ කියා අද තමුන්නාන්සෙලා කියනවා. එකම පොත් මාලාවක් අනුව අධ්‍යාපනයක් දෙන්න අද පුළුවන්කමක් නැහැ. අපි පළමුවෙන්ම ඉතිහාසයට බසිමු. ලංකාවේ ඉතිහාසයේ සම්පූර්ණයෙන්ම තිබෙන්නෙ සිංහලයන් හා ද්‍රවිඩයන් අතර ඇතිවූ යුද්ධ ගැනත්, ඒ වාගේම සිංහල ජාතිය බේරා ගැනීමට මතුවූ සිංහල වීරයන් ගැනත් පමණයි. හොඳයි, මෙවැනි කරුණු අන්තර්ගත ලංකා ඉතිහාසය යාපනේ ප්‍රදේශවල උගන්වන්න පුළුවන්ද? අපේ දුටු ගැමුණු රජතුමා ජාතික වීරයෙක් හැටියට යාපනේ ප්‍රදේශවාසීන් පිළිගන්නවාද? ඒ නිසා අපි ජාතික අධ්‍යාපනයෙන් ඉතිහාසයත් අයින් කරමු.

ඒ විධියටම සංස්කෘතික හා කලා කට යුතුත් බෙදෙනවා. එසේ නම්, ජාතික නොවූ විෂයයන් පිළිබඳව පමණයි එකම මට්ටමකින් ජාතික අධ්‍යාපනයක් දිය හැකිව තිබෙන්නෙ. ඒ විෂයයන් නම් භූගෝල ශාස්ත්‍රය, විද්‍යාව, ගණිතය, තාක්ෂණ විද්‍යාව, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව ආදියයි. මේ විෂයයන්වලට ජාතියක් නැහැ. එක මට්ටමකින්, එක පොත් මාලාවක් අනුව අධ්‍යාපනයක් දෙන්න පුළුවන් මේ විෂයයන් පිළිබඳව පමණයි.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னகோன்)*
(Mr. M. Tennakoon)
බුද්ධාගමට තිබෙන ජාතිය මොකක්ද?

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)
සිංහලයා තුළ ජාතික හැඟීම් ඇතිවුණේ බුද්ධාගම නිසයි. [බාධා කිරීමක්] ජර්මනියේ, ඇමෙරිකාවේ තියෙන්නෙ ක්‍රිස්තියානි ආගම. ඒ වාගේම ඒ රටවල ජාතික අධ්‍යාපනය පිළියෙළ කර තිබෙන්නෙත් ක්‍රිස්තියානි ආගමේ පදනම උඩ. ජාතිකය කියන්නෙ හැම විටම මූලික අත්තිවාරමක් අනුව ඇති කරන දෙයක්. ඒ නිසා මම තමුන්නාන්සේලාට කියනවා, ජාතික අධ්‍යාපනය වශයෙන් අද නියම වී තිබෙන්නෙ ජාතියක් නැති විෂයයන් පමණයි. හැප්පිලි නැති විෂයයන් පමණයි, අද ජාතික අධ්‍යාපන ක්‍රමයට ඇතුළු කරගෙන තියෙන්නෙ. ඔය ආකාරයට ජාතික අධ්‍යාපනය ගෙනියනවද, එසේ නැතුව දෙවුන්දර තුඩුවෙ සිට පේදුරු තුඩුව දක්වා එක අච්චුවෙන්, එක විෂය මාලාවෙන්, එක මට්ටමෙන් බෙදන බෙදීම අතහැර, මේ රටේ තියෙන ආගම් සහ භාෂාවන් අනුව ජාතීන් වර්ග කොට එක කට්ටියකට කතෝලික අධ්‍යාපනය ගෙනියන්න එක පැත්තකිනුත්, අනික් කට්ටියට හින්දු අධ්‍යාපනයත් දෙමළ භාෂාවත් ගෙනියන්න එක පැත්තකිනුත්, තව කට්ටියකට මුස්ලිම් අධ්‍යාපනය ගෙනියන්න එක පැත්තකිනුත්, තවත් කට්ටියකට බෞද්ධ අධ්‍යාපනය ගෙනියන්න එක පැත්තකිනුත් ඉඩ කඩ ලැබෙන පරිදි ආධාර දෙනවද කියල මා අහනව.

මා දෙවෙනුව කිව්වෙ එදාත් පවත්වා ගෙන ගිය වැඩ පිළිවෙළයි. එදා ඒ ඒ අයගෙ වියදම ඒ ඒ අය විසින් කළා. කතෝලිකයන් ඒ අයගෙ වියදම් කළා;

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ජී. සේනානායක මයා.]

හින්දූන් තමන්ගෙ වියදම්වලින් එක්තරා කොටසක් කළා ; ඔය විධියටයි හැමෝම කළේ. අද කරන්න යන්නෙ රජයට පාඨශාලා අරගෙන රජය මගින් ඒ ඒ අයට උදව් කිරීමයි. රජය මගින් කතෝලික අධ්‍යාපනයටත්, මුස්ලිම් අධ්‍යාපනයටත්, හින්දු අධ්‍යාපනයටත්, බෞද්ධ අධ්‍යාපනයටත් මුදල් වියදම් කිරීමයි කරන්න යන්නෙ. මේකයි ක්‍රියාවෙ යොදවන ජාතික අධ්‍යාපන ක්‍රමය හැටියට ඡන්ද කාලයෙ පොරොන්දු වෙලා තියෙන්නෙ.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னகோன்)*
(Mr. M. Tennakoon)

මේ රටේ ආගම් බේද ඇති කරන එක හොඳද ?

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனாநாயக்க)*
(Mr. R. G. Senanayake)

ඡන්දෙ ගන්නකොටයි, ඒක කියන්න තිබුණෙ.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னகோன்)*
(Mr. M. Tennakoon)

ඒ පිළිබඳව මන්ත්‍රීතුමාගෙ පුද්ගලික අදහස කියන්න.

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனாநாயக்க)*
(Mr. R. G. Senanayake)

ආගමික නිදහස නොවෙයි, තමුන්නාන්සෙලාගෙ ප්‍රතිපත්තිය—

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னகோன்)*
(Mr. M. Tennakoon)

අපේ ප්‍රතිපත්තිය වෙනස් කරන්න කැමතියි, මන්ත්‍රීතුමාගෙ පුද්ගලික අදහස උඩ.

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனாநாயக்க)*
(Mr. R. G. Senanayake)

මගේ පුද්ගලික අදහස උඩ තමුන්නාන්සෙලාගෙ ප්‍රතිපත්ති වෙනස් කරනව නම් මා ඔය පැත්තට එනව. තමුන්නාන්සෙලා අධ්‍යාපනය ගෙනියන්නෙ කොහොමද කියල කියන්න. තමුන්නාන්සෙලා රටට බොරුවක් කරල තියෙනව. ආගම් නැති අධ්‍යාපනයක් බෙදන්න තමුන්නාන්සෙලාගෙ සූදානමක් තියෙනව. එහෙම නැතිනම් කොටස් 4 කට බෙදල පැරණි අධ්‍යාපනයම රජය මගින් ගෙනියන්න සූදානමක් තියෙනව. ඒ කියන්නෙ ඒ ඒ ජාතීන් ඒ ඒ ජාතීන්ගෙ වියදම්වලින් පවත්වාගෙන ගිය දෙය ආණ්ඩුවෙ වියදමෙන් ගෙනියන්න සූදානම් වෙනව. [බාධා කිරීමක්] මේ පිළිබඳ නියම පියවර ගන්නෙ කුමන ආකාරයටද කියල අපි තමුන්නාන්සෙලාගෙන් ඇහුව. ජාතික අධ්‍යාපනය පිළිබඳව කතා කරද්දී මේ ගැන අපි තමුන්නාන්සෙලාගෙන් ඇහුව. ජාතික අධ්‍යාපන ක්‍රමය තෝර ගන්නෙ කුමන ප්‍රශ්න උඩද කියල අපි තමුන්නාන්සෙලාගෙන් ඇහුව. හොඳයි, මේ ගැන විපරම් කරල බලන්න කොමිෂන් එකක් පත් කරමු. ජාතික අධ්‍යාපනය සඳහා වැඩ කළාය ; දරුවන්ට ජාතික අධ්‍යාපනය ලබා දුන්නාය, කියල ප්‍රකාශ කරනව. නමුත් ලබා දුන්නද ?

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னகோன்)*
(Mr. M. Tennakoon)

ඔව්.

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனாநாயக்க)*
(Mr. R. G. Senanayake)

තමුන්නාන්සෙල රටවැසියන්ගෙ අයිතිවාසිකම් ලබා දෙනවය කියනව. ආණ්ඩුවෙ සේවකයන්ගෙන් එක්තරා කොටසකුත්, ආණ්ඩුවෙ නොවන ගුරුවරුන් අතරෙන් තව කොටසකුත් සිටිය, දේශපාලන අයිතිවාසිකම් තිබෙන. ජාතික අධ්‍යාපන ක්‍රමය අනුව පාඨශාලා පවත්වාගෙන යාමට පටන් ගත්තට පසු ඒ ගුරුවරුන්ට ගිය කල කුමක්ද ? ඒ අයගෙ දේශපාලන අයිතිවාසිකම් වැඩි වුණාද, අඩු වුණාද ? ඔවුන්ට දේශපාලනය දැන් සම්පූර්ණයෙන්ම තහනම් කරලය කියනව. ගුරුවරුන්ට දේශපාලන අයිතිවාසිකම් දීම නිසා රටට හානියක් සිදු වෙනවද කියල මා අහනව. ගුරුවරුන්ට පන්ති කාමරය තුළ දේශපාලනය උගන්වන්න පුළුවන් වන ආකාරයට "ආණ්ඩු ක්‍රම" නමින් විශෙෂ විෂයයක් නම් කරල තියෙනව. ඒ සම්බන්ධයෙන් පාවිච්චියට ගැනීම සඳහා පොත්පත් ඕන තරම් දීල තියෙනව. ඒවා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අනුව ළමයින්ට දේශපාලනය ගැන කියා දෙන්න කියනවා; විස්තර කර දෙන්න කියනව.

අ. භා. 3.30

දේශපාලන විද්‍යාව ගැන පංක්ති කාමරයේදී පාඩම උගන්වනවට ගුරුවරයාට පඩියක් ගෙවනව. ඒ පාඩම පංක්ති කාමරයෙන් පිට තැනකදී කළොත් දඬුවම් කරනව. මොකක්ද මේකෙ තේරුම? මේක පුදුමයක් නොවෙයිද? දේශපාලනය ඒ තරම් පිළිකුල් සහිත දෙයක් නම් කොහොමද ගුරු වෘත්තියේ යෙදුණු පිරිසක් අද ආණ්ඩු පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හැටියට ඉන්නෙ? වලපනේ ගරු මන්ත්‍රීතුමා (ටී. බී. එම්. හේරත් මයා.) සහ ගලිගොමුවෙ ගරු මන්ත්‍රීතුමා (පී. බී. බාලසූරිය මයා.) ඇතුළු ගරු මන්ත්‍රීවරුන් කීප දෙනෙක්ම මෙහාට එන්න කලින් ගුරු වෘත්තියේ යෙදිල හිටියෙ නැද්ද? ඒ උදවියට දේශපාලන අයිතිවාසිකම් තිබුණු නිසා නොවෙයිද ඒ කාලෙ පාර්ලිමේන්තු ආසනයකට තරඟ කරන්න ලැබුණෙ? දේශපාලන අයිතිවාසිකම් තිබුණු නිසා ගුරුවරුන් වශයෙන් සේවය කරද්දී එතුමන්ලාගෙන් රටටත් ජාතියටත්, අනාගත පරම්පරාවටත් හානියක් වුණාය කියන්න පුළුවන්ද? එතකොට ඒ විධියට ගුරු වෘත්තියෙන් පාර්ලිමේන්තුවට ආ ඒ ගරු මන්ත්‍රීතුමන්ලට කියන්න පුළුවන්ද ගුරුවරුන්ට දේශපාලන අයිතිවාසිකම් දී තිබීම නරකය කියල· පාර්ලිමේන්තු මන්ත්‍රීන් හැටියට ආසන දිනා ගත්තායින් පස්සෙ දැන් කියන්න පුළුවන්ද ගුරුවරුන්ට දේශපාලන අයිතිවාසිකම් නොදිය යුතුය කියල? එදා මැතිවරණ කාලෙ කොහොමද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රචාරක රැස්වීම්වල තමුන්නාන්සේල කථා කළේ? ගුරුවරුන් වෙනුවෙන් කථා කරන්න, ගුරුවරුන්ගෙ අයිතිවාසිකම් ආරක්ෂා කරන්න, ගුරුවරුන්ගෙ නියෝජිතයින් පාර්ලිමේන්තුවට යැවීමට අපේ පක්ෂයෙන් ඉදිරිපත් කර සිටිනවය කිව්වෙ නැද්ද? ඒ විධියට රැස්වීම්වලදී කියල පාර්ලිමේන්තුවට ගෙන්වා ගත්තට පස්සෙ ඒ අයගෙ උපදෙස් ගන්නෙ නැතුව ගුරුවරුන්ට දේශපාලනය තහනම් කරල තයෙනව නේද? කී දාහක් ගුරුවරු ඒ කාලෙ දේශපාලන අයිතිවාසිකම් ඇතුව හිටියද? නමුත් ඒ උදවියගෙන් අපේ රටට හානියක් වුණාද? රටක් හදන්න පුළුවන් ප්‍රධාන උදවිය හැටියට ගම් ප්‍රදේශවල ඉන්නෙ කවුද? ප්‍රධාන ස්ථානය භික්ෂූන් වහන්සෙලාට හිමි වන අතර ඊ ළඟ ස්ථානය ගුරුවරුන්ට නේද අයිති වන්නෙ? ඒ දෙදෙනා හැර ඊට ඉහළින් ප්‍රධානයන් තවත් ඉන්නවාය කියන්න බැ. භික්ෂූන් වහන්සෙලා දේශපාලන භූමියෙන් අයින් විය යුතුය කියන්නෙ මෙතනට ආවාම යම් යම් සට්ටන ඇති වන නිසා ගෞරවය රැකීම පිණිසය කියා කියනව. එසේ කියා උන් වහන්සෙලා දේශපාලනයෙන් අයින් කරනව. එහෙත් දරුවන්ට අධ්‍යාපනය දෙන ගුරුවරුන්ට — තරුණ පරම්පරාව හැඩ ගස්සන්න ඉන්න ගුරුවරුන්ට — දේශපාලනය සම්බන්ධයෙන් නිදහසක් නැත්නම් ගම්වල ඉන්න වැඩිහිටි උදවියත් පාසල් යන ශිෂ්‍ය ශිෂ්‍යාවනුත් කොහෙන්ද උපදෙස් ලබා ගන්නෙ? යුක්තියක් අනුව තමන් ගමන් කරන්නෙ මේ අන්දමටයි, මෙන්න මේ විධියටයි තමන් පාලනය කරනු ලබන්නෙ, රටක් පාලනය කරනු ලබන්නෙ මේ විධියටයි, පාලනයට තිබෙන ආයතන මේ මේ ඒවාය, ඒවායේ මහජන නියෝජිතයන් කරන්නෙ මේ මේ ඒවාය යනාදි වශයෙන් පැහැදිලි කරවා ගැනීමට ගැමියන් උපදෙස් ලබා ගත්තෙ කාගෙන්ද? කවුරු හරි කෙනෙක් මේ කරුණු කියා දිය යුතුයි නේද? වැඩිහිටි පරම්පරාවට යම් යම් දේවල් සම්බන්ධයෙන් ගුරුහරුකම් ලබා ගන්න කෙනෙක් ගම්වල ඉන්න ඕනෑ නේද? ගුරුවරුන් දේශපාලනයෙන් අයින් කරන්න හදන්නෙ සමහර විට දේශපාලන නිදහස දුන්නොත් ගුරුවරුන්ගෙන් මේ ආණ්ඩුවට කරදර සිදුවේය කියා හිතල වෙන්න ඇති. මම නම් හිතන්නෙ නැහැ. ගුරුවරුන් හොඳ උගත් පිරිසක් නිසා ආණ්ඩුව කරන්නෙ හොඳ දේවල් නම් හොඳ දේවල් කරන ආණ්ඩුවකට විරුද්ධව ගුරුවරුන් ක්‍රියා කරාවිය කියා. ගුරුවරන්ට පුළුවන්කමක් නැහැ තමන් කෙරෙහි විශ්වාසයක් තබාගෙන ඉන්න ජනතාවට තර්ජනය කර ඒ අයගේ ඡන්දය පාවිච්චි කිරීම සම්බන්ධයෙන් බල පාන්න. ඒ වුණත් ඒ අය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ජී. සේනානායක මයා.]

යම් යම් අවස්ථාවල යම් යම් කරුණු සම්බන්ධයෙන් උපදෙස් නම් දෙනවා ඇති. පොදු දේවල් සම්බන්ධයෙන් උපදෙස් ගැනීමට ගම්වල ඉන්න හොඳම අය ගුරුවරුන් නේද? ගුරුවරුන් සිටීමෙන් මහජනයට ගැටළු ප්‍රශ්නයක් ගැන විසඳුමක් ලබා ගන්න වටිනා අවස්ථාවක් ලැබෙනව. ඒ නිසා ඒ වටිනා අවස්ථාව නැති කර දමන්න නරකයි. ඒ ගැන මතක් කරන්න ඕනෑ.

ගුරුවරුන්ට දේශපාලනය තහනම් කරද්දී තමුන්නාන්සෙලා වරායෙ කම්කරුවන්ට දේශපාලන අයිතිවාසිකම් දීල තියෙනව. ලංකා සමසමාජ පක්ෂය, කොමියුනිස්ට් පක්ෂය, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ආදි දේශපාලන පක්ෂවල වෘත්තීය සංසංගම් ඇති කර තිබෙන අතර ඒවායේ සාමාජිකයන් හැටියට වරායේ කම්කරුවන් බැඳිල නැද්ද? ඒවා දේශපාලන පක්‍ෂ නොවෙයිද? මේ උදවියට දේශපාලන බල තල පාවිච්චි කරන්න ගුරුවරුන්ට වඩා ඉඩක් තිබෙනව. ආණ්ඩුවෙන් පඩි ලබන අතර වරායේ කම්කරුවන්ට දේශපාලන පක්ෂවලටත් බැඳී ක්‍රියා කරන්න ඉඩ දී තිබෙනවා නම්, ආණ්ඩුවට තර්ජනය කරන්න යුක්ති සහගතව පුළුවන් වන හැටියට නිදහස දීල තියෙනව නම් ගුරුවරුන්ට පමණක් මෙපමණ කාලයක් තිස්සේ තිබුණු ප්‍රමාණයවත් නොදෙන්නෙ මන්ද කියල මම අහනවා. දේශපාලන බලය තිබුණු කාලෙ වුවත් රටට කිසිම හානියක් නොකර ඒවා පාවිච්චි කළා නම් ඉදිරියටත් රටට හානියක් නො කරනවා ඇති. ඒ නිසා මේ ප්‍රශ්නයත් තමුන්නාන්සෙගෙ සැළකිල්ලට භාජන වෙනවා ඇතැයි විශ්වාස කරනව.

අලුත් ඇමතිතුමා ශාසන කොමිෂන් සභා වාර්තාව ක්‍රියාත්මක කරනවය කියා ප්‍රකාශයක් කර තිබෙනව. මේ ආණ්ඩුව කොමිෂන් සභාවල් පත් කරනව. මේ රටේ සාමාන්‍ය සිරිතක් වෙලා තියෙනව කොමිෂන් සභා පත් කරන්නත්, එම කොමිෂන් සභා මගින් ඉදිරිපත් කරනු ලබන වාර්තාවල් සඟවා තබන්නත්. මේවා කැබිනට් මණ්ඩලය සලකා බලනවද නැද්ද කියා මම අහන්න කැමතියි. මේ වාර්තාවල කියන්නෙ මොනවද කියා දැන ගැනීමට ඒවා ඉදිරිපත් කරනවද කියාත් දැන ගන්න කැමතියි. කොමිෂන් සභාවක් පත් කළොත් යුතුකමක් තිබෙනව ඒ කොමිෂන් සභාවෙ වාර්තාව මේ සභාවට ඉදිරිපත් කරන්න. පඩි කොමිෂන් සභා වාර්තාවක් තිබුණ. එය මේ සභාව කවදාවත් දැක්කෙ නැහැ. බෞද්ධ තොරතුරු පරීක්ෂක කාරක සභාවක් තිබුණා, ශාසන කොමිෂන් සභාවක් තිබුණා. ඒ එකම සභාවක වාර්තාවක්වත් මේ සභාව දැක්කෙ නැහැ. මේ සභාවට ගෙනෙන්නෙ නැහැ. ඒ වාර්තා කොහේ යනවද දන්නෙ නැහැ. ඒ කොමිෂන් සභා පත් කරන්නෙ, ඒවාට බල තල දෙන්නෙ, ඒවායින් කළ යුතු දේ නියම කරන්නෙ අපියි. නමුත් ඒ සභාවල වාර්තා මේ සභාවට එන්නෙ නැහැ, සාකච්ඡා කරන්න. බෞද්ධ තොරතුරු පරීක්ෂක කාරක සභාවෙ වාර්තාව පිළිගත්ත. ඒ වාර්තාවෙ යම් යම් දේ ක්‍රියාත්මක කරන්නය කියා ශාසන කොමිෂන් සභාවක් ඇති කළා. දැන් අපේ ඇමතිතුමා කියනවලු, ශාසන කොමිෂන් සභාවෙන් ඉදිරිපත් කර ඇති යෝජනාවලින් ක්‍රියාත්මක කළ යුතු කොටස ගැන පරීක්ෂා කිරීමට තවත් අමුතු කොමිෂන් සභාවක් පත් කරන්නය කියා. බෞද්ධ තොරතුරු පරීක්ෂක සභා වාර්තාවෙ කළ යුතු වැඩ කොටස ගැන සොයන්නය කියා ශාසන කොමිෂන් සභාව පත් කළා. දැන් ශාසන කොමිෂන් සභා වාර්තාවෙ කළ යුතු වැඩ කොටස කුමක්ද කියා පරීක්ෂා කිරීමට තවත් කොමිෂන් සභාවක් පත් කරනව. ඒ කාරක සභා වාර්තාවවත් මේ සභාවට අද වන තුරු ගෙනාවෙ නැහැ. මේ වාර්තා ගැන සාකච්ඡා කිරීමට අවස්ථාවක් මේ සභාවට දීමට යුතුකමක් තිබෙනව නොවේද?

මම අහන්න කැමතියි, බෞද්ධ තොරතුරු පරීක්ෂ කාරක සභාව අනුවද ශාසන කොමිෂන් සභා වාර්තාව සකස් කර තිබෙන්නෙ කියා. බෞද්ධ තොරතුරු පරීක්ෂක කාරක සභා වාර්තාවට සම්පූර්ණයෙන්ම ප්‍රතිවිරුද්ධ විධියටයි ශාසන කොමිෂන් සභා වාර්තාව සකස් වී තිබෙන්නෙ. ශාසන කොමිෂන් සභා වාර්තාවට විරුද්ධව මහ ලොකු උද්ඝෝෂණයක් ඇති වුණ නිසා ඒ ගැන දැන් කථාවක් නැහැ. එම නිසා ශාසන කොමිෂන් සභා වාර්තාවෙ ක්‍රියාත්මක කළ යුතු වැඩ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කොටස සොයන්නය කියා තවත් කොමිෂන් සභාවක් පත් කිරීමෙ කිසිම තේරුමක් නැහැ.

තමුන්නාන්සේලාට මම එක විශෙෂ කාරණාවක් කියන්න කැමතියි. අපි කවුරුත් බෞද්ධයන් වශයෙන් අපේ ඉතිහාසයෙන් දන්නව, ශාසන පාලනය සම්පූර්ණයෙන් ප්‍රතිපත්තියක් වශයෙන් සංඝයාට භාර දී ඇති බව. ඒක අපි පිළිගන්න ඕනෑ. බුදුරජාණන් වහන්සෙ පවා තමන්ගෙ පියාට භාර දුන්නෙ නැහැ ශාසනය රැකගන්නය කියා. එදා සිටම ප්‍රතිපත්තියක් වශයෙන් ඒ කටයුත්ත භාර දී තිබුණෙ සංඝයාටයි. ශාසනය රැක්කෙ සංඝයා වහන්සේයි. අවුරුදු 2,500 ක් තිස්සෙ අපෙ සංඝයා වහන්සෙ විසින් රැකගෙන ආ අපේ ධර්මය රකින්න වාර්තා පිළියෙළ කිරීමට අවුරුදු පහෙන් පහට වෙනස් වෙන මේ ආණ්ඩුව ලැහැස්ති වෙනව. අවුරුදු 2,500 ක් රැකගෙන ආවාය කියන එක පුදුම විය යුතු දෙයක්. තමුන්නාන්සෙලා ටිකක් කල්පනා කර බැලුවොත් පෙනේවි අවුරුදු 2,500 ක් ජීවත් වුණ ජාතියක්වත් සොයා ගැනීමට අමාරු බව. අවුරුදු 2,500 ක් ජීවත් වුණ ධර්මයක් තිබෙන්නෙ බෞද්ධ ධර්මය පමණයි. මේ තරම් පැරණි ධර්මයක නිර්මලත්වය රැකගෙන, සංඝයා වහන්සේලා විසින් එය මේ තරම් කාලයක් තිස්සෙ ගෙනාවට පසුව, අවුරුදු පහෙන් පහට වෙනස් වන ආණ්ඩුව සූදානම් වෙනව ශාසනය රකින්නට. මේක මහ පිස්සු වැඩක් නොවේද? ආණ්ඩුවේ කාලය අවුරුදු පහයි. නමුත් ආණ්ඩුව ඒ අවුරුදු පහවත් රැක ගැනීමේ අපහසුව අපට පෙනෙනව. එහෙම තිබෙද්දී අපත් මෙපමණ කාලයක් වටිනා සේවයක් කළ සංඝයා වහන්සේගෙන් ධර්මය උදුරාගෙන ශාසනය සෑදීමට ඉදිරිපත් විය යුතුද කියා මා අහනවා.

ශාසන කොමිෂන් සභාව ඉදිරිපත් කර තිබෙන යම් යම් නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට ඇති කර තිබෙන සංස්ථා මොන ධර්මයකටවත් එකඟ නොවන සංස්ථා බව කියන්න පුළුවනි. යම් වැඩ පිළිවෙළක් සකස් කරන විට එය එක්තරා ප්‍රතිපත්තියක් උඩ, ධර්මයක් උඩ ගොඩනැගිය යුතු. නමුත් මේ සංස්ථා ගොඩනඟා තිබෙන්නෙ මොන එකකටවත් ගැලපෙන්නෙ නැති ආකාරයටයි. පංගුවක් සංවිධාන කර තිබෙනවා, ඡන්දයෙන් සංස්ථා බිහි කරන්න. පංගුවක් සංවිධාන කර තිබෙනවා, පත්වීම් අනුව සංස්ථා හදා ගන්න. තවත් පංගුවක් සංවිධාන කර තිබෙනවා, නොම්මර ඇදීමෙන් සංස්ථා හදා ගන්න. එපමණක් නොවෙයි, ශාසන කොමිෂන් සභාව සංස්ථා හතරකට බෙදා තිබෙනවා. උත්තරීය සංඝ සභාව, ශාසන සංඝ සභාව, විහාර සමිතිය, කෘත්‍යාධිකාරී විධායක සංඝ සමිතිය මේ ආදී වශයෙන් බෙදා තිබෙනවා. මෙන්න මේ අන්දමට මිශ්‍රව, අවුල් සහිත වාර්තාවක් ලෝකයේ කොයි රටකවත් ඉදිරිපත් කර නැහැ. උත්තරීය සංඝ සභාවය කියා එකක් හදා ගෙන තිබෙනවා. ඒ උදවියට දී තිබෙන බලතල සංඝ සභාවටත් දී තිබෙනවා. එම බලතල සහිතව, නැවතත් විහාර සමිතියට දී තිබෙනවා. මේ අන්දමට එකකට එකක් පැටලුම් සහිතවයි හදාගෙන තිබෙන්නෙ. මෙය ක්‍රියාත්මක කළොත් ශාසනය විනාශ වී යනවාට කිසිම අනුමානයක් නැහැ. ඊළඟට තමුන්නාන්සේගෙන් අහන්න කැමතියි, ගිහි උදවියගේ පාලනයට සාංඝික දේපළ දීම කොහොමද කර තිබෙන්නෙ කියා. මොන බෞද්ධ රටේද සාංඝික දේපල ගිහියන් විසින් පාලනය කරන්න ඉඩ දී තිබෙන්නෙ? ශාසන සංගමය කියා සංස්ථාවක් තිබෙනවා. මෙය සාමාජිකයන් 101 දෙනකුගෙන් සමන්විතයි. නමුත් භික්ෂූන් වහන්සේලා 19 දෙනයි ඉන්නෙ. 82 ම ගිහි අයයි. මේ ගිහි පිරිසට තමයි බෞද්ධ කටයුතු සම්පූර්ණයෙන්ම භාර වෙන්නෙ. බෞද්ධ පූජනීය ස්ථානවලින් ලැබෙන ආදායම සම්පූර්ණයෙන්ම භාර දී තිබෙන්නෙ මේ සභාවටයි. තමුන්නාන්සෙ මේවා ගැන දන්නවා නම් පුදුමවෙයි. එතකොට, සංඝ කෘත්‍යය; භික්ෂූන් වහන්සේලාගේ යම් යම් වැඩ කටයුතු, පාලනය ආදී කටයුතු, සියල්ලක්ම භාර දී තිබෙන්නෙ ගිහියන් වැඩි සංඛ්‍යාවක් සිටින මේ සංස්ථාවටයි; ශාසන සංගමයටයි.

ඊළඟට, භික්ෂූන්වහන්සේලාගේ අධ්‍යාපනයත් බෞද්ධාගම පිළිබඳව ප්‍රචාරයත් ආදී සියල්ලම භාර දී තිබෙන්නෙ ගිහියන් වැඩි සංඛ්‍යාවක් සිටින වෙනම කොමිටියකටයි. මෙම කොමිටියෙ ගිහි සාමාජිකයන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ජී. සේනානායක මයා.]

10 දෙනකු සිටින අතර භික්ෂූන් වහන්සේලා සිටින්නෙ දෙනමයි. ඊළඟට ස්වාමීන්වහන්සේලා පාලනය කරන නීතිරීති පිළිබඳව කටයුතු කිරීම සඳහා කොමිටියක් පත් කර තිබෙනවා. මෙයට ගිහියන් වැඩි සංඛ්‍යාවක් සිටින අතර භික්ෂූන් වහන්සේලා සිටින්නෙ දෙනමයි. ඊළඟට, බෞඩ සමාජ සේවය පිළිබඳව පත් කර සිටින කොමිටියට භික්ෂූන් වහන්සේලා ඇතුළත් වී තිබෙන්නෙ තුන් නමයි. වැඩි සංඛ්‍යාවක් සිටින්නෙ ගිහි පිරිසයි. ඊළඟට විහාර සහ පූජනීය ස්ථාන පාලනය කරන කාරක සභාවට ගිහියන් 10 දෙනකු සිටින අතර භික්ෂූන් වහන්සේලා සිටින්නෙ දෙනමයි. අනුරාධපුරය, පොළොන්නරුව, අටමස්ථානය ආදී බෞද්ධ පූජනීය ස්ථාන පාලනය කරන්නෙ මේ කොමිටිය මගින්, බෞඩ දේපළ, වතුපිටි වේවා, පූජනීය වස්තු වේවා, දළදා වහන්සේ හෝ වේවා පාලනය කරන්නෙ ගිහියන් වැඩි දෙනකුගෙන් යුත් කොමිටියකින්. මේවාට බෞඩ භික්ෂූන් වහන්සේලා සිටින්නෙ තුන් නමයි—නැතිනම් හතර නමයි. අන්තිමට මේ සියල්ලම සකස් කරන සංවිධායක මණ්ඩලයෙත් ඉන්න අයගෙන් වැඩි දෙනෙක් ගිහියො. භික්ෂූන් වහන්සෙල ස්වල්ප දෙනයි, ඉන්නෙ. කවදාවත් අහල තියෙනවද මෙහෙම දෙයක්. චීනයෙවත් නැහැ, මේ විධියට බොරු කරන්නෙ. අපි හදන දේට තමයි, උඹල වදින්නෙ කියා ඒ අය අපට කියනවා. ඒ රටේ බුද්ධාගම තියෙන පිළිවෙළට එහෙම කරන්න පුළුවන්. ශාසනයෙ දියුණුවටය කියා මෙහෙමත් බොරු කරන්නෙ මොකද? සම්පූර්ණයෙන්ම ගිහි පාලනයක් තියෙන්නෙ. සංඝයා වහන්සේ හෝ වේවා ගිහි අය හෝ වේවා පාලනය සඳහා ඉතාම අවංක පුද්ගලයන් සොයා ගන්නට අපට පුළුවන් නම් ඒත් කමක් නැහැ. කාවද අපි ගිහියන් වශයෙන් තෝර ගන්නෙ? සමුපකාර සමිතිවල ඉන්න අයම නේද, කඩ පාලනය කරන අයම නේද අපි මේවට තෝර ගන්නෙ? පිට රටින් උදව්ය ගෙන්වන්න යනවද මේකට? අනික් වැඩවලට ගන්න අයවම තමයි, මේවටත් ගන්න වෙන්නෙ.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னகோன்)*
(Mr. M. Tennakoon)

ශාසනයට ආලය තියෙන අය.

අ. භා. 3.45

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)

කොහොමද ඒ අය හොයන්නෙ? මේ රටේ ආවාසයක් තියෙන සෑම තැනකම අද දායක සභාවක් තියෙනවා. පන්සලට ලැදි පිරිස තමයි, ඒ දායක සභාවෙ ඉන්නෙ. අළුතෙන් විහාර සමිති ඇති කරන විට විහාර සමිතියෙ සභාපති වන්න පුළුවන්, පන්සලේ ප්‍රධාන භික්ෂූන් වහන්සෙටයි. උන් වහන්සෙ උපසම්පදා වූ කෙනෙක් වන්නට ඕනෑ. උප සම්පදා නොවූ භික්ෂූන් වහන්සේ නමකට සාමනේර නමකට විහාර සමිතියට ඇතුළු වෙන්න බැහැ. නමුත් ගිහි අය ඕනෑම කෙනකුට පුළුවන් විහාර සමිතියට ඇතුළු වන්න. ඒ අයට සීමාවක් නැහැ. හැලි අරක්කුකාරයන්ටත් පුළුවන්.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னகோன்)*
(Mr. M. Tennakoon)

හැලි අරක්කුකාරයන්ට නොවෙයි. වයස 21 පැන්න අයට පුළුවන්.

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)

වයස 21 පැන්නෙ නැති හැලි අරක්කුකාරයොත් ඉන්නවා. 21 පැනපු හැලි අරක්කු කාරයන්ටත් පුළුවන්, මිනී මරුවන්ටත් පුළුවන්, විහාර සමිතියෙ සාමාකත්වය ලැබීමට තිබිය යුතු සුදුසුකම් කියල තියෙනවා. තමා බෞද්ධයකු වශයෙන් බෞද්ධාගම ගැන විශ්වාසය ප්‍රකාශ කරන්න ඕනෑ. බෞද්ධ ප්‍රතිපත්ති අනුගමනය කරන්න උත්සාහ කරන්න ඕනෑ. ඒ වගේම තමා ඉන්න ගේ බෞද්ධ කරන්න ඕනෑ. බුදුරජාණන් වහන්සේ ධර්මය දේශනා කළේ නම් පුද්ගලයටද්. පුද්ගලයගෙ හිත පුළුවන් තරම් පිරිසිදු කරගෙන නිවන් දකින්නට වැඩ කරන්න ඕනෑය කියලයි, උන්වහන්සෙ දේශනා කළේ. ගේ බෞද්ධ කරන්න ඕනෑය කියන්නෙ ශාසන වාර්තාවෙ පමණයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னகோன்)*
(Mr. M. Tennakoon)
බෞද්ධ පරිසරයක ජීවත් වෙන්න.

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனாநாயக்க)*
(Mr. R. G. Senanayake)
මොකක්ද බෞද්ධ පරිසරය කියන්නෙ? කතෝලික බෝඩිමක ඉන්න බෞද්ධයකුට විහාර සමිතියට බැදෙන්න බැරිද?

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னகோன்)*
(Mr. M. Tennakoon)
ටිකක් අමාරුයි.

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனாநாயக்க)*
(Mr. R. G. Senanayake)
පපුව කොහොම වුණත් කමක් නැහැ, පරිසරයයි වුවමනා කරන්නෙ. කතෝලික ප්‍රදේශවලින් විහාර සමිතිවලට සාමාජික යො නැහැ. පරිසරයේ වරද, චේතනාව කොතරම් හොඳ වුණත් විහාර සමිතියට බැදෙන්න බැහැ, පරිසරය හොඳ නැත්නම්.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னகோன்)*
(Mr. M. Tennakoon)
පරිසරය චේතනාව හරිගස්සා ගැනීමට උපකාර වෙනව.

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனாநாயக்க)*
(Mr. R. G. Senanayake)
බුදුරජාණන් වහන්සේ හිටියෙ ජේත වනාරාමයෙයි. ඒ පරිසරයෙ ඌරො මැරුව. එයින් බුදු රජාණන් වහන්සෙගෙ ධර්මය කිළිටි වුණේ නැහැ.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னகோன்)*
(Mr. M. Tennakoon)
බුදුරජාණන් වහන්සේ සමග සාමාන්‍ය අය සමාන කරන්න බැහැ.

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனாநாயக்க)*
(Mr. R. G. Senanayake)
වැඩි බුරුලක් දෙන්න ඕනෑ, මීගමුව වැනි කතෝලික ප්‍රදේශවල ඉන්න බෞඬ යන්ටයි. ඒ අය එක්කෙනෙක් වුණත් කමක් නැහැ, ඒ අයට ඉඩ දෙන්න ඕනෑ. විහාර සමිතිවලට බැදෙන්න. ඒ ප්‍රදේශ වල හුඟ දෙනෙක් සොයා ගන්න බැහැ. කතෝලික ගෙවල ඉන්න අයට අවස්ථා වක් දෙන්න ඕනෑ. කොහොමද බෞඬ පරි සරයක් ඇති කරන්නෙ? බෞඬ පින්තූර යක් එල්ලුවොත් බෞඬ පරිසරයක්ද? බෞඬ ගෙයක් කියන්න බෞඬ පින්තූර යක් තියෙන්න ඕනෑද?

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னகோன்)*
(Mr. M. Tennakoon)
ගති පැවතුම්වලට උපකාර වන අයුරින්යි ගෙවල් තිබෙන්න ඕනෑ.

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனாநாயக்க)*
(Mr. R. G. Senanayake)
මොන විධියටද?

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னகோன்)*
(Mr. M. Tennakoon)
නොයෙක් දේවල් තිබෙනවා.

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனாநாயக்க)*
(Mr. R. G. Senanayake)
ඒ නොයෙක් දේවල්වලින් එකක් දෙකක් කියන්න. තමාගේ හිතේ කිළුටු ඇතොත් ගේ අතු ගෑවට එය නැතිවෙයිද? අනේ බලන්න, මෙන්න මේ උදවිය වගේ උද වියනෙ ශාසන වාර්තාව ක්‍රියාත්මක කරන් නෙ. ඉතින් බය නැද්ද? ගේ බලා කියයි මෙයා සුදුසු නැහැ, කියා. කොයි තරම් සුද්ධ ලෙස අවංකව වැඩ කරන්න හැදු වත් කියන්න පුළුවන් ගෙදර හොඳ නැහැ, ඒ නිසා බෞද්ධකමක් නැහැ කියල. අපි හැම විටම කල්පනා කරන්න ඕනෑ මේ ශාසන වාර්තාවට විරුද්ධ කවුද කියා. රන් කොත් විහාරයේ අමරපුර නිකායේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කොටස් 22ක් තිබෙනව. අපට ශාසන වාර්තාව එපාය කියා එම කොටස් 22 ම එක වචනයෙන් කියා හිටිනව. උඩරට අස්ගිරිය හා මල්වත්ත එක වරටම කියා හිටිය අපට ශාසන වාර්තාව එපාය කියා. රාමඤ්ඤ නිකායෙත් වැඩි කොටසක් එසේ කියා තිබෙනව. ඤාණසීහ හාමුදුරුවෝ වැනි අය ටික දෙනයි මෙයට කැමති. ඒ උදවියට පමණක් නිලතල ලබා ගන්නට ඒ අය කැමතියි.

මම මේ කථා කරන්නෙ මේ ප්‍රශ්නය ගැන නොදැන නොවෙයි. ලංකාවේ පන්සල් හය දහස් අට සිය ගණනක් තිබෙනව. ඒ හැම පන්සලකටම මම ලියුම් ලියා ඇරියා. ඒවාට අත්සන් ඇතිව පිළිතුරු ලබා ගෙන ඒ අනුවයි මා කථා කරන්නෙ. මෙයට පක්ෂ පන්සල් ලැයිස්තුව පෙන්වන්නය කියා මා අභියෝග කරනව. අනිත් කාරණා ලැහැස්ති නම් මේ වාර්තාව ගැන විවාද කරන්න පාර්ලිමේන්තුවට ගෙනෙන්න. එවිට තමුන්නාන්සේලාගේ අදහස් සොයා ගන්න අපට පුළුවන් වේවි. අපි තර්ක කරමු. මෙහි බැරි නම් පිටත ලැහැස්ති කරන්න. එවිට ශාසන වාර්තාවේ තිබෙන දුර්වලකම් පෙන්වන්න අපට පුළුවනි. නැත්නම් ප්‍රවෘත්ති පත්‍රවලට ලැහැස්ති වෙන්න. ආණ්ඩුව උත්තර දෙන්න. මෙපමණ කලක් ලිව්ව, එකකට වත් උත්තර දුන්නේ නැහැ. ආණ්ඩුව හෝ මෙයට පක්ෂ භික්ෂූන් වහන්සේලා හෝ මේ වාර්තාවට අත්සන් කළ භික්ෂූන් වහන්සේලා හෝ කවුරුවත් උත්තර ලියන්නෙ නැහැ. මොකක්ද හේතුව? පත්‍රවල ලියුම් තියෙනව පාර්ලිමේන්තු ලේකම්වරයා ඇක්කාද? ඇයි ලියුම් ලිව්වෙ නැත්තෙ?

ඒ නිසා රටට දැනෙන්න මේ වාර්තාව මේ සභාවට ගෙනැවිත් සාකච්ඡා කරමු. එහෙම නැත්නම් මේ වාර්තාවට පක්ෂ භික්ෂූන් වහන්සේලා කීප නමක් ඉදිරිපත් කර රටට දැන්වීම පිණිස ලොකු වාදයක් ඇති කරමු. එහෙම නැත්නම් පත්‍රවලින් මේ වාදය අරඹමු. එහෙම නැතිව මේ වාර්තාව ක්‍රියාත්මක කරන්න සූදානම් වීම මුළු ශාසනයටම කරන අපරාධයක්. වියට්නාමයේ වන සිද්ධිය තමුන්නාන්සේලා දන්නව. එය කතෝලික ආණ්ඩුවක් විසින් බුද්ධාගම මකා දැමීමට කරන උත්සාහයක්. ඒ ගැන ලංකාවෙ බෞද්ධයින් පවා සටන් කරනව. නමුත් බෞද්ධයන් විසින්ම බෞද්ධාගම විනාශ කරන්න යම් යම් වැඩ කටයුතු කරනව නම් අප කරන්නෙ මොකක්ද? වියට්නාමයේ භික්ෂූන් වහන්සේලා ජීවිත කැප කළා නම්, මෙහි එසේ නොකරයිද කියා අහන්න කැමතියි. තමුන්නාන්සේල මේ ශාසන වාර්තාව ක්‍රියාත්මක කරන්න සූදානම් වන්න. නමුත් ජීවිත කැප කරන භික්ෂූන් වහන්සේලා මෙහෙත් හිටිවිය කියා මතක් කරන්න කැමතියි. තමුන්නාන්සෙලට වැඩි කාලයක් මෙය කරන්න ලැබෙන්නෙ නැහැ.

වියට්නාමයේ වෙසක් පෙරහැරක් තහනම් කළාය කියා, බෞද්ධ අයිතිවාසිකම් නැතිකළාය කියා, තමුන්නාන්සේලා විශාල මිටින් තබා කිව්ව. නමුත් කැළණියේ අපේ දුරුතු පෙරහැර අවුරුදු 3ක් තිස්සේ තහනම් කර තිබෙනව. බුදුරජාණන් වහන්සේ වැඩි ස්ථානයක්, කැළණිය. සිංහලයාට ඉතාමත්ම වටිනා ස්ථානයක්. පෙරහැර අවුරුදු 3ක් නීතියෙන් තහනම් කර තිබෙනව. පන්සල් ආණ්ඩුව අතට අරගෙන. දොරවල්වලට ඉබ්බෝ දමල. ඊයේ පත්‍රයේ දකින්න තිබුණා වටිනා පුස්කොළ පොත් වේයො කාල කියා. පිං පෙට්ටිය තවම ආණ්ඩුව අතේ. තමුන්නාන්සෙල වියට්නාමයේ වන කරදර ගැන මෙතරම් කරුණාව මෛත්‍රිය පෙන්වනව. ඇයි ඒ කරුණාව කැළණියට නැත්තේ කියා අහන්න කැමතියි. කෝ කැළණියේ පෙරහැර? අවුරුදු 3 ක්ම තහනම් කර තිබෙනව. මුළු ලංකාවම බලා සිටින පෙරහැරක් නේද, එය? ආණ්ඩුව එහි පාලනය බාර ගත්තා නම් ඊට වගකියන්න ඕන. නැති නම් පන්සල නිදහස් කරන්න ඕන. එතකොට අපට පුළුවනි, පෙරහර පවත්වන්නට [බාධා කිරීමක්] තමුන්නාන්සෙල ගාලු මහපාරෙ භික්ෂූන්වහන්සෙල බිම දමා උන්වහන්සේලාගෙ ඔළු පැළුවෙ නැද්ද? එදා තමුන්නාන්සෙලාගෙ ඇමතිවරයා කිව්වෙත් එය මරියකඩේ දාමරිකයන් විසින් ගෙනගිය ව්‍යාපාරයක්ය කියායි. නමුත් එහි අහිංසක ශිෂ්‍ය භික්ෂූන්වහන්සෙල සිටි බව ඔප්පු වූයේ නැද්ද? උන්වහන්සෙලාගෙ පාවහන්, කුඩ ආදිය දමා ගොස් තිබුණා නේද? අද තමුන්නාන්සෙල වියට්නාමයේ ඩියම්ගේ ක්‍රියා කලාපය හෙළා දකිනවා. නමුත් තමුන්නාන්සෙලාත් අහිංසක

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

භික්ෂූන් වහන්සෙලාට වද දුන්න. අවා සනාව නම් අපේ සිංහල මිනිසුන්ට වෙන මොකක් හරි වුණාම කලින් කළ දේ අම තක වීමයි. මම එකක් කියන්නම්. අද තමුන්නාන්සෙල වියට්නාමයේ වන සිද් ධීන් හෙළා දැකීම සඳහා මෙහි රැස්වීම් තබන්නාක් මෙන් වියට්නාමිකයෝ තමුන් නාන්සෙල මෙහි කරන දේ හෙළා දැකීම සඳහා වියට්නාමයේ රැස්වීම් පවත්වාවි.

ශාසන වාර්තාවක් ඉදිරිපත් කරගෙන සාසන පාලනය කරන්නට නොයන හැටි යට මම තමුන්නාන්සෙලාගෙන් ඉල්ලා සිටිනවා. මුළු ලෝකයම අද පිළිගන්නවා, නිර්මල ථෙරවාදී බුඩාගම ලංකාවේය කියා. චීන රටේ උදවිය කියන්නෙ ලංකාව ථෙර වාද බුඩාගමේ උල්පත කියායි. ලංකාවෙ බුඩාගම රැකුනේ එය භික්ෂුන්වහන්සේ ලාට භාරව තිබුණු නිසයි. දැන් එතරම් කලක් පැවතුනු බුඩ ශාසනය තමුන්නාන් සෙලාගේ අතට ගෙන ක්‍රියා කරන්නට ලැබෙන්නේ නැහැ. විශේෂයෙන්ම මල්වතු අස්ගිරි දෙපාර්ශ්වයේම භික්ෂුන්වහන් සෙල මේ වාර්තාව ප්‍රතික්ෂේප කර තිබෙන නිසා මේ සභාවවත් ඇති කරන්න පුළුවන් වන්නේ නැත කියායි මම කල්පනා කරන් නෙ. භික්ෂුන් මර්දනය කිරීම සඳහා තමන් අතට බලය ගැනීමේ පරමාර්ථය ඇතිව ශාසන ශෝධනයක් කරන්නට යනවායයි කිව්වට යටි හිතේ අදහස පරිදි ශාසනය පාලනය කරන්නට නම් නොලැබෙන බව මම කියන්න කැමතියි.

**චන්ද්‍රසේන මුණවීර මයා.** (රත්තොට)
*(திரு. சந்திரசேன முனவீர—ரத்தோட்டை)*
(Mr. Chandrasena Munaweera—Rattota)

එහෙම චේතනාවක් ඇත්තෙ නැහැ.

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)

එහෙම නම් මේක අත්හරින්න.

**බාලසූරිය මයා.**
*(திரு. பாலசூரிய)*
(Mr. Balasuriya)

නියෝජ්‍ය සභාපතිතුමනි, මම පළමු වෙන්ම සංස්කෘතික අංශය පිළිබඳව වචන ස්වල්පයක් කීමට අදහස් කරනවා. වැලි මඩ ගරු මන්ත්‍රීතුමා සාහිත්‍යය පිළිබඳව වැදගත් කරුණු රාශියක් ප්‍රකාශ කළා. මේ රටේ සාහිත්‍ය ග්‍රන්ථ නිෂ්පාදනය කරන ආචාර්ය පරම්පරා ගණනක අය සිටිනවා. එයින් එක් කොටසක් තමයි, පේරාදෙණිය විශ්ව විද්‍යාලය අනුගමනය කරන පක්ෂය. තවත් පක්ෂයක් සිටිනවා, කොළඹ කවීන් අනුගමනය කරන.

අ. භා. 4

**කාරකසභා නියෝජ්‍ය සභාපති**
*(குழுக்களின் பிரதி அக்கிராசனர்)*
(The Deputy-Chairman of Committees)

කරුණා කර නිශ්ශබ්ද වෙන්න. රැස්වීම 4.30 වන තුරු කල් තබනවා. නැවත පටන් ගන්න විට මැද කොළඹ පළමුවන ගරු මන්ත්‍රීතුමා මූලාසනය ගන්නවා ඇති.

**රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් සිටුවන ලදින්, අ. භා. 4.30 ට ශ්‍රීමත් රසික් ෆරීඩ් මන්ත්‍රීතුමාගේ සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදි.**

**බාලසූරිය මයා.**
*(திரு. பாலசூரிய)*
(Mr. Balasuriya)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා කිය මින් සිටියේ මේ රටේ සාහිත්‍යකාරයන් ඒ ඒ ගුරු කුළය අනුව බෙදී සිටින බවයි. එයින් එක ගුරුකුළයක් පේරාදෙණි ගුරු කුළය වශයෙන් මා පෙන්වා දුන්නා. අනික කොළඹ කවිකාර කුළයයි. ඊළඟ කුළය හැටි යට පෙන්වා දෙන්ට පුළුවනි, කවර භාෂා වකින් එන අදහසක් වුණත්, කවර භාෂා වකින් එන වචනයක් වුණත් සිංහල ඌරුව ඇතුව, සිංහලයට ගැලපෙන හැටි යට, සිංහල කටට ගැලපෙන හැටියට සකස් කර පොත් ලියන ලද සාහිත්‍යකාරයන්. මේ රටේ තිබෙන ගුරුකුළ තුන හැටියට මා පෙන්වා දෙන්නේ ඒ කොටස් තුනයි. පේරාදෙනි සාහිත්‍යකාරයන්ගෙන් හෝ වේවා, අනික් සාහිත්‍යකාරයන්ගෙන් හෝ වේවා, කවර සාහිත්‍යකාරයන්ගෙන් හෝ වේවා මේ කොටස් තුනෙන්ම රටේ සාහි ත්‍යයට එක්තරා සේවයක් සිදුවී තිබෙන බව අපි පිළිගන්නට ඕනෑ. පේරාදෙනි සාහිත්‍යය කුණුහරුපවලින් යුක්තය කියා අපට පුළුවන්කමක් නැහැ, ඒ සාහිත්‍ය කාරයන් පැත්තකට තල්ලු කරන්න. ඒ වගේම පාර්ලිමේන්තුවටත්, වෙන කිසිම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බාලසූරිය මයා.]

බලවතෙකුටවත් මේ රටේ පුළුවන්කමක් නැහැ, සාහිත්‍යකාරයකුගේ කට වහන්නත්. සාහිත්‍යකාරයා ඔහුට ගැලපෙන හැටියට, ඔහුට රිසි හැටියට, ඔහුට රුචි හැටියට සාහිත්‍යය මවනව. එහෙත් අපේ යුතුකමක්ව තිබෙනව, සාහිත්‍ය දිනයෙදි, සාහිත්‍ය දිනය නිමිත්තෙන් පවත්වන උත්සවවලදි, එක් පක්ෂයකට පමණක් පක්ෂග්‍රාහී නොවී සෑම ගුරු කුළයකින්ම කවිකයන් ගෙන්වා කථා පැවැත්වීමට ඉඩ සලසන්න. එහෙත් අභාග්‍යයකට වගේ අපේ රජය එක්තරා පක්ෂයකට නැත්නම් එක්තරා ගුරු කුළයකට පමණක් ගරු කර ඒ ගුරු කුළයේ කවිකයන් 5 දෙනෙකු පමණක් එම උත්සවයේ කථා පැවැත්වීමට තෝරාගැනීමෙන් මුළු රටේම සාහිත්‍ය සේවය සඳහා ලොකු සේවයක් කළ අනිකුත් ගුරුකුළවලට ලොකු වරදක් කළාය කියා මා හිතනව.

අපේ සමහර ලේඛකයන් කුණු හරුප සාහිත්‍ය පොත් ලියනවාය කියා දැන් වැලිමඩ ගරු මන්ත්‍රීතුමා කිව්වා. වර්තමානයේ මෙන්ම අතීතයේත් ඔය විධියේ කුණු හරුප සාහිත්‍ය පොත් සිංහල භාෂාවෙන් ලියැවී තිබෙන බව සිංහල පොත්පත් කියවා බැලුවොත් පෙනී යනවා. සද්ධර්ම රත්නාවලිය, සද්ධර්මාලංකාරය, පරෙවි සන්දේශය ආදී පොත් කියවා බැලුවොත් ඔය විධියේ දේවල් ඒවායේත් ලියැවී තිබෙන බව අපට පෙන්වන්ට පුළුවන්. නමුත් ඒවායේ අද සාහිත්‍යකාරයින් කරන්නා වගේ අමූ අමුවෙ ඒ අදහස් විස්තර කරල නැහැ. ඕනෑම කුණුහරුපයක්, ඕනෑම අසභ්‍ය දෙයක් වැදගත් භාෂාවෙන් සභ්‍ය විධියට කථා කරන්ටත්, ලියන්ටත් පුළුවන්කම තිබෙනවා. සාමාන්‍යයෙන් ඒ ඒ දේවල් අසන කියවන පුද්ගලයන් ඒවා තේරුම් ගන්නෙ තම තමන්ගේ කල්පනා ශක්තිය අනුවයි. ලියු දෙයක් එකවරම කුණු හරුපයක්ය කියා අපට කියන්ට පුළුවන්කමක් නැහැ. නමුත් මේ වර්තමානයේ ලියැවී ඇති ඇතැම් පොත්පත් පාඨශාලා ශිෂ්‍යයන් භාවිතා කරනවා නම් ඒක සම්පූර්ණයෙන්ම වැරදියි. කල්පනා ශක්තියෙන් වැඩුණු අය හැටියට, වැඩිහිටියන් හැටියට මේ පොත් කියවා රසයක් විඳිනවා නම් වරදක් නැහැ. නමුත් පාඨශාලා ශිෂ්‍යයන්ට නම් මේවා භාවිතා කරන්ට ඉඩ සැලසීම අපාගතවීමට තරම් බරපතල වරදක්.

"මනමේ" නාට්‍ය ගැන මම සඳහන් කරන්ට සතුටුයි. එය ඉතාම හොඳ ශෛලියයකින් නිෂ්පාදනය වූ නාට්‍යයක්. වැරදි දේවල් වැරදිය කියනවා වගේම හොඳ දේවලට අප ස්තුති කළයුතුයි. ඒ අතින් "මනමේ' නාට්‍යය ශෛලීගත නාට්‍යයක්. ඒ වගේම විශිෂ්ඨතර සම්ප්‍රදායක් අනුව එම නාට්‍යය නිෂ්පාදනය කර තිබෙන බවත් මම සඳහන් කරන්ට කැමතියි.

අළුතෙන් බඳවා ගන්නා ශිෂ්‍ය ගුරුවරුන්ට ගෙවන රුපියල් සියයේ වේතනය ප්‍රමාණවත් නැත කියා කඹුරුපිටියේ ගරු මන්ත්‍රීතුමා සඳහන් කළා. මේ කාලයේ හැටියට මසකට රුපියල් 350 ක් වුවත් ප්‍රමාණවත් නැහැ තමයි. නමුත් අපි ඒ රුපියල් සියය ගෙවන්නෙ වේතනයක් හැටියට නොවෙයි; 'පොකට් මනි' වගේ, ස්ථිර ගුරු පත්වීමක් ලැබෙන තුරු වියහියදම් පිරිමසා ගැනීමට ගෙවන මුදලක්, මේ බඳවා ගන්න ශිෂ්‍ය ගුරුවරුන්ට සම්පූර්ණ දැනුමක් ලබා දෙන්නටත්, ඒ වගේම ඔවුන් අභ්‍යාස විද්‍යාලවලට යවා පුහුණු කරවන්නටත් අපි බලාපොරොත්තු වෙනවා. ඒ නිසා රුපියල් සියය නොවෙයි ඊට වඩා අඩු මුදලක් ගෙව්වත් වරදක් නැහැ. රුපියල් සියයක වේතනයක් නොවෙයි, අවුරුද්දක් නොමිළයේ උගන්වන්න කියා කොන්දේසියක් දැම්මත් මෙවැනි පත්වීම් සඳහා ඉදිරිපත් වන දහස් ගණන් ජ්‍යෙෂ්ඨ සමතුන් අපේ කොට්ඨාශවල සිටින බව අපි දන්නවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**

*(தலைமை தாங்கும் அங்கத்தவர்)*

(The Presiding Member)

ගරු මන්ත්‍රීතුමා දැන් විනාඩි දහයකට වඩා කථා කර තිබෙනවා. ඒ නිසා කරුණා කර කෙටි කරන්න.

**බාලසූරිය මයා.**

*(திரு. பாலசூரிய)*

(Mr. Balasuriya)

තමුන්නාන්සේගේ නීතියට මම ගරු කරනව. සාධාරණ අන්දමින් අනෙක් අය සම්බන්ධයෙනුත් ඒ විධියටම ක්‍රියා කරාවිය කියා මම හිතනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**මූලාසනාරූඪ මන්ත්‍රී**
*(தலைமை தாங்கும் அங்கத்தவர்)*
(The Presiding Member)

මම එය බොහොම සන්තෝෂයෙන් කරනවා.

**බාලසූරිය මයා.**
*(திரு. பாலசூரிய)*
(Mr. Balasuriya)

ශිෂ්‍ය ගුරු පත්වීම් ගැන කඹුරුපිටියේ ගරු මන්ත්‍රීතුමා විරුද්ධ නම් කඹුරුපිටිය කොට්ඨාශයට ශිෂ්‍ය ගුරුවරුන් පත් නොකොට නියම පුහුණු ගුරුවරුන් ලැබුණොට පසු එම කොට්ඨාශයට ඒ පුහුණු ගුරුවරුන් පත් කරන ලෙස ගරු අධ්‍යාපන ඇමතිතුමාට කියන්න. එතකොට එසේ කරනවා ඇති.

ඊළඟට විද්‍යාව ස්වභාෂාවෙන් ඉගැන්වීම ගැන වචනයක් දෙකක් කියන්ට කැමතියි. විද්‍යාව ස්වභාෂාවෙන් ඉගැන්විය යුතුයයි අධ්‍යාපන උපදේශක මණ්ඩලය තීරණය කළා. මෙය ක්‍රම ක්‍රමයෙන් සම්පූර්ණයෙන්ම ස්වභාෂාවෙන් කළ යුතුව තිබුණා. උපදේශක මණ්ඩලයේ තීරණයෙන් වැඩක් නොවුණු තැන ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් සියලු දෙනාම එකතු වී විද්‍යාව ස්වභාෂාවෙන් කළ යුතුයයි තීරණය කළා. නමුත් එයත් ක්‍රියාත්මක වුණේ නැහැ. ඊට පසු මහජනයාගෙ යහපත පිණිස, වැඩි දෙනාගෙ යහපත පිණිස, විද්‍යාව ස්වභාෂාවෙන් ඉගැන්විය යුතු බවට මන්ත්‍රීවරුන් 48 දෙනකු අත්සන් කොට පෙත්සමක් ඉදිරිපත් කළා. ඒත් මේ වැඩේ කෙරුණේ නැහැ. ඊටත් පසු විද්‍යාව ස්වභාෂාවෙන් කළ යුතුයයි මධ්‍යම කාරක සභාව විසින් තීරණය කරන්ට යෙදුණා; නමුත් තත්ත්වයෙහි කිසිම වෙනසක් වුණේ නැහැ. මන්ත්‍රීවරුන් මොනවා කිව්වත්, උපදේශක මණ්ඩල මොනවා කිව්වත්, ඒව ක්‍රියාත්මක නොවන බවයි, මෙයින් පෙනී යන්නෙ. කලා අංශයේ ශිෂ්‍යයන්ගෙන් සියයට අසූවක් පමණ දැන් ගම්බද ප්‍රදේශවලින් විශ්ව විද්‍යාලයට යන බව අප දන්නවා. එසේ වී තිබෙන්නෙ කලා අංශයේ කටයුතු සවභාෂාවෙන් කෙරෙන නිසයි. විද්‍යාවත් සවභාෂාවෙන් ඉගැන්වුවහොත් ලංකාවෙ සැම තැනකම සිටින ශිෂ්‍යයන්ට සාධාරණයක් ඉෂ්ට වෙනවායයි අප කල්පනා කරනව. විද්‍යාවත් ස්වභාෂාවෙන් ඉගැන්වුවහොත් විශ්ව විද්‍යාලයේ විද්‍යා අංශයටත් ගම්බද ළමයින් වැඩි දෙනකු තේරෙන බවට සැකයක් නැහැ.

විද්‍යාව ස්වභාෂාවෙන් කිරීම සඳහා පොත් නැතැයි, ගුරුවරුන් නැතැයි සමහරුන් කියනව. මෙය සම්පූර්ණයෙන්ම බොරුවක් බව මතක් කර දෙන්ට කැමතියි. මෙය සම්පූර්ණයෙන්ම බොරුවක් බව විශ්ව විද්‍යාලයේ ආචාර්යවරුන් හැරෙන විට අනික් සැම ආචාර්යවරයකුම ප්‍රකාශ කර තිබෙනවා. අවුරුදු ගණනක සිටම ආනන්ද විද්‍යාලයේ විද්‍යාව සිංහලෙන් උගන්වා පුරුද්දක් තිබෙන අය මේ බව පැහැදිලි වශයෙන් ප්‍රකාශ කර තිබෙනවා. නමුත් විශ්ව විද්‍යාලයේ ආචාර්යවරුන් නම් මෙය කළ නොහැකි වැඩක් බව හුවා දක්වන්ට මහන්සි ගන්නවා. විශ්ව විද්‍යාලයේ ආචාර්යවරුන්ට විද්‍යාව ස්වභාෂාවෙන් උගන්වන්ට බැරි නම් ඒ අය විශ්‍රාම ලබාගෙන ගියාට කමක් නැතැයි මා කියන්නේ විශ්ව විද්‍යාලයට බැඳී ස්වභාෂාවෙන් විද්‍යාව ඉගැන්විය හැකි හොඳ ගුරුවරුන් ලංකාවෙ සිටින නිසයි.

ඊළඟට පසුගිය දිනවල විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් විසින් කරන ලද වැඩ වර්ජනය ගැනත් වචනයක් දෙකක් කියන්ට කැමතියි. විශ්ව විද්‍යාලයීය ශිෂ්‍යයන් හාරදාහෙන් විස්සක් තිහක් දෙනා හැරුණු විට අනික් සියලු දෙනාම මේ වැඩ වර්ජනයට සහභාගි වුණා; ඒකට අනුකූලතාව දැක්වුවා. ශිෂ්‍යයන් හාරසීයක් දෙනා අතර වර්ජනයක් කළා. අවට ගම්වල සියලු දෙනාගේම සහයෝගය මේ වැඩ වර්ජනයට ලැබුණු බව මතක් කරන්ට කැමතියි. ඒ මහජනයා බත් මුල් 5,000 ක් බෙදා දෙනු මගේ ඇසින්ම දැක්කා. මේ ශිෂ්‍යයන්ගෙ සිතුම් පැතුම් බලහත්කාරයෙන් මැඩ පවත්වා ඔවුන් පැත්තකට තල්ලු කර දැමීම වැරදියි. ශිෂ්‍යයන්ගේද අදහස් විමසා ක්‍රියා කිරීමට විශ්ව විද්‍යාල පාලකයන්ට යුතුකමක් තිබෙනවා. නමුත් ශිෂ්‍යයන්ට දෙන ලද දඬුවම් ඒ විධියටම තබන්නට ඒ විශ්ව විද්‍යාල පාලක සභාව ක්‍රියා කරන බව පෙනෙන්ට තිබෙන කාරණයක්. පාලක සභාවට මේ ශිෂ්‍යයන් ගැන කිසිම අනුකම්පාවක් නැහැ. ශිෂ්‍යයන්ගෙ විරෝධය නැගී තිබෙන්නෙ අසමතාව අනුව දඬුවම් පැමිණවීම ගැනයි. එක් කෙනෙකුට එක් නීතියකුත් තවත් කෙනෙකුට තවත් නීතියකුත් තිබීම හරි නැහැ.


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**මුණවීර මයා.**
*(திரு. முனவீர)*
(Mr. Munaweera)
උඩ තට්ටු, පාත තට්ටු.

අ. භා. 4.45

**බාලසූරිය මයා.**
*(திரு. பாலசூரிய)*
(Mr. Balasuriya)
ඔව්, උඩ තට්ටු, පාත තට්ටු. ඒ විධියට තට්ටු දෙකක් තිබීම ගැන අපි විරුද්ධයි. මහජන මුදලින් පේරාදෙනියෙ විශ්ව විද්‍යාලය නඩත්තු කරනව නම්, මහජන මුදලින් ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය නඩත්තු කිරීම හොඳය කියනව නම්, මම ඉල්ලා සිටිනව ගරු අධ්‍යාපන ඇමතිතුමාට යම්කිසි විධියක බලයක් තිබෙන්න ඕනෑ කියල. පාලනය සඳහා යම් බලයක් නැත්නම් එහාට දෙන මුදල අස් කරන්න ඕනෑ. එසේ පේරාදෙනියෙ විශ්ව විද්‍යාලයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට සාධාරණය ඉටු කිරීමට මේ ආණ්ඩුව මොන ක්‍රමයක් හෝ හැකි තාක් ඉක්මනින් ඇති කරනවා ඇතැයි අප බලාපොරොත්තු වන බව ප්‍රකාශ කරමින් මගෙ කතාව අවසන් කරනව.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)
වැඩි වෙලාවක් කතා කරන්න බලාපොරොත්තු වන්නෙ නැහැ. කරුණු හතරක් පහක් පමණක් ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනව. පාසල් යන ළමයින්ට දීම පිණිස අධ්‍යාපන දෙපාර්තමේන්තුව පොත් පත් තේරීම සම්බන්ධයෙන් අනුගමනය කරන ප්‍රතිපත්තිය මොකක්ද ? එක එක කර්තෘවරුන්ට වුවමනා විධියට පොත් සකස් කර දෙපාර්තමේන්තුවට ඒවා යවා පාස් කරගෙන පෞද්ගලික ලාබ ලැබීමට ඉඩ දෙන විධියෙ වැඩ පිළිවෙළක් තවම ගෙන යනවද කියාත්, එසේ නම් ඒ ක්‍රමය වෙනස් කිරීමට ක්‍රියා කරනවද කියාත් දැන ගන්න කැමතියි.

සාහිත්‍ය අංශයේ පොත්පත් ගැන වැලිමඩ ගරු මන්ත්‍රීතුමා (කේ. එම්. පී. රාජරත්න මයා.) කිව්ව. මේ රටේ සාහිත්‍යයට අසභ්‍ය සිරිත් විරිත් ඇතුළත් කරන, අසභ්‍ය භාෂාව ඇතුළත් කරන ලද පොත් පත් කීයක් පිටවෙලා තියෙනවද කියා සොයා බලන්න ඕනෑ. ඒවා සියල්ලක්ම ගැන අධ්‍යාපන දෙපාර්තමේන්තුව වගකිව යුතුයි. එවැනි පොත්පත් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට නොලැබෙන හැටියට තහනමක් කරන්න ඕනෑ. රටට වුවමනා හැටියට අනාගත පරම්පරාව හැඩ ගසා ගන්න වුවමනා කරනව නම් එසේ කරන ලෙස මම ඉල්ලා සිටිනව. සාහිත්‍යය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ බෞද්ධ ධර්මය පිළිබඳ කථිකාචාර්යවරයා වන ආචාර්ය ඩබ්ලිව්. එස්. කරුණාරත්න විසින් සංස්කෘතික දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ විශාල පොත මට මතකයි. දීර්ඝ වාර්තාවක් අඩංගු කරමින් ඒ කථිකාචාර්යතුමා විසින් ඉදිරිපත් කරන ලද විශාල පොත ගරු ඇමතිතුමා පිළිගත්ත. එහෙත් අද වනතුරු ඒ වාර්තාව ගැන කල්පනා නොකර අද වන තුරු දෙපාර්තමේන්තුව නිශ්ශබ්දව ඉන්නෙ ඇයි කියල මම අහනව. ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ බෞද්ධ ශිෂ්ටාචාරය පිළිබඳ උගත් කථිකාචාර්යවරයකු විසින් සකස් කරන ලද ඒ පොතේ නොයෙක් වැදගත් කරුණු ඇතුළත් කර තිබෙනව. මේ රටේ සමාජය දූෂණය වන ආකාරයට මේ මේ විධියෙ කරුණු ඇතුළත් පොත් පිට වී තිබෙනවය, ඒවා ශිෂ්‍ය ශිෂ්‍යාවන් අතට යා නොදී වහාම නතර කරන්න ඕනෑය ආදි වශයෙන් ඒ වාර්තාවේ සඳහන් වෙනව. නොයෙක් අසභ්‍ය කරුණු ගැන ලියන ලද සඟරා ආදියත් පදික වේදිකාවල තබාගෙන විකුණන බවත්, හිතුවක්කාර අන්දමට කුණුහරුප ලියා ප්‍රසිද්ධ කරන බවත් කල්පනා කර වහාම ඒවා තහනම් කරන්න වැඩ පිළිවෙළක් යොදන ලෙස මම ඉල්ලා සිටිනව. ඒ ගැන තවම කිසිම අඩියක් අරන් නැහැ. මින් මත්තට අපේ පාසල්වල අධ්‍යාපනය ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට දෙනු ලබන පොත්පත් ගැන විශේෂ පරීක්ෂණයක් ඇතිව ක්‍රියා කළ යුතුයි. එය රජයේ යුතුකමක්. පාඨශාලා ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට වුවමනා කරන පොත්පත් රජය මගින් මුද්‍රණය කර අඩු මිළට ලබා දෙන්න වැඩ පිළිවෙලක් සලස්සන්න ඕන.

පාසැල් ගොඩනැගිලි නැතිම ගැන පසුගිය දවසක මා කිව්ව කරුණු සියයට සියයක්ම පිළිගන්න බව ගරු ඇමතිතුමා කිව්ව.පාසල්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගොඩනැගිලි සඳහා විශාල මුදලක් වැය කර නව. පාසැල් ගොඩනැගිලි තැනීම ගුරු දෙගුරු සමිති වලින් කෙරෙනවා නම් ඒ අය ඒවා තමන්ගෙ ගෙවල් දොරවල් මෙන් ශක්තිමත් ආකාරයට හදන්න ලැස්ති බව මතක් කරනව. තමන්ගෙ ගෙවල් හදන්න වාගෙ පාසැල් ගොඩනැගිලි ශක්ති සම්පන්නව හදන්න ඕන. ගුරු-දෙගුරු සමිති මගින් පාසැල් ගොඩනැගිලි හදන්න ඉල්ලනව නම් ඒ අයට එම වැඩය භාර දෙන්න ඕන.

අද බොහොමයක් පාසැල්වලට ක්‍රීඩා පිට්ටනි නැහැ. මහා විද්‍යාලවලට පවා ක්‍රීඩා පිට්ටනි නැහැ. මුල් වශයෙන්, මහා විද්‍යාලවල වත් වැඩිය ශිෂ්‍ය ශිෂ්‍යාවන් සිටින පාසැල් වලටත් අවශ්‍ය තරමට ක්‍රීඩා පිට්ටනි සපයා දෙන්න ඕන. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම වැඩ පිළිවෙලේ විශාල පැටලිල්ලක් තියෙනව. ක්‍රීඩා පිට්ටනි යනාදිය සඳහා පාඨශාලාවලට අක්කර දෙක තුන ඉල්ලන කොට මාස දෙක තුනක් යන්න ඉස්සෙල්ල ඒව ලබා දෙන්න වැඩ පිළිවෙළක් යොදන්න ඕන. මේ වැඩ කටයුතු ඉඩම් ඇමති අංශයේ ක්‍රියා පිළිවෙළ උඩ අවුරුදු ගණන් පස්සට යන බව පේනව. එම ඉඩම් පිළිබඳ යම් යම් අවහිර තියෙනව නම් පසුව පුළුවන්, උසාවි මගින් ඒව බේර ගන්න. එසේ අවුල් බේරා ගන්න ඉඩ තබාගෙන ප්‍රථමයෙන් කරන්න තියෙන්නෙ, පාඨශාලාවලට අවශ්‍ය ඉඩම් ප්‍රමාණය හිමිකර දෙන එකයි. තමුන්නාන්සේලාට ඉතා පහසුවෙන් නීති සකස් කර ගන්න පුළුවනි. මගේ කල්පනාවෙ හැටියට 38 වන වගන්තියෙ 6 වන කොටස උඩද කොහේද එම වැඩ පිළිවෙළ ක්‍රියාවෙ යොදවන්න පුළුවන් කියල මා හිතනව. ඒ අන්දමට ක්‍රියා කරල මාස 3 ක් යන්න ඉස්සෙල්ල අවශ්‍ය කරන ඉඩම් පාඨශාලාවලට ලබා දෙන්න වැඩ පිළිවෙළ සකස් කරන්න ඕන.

ගුරුවරුන් වශයෙන් 10,000 ක් දෙනා බඳවා ගන්න කටයුතු යොදාගෙන යනව. ඒ සඳහා 20 වන දාට ප්‍රථම ඉල්ලුම් පත්‍ර කැඳවා අවසාන කරන්න යන බව පේනව. මේ ගුරුවරුන් බඳවා ගැනීමේදී විද්‍යා අංශයෙන් සුදුසුකම් ලබා තිබෙන අයට විශේෂ සැලකිල්ලක් දක්වන ලෙස මා ඉල්ලනව. මෙතෙක් අධ්‍යාපන ඇමති අංශයෙන් සකස් කර දී තිබෙන අධ්‍යාපන ක්‍රමය මේ රටේ දියුණුවට අදාළ නැහැ. මේ රටේ පරම්පරාවෙන් සියයට 90 ක් පමණ දෙනා විද්‍යාවෙන් නොවෙයි ඉගෙනීම ලබන්නෙ. මේ රට කාර්මික අංශයෙන් සහ කෘෂිකර්ම අංශයෙන් දියුණු කරන්න නම් විද්‍යා අංශයෙන් ඉගෙනීම ලබා ගත් අය සිටිය යුතුයි. එම නිසා මේ කාරණය ගැන විශෙෂ සැලකිල්ලක් දක්වා කටයුතු කරන හැටියට මා ඉල්ලනව.

දුර බැහැර බොහෝ ප්‍රදේශවලට ප්‍රමාණවත් පරිදි පාඨශාලා නැහැ. ජනගහනය වැඩි ප්‍රදේශවල තිබෙන පාසැල්වල පවා තාවකාලික ගොඩනැගිලිවලයි කටයුතු කරගෙන යන්නෙ. මේ වර වෙන් කර තිබෙන මුදල් නිසියාකාර වියදම් කළ යුත්තෙ එවැනි වැඩවලටයි. පාසැල් ගොඩනැගිලි සෑදීමෙ කටයුත්ත ගුරු-දෙගුරු සමිති මගින් කරන්න ඉදිරිපත් වෙනව නම්, කොන්ත්‍රාත්කරුවන්ට නොදී ඒ අයට භාර දෙන්න ඕන. එසේ කළොත් අද පාඨශාලාවල තිබෙන තදබදය බොහෝ දුරට මග හරවන්න පුළුවනි. මහා විද්‍යාල තිබුණත් ඒවායේ විද්‍යා අංශ නැහැ; ගොඩනැගිලි තිබුණත් ඒ අංශ නැහැ. මේ අන්දමට ඉගෙනීම දියුණු කිරීමට අවශ්‍ය පහසුකම් නැහැ. එම නිසා මේ පහසුකම් ලබාදීමට කටයුතු කරන ලෙස තමුන්නාන්සේගෙන් මම ඉල්ලා සිටිනවා. බොහෝ ස්ථානවල ජලය නැහැ, අවශ්‍ය විදුලි බලය නැහැ. මේ නිසා නියම විධියට අධ්‍යාපන කටයුතු කරගෙන යන්න බැහැ. මේ අඩුපාඩුකම් සොයා බලා ඒවාට නියම ප්‍රතිකර්ම යොදා අධ්‍යාපන තත්ත්වය උසස් කිරීමට කටයුතු යොදන්න ඕනෑ.

බත්තරමුල්ලේ මහා විද්‍යාලයක් තිබෙනවා. එම විද්‍යාලයට වුවමනා කරන ජලය ලබාගැනීමට මාස ගණනක් තිස්සෙම වැයම් කරනවා. නමුත් මේ වනතෙක් ලැබී නැහැ. හෙට දෙනවා අනිද්දා දෙනවා කිය කියා බොරු කරනවා මිස ඒ ගැන උනන්දුවක් දක්වන්නෙ නැහැ. ඒ වාගේම ඇතැම් ප්‍රදේශවල ළමයින් හත් සියය අට සියය පැමිණෙන පාසැල් තිබෙනවා. මේවා මහා විද්‍යාල තත්ත්වයට පරිවර්තනය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.]

කරන්න ඕනෑ. මගේ කොට්ඨාව ආසනය තුළ එබඳු පාඨශාලා කීපයක්ම තිබෙනවා. මේ හැම පාඨශාලාවක්ම නියම සැලැස්මක් යටතේ දියුණු කිරීමට කටයුතු යොදන්න ඕනෑ. නියම සැලැස්මක් ඇතිව වැඩ කළොත් මගේ ප්‍රදේශයේ තිබෙන ධර්මපාල මහා විද්‍යාලය උසස්ම තත්ත්වයේ විද්‍යාලයක් බවට පරිවර්තනය කිරීමට පුළුවනි. ඒ සමගම කියන්න කැමතියි, මෙම විද්‍යාලයට කිට්ටුවම තිබෙනවා, ආනන්ද විද්‍යාලය. මෙය ප්‍රාථමික පාඨශාලාවක් කර මේ විද්‍යාල දෙක ඒකාබද්ධ කර ක්‍රමවත් වැඩ පිළිවෙළක් සකස් කළොත් ඉතාමත් දියුණු තත්වයකට පත් කරන්න පුළුවනි. ඒ වාගේම අවශ්‍ය විද්‍යා අංශ සකස් කර දුන්නොත් එම පාඨශාලාවලින් බිහි වන ශිෂ්‍යයන්ගෙන් මේ රටට නියම සේවයක් ලබාගන්න පුළුවනි. ඒ අයගෙන් මේ රටේ සංවර්ධනය ඇතිකරන්න පුළුවනි. ඒ අය මේ රටේ සංවර්ධනය සඳහා යොදන්න පුළුවනි. එම නිසා මා විසින් කරන ලද මේ ඉල්ලීමට තමුන්නාන්සේ මුල්තැන දෙන ලෙස ඉල්ලා සිටිනව. අධිරාජ්‍යවාදී යුගයේ සිට ගෙන ගිය වැඩ පිළිවෙළ අනුව ගම්බද පාඨශාලාවල ඉගෙනීම ලබන ශිෂ්‍යයන්ට මෙතෙක් විද්‍යාව ඉගෙන ගැනීමට අවකාශ තිබුණේ නැහැ. එම නිසා දැන්වත් ඒ තත්ත්වය සම්පූර්ණයෙන් වෙනස් කර අපේ ගම්බද දරුවන්ට විද්‍යාව ඉගෙනීමට අවස්ථාව සලසා දෙන ලෙස මා ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනව.

ගරු සභාපතිතුමනි, පාසල් ශිෂ්‍යයන්ට අවශ්‍ය පොත් පත් රජයේ මුද්‍රණාලයේ මුද්‍රණය කොට අඩු මිළට සපයන්න ඕනෑ. නමුත් මෙහිදී මතුවන වැදගත් කාරණය මෙයයි. මේ පොත් පත් ළමයින් අතට පත් කිරීමට පෙර, ඒ ඒ පංක්තිවල ළමයින්ගේ අතට පත් කිරීමට පෙර, ඒ පොත් සුදුසුද නැද්ද කියා පරීක්ෂා කර බලන්න ඕනෑ. අසභ්‍ය පොත්පත් ළමයින්ගේ අතට පත් කිරීම හැකි තරම් දුරට වළක්වන්න ඕනෑ. මෙතෙක් කලක් අප ඒවා ගැන කිසිවත් සැලකිල්ලක් දැක්වුවේ නැහැ. මෙවැනි අසභ්‍ය පොත්පත් මුද්‍රණය කරන අය, ලියන අය, අල්ලා හංවඩු ගහන්න ඕනෑ. ඉදිරි සමාජය හැඩ ගස්වන්න ඉන්නෙ, මේ රට ඉදිරියට ගෙන යන්න ඉන්නෙ මේ ශිෂ්‍යයන් නිසා මෙවැනි පොත් පත් ඔවුන් අතට පත් වීමෙන් ඒ අය නොමග යන්න පුළුවනි. එම නිසා පොත්පත් මුද්‍රණය රජය මගින් කරන ලෙසත්, අසභ්‍ය පොත්පත් ළමයින්ගේ අතට පත් නොකිරීමට වැඩ කටයුතු යොදන ලෙසත් ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ඒ. යූ. රොමානිස් මයා.** (දොඩන්ගස්ලන්ද)

*(திரு. ஏ. யூ. ரொமானிஸ்—தொடங்கஸ்லந்தை)*

(Mr. A. U. Romanis—Dodangaslanda)

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, මේ අවසථාවේදී අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය උඩ වචන ස්වල්පයක් කථා කිරීමට අවසථාව සලසා දීම ගැන මගේ අවංක ස්තුතිය තමුන්නාන්සේට ප්‍රථමයෙන් හිමි කරනවා. අපේ වැලිමඩ මන්ත්‍රීතුමා (කේ. එම්. පී. රාජරත්න මයා.) අද තිබෙන අපේ සාහිත්‍ය පොත්වලින් මොන තරම් හානියක් සිදුවී තිබෙනවාද කියා පැහැදිලි කර දුන්නා. අපේ රටේ මෙතෙක් කලක් තිබුණේ බුදුදහම අනුව කෙලෙස් නැවීමට අනුබල ලැබෙන අන්දමේ සාහිත්‍ය පොත් පත්. අපේ සමාජයට පුරුදු පුහුණු කළේද යහපත් පුරවැසියන් හැටියට ජීවත්වීමට හැකිවන මාර්ගයක්. නමුත් ඒ තත්ත්වය ක්‍රම ක්‍රමයෙන් වෙනස් වී කෙලෙස් නැවී මේ මාර්ග වෙනුවට කෙලෙස් වැඩීමට හේතුවන විධියට අපේ සාහිත්‍යය ටිකින් ටික සකස් වුණා. අපේ රට ක්‍රමක්‍රමයෙන් වැටීගෙන යන භයානක ප්‍රපාතයෙන් මුදා ගැනීමට ඉතා ඉක්මනින් ප්‍රතිකර්මයක් යොදන ලෙස ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් මම ඉල්ලා සිටිනවා. එය සමාජයේ යහපත ප්‍රාර්ථනා කරන අප හැමගේ බලවත් යුතුකමක් බවත් මේ අවසථාවේදී මතක් කර දෙන්න කැමතියි. නවකථා පොත් පත් මෙන්ම කවි පොත් ද වැඩි වශයෙන් ජාතක කථා මුල් කරගෙන ඒ කාලයේදී ලියැවී තිබෙන බව අපි දන්නවා. ඊට පසු කාලයේදී, ජාතිය පිළිබඳව කැක්කුමක් ඇතුව පියදාස සිරිසේන වැනි සාහිත්‍යධරයන් විසින් සාහිත්‍ය පොත් රාශියක්ම ලියා තිබෙනව. මේ පොත්පත්, ජාතිය හැදීමට වුවමනා කරන උපදේශ යන්ගෙන් යුක්තවයි සම්පාදනය කළේ. නමුත් බටහිරින් ලැබුණ ඒ තුප්පහි සංස්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කෘතිය අනුව හැඩ ගැසුණු පේරාදෙණි යෙන් අපට ලැබුණේ ජාතිය විනාශ කරන, ජාතිය මක බෑ කරන, සාහිත්‍යයක් බව මමත් මේ අවසථාවෙදි ප්‍රකාශ කරන්න කැමතියි. මෙවැනි දූෂණයන් මැඩ පැවැත් වීමට විශේෂ කොමිෂන් සභාවක් පත් කර මේවා අපේ දරුවන්ගෙ අතට නොලැබෙන අන්දමේ වැඩ පිළිවෙළක් ඇති කරන්න ඕනෑ. අපේ ගලිගමුවෙ මන්ත්‍රීතුමා කිව්ව, මේවත් තිබෙන්නට ඕනෑය, නමුත් දරුවන්ගෙ නොහොත් ශිෂ්‍යයන්ගෙ අතට පත් නොවිය යුතුය, කියා. මම දන්නෙ නැහැ මොන විධියකින්ද ඒව ඔවුන්ගෙ අතට පත් නොවී ප්‍රවේසම් කර ගත හැක් හැක්කෙ කියා. දෙමව්පියන් වශයෙන් සිටින තමුන්නාන්සෙල දන්නව ඇති, අපේ ගෙදරක යම් කිසි පොතක් පතක් තිබෙනව නම් දරුවන්ගෙන් ඒව රැක ගන්න, ආරක්ෂා කරගන්න පුළුවන් කමක් නැති බව. එසේ නම් අපට තිබෙන්නෙ, මේ පොත්පත් නැති කර, සම්පූර්ණයෙන්ම විනාශ කර, සමාජයට නොගෙන තුරන් කිරීමයි.

අ. භා. 5

මේ අලුත් සභ්‍යත්වය අනුව ඔවුන් මේ කරගෙන යන සමාජ හානිය, සමාජ උවදුර, නිසයි අද මේ පොත්පත් සමාජයට බිහි වී තිබෙන්නෙ. එම නිසා ආණ්ඩුව මේ මන්ත්‍රීවරුන්ගෙ ඉල්ලීම්වලට ඇහුම්කන් දී මේ ගැන පරීක්ෂණයක් කිරීම පිණිස වහාම කොමිෂන් සභාවක් පත් කරන හැටියට මම ඉල්ලනව. විශේෂයෙන්ම සිංහල ගැන ලැදියාවක් ඇති, ජාතික කැක්කුමක් ඇති, මන්ත්‍රීවරු දෙදෙනෙක්ම අද අධ්‍යාපනය භාරව සිටීම ගැන අපි සන්තෝෂ වෙනව. එතුමන්ලා දෙදෙනාම ජාතික සංස්කෘතිය ගැන විශෙෂ සැලකිල්ලක් දක්වන බව අපි දන්නව. එම නිසා ඇමතිතුමාටත් උප ඇමතිතුමාටත් ලැබුණු මේ අවසථාවෙදි මේ ජාතික උවදුර නැති කිරීමට තමුන්නාන්සෙල දෙපොළම උත්සාහ ගන්නව ඇත කියා අපි බලාපොරොත්තු වෙනව. මූලාසනයෙන් මට අවසර දී ඇත්තෙ මිනිත්තු 10 ක් පමණක් නිසා මා ඒ ගැන ඊට වඩා කථා කිරීමට අදහස් කරන්නෙ නැහැ.

සභාපතිතුමනි, කොට්ටාවෙ ගරු මන්ත්‍රීතුමා කිව්ව වගේ, අපි ඒ කාලයෙ පොත් කීපයකින් විශාල දැනුමක් ලබා ගත්ත. නමුත් අද දෙමව්පියන්ට උසුලන්න බැරි බරක් වන විධියට අධ්‍යාපන දෙපාර්තමේන්තුව ශිෂ්‍යයන් සඳහා පොත් නියම කර තිබෙනව. බොහෝ දෙනෙක් හඳුන් වනව වාගෙ මේකත් ජාවාරමක්ද දන්නෙ නැහැ. මේ අවුරුද්දෙ තිබෙන පොත් නොවෙයි ඒ පංක්තියට ඊ ළඟ අවුරුද්දෙ ගන්නෙ. එය හේතුකොටගෙන ළමයින් හත් අට දෙනා සිටින පවුල්වල ළමයින්ට පරණ පොත්, එනම්, තම වැඩි මහලු සොහොයුරු සොහොයුරියන් පාවිච්චි කළ පොත් පාවිච්චි කරන්න විධියක් නැහැ. අලුත් පොත්ම අවුරුද්දක් පාසා ගන්න වෙනව. අපි පිළිගන්න ඕනෑ පොත් වැඩි වුණ තරමට දැනීම වැඩි වෙන්න ඕනෑ බව. නමුත් අපට සැමදම පෙනෙන්ට තිබෙනව පොත් සංඛ්‍යාව වැඩි වුණ තරමට අපේ දරුවන්ගෙ දැනීම දියුණු වී නැති බව. එම නිසා ඒ ගැන දෙපාර්තමේන්තුවේ සැලකිල්ල යොමු කරවන ලෙස මම පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් ඉල්ලා සිටිනව.

මන්ත්‍රීතුමන්ලා කීප දෙනෙක්ම මතක් කළා, විද්‍යාව සිංහලයෙන් ඉගැන්වීම ගැන. විද්‍යාව සිංහලයෙන් උගන්වන්න බැහැ කියන අදහසක් ඉදිරිපත් වෙලා තියෙනව. ඒ අනුව නොයෙක් ඉල්ලීම් ඉදිරිපත් වෙලා තියෙනව. මේක කරන්න බැහැ කියනව නම් මේ දෙපාර්තමේන්තුවෙ නිලධාරිනුත්, උසස් අධ්‍යාපනඥයොත් කරන්නෙ කොළේ වහල ගැහීමක්. යම් කිසි භාෂාවකින් යම් කිසි දේකට නමක් කියනව නම් අපට ඕකට නමක් දා ගන්න විතරයි තියෙන්නෙ. එය ඒ නමින්ම ව්‍යවහාර කළත් කමක් නැහැ. වුවමනා කරන්නෙ හැඳින්වීමක් පමණයි. හැඳින්වීම සඳහා දැනට ඒ භාෂාවෙ පාවිච්චි කරන නමම පාවිච්චි කළත් හානියක් සිදු වන්නෙ නැහැ. අනික් හැම රටවලත් විද්‍යාව උගන්වන්නෙ ඉංග්‍රීසියෙන්ම පමණක් නම් මේ තර්කය අපට පිළිගන්න පුළුවන්. නමුත් අද ලෝකයේ අනික් හැම ජාතීන්ම විද්‍යාව සම්බන්ධයෙන් පාවිච්චි කරන්නෙ ඉංග්‍රීසි භාෂාවද? එංගලන්තයට මෙහා පැත්තෙ කිට්ටුවම තියෙන ප්‍රංශයෙ ඉංග්‍රීසි භාෂාවෙන් විද්‍යාව උගන්වනවද? නැහැ. ඕලන්දයේ ඉංග්‍රීසි භාෂාවෙන් විද්‍යාව උගන්වන්නෙ නැහැ. ජර්මනියේ ඉංග්‍රීසි භාෂාවෙන් විද්‍යාව උගන්වන්නෙ නැහැ. ඉතාලියේ ඉංග්‍රීසි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රොමානිස් මයා.]

භාෂවෙන් විද්‍යාව උගන්වන්නෙ නැහැ. ස්විට්සර්ලන්තයේ ඉංග්‍රීසියෙන් විද්‍යාව උගන්වන්නෙ නැහැ. ජපානයේ ඉංග්‍රීසියෙන් විද්‍යාව උගන්වන්නෙ නැහැ. රුසියාවේ ඉංග්‍රීසියෙන් විද්‍යාව උගන්වන්නෙ නැහැ. එහෙම නම් මොකද අපට සවභාෂාවෙන් විද්‍යාව උගන්වන්න තියෙන අමාරුව? හැබැයි පොත්පත් සපය ගන්න ටිකක් කාලයක් ගත වෙනව. අමාරුකම් තියෙන බව අපි පිළිගන්නව. ඒ අමාරුකම් තියෙනවය කියා අපි මේක හදාගන්නෙ නැතිව හිටියොත් අප බලාපොරොත්තු වන්නෙ හැම දම මේ විධියටම ගෙන යන්නද? අපි ඉංග්‍රීසි උගන්වනව. දැන් අවුරුදු 150 ක් ගත වුණා. තවමත් බැරි වුණා අපට සියයට හතකට වැඩි ප්‍රමාණයකට ඉංග්‍රීසි දැනුම ලබා දෙන්න.

**මුණවීර මයා.**
*(திரு. முனவீர)*
(Mr. Munaweera)

කව්ද කීවෙ ඔය ගණන්? මොන වාර්තාවෙද තියෙන්නෙ? පච්ච පල් බොරු කියන්න එපා.

**රොමානිස් මයා.**
*(திரு. ரொமானிஸ்)*
(Mr. Romanis)

මොකක්ද පච්ච පල් බොරුව? එයාගෙ වාර්තාවෙ ගණන් එයා අරගෙන ඇති. පච්ච පල් බොරු කියල මේ රට රවටන්න තමයි, තමුන්නාන්සෙලට පුළුවන්. අපි නොවෙයි, පච්ච පල් බොරු කියන්නෙ. ඒ.බී.සී.ඩී. කියන්න දැන ගත්තොත් ඉංග්‍රීසි දන්නවය කියා තමුන්නාන්සෙල හිතනව ඇති. හරියට ඉංග්‍රීසි දන්න අය මේ රටේ සියයට 7 ක් වත් නැති බව මම ඔප්පු කරනව. තමුන්නාන්සෙ පුළුවන් නම් ඔප්පු කරන්න, ඊට වැඩිය කියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කාලය කන්නයි, මේ ලෑස්ති වන්නෙ. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් ඔය විධියට කීවොත් මට වැඩිපුර කාලය ගන්න වෙනව. මේ රටේ, මේ ලෝකයේ ඇති හැම භාෂාවක්ම අපේ දරුවන්ට ඉගෙන ගන්න පුළුවන් නම් මම බොහොම සන්තෝෂ වෙනව. නමුත් අපේ භාෂාව වන සිංහල භාෂාව තියෙන්නෙ මේ රටේ පමණයි. අපි මේක මැරෙන්න නොදී ආරක්ෂා කර ගන්න ඕනැ. අපට ජාතික ගෞරවයක් තියෙනව නම්, ජාතික දයාවක් තියෙනව නම්, අපේ භාෂාව වෙන රටක නැති නිසා, අපේ සිංහල භාෂාව ලක්ෂ ගණනකට පමණක් සීමා වූ භාෂාවක් නිසා අපි එය ආරක්ෂා කර ගන්න ඕනැ. අපි එය ආරක්ෂා කර ගත්තෙ නැත්නම් ඉදිරි පරම්පරා අපට ශාප කරනව ඇති. විශේෂයෙන්ම අපේ සෑම ඉගැන්වීමක්ම මව් භාෂාවෙන් කිරීමට—අපේ දරුවන්ට මව් භාෂාවෙන් ඉගැන්වීමට—වැඩ පිළිවෙළ ක්‍රමවත්ව සකස් කරන ලෙස ගරු ඇමතිතුමාගෙනුත්, අමාත්‍යංශයෙනුත් ඉල්ලා සිටිනවා.

මා ඒ ගැන ඊට වඩා යමක් කියන්න යන්නේ නැහැ. දැන් මා කියන්නෙ අපට තිබෙන අමාරු තත්ත්වය ගැනයි. මී ළඟට මගේ ප්‍රදේශයේ තිබෙන අඩුපාඩුකම් ගැන තමුන්නාන්සේට මතක් කරනවා. විශේෂයෙන්ම ඉඩම් හිඟය ඉතාමත්ම තදින් බලපානවා. පාසැල්වලට ක්‍රීඩා භූමි නැහැ. සමහර තැන්වල පාඨශාලාවල ගොඩනැගිලිවලට පමණක් ඉඩම සීමා වී තිබෙනවා. ශිෂ්‍යයින්ට ගොඩනැගිල්ලෙන් පිටත අඩිය තබන්න වී තිබෙන්නේ පිටස්තර කෙනෙකුගේ ඉඩමකටයි. අධ්‍යක්ෂ යටතේ තිබුණු පාසැල් කීපයක්ම දැන් රජයට අර ගෙන තිබෙනවා. රත්කිරිමඩ කියන පාසැලේ වැට තිබෙන්නෙ බිත්තියේ.

ඒ වාගේම මහා විද්‍යාලවලට අවශ්‍ය ක්‍රීඩා භූමි නැහැ. උපකරණ නැහැ. විද්‍යාගාර නැහැ. ගොඩනැගිලි නැහැ. එම නිසා මේ ගැන සොයා බලන්නය කියා මා අධ්‍යාපන ඇමතිතුමාගෙන් ඉල්ලනවා. මා මීට කලිනුත් ඉල්ලීමක් කළා. 36 වැනි වගන්තිය යටතේ හදිසියේ ඉතාමත්ම අවශ්‍ය පාසැල්වලට පමණක්වත් ඒ ඉඩම් ලබා ගැනීමට ක්‍රියා කරන හැටියට මා ගෞරවයෙන් ඉල්ලනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
*(தலைமை தாங்கும் அங்கத்தவர்)*
(The Presiding Member)

ගරු මන්ත්‍රීතුමාට අයිති වෙලාව දැන් අවසානයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**රොමානිස් මයා.**
*(திரு. ரொமானிஸ்)*
(Mr. Romanis)

එමෙන්ම ජ්‍යෙෂ්ඨ සමතුන් පාසැල්වලට බඳවා ගැනීම ගැන ඇමතිතුමා ප්‍රතිඥාවක් දී තිබෙනවා. මම ඒ ගැන සන්තෝෂයි. නමුත් එක වරක් වෙනත් දෙයක් කියා තිබුණා. එහෙත් ළඟදී එතුමා කෑගල්ලේදී කළ ප්‍රකාශය ගැන සතුටු වෙනවා. විශේෂත්වයක් නැතිව සුදුසුකම් අනුව මේ ගුරුවරුන් 10,000 බඳවා ගැනීමට මා සතුටු වෙනවා.

මා හිතන විධියට, අපේ ජ්‍යෙෂ්ඨ සමතුන් තමන්ගේ ඉදිරි දියුණුව සලකා ගෙන ඔය නියම කර තිබෙන පඩියට සේවය කරන්නට මැළිවන්නෙ නැහැ. දැන් වේලාවත් නැහැ. නමුත් මේ ටිකත් කියන්නට ඕනෑ. මේ පාසැල් කොල්ලය තවමත් මේ රටේ තිබනවා. දෙපාර්තමේන්තුව දන්නවාද කියා මම දන්නෙ නැහැ. නමුත් නම් ගම් ඇතිව අහවල් පුද්ගලයා මේ විධියට කරන වාය කියා දෙපාර්තමේන්තුවට ලියා යැව්වා. මේ ගැන ක්‍රියා කරන්නය කියා දැන්නුවා. තවම ක්‍රියා කරන පාටක් නම් නැහැ. මඩිතියගොල්ල පාසැල ආරම්භ කර ගුරුවරුන් බඳවා ගෙන රුපියල් දාහ දෙ දාහ අරගෙන තිබෙනවා. මගේ කොට්ඨාශයෙත් එක පාසැලක් ආරම්භ කළා. දැන් නම් ඒ පුද්ගලයා එහාට එන්නෙ නැහැ. ඔහු කෑගල්ලේ විජයසුන්දර කියා පුද්ගලයෙක්. ඔහු මුළු ලංකාවේම මේක කරගෙන යනවා. අනුරාධපුර දිස්ත්‍රික්කයේ මේ සම්බන්ධයෙන් පගා ගැනීමක් ගැන දැන් ඔහු හිර භාරයේ සිටිනවා කියා අපට ආරංචියි. කෙසේ හෝ අද නීතියේ රැහැනට අසු වී තිබෙන බව දැනගන්නට ලැබීම ගැන සන්තෝෂයි. මේක තවමත් කරගෙන යනවා. ගිය සතියේ සිවුරක් පොරවා ගෙන සිටින පුද්ගලයෙක් අපි අල්ලා දුන්නා. ගුරු පත්වීම් අරගෙන දෙනවාය කියා රුපියල් 800ක් ලබා ගත්තාය කියා සහතික කර ලියා අත්සන් කළ ලියමනකුත් ඉදිරිපත් කළා. එම නිසා විශේෂයෙන්ම මේ ගැන තමුන්නාන්සේලා සලකා බලන්න ඕනෑ. මේ ව්‍යාපාරය තවමත් ගෙන යනවා.

තවත් කියන්නට තිබෙන්නේ මගේ ප්‍රදේශයේ පාසැල් 45ට ගුරුවරුන් 115ක් අඩුයි.

**බාලසූරිය මයා.**
*(திரு. பாலசூரிய)*
(Mr. Balasuriya)

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, මා කී දෙයක්ය කියා මන්ත්‍රීතුමා ප්‍රකාශයක් කළා. මා කීවේ ලේඛකයින් ලියන දේ තහනම් කරන්න බැහැ. මා කීවේ ඒ ලියන දේ ළමයින්ගේ අතට පත් වන්නට ඉඩ නොතබා වැඩි හිටියන්ට ඕනෑ නම් බැලුවාට වරදක් නැහැ කියන එකයි. ගෙවල්වල තබන්න කිව්වේ නැහැ.

**රොමානිස් මයා.**
*(திரு. ரொமானிஸ்)*
(Mr. Romanis)

මම දන්නේ ' නැහැ, වැඩි හිටියන්ට බලන්න ගන්නා පොත් දරුවන්ගේ අතට යයිද නැද්ද කියන එක.

**බාලසූරිය මයා.**
*(திரு. பாலசூரிய)*
(Mr. Balasuriya)

ලේඛකයන්ට ලිවීම තහනම් කරන නීතියක් ලෝකයේ කොතැනකවත් නැහැ.

අ. භා. 5.15

**රොමානිස් මයා.**
*(திரு. ரொமானிஸ்)*
(Mr. Romanis)

හිතේ පහළ වන අදහස් පොත් ගිනි තැබුවාට අස් කළ නොහැකි බව මම දන්නව. ඒ කවිය මම දන්නව. දෙමව්පියන්ට දරුවන්ට හොරා පොත් බලන්න අමාරු බවයි, මම කිව්වෙ.

මගේ කොට්ඨාශයේ පාසල් ගුරුවරු 115 කගේ හිඟයක් තිබෙනව. ඒ නිසා ඒ ගැන විශෙෂයෙන් සලකා බලන මෙන් මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනව.

**ඩී. එම්. ගුණසේකර මයා.** (බිබිලේ)
*(திரு. டீ. எம். குணசேக்கர—பிபிலே)*
(Mr. D. M. Gunasekere—Bibile)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කොට්ඨාශයේ පාසල් ගොඩනැඟිලි රාශියක් සාදා තිබෙනව. තවත් ගොඩනැඟිලි දීමට බලාපොරොත්තුවකුත් තිබෙන නිසා මම ඒ ගැන යමක් කියන්න බලාපොරොපොරොත්තු වෙන්නෙ නැහැ. ගොඩනැඟිලි සෑදීමේදි දැනට ග්‍රාම සංවර්ධන සමිතිවලට නැත්නම් ගුරු දෙගුරු සමිතිවලට කිසිම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. එම්. ගුණසේකර මයා.]

බලයක් ඇත්තෙ නැහැ. සමුපකාර සමිති වලට පමණයි, ඒ බලතල දී තිබෙන්නෙ. ඒ නිසා තම ළමයින්ගේ පාසල් සාදා දීම සඳහා ගුරු දෙගුරු සමිතිවලට බලය දෙන්නය කියා මම ඉල්ලා සිටිනවා. දැනට ග්‍රාම සංවර්ධන සමිතිවලට පාසල් ගොඩනැගිලි සෑදීම සඳහා ලැබෙන ආධාර මදි. කලින් සියයට 50 යි දුන්නෙ. නමුත් අළුත් ඇමතිතුමා සියයට 75ක් දෙනවා. මම ඉල්ලා සිටිනවා සියයට 100ක්ම ආධාර දෙන්නය කියා.

ග්‍රාම සංවර්ධන සමිති මඟින් පිට්සර බද සාදනු ලබන පාසල් රජයට ගත යුතුයි. අපේ ප්‍රදේශවල හැතැප්ම 25ක් පමණ පයින් යාමට සිදු වෙන ස්ථාන තිබෙනවා. ඒ ස්ථානවල රජයෙන් පාසල් හදන්නෙ නැහැ. ග්‍රාම සංවර්ධන සමිති මඟින් එවැනි ස්ථානවල පාසල් ගොඩනැගිලි සාදන්නෙ පාසල් ඒ ස්ථානවලට අවශ්‍ය නිසයි. සමහර විට නගරබදව එවැනි ගොඩනැගිලි සාදනවා, ගුරුවරුන්ට රක්ෂා ලබාගැනීම සඳහා. නමුත් ඌව වැනි දුෂ්කර පළාත්වල ග්‍රාම සංවර්ධන සමිති මඟින් පාසල් ගොඩනැගිලි සාදන්නෙ රක්ෂා ලබාගැනීමට පමණක් නොවෙයි. පාසල් ඒ ස්ථානවලට අවශ්‍ය නිසයි. බිබිලේ එවැනි පාසැල් කිහිපයක් තිබෙනවා. සමහර පාසල් රජයට ගත්ත. තවත් පාසලක් බිබිලේ තිබෙනවා. එය හැතැප්ම 18ක් පමණ ඈතිනුයි තිබෙන්නෙ. එහි අවුරුදු එකහමාරක් පමණ කාලයක් වැඩ කළ ගුරුවරයාට තවමත් රක්ෂාව ලැබී නැහැ. රිටිගහවත්ත කියන පාසලයි, ඒ. ඒ ගැන සොයා බලා ඒ ගුරුවරයාට රක්ෂාව ලබා දෙන හැටියට මම ඉල්ලා සිටිනවා.

දුෂ්කර පළාත්වල වැඩ බලන මුල් ගුරුවරුන්ට රුපියල් 25 ක විශෙෂ දීමනාවක් ඉස්සර ගෙව්වා. මන්ද ? ඒ අයට කිසිම සැප පහසුකමක් නැති නිසයි. නිවාස පහසුකමක් ඇත්තෙ නැහැ. වෙනත් පහසුකම් ඇත්තෙත් නැහැ. ඒ නිසයි. බදුරළිය හැතැප්ම 18ක් දුර පයින් යන්නට තිබෙන පාසලක්. එහි ගුරු නිවාසයක් ඇත්තෙ නැහැ. ජල පහසුකම් ඇත්තෙත් නැහැ. තවත් බොහෝ අඩුපාඩුකම් තිබියදී ඒ ගුරුවරු සේවය කරනවා. ඒ නිසා ඔවුන්ට අර රුපියල් 25 විශෙෂ දීමනාව දෙන ලෙස මම ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

තවත් ප්‍රශ්නයක් ගැන මතක් කරන්ට තිබෙනවා. එය මා කවදත් මේ ගරු සභා වෙදි කියන එකක්. මීට කලින් මේ කරුණ පෞද්ගලිකවත් ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාට මතක් කර තිබෙනවා. ඌව ප්‍රදේශයට ගුරු අභ්‍යාස විද්‍යාලයක් දිය යුතු බව ගැමි කොමිසන් සභා වාර්තාවේ යෝජනා කර තිබෙනවා. අපි මේ ඉල්ලීම කරන්ට පටන් ගන්ට කලින් 1952 දී ඒ කොමිසන් සභාව මේ යෝජනාව ඉදිරිපත් කළා. ඌවේ අධ්‍යාපන තත්ත්වය පිළිබඳව සොයා බැලූ ගැමි කොමිසන් සභාව ඌවට අභ්‍යාස විද්‍යාලයක් දිය යුතුයයි නිර්දේශ කර තිබෙනවා. 1952 සිට නැත්නම් 1956 සිට ක්‍රියාත්මක කරන්ට ලැහැස්ති වී සිටි ඒ වාර්තාවේ සඳහන් මේ යෝජනාව තවමත් ඉටු කර නැහැ. ඊයෙ පෙරේදා පත්‍රයකත් තිබෙනවා මා දැක්ක "ඌවට අභ්‍යාස විද්‍යාලයක්" කියා ශීර්ෂයක්. එහෙත් මේ දක්වා ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ගයක් ගෙන තිබෙනවායයි මා හිතන්නෙ නැහැ. උඩරට ගැමි කොමිෂන් සභා වාර්තාව ක්‍රියාත්මක කරනවායයි කියන නිසා පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් මා ඉල්ලා සිටිනවා, මේ යෝජනාව ගැන ඉක්මනින් කටයුතු කර ගුරු අභ්‍යාස විද්‍යාලයක් එහි පිහිටුවන්න කියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එච්. එස්. සී. විභාගය, විශ්ව විද්‍යාල ප්‍රවේශ විභාගය ආදි උසස් විභාගවලට අපේ ප්‍රදේශවලින් පෙනී සිටින ශිෂ්‍ය-ශිෂ්‍යාවන් නුවර විභාග මධ්‍යස්ථානයකට හෝ කොළඹ විභාග මධ්‍යස්ථානයකට හෝ එන්නට ඕනැ. ඌව පළාතේ බිබිලේ වැනි ප්‍රදේශවල සිට කොළඹට එන්නට ඕනැ. එතරම් දුර ප්‍රදේශයකින් ශිෂ්‍යයෙකුට කොළඹට එන්ට පුළුවන්කමක් නැහැ. මන්ද? කොළඹට මීට කලින් ඇවිත් නැති උදවියත් සිටිනවා. ඒ නිසා ඌව ප්‍රදේශයේ උසස් විභාගවලට පෙනී සිටින ශිෂ්‍යයන්ගේ පහසුව සඳහා විභාග මධ්‍යස්ථානයක් ඒ ප්‍රදේශයේ ඇති කරන මෙන් මා ඉල්ලා සිටිනවා.

තවත් විශේෂ කාරණයක් මතක් කළ යුතුයි. මොස්කව් විශ්ව විද්‍යාලයෙන්, ලුමුම්බා විශ්ව විද්‍යාලයෙන් ශිෂ්‍යත්ව ලබාගෙන ඉගෙනීම ලබන ලාංකික සිසුන් 170ක් පමණ එහි සිටිනවා. ඒ උදවිය ඒ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විශ්ව විද්‍යාලවලින් උපාධි ලබාගෙන ලංකාවට පැමිණීමෙන් පසු, ඔවුන්ගේ උපාධි ලංකා අධ්‍යාපන දෙපාර්තමේන්තුව පිළිගන්නවාද යන්න ගැන මෙතෙක් අධ්‍යාපන දෙපාර්තමේන්තුව තීරණයක් ගෙන නැහැ. වැඩිදුර අධ්‍යාපනය සඳහා රටෙන් පිට වී ගිය ඒ උදවිය මේ රටට නැවත එන විට ඉන්ජිනේරුවෙක් වෙලා එනව නම්, දොස්තර කෙනෙක් වෙලා එනව නම්, ඇයි ඒ උදවිය ඒ තත්ත්වයෙන් පිළිගන්ට බැරි? අධ්‍යාපන දෙපාර්තමේන්තුවට බැරි ඇයි, ඒ උදවියට රක්ෂා දෙන්න? ඇයි ඊට කටයුතු නොකරන්නෙ? අපේ ලාංකික ශිෂ්‍යයන් උසස් අධ්‍යාපනයක් ලබාගෙන පැමිණෙන විට ඒ උදවියට ඒ සහතිකයට මේ රටේ රක්ෂා දෙන්ට ඕනෑ. ඒ උපාධියට, ඒ සුදුසුකමට වෙන රටවල රක්ෂා දෙනවා නම් අපේ ලාංකිකයන්ටත් ඒ අයිතිවාසිකම දිය යුතුයි. මොස්කව් විශ්ව විද්‍යාලයේත්, ලුමුම්බා විශ්ව විද්‍යාලයේත් ඉගෙනීම ලබා උපාධි ලබාගෙන පැමිණෙන ලාංකික ශිෂ්‍යයන්ට අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් රක්ෂා සපයා දෙනවාද? ඒ වගේම ඒ උදවියගේ උපාධි අධ්‍යාපන දෙපාර්තමේන්තුව පිළිගන්නවාද යන්න ගැන ස්ථිර ප්‍රකාශයක් කරන ලෙස ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනව.

ඊළඟට කියන්ට තිබෙන්නෙ පේරාදෙනියෙ ලංකා විශ්ව විද්‍යාලය ගැනයි. ඊයේ පෙරේදා සිට, නැත්නම් අවුරුදු ගණනට පෙර සිට පේරාදෙනි විශ්ව විද්‍යාලයේ අවුලක් පවතිනව. ඒ ගැනත් වචනයක් කියන්ට ඕනෑ. පේරාදෙනි විශ්ව විද්‍යාලය සම්බන්ධයෙන් මේ ලඟදීත් මේ ගරු සභාවේ සාකච්ඡාවක් ඇති වුණා. ඒ විශ්ව විද්‍යාලය පටන් ගත්තේ අධිරාජ්‍යවාදී ධනේශ්වර අදහස් ඇති අවධියකයි. ඒ ක්‍රමය උඩම ඒ අඩිතාලම උඩම එහි පාලක පක්ෂය අදත් කටයුතු කරන බව අපට පෙනී යනව. එසේ කරන බව අපි ප්‍රසිද්ධියේ කියනව. විශේෂයෙන්ම අනික් රටවල් දෙස බලන විට අපට පෙනී යනව, ඒ රටවල විශ්ව විද්‍යාලයවල පාලක මණ්ඩලවලට ශිෂ්‍ය නියෝජිතයන් පත් කර සිටින බව. එදා අපි මොස්කව් විශ්ව විද්‍යාලයට ගිය අවස්ථාවේදීත්, ලුමුම්බා විශ්ව විද්‍යාලයට ගිය අවස්ථාවේදීත් අපට දකින්ට ලැබුණා, ශිෂ්‍ය නියෝජිතයන් ඒ පාලක මණ්ඩලවලට පත් කර සිටින බව. අපටත් පුළුවන්කම තිබෙනව, ඒ ක්‍රමය අනුගමනය කරන්න. දරදඬු නීති පනවන විට, පන්ති භේදය අනුව එක්තරා කොටසකට සලකන විට ඒ පිළිබඳව ශිෂ්‍යයන්ගේ අදහස් ඉදිරිපත් කිරීමට පාලක මණ්ඩලයට ශිෂ්‍යයන් ඇතුළත් කළ යුතුයි. එවිට ඔවුන්ටත් අවස්ථාවක් ලැබෙනව, ඒ පිළිබඳව සාකච්ඡා කරන්න. අප මේ ගරු සභාවේදී සාකච්ඡා කොට මහජන මුදලින් විශ්ව විද්‍යාලයේ නඩත්තුව සඳහා විශාල මුදලක් වෙන් කරනවා. නමුත් එහි පාලනය ගැන තොරතුරු විමසන්නට අධ්‍යාපන ඇමතිවරයාට බලයක් නැහැ. වෙනම ආණ්ඩුවක් වගේ තත්ත්වයක් විශ්ව විද්‍යාලයට දී තිබෙනවා. එම නිසා මා ඉල්ලා සිටින්නේ, විශ්ව විද්‍යාලයේ දැනට පවතින තත්ත්වය වෙනස් කරන්ට නම් අධ්‍යාපන ඇමතිවරයා සතුව දැනට වඩා බලතල තියෙන්ට ඕනෑ. නොඑසේ නම් විශ්ව විද්‍යාලයේ උපකුලපති වශයෙන් ආණ්ඩුව මගින් යම් නැනැත්තෙක් පත් කරනු ලැබීමට පුළුවන්කමක් තිබෙන්ට ඕනෑ. අන්න ඒ ආකාරයට කටයුතු නොකළොත් විශ්ව විද්‍යාලයේ පාලක මණ්ඩලය තව දුරටත් අධිරාජ්‍යවාදී ධනේශ්වර අදහස් අනුව විශ්ව විද්‍යාලයේ කටයුතු ගෙන යනවා ඇති. විශ්ව විද්‍යාලය යයි කියන්නේ හොඳ පුරවැසියන් තනන කම්හලකටයි. ඒ නිසා විශ්ව විද්‍යාලයේ පාලන ක්‍රමය වෙනස් කිරීමට කටයුතු නොයෙදුවහොත් විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්ට අවුලක් නැතිව සාමකාමීව විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනය ලබා පිට වී යන්නට පුළුවන් වෙන එකක් නැහැ. මේ කාරණය ගැන විශේෂ සැලකිල්ලක් දක්වා ක්‍රියා කරන ලෙස මා ගරු අධ්‍යාපන ඇමතිතුමාගෙනුත් අධ්‍යාපන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්තුමාගෙනුත් ඉල්ලා සිටිනවා.

අ. භා. 5.30

**මොහමඩ් අලි මයා.**
*(ஜனாப் முகம்மது அலி)*
(Mr. Mohamed Ali)

*கௌரவ தலைவர் அவர்களே! கல்வி அமைச்சின் மான்யம் சம்பந்தப்பட்ட இந்த முக்கியமான விவாதத்திலே நானும் சில குறிப்புக்களைக் கூற விரும்புகிறேன். எங்க*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මොහමඩ් අලි මයා.]

ளுடைய நேரத்தை நீங்கள் கட்டுப்படுத்தியிருப்பதன் காரணமாக மிக நிதானமாக எனது பேச்சைச் சுருக்கிக் கொள்வேன்.

இந்த அரசாங்கத்தினுடைய கல்விக் கொள்கை என்னவென்பதை கௌரவ அமைச்சர் அவர்கள் இச்சபைக்கு முதலில் நன்கு தெளிவு படுத்த வேண்டும். இன்று இந்த நாட்டின் கல்விக் கொள்கை ஒரு ஸ்திரமற்ற நிலையில் இருக்கின்றது. இந்த அரசாங்கத்தின் கல்விக் கொள்கை காரணமாக விசேஷமாகத் தமிழ் பேசும் மக்கள் தத்தளித்துக் கொண்டிருக்கும் ஒரு நிலையைக் காணக்கூடியதாக இருக்கிறது. எனவே கௌரவ அமைச்சர் அவர்கள் தம்முடைய கல்விக் கொள்கை என்னவென்பதைத் தெளிவு படுத்த வேண்டும். தம்முடைய கல்விக் கொள்கையை அவர் எவ்விதம் அமுல் நடத்தப் போகிறார் என்பதையும் ஆணித்தரமான முறையில் விளக்கிப் பதில் தர வேண்டும். வரவு செலவுத் திட்டம் சபைக் குழுவில் பரிசீலனை செய்யப்படும் பொழுது எமது கருத்துக்களைத் தெரிவிப்பதற்கு வசதியாக எதிர்க்கட்சி அங்கத்தவர்களாகிய நாம் சில மான்ய வெட்டுக்களைத் திருத்தப் பிரேரணை ரீதியாகச் சமர்ப்பித்திருக்கிறோம். எனவே இந்த விவாதங்களிலே முக்கிய பங்கு கொள்ள எங்களுக்கு உரிமை இருக்கிறது. அரசாங்கக் கட்சி அங்கத்தவர்கள் தங்களுடைய அபிப்பிராயங்களையும் குறைகளையும் அரசாங்கக் கட்சிப் பாராளுமன்ற அங்கத்தவர்களின் கூட்டங்களில் தெரிவிக்கலாம். ஒவ்வொரு அமைச்சிலும் இருக்கின்ற ஆலோசனைச் சபைகளிலும் தங்களுடைய அபிப்பிராயங்களைத் தெரிவிக்க அவர்களுக்கு அவகாசம் இருக்கிறது. எங்களுக்கு எங்களுடைய தொகுதிகளின் குறைகளைத் தெரிவிக்க இப்படியான ஒரு சந்தர்ப்பம்தான் உண்டு. எனவேதான் இத்தகைய சந்தர்ப்பங்களில் என்ன கஷ்டம் ஏற்பட்டபோதிலும் எங்களுடைய தொகுதிகளின் குறைகளை எடுத்துக் கூற வேண்டிய அவாவுடன் நாம் இருக்கிறோம்.

கௌரவ அமைச்சர் அவர்களுக்கு இச் சந்தர்ப்பத்தில் நான் ஒன்று கூற விரும்புகிறேன். ஆசிரியர்களைப் பொறுத்த அளவில் அவர் எல்லோரையும் சமமாகப் பாவிக்க வேண்டும். தமிழ் ஆசிரியர்கள், சிங்கள ஆசிரியர்கள், ஆங்கில ஆசிரியர்கள் என்று ஆசிரியர்களுக்கிடையில் எவ்வித வேறுபாடும் காட்டாமல் அனைவரையும் சமமான முறையில் நடாத்த வேண்டும். அதோடு இந்த ஆசிரியர்களுக்கிடையில் வேறுபாடெதுவும் இல்லாத முறையில் சம சம்பளம் கொடுத்து அனைவரையும் சமமாகப் பாவிக்க அரசாங்கம் நடவடிக்கை எடுக்க வேண்டுமென்று கேட்டுக் கொள்ளுகிறேன். கௌரவ கல்வி அமைச்சர் தொகுதிவாரியாகப் பாடசாலைகளைத் திருத்தவும் கட்டடங்களை அமைக்கவும், சம்பந்தப்பட்ட தேவைக்கு வேண்டிய நிலங்களைப் பெறவும் பணம் ஒதுக்கியிருக்கிறார். ஒவ்வொரு தொகுதி அங்கத்தவர்களைப் பொறுத்த வரையில் இப்படியாகப் பணம் ஒதுக்கப்பட்டிருக்கிறது. ஆனால் என்னைப் பொறுத்த அளவில் இன்றுவரை என் தொகுதி சார்பாகக் கிடைக்கக்கூடிய பணத்தைப் பற்றிய தகவலே எதுவும் கிடைக்கவில்லை. இதைப் பற்றி எனது கருத்தை அவரது கவனத்திற்கு நேற்றைய தினம் எடுத்துக் கூறியிருக்கிறேன். இப்படித் தொகுதிவாரியாக அவர்கள் இச் சபையிலுள்ள அங்கத்தவர்களுக்கு பணமொதுக்கும் பொழுது பாகுபாடில்லாத விதத்தில் ஒதுக்க வேண்டுமென்று கேட்டுக் கொள்ளுகின்றேன்.

கனம் அக்கிராசனரவர்களே, நான் அறிந்த அளவில் எதிர்க்கட்சி அங்கத்தவர்களுக்கு ஐம்பதினாயிரம் ரூபாதான் ஒதுக்கப்படுவதாகத் தெரிகின்றது. ஆனால் அதே நேரத்தில் தங்களுக்கு வேண்டிய அரசாங்கக் கட்சி அங்கத்தவர்களுக்கு ஒரு இலட்சம், ஒன்றரை இலட்சம், இரண்டு இலட்சம் ரூபா வரை ஒதுக்கப்பட்டிருப்பதாகவும் நான் அறிகின்றேன். இது உண்மையாக இருக்குமேயானால் இது பாரபட்சமான, மிக்க கண்டனத்துக்குரிய செயலாகும் என்று கூறக் கடமைப்பட்டவனாக இருக்கின்றேன்.

சமீபத்தில் கல்வி இலாகா, ஆசிரிய மாணவர்களைத் தெரிவு செய்வதற்காக விண்ணப்பங்கள் கோரப்படுகின்றனவென்று அரசாங்க வர்த்தமானியில் பிரசுரம் செய்திருந்தார்கள். சிங்கள மொழியில் சிரேஷ்ட பாடசாலைத் தாராதரப் பத்திரப் பரீட்சையில் சித்தியடைந்தவர்களுக்கே விண்ணப்பிக்க உரிமையுண்டென்றும் பிரசுரித்திருந்தார்கள். இப்பதவிக்கு சுமார் பத்தாயிரம் பேர்கள் வரை எடுக்கப் போவதாக அறிகிறோம். தமிழ் பேசும் பாராளுமன்ற அங்கத்தவர்களாகிய நாங்கள்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

கௌரவ கல்வி அமைச்சருக்கு இதைப் பற்றி எடுத்துக் கூறி, தமிழ் மாணவர்களும், முஸ்லிம் மாணவர்களும் பாரபட்சமின்றி இப் பரீட்சைக்குத் தோற்றுவதற்கான வசதிகளைச் செய்து கொடுக்க வேண்டுமென்று கேட்ட பொழுது, கௌரவ அமைச்சரவர்கள் எங்களது கோரிக்கையிலிருந்த நியாயத்தை உணர்ந்து, எங்கள் வேண்டுகோளை ஏற்று, தமிழ், முஸ்லிம் மாணவர்கள் தமிழ் மொழி மூலம் ஆசிரிய மாணவர்களாகத் தெரிவு செய்யப்படுவதற்கான நடவடிக்கையை எடுத்திருப்பது குறித்து அமைச்சரவர்களை நான் மனமாரப் பாராட்டுகின்றேன்; எங்கள் அனைவர் சார்பிலும் நன்றியறிதலைத் தெரிவித்துக் கொள்ளுகின்றேன். இந்த நேரத்தில் ஒரு முக்கியமான விஷயத்தையும் கூற விரும்புகின்றேன். ஆசிரிய மாணவர்களை நியமிக்கும் பொழுது அரசியற் கண்ணோட்டமின்றி, நேர்மையான முறையிலே தகுதியானவர்களை நியமிக்க வேண்டும். இந் நியமனங்களில் தகுதிதான் முக்கியமேயன்றி அரசியற் செல்வாக்கு முக்கியமல்ல. நீங்கள் போட்டிப் பரீட்சை வைத்தால், அரசியற் செல்வாக்கைப் பாவித்து எப்படியாவது நியமனம் பெற்றுவிடவேண்டுமென்ற நோக்கத்துடன் இப்பொழுதே எத்தனையோ மாணவர்கள் அரசாங்கப் பிரதிநிதிகளுக்குப் பின்னால் திரிய ஆரம்பித்து விட்டார்கள். இப்படியான நெருக்கடி ஏற்படாமல், நல்ல முறையிலே, நேர்மையான விதத்திலே இந் நியமனங்களைச் செய்ய வேண்டும் என்று கௌரவ அமைச்சர் அவர்களை வற்புறுத்திக் கேட்டுக் கொள்ள விரும்புகின்றேன்.

அடுத்ததாக, என்னுடைய தொகுதி சம்பந்தமான சில குறிப்புக்களை எடுத்துக் கூறி, எனது பேச்சின் முக்கியமானதொரு கட்டத்துக்குச் செல்ல விரும்புகின்றேன். மூதூர், கிண்ணியா ஆகிய கிராமங்களிலிருக்கும் மகாவித்தியாலயங்களுக்குப் பட்டதாரிகளை அதிபர்களாக நியமிக்க வேண்டுமென்று கேட்டுக்கொள்கின்றேன். இப்பொழுது சாதாரண ஆசிரியர்கள் பலர் பதில் அதிபர்களாக நியமனம் செய்யப்பட்டிருக்கின்றார்கள். அப்படிப் பதிலதிபர்களாக நியமனம் செய்யப்பட்டிருக்கும் ஆசிரியர்களுக்குத் தகுதி இருக்குமேயானால் அவர்களை நிரந்தரமாக்குங்கள், அல்லாவிட்டால் அவர்களை அகற்றி, பட்டதாரிகளை அதிபர்களாக நியமனம் செய்யுங்கள் என்று கேட்டுக் கொள்ளுகின்றேன்.

கந்தளாவை மகாவித்தியாலயம் பற்றியும் ஒரு குறிப்புக் கூற விரும்புகின்றேன். கந்தளாவை மகாவித்தியாலயத்தில் நூற்றுக்கு நூறு வீதம் சிங்கள மாணவர்களே கல்வி கற்று வருகின்றார்கள். அம் மாணவர்களின் பெற்றோர்கள் பட்டதாரி ஒருவரை அம் மகாவித்தியாலயத்துக்கு அதிபராக நியமிக்க வேண்டுமென்று கேட்டார்கள். அவர்களுடைய வேண்டுகோளுக்கிணங்க, பட்டதாரி அதிபரொருவர் நியமிக்கப்பட்டும் அரசியல்வாதிகளின் தலையீட்டினால் அந்த நியமனம் ரத்து செய்யப்பட்டுவிட்டது. அதன் பின்னர் அப் பெற்றோர்கள் என்னிடம் வந்து முறையிட்டார்கள். "பட்டதாரி அதிபர் நியமனத்தை ரத்து செய்துவிட்டு ஒரு சாதாரண ஆசிரியரை அதிபராகப் போட்டிருக்கின்றார்கள், அதை நீங்கள் கல்வி அமைச்சரின் கவனத்துக்குக் கொண்டு வந்து ஆவன செய்ய வேண்டும்" என்று அவர்கள் என்னிடம் கேட்டார்கள். அவர்களது மகஜரை நான் கல்வி அமைச்சர்களிடமே கொடுத்தேன். இன்று காலை திருவாளர் துரைசிங்கம் அவர்கள் பட்டதாரி ஒருவரை அம் மகாவித்தியாலயத்துக்கு அனுப்பத் தீர்மானித்திருப்பதாகக் கூறினார். அது உண்மையாக இருக்குமானால், அது குறித்து நான் மிக்க மகிழ்ச்சியடைகின்றேன். அது உண்மையாக இல்லாவிட்டால், கந்தளாவை மகாவித்தியாலயத்துக்கு உடனடியாகச் சிங்களப் பட்டதாரி அதிபரொருவரை நியமிக்க வேண்டும் என்று கேட்டுக் கொள்ளுகின்றேன்.

என்னுடைய தொகுதியில் முஸ்லிம் மக்களுக்கு இரண்டு மகாவித்தியாலயங்கள் இருக்கின்றன. சிங்கள மக்களுக்கு இரண்டு இருக்கின்றன. ஆனால் தமிழ் மக்களுக்குத் தம்பலகாமம்பற்றில் மாத்திரம் ஒரு மகாவித்தியாலயம் இருக்கின்றது. அவர்களுக்குக் கொட்டியாரப்பற்றிலும் ஒரு மகாவித்தியாலயம் அமைத்துக் கொடுக்க வேண்டுமென்று கேட்டுக் கொள்ளுகின்றேன். தங்களுக்கு மகாவித்தியாலயம் ஒன்று கொடுக்கப்பட வேண்டுமென அவர்களும் வற்புறுத்திக் கொண்டே வருகின்றார்கள். அதையே நானும் இத் தருணத்தில் இவ்விடத்தில் வற்புறுத்திக் கூறுகின்றேன்.

என்னுடைய தொகுதியில் ஏராளமான பாடசாலைக் கட்டடங்கள் உடைந்திருக்கின்றன. பாடசாலைகளுக்குப் போதிய கட்டடங்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මොහමඩ් අලි මයා.]

கள் இல்லை. மாணவ மாணவிகள் படிக்கத் தளபாடங்கள் இல்லை. கிணறுகள் இல்லை. பாடசாலைகளைச் சுற்றி வேலிகள் இல்லை. மலசலகூடம் இல்லை. நல்ல மேசை வாங்குகள் இல்லை. விளையாட்டுத் திடல்கள் இல்லை. ஆசிரியர்கள் வசிப்பதற்கான வீட்டுவசதிகள் எதுவுமேயில்லை.

**රාසමානික්කම් මයා.**
*(திரு. இராசமாணிக்கம்)*
(Mr. Rasamanickam)

வேறு என்ன இருக்கின்றது?

**මොහමඩ් අලි මයා.**
*(ஜனாப் முகம்மது அலி)*
(Mr. Mohamed Ali)

உடைந்த வாங்குகள், கதிரைகள் இருக்கின்றனவே யன்றி அனேக பாடசாலைகளிலே திருப்திகரமான தளபாடங்கள் எதுவுமேயில்லை என்று வற்புறுத்திக் கூற விரும்புகின்றேன். நான் என்னுடைய தொகுதி பற்றி இன்னும் ஒரு விஷயத்தைக் கூறிவிட்டு, வேறு விஷயத்துக்குச் செல்ல ஆசைப்படுகின்றேன்.

மூதூர்ப்பகுதிக்கு கடந்த பல ஆண்டுகளாக பாடசாலைப் பரிசோதகர் (Inspector of Schools) ஒருவரை நியமித்திருந்தீர்கள். ஆனால் இப்பொழுது அவரைத் தலைமைக் காரியாலயத்துக்கு மாற்றிவிட்டீர்கள். இப்பொழுது அவருக்குப் பதிலாக பதில் பரிசோதகரொருவரைப் போட முயற்சிக்கின்றீர்கள். மூதூர் மிகவும் பிற்போக்கான ஒரு பகுதியாதலால், அதற்கு பதிற் பரிசோதகர் ஒருவரை நியமிக்காமல், நிரந்தரமான பரிசோதகரொருவரை நியமிக்கும்படி கேட்டுக் கொள்ளுகின்றேன். Appoint a permanent Inspector of Schools for the Muttur area.

அடுத்ததாக, புத்தகங்களைப் பற்றியும் ஒரு வார்த்தை குறிப்பிட விரும்புகின்றேன். கௌரவ வெலிமடைப் பிரதிநிதி (திரு. கே. எம். பி. ராஜரத்ன) மிகவும் அழகான முறையிலே, எங்களுடைய நாட்டிலே எத்தனையோ எழுத்தாளர்கள் இருக்கின்றார்கள், எத்தனையோ புத்தகங்களை அவர்கள் எழுதியிருக்கின்றார்கள், அவர்கள் எழுதிய புத்தகங்களை நாங்கள் பாவிப்பதற்குப் பதிலாக வெளிநாடுகளிலிருந்து முற்காலத்திலே நாங்கள் பெற்று வந்த புத்தகங்களையே இன்னமும் எங்கள் பாடசாலைகளில் பாவித்துக் கொண்டு வருகின்றோம் என்று கூறினார். அதை நான் வரவேற்று, எங்களது நாட்டிலேயுள்ள பல பெரியார்கள் எழுதிய புத்தகங்களை எங்களுடைய பாடசாலைகளிற் பாவிப்பதற்கான முயற்சிகளை நீங்கள் எடுக்க வேண்டும் என்று கேட்டுக் கொள்ளுகின்றேன்.

அடுத்ததாக, நான் மிகவும் முக்கியமாகக் கூறவேண்டிய விடயம் என்னவென்றால், இன்று எங்கள் பாடசாலைகளில் படிப்பிக்கும் அரபி ஆசிரியர்களைப் பற்றியதாகும். அரபி ஆசிரியர்கள் மிகவும் பாரபட்சமான முறையில் நடத்தப்பட்டுக்கொண்டிருக்கின்றார்கள். 1956 ஆம் ஆண்டுக்கு முன் அரபி ஆசிரியர்களை நியமிக்கும் போது வருடத்துக்கு 804 ரூபா சம்பளம் அவர்களுக்குக் கொடுக்கப்பட்டது. அதன்பின் நியமனம் செய்யப்பட்டவர்கள் பாரபட்சமான முறையில் சம்பளம் பெற்று வருகின்றார்கள். இவர்கள் வருடத்துக்கு 624 ரூபா வீதம் பெறுகின்றார்கள். இன்னும் சிலர் வருடத்துக்கு 648 ரூபா வீதம் பெறுகின்றார்கள். இன்னும் சிலர் வருடத்துக்கு 788 ரூபா வீதம் பெறுகின்றார்கள். ஏன் இந்தப் பாகுபாடு என்று கேட்க விரும்புகின்றேன்.

அரபி ஆசிரியர்கள் பல வருடங்களாக 'மத்ரஸா' க்களில் பல பாடங்களையும் பயின்று, "அல் ஆலிம்" என்ற பட்டத்தைப் பெற்று திறமையான, தராதரமுடைய மௌலவிகளாக வெளிவருகின்றார்கள். அப்படியிருந்தும் அவர்களை ஏன் நீங்கள் பாரபட்சமான முறையில், சம்பள வித்தியாசங்களுடன் நியமனம் செய்கின்றீர்கள் என்று கேட்க விரும்புகின்றேன். மௌலவிகள் அத்தனை பேரையும் சமமாகப் பாவித்து எல்லோருக்கும் வருடத்துக்கு 804 ரூபா சம்பளம் கொடுக்க வேண்டுமென்று வற்புறுத்திக் கூற விரும்புகின்றேன்.

All Arabic teachers employed by the Department of Education have the same minimum qualifications. Moulavis with a certificate in Arabic, who were appointed previous to 1956, started on an annual salary of Rs. 804. Moulavis appointed after that are being paid on a different basis; some of them are paid Rs. 624 per annum, some are paid Rs. 648 per annum, and some others are paid

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Rs. 788 per annum. I would like to know from the Hon. Minister as to why this discrimination is being shown to these Moulavis.

அடுத்ததாக, பரீட்சைப் பகுதியினர் மௌலவிமார்களை நல்ல முறையில் தெரிவு செய்வதற்கான திட்டமொன்றை வகுத்து, 1963 ஆம் ஆண்டிலும் அதன் பிறகும் சில பிரமாணங்களுடன் ஒரு பரீட்சை நடத்த முயற்சியெடுத்திருக்கின்றார்கள். இதை நான் வரவேற்கின்றேன். அத்துடன் அந்தப் பரீட்சையைத் தாமதிக்காமல் நடத்தவேண்டுமென்றும் கேட்டுக்கொள்கின்றேன்.

கடைசியாகக் கூறவிரும்புவது என்னவென்றால், ஆசிரியர்கள் அநீதமான முறையிலே மாற்றம் செய்யப்படுகின்றார்கள். அதைக் குறிப்பிடாமல் இருக்க முடியாது. அவ்வாசிரியர்களின் பெயர்களை நான் இங்கு குறிப்பிடுகின்றேன். திருவாளர் எம். எச். எம். கரீம், பலாலி ஆசிரியர் பயிற்சிக் கல்லூரியிற் பயின்றவர், 1961 ஆம் ஆண்டு தந்தி மூலம் திடீரென்று ஒருவித காரணமுமின்றி கிண்ணியா மகா வித்தியாலயத்திலிருந்து காலிக்கு மாற்றப்பட்டார். நாம் இதை ஆட்சேபித்தோம். எங்கள் ஆட்சேபனைக்கு எதுவித பதிலும் தரப்படவில்லை. என்ன காரணத்துக்காக அவர் மாற்றப்பட்டார் என்பதும் கூறப்படவில்லை. அடுத்ததாக, ஜனாப் எம். எஸ். ஏ. சலாம் எனும் ஓர் உதவி ஆசிரியர் கிண்ணியாவிலுள்ள பாடசாலையொன்றிலிருந்து திடீரென்று தந்தி மூலம் புத்தளத்துக்கு மாற்றப்பட்டார். இதுவும் 1961 ஆம் ஆண்டு நடந்தது. அம்மாற்றத்துக்கான காரணம் எதுவும் இருக்கவில்லை.

1961 ஆம் ஆண்டு தமிழ் பேசும் மக்களாகிய நாங்கள் எங்களுடைய மொழியுரிமைப் போராட்டத்தில் ஈடுபட்டுக் கொண்டிருந்தோம். அந்த நேரத்திலே நாங்கள் சத்தியாக்கிரகம் நடாத்திய இடத்தில் சில ஆசிரியர்கள் காணப்பட்டார்கள் என்று சொல்லி, அப்படி அவர்கள் சத்தியாக்கிரகத்தில் கலந்துகொண்டிருந்தாலும் விசாரணை எதுவும் நடத்தாமல், ஒரு காரணமும் காட்டாமல் இரு ஆசிரியர்களைத் தந்திமூலம் இடமாற்றம் செய்தார்கள். இவர்களில் ஒருவர் புதிதாகச் சடங்கு முடித்தவர். மற்றவர் சடங்கு முடிக்க ஆயத்தம் செய்துகொண்டிருந்தவர். இவர்களில் ஒருவரைக் காலிக்கும் மற்றவரைப் புத்தளத்துக்கும் தந்திமூலம் மாற்றியிருக்கிறீர்கள். இந்த விடயத்தை நீங்கள் சிந்தித்துப் பார்த்து அவ்வாசிரியர்களை அவர்களுடைய சொந்த இடங்களுக்கு விரைவிலே மாற்ற வேண்டுமென்று நான் கேட்டுக்கொள்ளுகிறேன்.

என்னுடைய தொகுதி மிகவும் பிற்போக்கான தொகுதியாகையால் என்னுடைய தொகுதியின் கல்வித் தேவைகளைக் கவனித்து ஆவன செய்து தர வேண்டுமெனக் கேட்டு, எனக்குப் பேசுவதற்குச் சந்தர்ப்பமளித்தமைக்காகத் தங்களுக்கு நன்றி தெரிவித்து எனது பேச்சை முடித்துக் கொள்ளுகின்றேன்.

අ. භා. 5.45

**කුසුමා රාජරත්න මිය.** (ඌව-පරණගම)
(திருமதி குஸுமா ராஜரத்ன—ஊவ-பரனகம)
(Mrs. Kusuma Rajaratna—Uva-Paranagama)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ වචන ස්වල්පයක් කථා කරන්නට මටද අවස්ථාවක් සලසා දීම ගැන තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙනවා. අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් ගුරුමාරු සම්බන්ධව අනුගමනය කරන ප්‍රතිපත්තිය කුමක්දැයි ප්‍රථම කොටම ප්‍රශ්න කරන්ට කැමතියි. ගුරුවරුන් මාරු කරන්නේ අවුරුද්දේ මුල හරියේදීද? අගදීද? නැත්නම් හැමදාමද? අවුරුද්ද මුළුල්ලේම ගුරුවරුන් මාරු කරන බව අපට යම් යම් සිද්ධින්ගෙන් පෙනී යනවා. සමහර ගුරුවරුන්ට එක පාසලක හය මාසයක්වත් ඉන්ට දෙන්නෙ නැහැ. මෙසේ කිරීමෙන් පාඩු සිදු වන්නෙ ගුරුවරුන්ට නොව පාඨශාලා ශිෂ්‍ය ශිෂ්‍යාවන්ටයි. මේ අවස්ථාවේදී හොඳ නිදර්ශනයක් ඉදිරිපත් කරන්ට කැමතියි. වැලිමඩ පැවති පසුගිය අතුරු මැතිවරණ කාලයේදි වැලිමඩ ඡන්දදායක කොට්ඨාශයේ වංගියකුඹුර මහා විද්‍යාලයට, විද්‍යාලයාධිපතිවරයකු පත් කරන්ට යෙදුණා. ඒ පත්කිරීම ගැන අපේ කිසිම ඉල්ලීමක් තිබුණේ නැහැ. ඒ විද්‍යාලයාධිපතිවරයා ඒ පාඨශාලාවෙ හය මාසයක් විතර වැඩ කරගෙන ගියායින් පසු ඔහු වෙනත් තැනකට මාරු කළා. නමුත් ඒ මහතාගෙ භාර්යාවත් දරුවන් තිදෙනාත් වංගියකුඹුර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කුසුමා රාජරත්න මිය.]

විද්‍යාලයේමයි. වංගියකුඹුර විද්‍යාලය දියුණු කරගෙන ආ විද්‍යාලයාධිපතිවරයකු ඒ විද්‍යාලයෙන් වෙන විද්‍යාලයකට මාරු කිරීම ගැන ඒ ප්‍රදේශයේ ගම්වැසියන් අග මැතිනියට පවා පෙත්සම් ඉදිරිපත් කළා. ඒ විද්‍යාලය දියුණු කරගෙන ආ නිසා ඔහු එහි සිටිය යුතු බවට ඉල්ලීමක් කළා.

ඒ වාගේ අපට ලැබී තිබෙන එක පෙත්සමක් කියවීමට තමුන්නාන්සේ අවසර දේවි යයි සිතනවා. මේක ගරු අගමැතිනියට යැවූ පෙත්සමක්. වංගියකුඹුර විද්‍යාලයාධිපතිතුමා මාරු කිරීම සම්බන්ධ ඒ පෙත්සම මේකයි :

" ගරු අගමැතිනි

සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය වෙතය.

ගරු අගමැති මැතිනියනි,

මෙහි පහත අත්සන් කරන අපි බ/වන්ගිය කුඹුරේ මහා විදුහලේ සිසුන්ගේ දෙමාපියෝ වම්හ.

මෙම විදුහලේ විදුහල්පතිතුමා විදුලි පුවතක් මාර්ගයෙන් මාරු කර යැවීම ගැන ඔබතුමියට කරුණු කියනු කැමැත්තෙමු.

අපේ දරුවන් අවුරුදු 50ක් පමණ මුලුල්ලේ තමන්ගේ සෙල්ලම්පිටිය වශයෙන් පාවිච්චි කළ ඉඩම ඔබතුමියගේ මස්සිනා සහ සහෝදරිය කවු කම්බි ගසා අවුරා තේ පැළ සිටුවා තිබුණ හෙයින් මෙම ඉඩම පාසැලට පවරා දිය යුතු යයි ආණ්ඩුවෙන් ඉල්ලීමට ගුරු දෙගුරු සමිතිය තීරණය කළා. ඒ තීරණය විදුහල්පතිතුමා අධ්‍යාපන දෙපාර්තමේන්තුවට දන්වා හැරියේය.

ඒ නිසා මෙතන වරද කර තිබෙන්නෙ විදුහල්පතිතුමා නොව දෙමාපියන් වන අපය. ඔබතුමියගේ සහෝදරියගේ හා මස්සිනාගේ (කපිතාන් දිවිතොටවෙල මහතාණන් හා එම මැතිනියගේ) ඉඩම පාසැලට පවරා ගන්නා ලෙස අප කීමෙන් අප කළේ වරදක් අපි නොදන සිටියෙමු. එම නිසා අප කළ වරදට අපට සමාව දෙන්න. එසේ නැතිනම් අපට දඬුවම් කරන්න. අහිංසක විදුහල්පතිතුමා මාරු කර යවා ඔහුට දඬුවම් නො කරන ලෙස අධ්‍යාපන නිලධාරීන්ට නියෝග කරන ලෙස ඉතා යටහත් භාවයෙන් අපි ඉල්ලා සිටිමු.

අපේ ඉල්ලීමක් ආණ්ඩුවට ඉදිරිපත් කරන්නට යාමෙන් විදුහලට ඉතා අගනා සේවයක් කර තිබෙන විදුහල්පතිතුමා දඬුවම් ලබා තිබීම ගැන දුප්පත් අපේ දරුවන්ගේ සිත් තුළ මහත් වේදනාවක් ඇතිවී තිබේ.

ඔබතුමියගේ සහෝදරියගේ සහ මස්සිනාගේ ඉඩම පාසැලට ගත යුතු යයි ආණ්ඩුවට කීමෙන් වරද කළ අපට දඬුවම් දී අහිංසක විදුහල්පතිතුමා නිදහස් කොට විදුහල්පති හැටියට සේවය කිරීමට ඔහුට ඉඩ දෙන ලෙස නියෝග කරන ලෙස අපි ඔබ තුමියගෙන් ගෞරවයෙන් ඉල්ලමු."

මේ පෙත්සමට විශාල සංඛ්‍යාවක් අත්සන් තබා තිබෙනව. දිවිතොටවෙල මහත්මයාගේ මේ ඉඩම වන්ගියකුඹුරේ මහා විද්‍යාලයේ ක්‍රීඩා භූමිය සඳහා පාසැලට ලබා දෙන්න කියා ඒ විද්‍යාලයේ ශිෂ්‍යයන්ගේ දෙමාපියන් ඉල්ලා සිටියා.

ඒ විදුහල්පතිතුමා එම යෝජනාව ඉදිරිපත් කළා, දෙපාර්තමේන්තුවට. එච්චරයි, කළේ. ඒකයි, වරද. එම යෝජනාව ඉදිරිපත් කරනවත් එක්කම මොකද වුණේ ? අගමැතිනියගෙ නෑදෑ පිරිස එතුමිය ළඟට ඇවිත් කියල වැඩි දවසක් යන්න පෙර එතරම් හොඳට සේවය කරගෙන ආ ධර්මවර්ධන නමැති ඒ විදුහල්පතිතුමා මාරු කෙරෙව්ව. මා අගමැතිනියට පුද්ගලිකව දෝෂාරෝපණයක් කරනව නොවෙයි, මේ. ගරු ඇමතිතුමාට මේ අවස්ථාවෙදි දෝෂාරෝපනයක් කරන්නෙත් නෑහැ. ඇමතිතුමාගෙත් පාර්ලිමේන්තු ලේකම්තුමාගෙත් අත පය බැඳලයි තියෙන්නෙ ; කට වල් වහලයි තියෙන්නෙ. අගමැතිනිගෙ නියෝගය උඩ මේ ධර්මවර්ධන මහත්මයා එම පාඨශාලාවෙන් මාරු කෙරුව. අවුරුද්ද අවසානයේදි එසේ කිරීමෙන් කාටද පාඩු වුණේ ? මා ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් අහනව, කාටද පාඩු වුණේ කියල. පළාත්වාසීන්ට සහ අර විශ්ව විද්‍යාල ප්‍රවේශ පන්තියේ ඉගෙනීම ලබමින් සිටි ශිෂ්‍ය පිරිසටයි, පාඩු වුණේ.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

ගරු මන්ත්‍රීතුමිය අසන කරුණු පිළිබඳව වචනයෙන් වචනයට උත්තර දෙන්නද, කරුණු කියල ඉවර වුණහම උත්තර දෙන්නද ?

**කුසුමා රාජරත්න මිය.**
*(திருமதி குஸுமா ராஜரத்ன)*
(Mrs. Kusuma Rajaratna)

කුමන විධියට හරි කමක් නැහැ ; උත්තර දෙන්න. එම ක්‍රියාවෙන් පාඩු සිදු වුණේ ශිෂ්‍ය පිරිසටයි. අගමැතිනිය, නෑදෑයන්ගෙ කීම අහල අර අසරණ ගුරු මහතාව මාරු කෙරුව. මේ ගෙනියන ප්‍රතිපත්තිය කුමක්ද කියල මා රජයෙන් අහන්න කැමතියි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අවුරුද්ද මුළල්ලේම ගුරුවරුන් මාරු කරනව. මගෙ කොට්ඨාශයෙත් තියෙන තත්ත්වය ඕකයි. එක තැනක මාස 3 ක් ඉන්න ඉස්සෙල්ල වෙන තැනකට මාරු කරනව. එසේ මාරු කළාම ඒ ගුරුවරුන් කොපමණ අමාරුවකට පත් වෙනවද කියා කල්පනා කර බලන්න. එසේම එවැනි ගුරුවරුන්ගෙන් ඉගෙනීම ලබන දරුවන්ගෙ තත්ත්වය ගැන කල්පනා කර බලන්න. මා ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් ඉල්ලා සිටිනව අර විද්‍යාලයාධිපතිතුමා නැවතත් වංගියකුඹුර මහා විද්‍යාලයට මාරු කරන්නය කියා ගරු ඇමතිතුමාට දන්වන හැටියට. ගරු අගමැතිණිය හිතන්න ඇති ඒ මාරු කිරීමෙන් අපට පහර වැදුනය කියල. අපට නොවෙයි පහර වැදුනෙ. ඉගෙන ගන්න දුප්පත් ශිෂ්‍යයන්ටයි. මගෙ කොට්ඨාශයෙ එක්සත් ජාතික පක්ෂයට පන්දම් අල්ලන ගුරුවරුන් සිටිනව; ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට පන්දම් අල්ලන ගුරුවරුන් සිටිනව; අනිකුත් පක්‍ෂවලට පන්දම් අල්ලන ගුරුවරුන් සිටිනව. මේ කුමන පක්ෂයට අයිති ගුරුවරයකු වුණත් හොඳට සේවය කරනව නම් මට වුවමනා කරන්නෙ එච්චරයි. ඒකයි අපේ ප්‍රතිපත්තිය. [බාධා කිරීමක්] ෆෙඩරල් පක්ෂයෙ අයත් ඉන්නවද කියල අහනව. කෙසේ වෙතත් දේශපාලන ප්‍රශ්න පැත්තකට දමල වැඩ කරන්න ඕන. යම්කිසි ගුරුවරයෙක් හොඳට සේවය කරනව නම් ඔහු මාරු කරන්න වුවමනා නැහැ.

යෝජිත පාසැල් රජයට ගැනීම සම්බන්ධව මතක් කරන්න තියෙනව. මගේ කොට්ඨාශයෙ තියෙනව දිය—බෝකඳුර පාසැල කියල පාසැලක්. ඒ ගමේම ළමයි හය දෙනෙක්—ගැහැණු ළමයි 2 ක් සහ පිරිමි ළමයි 4 ක්—තමයි එම පාසැලේ මුලින්ම ඉගැන්වීම කළේ. ස්ථිර ගොඩනැගිල්ලක් හදල ස්ථිර වහලයක් දමල එම කටයුත්ත හොඳට කරගෙන ගියා. ගොඩනැගිල්ල හදන්න බොහොම මහන්සියෙන් කටයුතු කළා. බදිඋද්දීන් මහ්මූද් මැතිතුමා අධ්‍යාපන ඇමතිවරයා වශයෙන් කටයුතු කරද්දී එතුමා ළඟට පැමිණී නියෝජිත පිරිසක් තමයි, මුලින්ම මෙම පාසැල රජයට ගන්නා ලෙස ඉල්ලා සිටියෙ. ඒ අය ඇවිත් කියා සිටිය පාසැල පමණක් නොවෙයි එහි සේවය කරන ගුරුවරුන් 6 දෙනාත් රජයට ගන්නය කියල. නමුත් සිදු වුණේ වෙන දෙයක්. එතෙන්ට වෙන ගුරු ජෝඩුවක් පත් කළා. අර අයට පත්වීම් දුන්නෙ නැහැ. වෙන කොට්ඨාශවල නම් පාසැල් රජයට ගත්තෙ ඒවායෙ සේවය කරමින් සිටි ගුරුවරුන් සමගයි. මේ ළඟදීත් ඒ අන්දමට රජයට පාසැල් පවරා ගෙන තියෙනව. ගුරුවරුන්ට පත්වීම් දෙනවට මම කිසිසේත් විරුද්ධ වෙන්නෙ නැහැ. මම කියන්නෙ අපේ කොට්ඨාශවලට පමණක් කුඩම්මගෙ සැලකිල්ල දක්වන්නෙ ඇයි කියන ප්‍රශ්නයට උත්තර දෙන ලෙසයි.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரி. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

අපි ඌව-පරණගමට බොහොම ඉහළිනුයි සලකන්නෙ.

**කුසුමා රාජරත්න මිය.**
*(திருமதி குஸுமா ராஜரத்ன)*
(Mrs. Kusuma Rajaratna)

කටින් විතරයි සලකන්නෙ.

**එල්. බී. ජයසේන මයා.** (බිංගිරිය)
*(திரு. எல். பி. ஜயசேன—பிங்கிரிய)*
(Mr. L. B. Jayasena—Bingiriya)

කෙරුවාවෙන් නැහැ.

**කුසුමා රාජරත්න මිය.**
*(திருமதி குஸுமா ராஜரத்ன)*
(Mrs. Kusuma Rajaratna)

ලංකාවෙ හැම තැනකම වාගෙ පාසල් රජයට පවරා ගත්තෙ ඒවායේ සේවය කරමින් හිටපු ගුරුවරුනුත් සමගයි. එහෙත් මා නියෝජනය කරන කොට්ඨාශයේ පාසලක් ගත් අවස්ථාවෙ එහි හිටපු ගුරුවරුන් හය දෙනාට පත්වීම් දුන්නෙ නැහැ. ඒක ලොකු වරදක්. අනෙක් පළාත්වල පාසල් රජයට ගත්තෙ ඒවායේ සේවය කරමින් හිටපු ගුරුවරුන් සමගයි. එහෙම නම් මේ පාසල ගන්න විටත් එහි සේවය කරමින් සිටි ගුරුවරුන් ගැනීමට රජයට හැම යුතුකමක්ම තිබෙනවය කියන්න කැමතියි.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரி. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

පාසලේ නම මොකක්ද කියල කරුණා කර කියන්න.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**කුසුමා රාජරත්න මිය.**
*(திருமதி குஸுமா ராஜரத்ன)*
(Mrs. Kusuma Rajaratna)

බ/නියබෝකඳුර පාසල ගැනයි මම කිව්වෙ. අවුරුද්දක් පමණ කාලයක් ඒ ගුරුවරු හය දෙනා ඒ පාසලේ සේවය කර තිබෙන නිසා මම ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාට කියන්නෙ කරුණා කර අනෙක් පාසල් ගන්නවිට අනුගමනය කළ ප්‍රතිපත්තියම අනුගමනය කර මේ ගුරුවරුන් හය දෙනාටත් පත්වීම් දීමට වැඩ පිළිවෙළක් යොදන ලෙසයි.

**මූලාසනාරූඪ මන්ත්‍රී**
*(தலைமை தாங்கும் அங்கத்தவர்)*
(The Presiding Member)

කරුණා කර කථාව කෙටි කරන්න.

**කුසුමා රාජරත්න මිය.**
*(திருமதி குஸுமா ராஜரத்ன)*
(Mrs. Kusuma Rajaratna)

කරුණා කරල තවත් සුළු වේලාවක් දෙන්න.

**මූලාසනාරූඪ මන්ත්‍රී**
*(தலைமை தாங்கும் அங்கத்தவர்)*
(The Presiding Member)

හයට ඉවර කරන්න.

**කුසුමා රාජරත්න මිය.**
*(திருமதி குஸுமா ராஜரத்ன)*
(Mrs. Kusuma Rajaratna)

මා නියෝජනය කරන කොට්ඨාශයේ මහා විද්‍යාල හතරක් ඇතත් ඒවා නාම පුවරුවලට පමණයි සීමාවෙලා තියෙන්නෙ. ඒවට අවශ්‍ය ගුරුවරුන්වත්, උපකරණවත්, ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ඉඳගන්න ඩෙස්ක්, බංකු, පුටු ආදියවත් නැහැ. ඒ නිසා මේ ගැන වහ වහා වැඩ පිළිවෙළක් යොදන ලෙස ගෞරවයෙන් ඉල්ලනව. මහා විද්‍යාලයක් වුණාම එය අංග සම්පූර්ණ එකක් විය යුතුයි. මේ විධියෙ අඩුපාඩු තිබුණම ඉගෙන ගන්න දරුවන්ට සිදු වන පාඩුව ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාට තේරෙනවා ඇත කියා මම හිතනව. මෙතන අපි ඇවිත් කොච්චර කෑ ගැහැව්වත් මෙතෙක් ඒ ගැන කිසිම සැලකිල්ලක් දක්වා තිබෙනවාය කියන්න බැහැ. දැන් ඉතින් මේ ආණ්ඩුවේ අවසාන කාලයත් ළඟා වී තිබෙන නිසා ප්‍රමාද නොකර ක්‍රියා කරන ලෙස මතක් කරන්න කැමතියි.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரி. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

නැහැ නැහැ, අපේ ආණ්ඩුවෙ අවසානය ළංවෙලා නැහැ.

**කුසුමා රාජරත්න මිය.**
*(திருமதி குஸுமா ராஜரத்ன)*
(Mrs. Kusuma Rajaratna)

ඉතිරි වී තිබෙන කාලය ඇතුළත මේ පාසල්වල අඩුපාඩු සම්පූර්ණ කර දීමට ක්‍රියා කරන ලෙස මම ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් කරුණාවෙන් ඉල්ලා සිටිනව.

සෑම පාඨශාලාවකටම පුස්තකාලයක් බැගින් තිබිය යුතුය යන්න ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා පිළිගන්නවා ඇත කියා මම කල්පනා කරනව. එහෙත් අපේ පළාතේ තිබෙන බොහොමයක් පාසල්වලට පුස්තකාල නැහැ. පුස්තකාලවලට රජයෙන් ආධාර දිය යුතුයි. ඒ සඳහා වෙන් කර තිබෙන මුදල ප්‍රමාණවත් නැහැ. මේ රජයට මුදල් සම්බන්ධයෙන් ප්‍රශ්නයක් නැහැ. මේ රජයට මුදල්වලින් කිසිම අඩුවක් නැති බව ගරු මුදල් ඇමතිතුමාම අපට කියා තිබෙනව. කිසිම මුදල් අර්බුදයක් නැති බව ගරු මුදල් ඇමතිතුමා කළ කථාවකින් අපට දැනගන්න ලැබුණා. ඒ කියන්නෙ මුදල් තිබෙනවය කියන එකයි. එහෙම නම් පාසල්වල තිබෙන මේ හැම අඩුපාඩුවක්ම සම්පූර්ණ කර දෙන්න ඕනෑ. පොඩි පාසල්වලට පුස්තකාල දෙන්න මේ වෙලාවෙ හැටියට පුළුවන්කමක් නැත කියා තමුන්නාන්සෙලා හිතනව නම් කරුණා කර මහා විද්‍යාලවලටත්, මධ්‍ය මහා විද්‍යාලවලටත් අංග සම්පූර්ණ පුස්තකාල ඇති කරන හැටියට මම මේ අවස්ථාවෙ ඉල්ලා සිටිනව.

තවත් එක් වැදගත් කාරණයක් ගැන තමුන්නාන්සෙගෙ අවධානය යොමු කරන්න කැමතියි. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හැටියට අපි අපේ කොට්ඨාශවල තිබෙන නොයෙක් අඩුපාඩුකම් ගැන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දන්වා ලියුම් ලියනවා. අමාත්‍යාංශයටත්, අධ්‍යාපන දෙපාර්තමේන්තුවටත්, බණ්ඩාරවෙල තිබෙන ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාලයටත් අපි කොයි තරම් ලියුම් ලිව්වත් කලාතුරකින් තමයි ඒ ලියුම් ලැබුණු බව වත් දන්වන්නෙ. ලියමනක් ලිව්වොත් මාස ගණනකටවත් උත්තරයක් ලැබෙන්නෙ නැති අවස්ථා එමට තිබෙනවා. ලියා පදිංචි කරන ලද තැපෑලෙන් ලියුම් යැව්වත් උත්තර එවන්නෙ නැත්තෙ ඒවා කුණු කූඩෙට යවන නිසාද කියා විභාග කර බලන්න ඕනෑ. මෙතන ඇවිල්ලා කථා කළාට මදි. ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා මේවා ගැන විභාග කර බලන්න ඕනෑ. අප හැම අවස්ථාවේම උත්සාහ දරන්නෙ අපේ කොට්ඨාශයේ ඇති අඩුපාඩුකම් සම්පූර්ණ කර ගන්ටයි. එහෙම අප උනන්දුවක් ගත්තෙ නැතිනම් හැම අවස්ථාවේදීම අපේ ඡන්ද දායකයින් අපට දොස් නගනවා අප මේවා ගැන සොයා බලන්නෙ නැහැයි කියා. අප පුළුවන් පමණ සොයා බලනවා, දෙපාතීමේන්තුවට, අමාත්‍යංශයට ලියකියවිලි යවනවා. නමුත් බොහෝ අවස්ථාවලදී ලිපි දහයක් යැව්වොත් එයින් එකකට-දෙකකට වඩා පිළිතුරු එවන්නෙ නැහැ. එම නිසා මේවා ගැන සොයා බලා ක්‍රමවත් වැඩ පිළිවෙලක් සකස් කරන ලෙස ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා.

අ. භා. 6

ගොඩනැගිලි සම්බන්ධයෙනුත් වචනයක් කථා කරන්න තිබෙනවා. ගොඩනැගිලි තැනීම පිණිස හැම කොට්ඨාශයක් සඳහාම රුපියල් පණස් දහස බැගින් දෙන බවට ලියුම් ලැබී තිබෙනවා. නමුත් මෙම පණස් දහසකින් සෑහීමකට පත් වෙන්න බැහැ. රුපියල් පණස් දහසකින් අවශ්‍ය ගොඩනැගිලි තනන්න බැහැ. මන්ද? විශෙෂයෙන් ඌව ප්‍රදේශයේ තිබෙන පාසැල් ඉතාමත් අබලන් තත්ත්වයකයි තිබෙන්නෙ. මගේ ප්‍රදේශයේ බොහෝ පාසැල් තිබෙන්නෙ අබලන් තත්ත්වයකයි. එම නිසා රුපියල් පණස් දාහකට වඩා වැඩි මුදලක් ඌව ප්‍රදේශය වෙනුවෙන් වෙන් කරන මෙන් ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් ඉල්ලා සිටිනවා.

බිබිලෙ ගරු මන්ත්‍රීතුමා (ඩී. එම්. ගුණසේකර මයා.) වැදගත් කාරණයක් ගැන මතක් කළා. ඇත්ත වශයෙන් ඌව ප්‍රදේශයට අභ්‍යාස විද්‍යාලයක් පිහිටුවීම වැදගත් බව මම අනුමත කරනවා. මේ සම්බන්ධයෙන් දිස්ත්‍රික් සම්බන්ධතා කාරක සභාවේදී යෝජනාවක් ඉදිරිපත් කළ විට ඌව ප්‍රදේශයේ සියලුම මන්ත්‍රීවරුන් එම යෝජනාවට එකඟවූ බව මේ අවස්ථාවේදී මතක් කරන්න කැමතියි. එම නිසා ගුරු අභ්‍යාස විද්‍යාලයක් ඌව ප්‍රදේශයේ පිහිටුවීම විශෙෂ කාරණයක් හැටියට ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාට මතක් කරමින්, එය ලබාදීමට හැම කටයුත්තක්ම කරන ලෙස ඉල්ලා සිටිමින් මගේ වචන සවල්පය අවසන් කරනවා.

**ජයසේන මයා.**
*(திரு. ஜயசேன)*
(Mr. Jayasena)

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, අධ්‍යාපනය ගැන දීර්ඝ ලෙස කථා කිරීමට සූදානම් නමුත් කාලය සීමිත නිසා මා ඉතාමත්ම කෙටියෙන් වචන සවල්පයක් කථා කරන්න අදහස් කරනවා. පළමුවෙන්ම පසුගිය අවුරුදු දෙක ඇතුළතදී අධ්‍යාපන අමාත්‍යාංශය මගින් බිංගිරිය ප්‍රදේශයට කරන ලද සේවය පිළිබඳවත්, ඉදිරියට කරන්නට අදහස් කරන වැඩ කටයුතු ගැනත් බිංගිරිය කොට්ඨාශයේ ජනතාව වෙනුවෙන් මගේ ගෞරව පූර්වක ස්තුතිය මේ අවස්ථාවේදී පුද කරන්න කැමතියි.

විශ්ව විද්‍යාලීය අධ්‍යාපනය පිළිබඳව යමක් කීම මේ අවස්ථාවේදී වැදගත් යයි මම කල්පනා කරනවා. විශ්ව විද්‍යාලයීය කොමිෂන් සභා වාර්තාවේ කෙසේ සඳහන් වුණත්, මේ රටට අවශ්‍ය අධ්‍යාපන ක්‍රමය සුළුවෙන් හෝ වේවා ලැබෙන්නෙ පිරිවෙන් විශ්ව විද්‍යාලවලින් බවයි අප විසින් පිළිගත යුතුව තිබෙන්නෙ. ලංකා විශ්ව විද්‍යාලය ගැන කථා කරනවා නම් දීර්ඝ වශයෙන් කරුණු කියන්න තිබෙනවා. මෙම විශ්ව විද්‍යාලයෙන් අධ්‍යාපනය ලබා එන පුද්ගලයන් මේ රටට අවශ්‍ය, ගැලපෙන පුද්ගලයන්ද, මේ රටට සේවය කිරීමේ හොඳ චේතනාවෙන් පුරුදු පුහුණු වූ පුද්ගලයන්ද කියා අප කල්පනා කර බලන්න ඕනෑ. ඇත්ත වශයෙන්ම එම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයසේන මයා.]

විශ්ව විද්‍යාලයෙන් එන පුද්ගලයන්ගේ —ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ—තත්ත්වය ගැන එහි පාලක පක්ෂය, ආචාර්ය මණ්ඩලය බොහෝ දුරට වග කියන්න ඕනැ. බොහෝ විට, මේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් අතර නොයෙකුත් දේශපාලන පක්ෂවලට බැඳී කටයුතු කරන අය සිටිනවා. හැබැයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට නම් නොවෙයි. මේ උදවිය ඉගෙනීම අවසාන කිරීමෙන් පසුව තමන් එතෙක් සිටි පක්ෂයේ නොවෙයි, ඊට ඉඳුරාම වෙනස්, ඉඳුරාම විරුද්ධ ධනපති පක්ෂයක් සමග එකතු වී තමන් ගැන පමණක් කල්පනා කරන, තමන්ගේ ආශාවන් පමණක් ඉටු කර ගැනීමට උත්සාහ දරන පිරිසකගේ තත්ත්වයට පරිවර්තනය වෙනවා. එපමණක් නොවෙයි, මෙබඳු පුද්ගලයන් රජයේ සේවයට බැඳුණත් වැඩි දෙනකු තමන්ගේ ප්‍රයෝජනය ගැනම කල්පනා කරන, මහජන සේවය ගැන නොතකන පිරිසක් බවට පත් වෙනවා. අද විශ්ව විද්‍යාල අධ්‍යාපනය මෙබඳු තත්ත්වයක තිබෙන බව, ඒ අන්දමේ පුද්ගලයන් බිහි කරන ස්ථානයක් බව, මේ අවස්ථාවේදී මට කියන්න පුළුවන් කම තිබෙනවා. ඊට හේතුව ඒ විශ්ව විද්‍යාලයේ ආචාර්ය මණ්ඩලයේ සිටින්නෙ මේ රටට අවශ්‍ය විධියට හැඩ ගැසුණු පුද්ගලයන් නොවීමයි. එහි සිටින වැඩි දෙනෙක් නොයෙකුත් විවිධ මත දරණ මේ රටට නොගැලපෙන විජාතික අදහස් මුදුන්පත් කර ගැනීමට තැත් කරන, එසේම තමන් දරණ අදහසට මේ රටේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් නම්මා ගැනීමට තැත් කරන උදවියයි.

එවකට සිටි උප ඇමතිතුමාටත් මටත් දවසක දකින්න ලැබුණ පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙ ශිෂ්‍ය පිරිසක් එහි ඇති අමු කැලෑවක් ගිනි තබනවා. ඒ කැලෑව සම්පූර්ණයෙන් ගිනි ගෙන ආචාර්යවරුන්ගෙ බංගලා දෙකකටත් ගින්න ළං වෙන්න පටන් ගත්ත. ගිනි නිවන හමුදාව පැමිණ එය නිවීමට ගිය අවස්ථාවෙදිත් ඒ ශිෂ්‍යයන් කෙළේ එයට බාධා කිරීමයි. නිවන්න ඉඩ දුන්නෙ නැහැ. මේ විධියට අමු කැලෑ ගිනි තබන අය හැදෙන්නෙ මම හිතනව ගුරුවරුන්ගෙ ඇති නොමඟට මඟ පෙන්වීමෙ ප්‍රතිපත්තිය නිසාය කියා. එක ගුරුවරයෙක් ගැන මම දන්නවා. මම දන්නෙ නැහැ දැන් ඔහු විශ්ව විද්‍යාලයෙ ඉන්නවද කියා. ඔහු නම් බුද්ධ ධර්මය පිළිබඳ මහාචාර්ය ඩබ්ලිව්. ඇස්. කරුණාරත්න ආචාර්යවරයායි. බුද්ධ ධර්මය ගැන විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයන්ට ඉගැන්වූ ඔහු තරම් බොරු කියන මිනිහෙක් මේ මිහි පිට නැති බව මට කියන්න පුළුවන්. චෛතිය රජ්ජුරුවන්ගේ කාලෙ වැනි කාලෙක නම් ඔහු කියන බොරුවලට පොළව පළාගෙන යනව ඇති. [බාධා කිරීම්.] දේශපාලන පක්ෂයකට මැදිහත් වී [බාධා කිරීම්.]

තමුන්නාන්සේට වාගෙ මටත් අයිතියක් තිබෙනව කථා කරන්න.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

පෞද්ගලික දේවල් ඇදගෙන කියන්න එපා.

**ජයසේන මයා.**
*(திரு. ஜயசேன)*
(Mr. Jayasena)

මගේ කථාවට පස්සෙ උත්තර දෙන්න.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

දුෂ්ඨ අදහස් ප්‍රකාශ කරන්න එපා. තමුන්නාන්සෙට ඒ විධියට උගන්වන්න බැරි වුණාට ඔය විධියට දුෂ්ඨ ලෙස කථා කරන්න එපා.

**ජයසේන මයා.**
*(திரு. ஜயசேன)*
(Mr. Jayasena)

තමුන්නාන්සෙ වාඩි වෙන්න. තමුන්නාන්සේට වගේම මටත් අයිතියක් තිබෙනව මේ සභාවෙ කථා කරන්න.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

කථා කරන්න අයිතිවාසිකම තිබුණ පළියට දුෂ්ඨ ලෙස අදහස් ප්‍රකාශ කරන්න එපා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ජයසේන මයා.
*(திரு. ஜயசேன)*
(Mr. Jayasena)

එවැනි පුද්ගලයන්ගෙ මඟ පෙන්වීම අනුවයි විශ්ව විද්‍යාලයෙ පාලනය අද සකස් වී තිබෙන්නේ. [බාධා කිරීම්.] නමුන් නාන්සෙ මම කථා කළාට පසුව කථා කරන්න. [බාධා කිරීම්.] මගේ කථාවෙන් පස්සෙ නමුන්නාන්සේ උත්තර දෙන්න. ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, විශ්ව විද්‍යාල කථාව මම එපමණකින් නවත්වනව.

ඊළඟට මම කියන්න කැමතියි කාර්මික විද්‍යාල ගැන. මේ රටේ කාර්මික විද්‍යාල රාශියක් තිබෙනව. නමුත් කාර්මික විද්‍යාල අධ්‍යාපනය ලබා ආපසු ගියාට පසුව ඒ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට රක්ෂාව ලබා දෙන ස්ථිර වැඩ පිළිවෙළක් දැනට නැහැ. අද විශාල සංඛ්‍යාවක් කාර්මික විද්‍යාලවල ඉගෙන ගන්නව. නමුත් කාර්මික අධ්‍යාපනයෙන් පසුව රක්ෂාවක් නැතිව ගෙදරට වී සිටිනව. එම නිසා ඒ අධ්‍යාපනය ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට රක්ෂා ලබා දෙන ස්ථිර වැඩ පිළිවෙළක් ඇති කරන්නය කියා මම ඇමතිතුමාගෙනුත් උප ඇමතිතුමාගෙනුත් ඉල්ලා සිටිනව.

ඊ ළඟට අපේ පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙ සිටින සාහිත්‍යධරයන් ගැන වචනයක් කියන්න ඕනෑ. ඒ අය නිසඳැස් කවිය කියා දෙයක් රටට බෝ කර තිබෙනව. මේ ගැන මම යමක් කියන්න අදහස් කෙළේ වැලිමඩ ගරු මන්ත්‍රීතුමා එය මතු කළ නිසයි. අපි දන්නව සංස්කෘතික දෙපාර්තමේන්තුවත් ඒ අයට ආධාර දීමට ඉදිරිපත් වී සිටින බව. උන්නැහෙල පිට රටින් ග්‍රන්ථධරයන් ගෙන්වා, සාහිත්‍යධරයන් ගෙන්වා, ලේඛකයන් ගෙන්වා, සංස්කෘතික සම්මේලනයක් මේ රටේ ඇති කිරීමට උත්සාහයක් කළා. ඒකෙදි නිස දෙස් කවි කියන කුණුහරුපවලට මුල් තැන දුන් සංස්කෘතික දෙපාර්තමේන්තුවෙ උදවිය කුමන්ත්‍රණ කරල, උප අධ්‍යක්ෂවරු ලැයිස්තුවක් දමා තිබුණ, කවදාවත් කවියකු හැටියට මේ රටේ කිසිම කෙනකු නොපිළිගන්න, කවදාවත් තමාගේ කවියක් මහජනයා අතරට යවන්න පුළුවන් නොවූ, සරත් අමුණුගම නමැති කෙනකු මේ ලංකාවේ ප්‍රධාන කවියා හැටියට ඉදිරිපත් කරන්නව. ඔහු සිවිල් සේවකයකු බව මම දන්නව. ඔහු වගේ උදවිය, සිරි ගුණසිංහ වැනි උදවිය ඔය ව්‍යාපාරය ගෙන යනව. කවියක රසය, භාෂා ලාලිත්‍යය, ව්‍යාකරණ අනුකූලතාවය මේ රටේ එදා තිබුණ, අදත් තියෙනව, කවදත් තියෙනව. ඒක වෙනස් කරන්නට එහෙන් මෙහෙන් අහුලා ගත් පරිවර්තකයන්ට බැහැ. කුණුහරුප ලියා කවියක් හැටියට රටට පෙන්වා තමන්ගේ ආත්මාර්ථය සලසා ගැනීම සඳහා පොත් ගහන්නට ඒ අයට ඉඩ දෙන්න පුළුවන්කමක් නැහැ. ඕනෑම පුද්ගලයෙකුගෙන් ඇහුවොත් ඒ උදවිය කවියොද, නව කථා කාරයොද, කෙටි කථා කාරයොද කියා මේ රටේ කිසි කෙනෙක් උත්තර දෙන්නෙ නැහැ, ඒ පුද්ගලයන් ඒ විධියේ උදවියය කියා. තමන් ගැසූ පිටපත් ගණනට වඩා තමන්ගේ පොත් විකිණෙනවාය කියන මේ පුද්ගලයන්ගේ පොත් සමහර විට ගම්බද ජනතාව තබා අපිවත් කියවා නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක් තරා වටිනා පරමාර්ථයක් ඇතිවයි, දිවංගත අගමැති තුමාගේ උපදෙස් අනුව පසුගිය මහජන රජයෙන් සංස්කෘතික දෙපාර්තමේන්තුව ඇති කළේ. මේ රටේ කවියට, සාහිත්‍යයට යම් කිසි සේවයක් කරන්නට දුක සේ නැතින් නැන ඇවිදිමින් ජීවිත පරිත්‍යාගයෙන් කටයුතු කළ සාහිත්‍යධරයන්, කවියන් වැනි උදවියට සහනයක් දී ඔවුන්ට මඟ පෙන්වීම සඳහායි, ඔවුන්ට උපකාර කිරීම සඳහායි සංස්කෘතික දෙපාර්තමේන්තුව ඇති කළේ. නමුත් ඒ දෙපාර්තමේන්තුව අද සම්පූර්ණයෙන් ම කටයුතු කරගෙන යන්නෙ අර උදවිය අයින් කර හිතුවක්කාර අන්දමින් තමන්ගේ සගයින්ට, තමන්ගේ ගුරු කුලයට පමණක් අයිතිවාසිකම් දී සංස්කෘතික දෙපාර්තමේන්තුවේ සල්ලි කුට්ටි ඔවුන්ට යන පිළිවෙළටයි. ඒ නිසා සංස්කෘතික දෙපාර්තමේන්තුවේ සම්පූර්ණ ප්‍රතිසංවිධානයක් ඇති කර, එවැනි පුද්ගලයන් සංස්කෘතික දෙපාර්තමේන්තුවෙ ඉන්නව නම් ඒ උදවිය අයින් කරන්නය කියා මම ඉතා ආදරයෙන් ඉල්ලනව.

කලා මණ්ඩල ගැනත් වචනයක් කියන්න ඕනෑ. අපේ කුරුණෑගල දිස්ත්‍රික්කයෙත් කලා මණ්ඩල තියෙනව. කලා මණ්ඩලවලින් සැලකිය යුතු සේවයක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයසේන මයා.]

ඉටු වෙනවද, මේ රටේ කලා වර්ධනය පිණිස, මේ රටේ කල්‍යාණය පිණිස, කලා රසය දියුණු කිරීම පිණිස සේවයක් වෙන වද කියා මම අහනව. ප්‍රාදේශීය කලා මණ්ඩල ඒ ඒ ප්‍රදේශවල ඉන්න නොයෙකුත් කුට පුද්ගලයන් ඔවුන්ට වාසි ලැබෙන ආයතන බවට පත් කරගෙන තිබෙනව.

කාල ගුණ දෙපාර්තමේන්තුව ගැනත් මතක් නොකර බැහැ. කාල ගුණ දෙපාර්තමේන්තුව කියනව නම් මේ දිනවල ගජිනා සහිතව වැසි වසිනවය කියා අපට ස්ථිරවම පිළිගන්න පුළුවන් ඒ දවස්වල පායන බව. ඒ නිසා කාලගුණ දෙපාර්තමේන්තුවේ පර්යේෂණ කටයුතු සඳහා උපකරණ සපයා දෙන්න ඕනෑ. ඒවා ගැන දන්න උදවිය එතන නැත්නම් දන්න උදවිය පත් කරන්න ඕනෑ. පුරා විද්‍යා දෙපාර්තමේන්තුවත්, ජාතික කෞතුකාගාරයත්, අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ මීට වඩා දියුණු තත්ත්වයකට පත් කර ගත යුතුව තිබෙනව. මේ කරුණු පිළිබඳව අවධානය යොමු කරන ලෙස ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසාන කරනව.

අ. භා. 6.15

**ඒ. සී. එස්. හමීඩ් මයා.** (අකුරන දෙවන මන්ත්‍රී)

*(ஜனாப் ஏ. ஸீ. எஸ். ஹமீத்—அக்குறணை இரண்டாம் அங்கத்தவர்)*

(Mr. A. C. S. Hameed—Second Akurana)

Since this Government came into power, we have been told very often inside this House and outside this House that the panacea for all evils in our education system would be the ntaional system of education which this Government proposes to set up. We want a categorical statement on this. The National Education Commission Report is out, the Technical Education Commission Report is out, and we wish to know definitely whether these reports are to be implemented and, if so, from when. This is the only Government perhaps in the world that had appointed two commissions to sit on the same subject, the National Education Commission and the Technical Education Commission, both sitting at the same time and both going into the same problem. Both these commissions have conveniently avoided certain issues and we wish to know whether there is going to be a third commission to co-ordinate the findings of these two commissions and whether there will be a fourth commission to corelate the findings of the third commission in terms of the Ten-Year Plan. This is an issue which needs clarification, whether there is going to be a third commission to co-ordinate the findings of the National Education Commission and the Technical Education Commission and whether there is going to be a fourth commission to corelate the findings of the third commission in terms of the Ten-Year Plan. We should like to know it.

Now you have been crowing in the villages at all your meetings that you will solve the education problem of this country with your national education system. Years have passed and still you live to thrive on your pocket phrase " the national education system "—ජාතික අධ්‍යාපන ක්‍රමය There is only one thing I see in this national education system, the *jathika adhyapana kramaya,* of the Sri Lanka Freedom Party Government.

You know when a child is to be admitted to the Kindergarten Class of a school, the child must be five years old on the 1st of January. If the child is four years eleven months and twenty-nine days, that child is not eligible. So, before implementing the national education system, your Government will have to carry out lectures and lessons on family planning. Parents will have to be told that when they bring a child into this world, they must make sure that the child will be five years on the 1st of January. That is all we see by way of your national education system which you talk of.

Take your National Education Commission Report ; take Part I of it. Out of the majority report of 46 pages, 39 pages are of dissents, riders

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

and rejoinders. What does that show? The very commission that you appointed has failed to bring out a common system. You do not have a National Education Commission Report. You have parallel reports. Are you going to implement these reports? That is what we want to know.

It is an accepted principle that in a country where there are parallel communities, the greatest tragedy that can befall that country, is to have a parallel system of education. Education has to be an instrument for national integration. That is the main purpose of education and that should specially apply to Ceylon which is a multi-racial country. Education must be an instrument for national integration.

**මූලාසනාරූඪ මන්ත්‍රී**
*(தலைமை தாங்கும் அங்கத்தவர்)*
(The Presiding Member)

Is the hon. Member discussing the White Paper that is to come?

**හමීඩ් මයා.**
*(ஜனாப் ஹமீத்)*
(Mr. Hameed)

No, Sir. I am discussing the reports that are out, and I am quite within the subject.

So you see we have vague reports here and there in the press that you are going to implement this report. In the country you talk of socialism; you talk of the onward march; but how can the country go forward unless there is national unity and national integration? And national integration can only be reached through a system of education. It is only the country's poets and writers, her educators of thought who could bring her people together and nobody else. If your national education system is not going to do that, but divide the people on a quota basis, where is national integration? Where is national unity? Where is the onward march, and where is the socialism that you so much speak of? We should like to know.

You have been fooling the country for the last so many years. Your trump card, your magic phrase, has been your talk of national education. Where is this national education?

I said these two commissions have conveniently avoided certain problems.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரி. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

පාසැල් බිස්නස්කාරයින්ට අපි නිසා යන එනමං නැති වී තිබෙනවා.

**හමීඩ් මයා.**
*(ஜனாப் ஹமீத்)*
(Mr. Hameed)

මොකක්ද කිව්වේ? කවුද පාසැල් බිස්නස්කාරයෝ?

Sir, I am very sorry if the Junior Minister cannot understand a finer problem behind an argument.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரி. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

අධ්‍යාපනය බිස්නස් එකක් වශයෙන් තබාගෙන හිටි අයට දැන් ඒක නැති වෙලා දොඩවනවාය කියා කිව්වෙ. ඔයා ළමයින්ට ඉගැන්නුවට ඔයාටත් උගන්වන්න මම දන්නවා.

**හමීඩ් මයා.**
*(ஜனாப் ஹமீத்)*
(Mr. Hameed)

අද වන තුරු මම තමුන්නාන්සේට යම්කිසි ගෞරවයක් ඇතිව හිටියා. නමුත් ඔහොම කථා කරනවා නම් ගෞරවයක් දක්වන්න පුළුවන්කමක් නැහැ.

I am sorry that this argument should come down to that level.

Let us take the position. What is the exact situation in the country today? This is the exact position: that a quarter of the children in this country who should be attending school are not attending school. That is one. Two: half the number of

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[හමීඩ් මයා.]

children in this country leave school before they are 14 years of age. Three: only one per cent. of the children reach university level. Four: 65 per cent. to 70 per cent. of the children fall back at the S. S. C. level. Five: in an age of growing science and technology we are still continuing to produce arts graduates. This is the actual position in the country. These are the five problems facing us.

I said that one of the biggest problems facing us immediately is this question of wastage at the G. C. E. level. In England where the wastage at the G. C. E. level is only four per cent, it led to the Crowther Commission. There was alarm even when the wastage at the G. C. E. level was only four per cent. In this country, the wastage is 500 per cent.

We hold the G. C. E. examination in December and in August. Roughly about two lakhs appear for this examination. Out of these two lakhs, a maximum of about 40,000 qualify, while 160,000 fall behind. Let us presume that another 30,000 are successful in the following year. There is still a wastage of 130,000 boys and girls every year. This is a serious problem which both commissions have conveniently overlooked.

The next thing is that there is nobody attending to education in this country. I may substantiate myself. Look at the circuit inspectors of schools, 65 per cent. of their time is taken up on administration; the district inspectors: 75 per cent. of their time is spent on administration; education officers: 85 per cent. of their time is spent on administration; assistant directors: 95 per cent. of their time is spent on administration; the director: 100 per cent. of his time is spent on administration. I like to ask you who is looking after education in this country?

Then again there is another important problem that should receive the attention of this Government. The law on education in this country is very strange. The Government has all the powers through labour legislation and through various other legislation to call upon people to send children to school. But at the same time there is nothing binding on the Government to make this education available. It is because there was nothing binding on the Government that Assisted schools came in and that is also how the educational societies came in. Now, we have taken over the Assisted schools. There are no more Assisted schools. Therefore, there must be somebody, some instrument to provide that education. You will find that, as I said earlier, the Government can by labour legislation prevent the employment of children in homes and in various other places. You can insist that school-going children should go to school, but there is nothing binding on the Government to provide that education. There was no such instrument till the Assisted schools, and the educational societies that sponsored Assisted schools, stepped in. Now, we have done away with that system too. Therefore the Government has a greater duty, a greater responsibility to make that education available.

We have today two versions on the national education system, one from the Government side, and the other from the hon. Member for Dambadeniya. I do not hold a brief for either, but I should like to make it quite clear that as a Ceylonese I do believe that education must be made into an instrument for bringing about national integration. If you are going to create a quota basis, if you are going to divide the people further, that is not education. You will be positively endangering the very ideals that education stands for.

**මූලාසනාරූඪ මන්ත්‍රී**
*(தலைமை தாங்கும் அங்கத்தவர்)*
(The Presiding Member)

I think you have gone much over the mark.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

හමීඩ් මයා.
(ஜனாப் ஹமீத்)
(Mr. Hameed)

Therefore, it is nothing but fair that this Government which swears so much by the common man, which says it has vouched to fight for the common man, should see that there is equality in education.

අ. භා. 6.30

It is true that in a democracy you have universal suffrage. But that alone does not give you equality. There must be equality of education. There must be equality of opportunities. It is said that the judiciary of any country must be independent. Similarly, in the matter of education, the teachers must be independent, because they are entrusted with the great task of preserving the freedom of knowledge. But if they are tossed about like tennis balls, if they have to dance to the whims and fancies of people who are in positions of power, how do you expect them to preserve the freedom of knowledge?

Much has been said about the National Education Commission whose recommendations the Government proposes to implement. The report of this commission sets out a new scheme of national education which will determine the future history of this country. Hence, in fairness to this House, hon. Members should be given an opportunity to discuss this report and express their opinions. I would ask this Government to give us an early opportunity to discuss this report.

I find that the Public Trustee also comes under this Ministry. Therefore, I wish to make a suggestion. Most of the *raja maha vihares,* over which the Public Trustee holds sway, are in the Kandyan area. As the two Venerable Nayake Theros of the Asgiriya and Malwatte Chapters controlling these *raja maha vihares* are also in Kandy, it has been felt for a long time that there should be a Deputy-Director of Public Trustees in Kandy. This would expedite the work and make things easy for the bhikkhus who would otherwise have to come down to Colombo. Besides, whenever the Deputy-Director wants to consult the two Nayake Theros, they are available and accessible to him——

ටී. බී. තෙන්නකෝන් මයා.
(திரு. ரி. பி. தென்னகோன்)
(Mr. T. B. Tennekoon)

මහා භාරකාර දෙපාර්තමේන්තුව අපේ අමාත්‍යාංශයට අයිති නැහැ.

හමීඩ් මයා.
(ஜனாப் ஹமீத்)
(Mr. Hameed)

I am very sorry, the Junior Minister does not know what departments are under his Ministry.

ටී. බී. තෙන්නකෝන් මයා.
(திரு. ரி. பி. தென்னகோன்)
(Mr. T. B. Tennekoon)

මම හොඳටම දන්නවා. මහා භාරකාර දෙපාර්තමේන්තුව අපේ අමාත්‍යාංශයට නැහැ. නොදන්නා එක කිව්වාම ඒ මන්ත්‍රීවරයා භාර ගන්න ඕනෑ.

ආචාර්ය එන්. එම්. පෙරේරා (යටියන්තොට)
(டொக்டர் என். எம். பெரேரா—யட்டியாந்தோட்டை)
(Dr. N. M. Perera—Yatiyantota)

It was changed last week.

ටී. බී. තෙන්නකෝන් මයා.
(திரு. ரி. பி. தென்னகோன்)
(Mr. T. B. Tennekoon)

මහා භාරකාර දෙපාර්තමේන්තුව අපේ අමාත්‍යාංශයට අයිති නැති බව දන්නෙ නැති නිසා කියා දුන්නා. කිව්වට අසුව භාර ගන්න ඕනෑ.

හමීඩ් මයා.
(ஜனாப் ஹமீத்)
(Mr. Hameed)

I understand that it has been gazetted last week. So, I accept that. That is about all. These

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[හමීඩ් මයා.]

things get changed overnight. Ministries and departments, get changed overnight. So, we do not know which department is under which Ministry.

**මූලාසනාරූඪ මන්ත්‍රී**

*(தலைமை தாங்கும் அங்கத்தவர்)*

(The Presiding Member)

The hon. Member has accepted that it does not come under this Ministry?

**හමීඩ් මයා.**

*(ஜனாப் ஹமீத்)*

(Mr. Hameed)

Yes.

I do not want to take more time. As the Hon. Minister is not here, at least let the hon. Parliamentary Secretary tell us whether this House will be given an early opportunity to discuss the reports of the National Education Commission and the Technical Education Commission. You will appreciate that the recommendations of these two commissions, if implemented, will determine the future of all the citizens of this country. Let him also tell us whether the Government will stop trying to implement any other proposals until these reports are discussed in the House.

Finally——

**මූලාසනාරූඪ මන්ත්‍රී**

*(தலைமை தாங்கும் அங்கத்தவர்)*

(The Presiding Member)

The hon. Member must stop now. He has taken over 20 minutes and no more time can be allowed to him.

**හමීඩ් මයා.**

*(ஜனாப் ஹமீத்)*

(Mr. Hameed)

I want only two more minutes.

**මූලාසනාරූඪ මන්ත්‍රී**

*(தலைமை தாங்கும் அங்கத்தவர்)*

(The Presiding Member)

I am sorry it cannot be allowed. Let the hon. Member for Galle (Mr. W. Dahanayake) speak now.

**හමීඩ් මයා.**

*(ஜனாப் ஹமீத்)*

(Mr. Hameed)

I appeal to you, Sir, to give me just two minutes to make an important point.

The former Minister laid down a quota of 80 per cent. for Sinhalese 12 per cent. for Tamils and 8 per cent. for Muslims in the matter of buildings for and appointments in the Education Department. This was announced both inside and outside this House. We wish to know whether the present Minister intends to follow the same principle or whether he has any other policy.

**ඩබ්ලිව්. දහනායක මයා.**

*(திரு. டப்ளியு. தகனாயக்க)*

(Mr. W. Dahanayake)

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ මට දී තිබෙන්නේ විනාඩි 20 යි. ඒ විනාඩි විස්සේ කාලය මා සන්තෝෂයෙන් පිළිගත්ත. නමුත් ලබන සතියේ පරිපූරක ඇස්තමේන්තු සාකච්ඡා කරන අවස්ථාවේදී අධ්‍යාපන සහ සංස්කෘතික අමාත්‍යාංශය ගැන අපට සම්පූර්ණයෙන් සාකච්ඡාවක් කරන්නට අවස්ථාව අවශ්‍ය බව ගරු කථානායකතුමාටත්, නියෝජ්‍ය කථානායකතුමාටත්, තමුන්නාන්සේටත්, මේ ගරු සභාවටත් මතක් කරන්න කැමතියි. එයට ඉඩ ලැබෙන්න ඕනෑ.

අපේ ගරු වැලිමඩ මන්ත්‍රීතුමා (කේ. එම්. පී. රාජරත්න මයා.) ඉදිරිපත් කළ වැදගත් කරුණ, එනම් විශ්ව විද්‍යාලයේ සමහර කථිකාචාර්යවරුන් විසින් ප්‍රසිද්ධ කරන ලද අසභ්‍ය කරුණු ඇතුළත් පොත් පත් ගැන ඇති වූ විවාදය ගැන මා මුලින්ම සඳහන් කරන්න කැමතියි. ඒ මන්ත්‍රීතුමා විසින් මතු කර දැක්වූ සිරි ගුණසිංහ, ගුණදාස අමරසේකර, එදිරිවීර සරත්චන්ද්‍ර වැනි අය නියම හොඳ ග්‍රන්ථ කර්තෘවරු නොවෙයි. නමුත් ඒ අයගේ නව කථා සහ පොත්පත්වලට, වෙළඳාම දියුණු කිරීම පිණිස, ඉතාමත්ම අසභ්‍ය කරුණු, කුණු හරුප, එකතු කර එය වෙළෙඳ ව්‍යාපාරය කට හරවා ගෙන තිබෙන එක කනගාටුදායක කරුණක්. වැලිමඩ ගරු මන්ත්‍රීතුමාගේ විවේචනයේදී මුලින්ම අහු වුණේ එදිරිවීර සරත්චන්ද්‍ර කර්තෘවරයායි. මේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අසභ්‍ය පොත් පිළිබඳව බොහොම පහසු වෙන්ම අණක් දෙන්නට අපේ අධ්‍යාපන ඇමතිවරයාට පුළුවන්ය කියා මා විශ්වාස කරනවා. මේ කාරණා ගැන හොඳට පරීක්ෂා කර බලා දන්නා කියන අයගේ උපදෙස් ලබා ගෙන මේ සඳහා හොඳ කමිටුවක් පත් කරන්න අධ්‍යාපන ඇමතිතුමාට පුළුවන්. ඒ කමිටුවේ තීන්දුව අනුව, අසවල් පොත කිසිම විභාගයකට ගන්න එපාය කියනවා නම්, විශ්ව විද්‍යාල ප්‍රවේශ විභාගයටත් ගන්න එපාය කියා, විශ්ව විද්‍යාලයට කියනවා නම් පාසැල්වල පුස්තකාලවලටත් ඒවා යවන්න එපාය කියා අධ්‍යාපන දෙපාර්තමේන්තුවටත් අණක් දෙනවා නම් මේ බාධාව හුඟක් දුරට අත්හැරී යාවි. ඒ පොත තහනම් කරන්න අපට වුවමනාවක් නැහැ. නමුත් අපි විරුද්ධ වන්නේ ඒ පොත විභාගවලට ඉදිරිපත් කොට ඒ පොත්වල කරුණුවලට අනුව ප්‍රශ්න ඇසීම ගැනයි. මෙය වෙළෙඳ ව්‍යාපාරයක් කියායි මා අදහස් කරන්නෙ. වැලිමඩ ගරු මන්ත්‍රීවරයා හරියටම ඒකට හේතුව සොයා ගෙන තිබෙනවා. අර සමන් මුද්‍රණාලයත් මෙයට එකතු වී තිබෙනවා. ඒ නිසා එය විශාල ජාවාරමක් කියා මා හිතනවා.

ඒ ජාවාරම් රටේ තිබුණාවේ. මම ගරු අධ්‍යාපන ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, පිරිසිදු අධ්‍යාපන ක්‍රමයට මේ ජාවාරම් කිච්චු කරගන්න එපාය කියා. අධ්‍යාපනය ගැන කථා කරන විට බොහෝ කරුණු පිළිබඳව කථා කිරීමට වුවමනා වෙනවා. මම අද පාන්දර මේ කරුණු සටහන් කර ගත්තා. කරුණු 44 ක් තිබෙනවා. නමුත් මම ඉන් 6 ක් ගැන කථා කිරීමට බලාපොරොත්තු වුණා. දැන් තමුන්නාන්සේ කෙටියෙන් කථා කරන්නට යයි කියන නිසා මම ඉන් තුනක් ගැන පමණයි කථා කිරීමට බලාපොරොතාත්තු වන්නේ.

අධ්‍යාපාන දෙපාර්තමේන්තුවට මම පළමු වෙන්ම ප්‍රශංසා කරන්න කැමතියි, පසු ගිය අවුරුදු තුන තුළ වැඩ කර තිබෙන ආකාරය ගැන. එහි වැරදි නැතැයි මම කියන්නෙ නැහැ. වැරදි රාශියක් තිබෙනවා. රාශියක් තිබෙනවා. නමුත් මුළු රටේම තිබෙන ඉතාමත්ම බැරුරුම් ප්‍රශ්නය අධ්‍යාපන ප්‍රශ්නය නිසා, ගත වූ අවුරුදු තුනේදී දෙපාර්තමේන්තුව විසින් කරන ලද වැඩ ගැන අපි ප්‍රශංසා කළ යුතුයි. විශෙෂයෙන්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සිටින නිලධාරීන්ට—ජිනදාස මහත්මයාට, ආචාර්ය ගුරුගේ මහත්මයාට, රත්නපාල මහත්මයාට, එස්. එෆ්. ද සිල්වා මහත්මයාට, තුරෙයිසිංහම් මහත්මයාට—අපි ප්‍රශංසා කරනවා. ඒ නිලධාරීන් අධ්‍යාපන අමාත්‍යාංශයේ පමණක් නොව, මුළු රජයේ සේවයේම සිටින ඉතාම උනන්දුවෙන් හා සෘජු ලෙස තමන්ගේ රාජකාරි කටයුතු කරන පිරිසක්. ඒ අයගෙන් මීටත් වඩා වැඩිපුර වැඩ ගන්නා මෙන් මම අධ්‍යාපන ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. එම අමාත්‍යාංශයේ සිටින වෙනත් යම් කිසි නිලධාරියකුගේ නම කීමට මට බැරි වුණා නම් ඒ ගැන සමාවන ලෙස මම ඉල්ලා සිටිනවා.

ගත වූ අවුරුදු තුන තුළ කොමිසන් සභා දෙකක් පත් කළා. ඒ කොමිසන් සභාවල තීරණ අනුව ධවල පත්‍රිකා සකස් කොට ලබන මාසයේදී ඉදිරිපත් කරාවියයි අපි බලාපොරොත්තු වෙනවා. ඒ අවස්ථාවේදී අපට මුකවාඩම් බඳින්නේ නැතිව කථා කරන්න ඉඩ දෙන මෙන් අපි ඉල්ලා සිටිනවා. ඒ ධවල පත්‍රිකා එන තුරු නොසිට කළ යුතු කරුණු දෙක තුනක් තිබේනවා. ජාතික අධ්‍යාපන ක්‍රමයක් මේ රටේ ඇති කරන්නට නම් මූලික කරුණු ටිකක් තිබෙනවා, කළ යුතු. ඉන් මූලික කාරණය නම් අවුරුදු 5 සිට 14 දක්වා සියලුම ළමයින්ට අධ්‍යාපනය දීමයි. 1961 දී පාසල් නොගිය අවුරුදු 5 ටත් 14 ටත් අතර ළමයින්ගේ සංඛ්‍යාව ආණ්ඩුවේ ලේඛනවල හැටියට 4,60,000 යි. දැන් ඒ ළමුන් යම් කිසි විධියකින් තමුන්නාන්සේලාට පාසැල්වලට ගන්ට බැරි නම්, ජාතික අධ්‍යපාන ක්‍රමයක් ඇති කරන්ට බැහැ. එහෙම නම් කළු කපුටා සුදු වෙනකන් ඉන්ට වෙයි ජාතික අධ්‍යාපනය සොයා ගන්න. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිබෙන මානුෂික අයිතිවාසිකම් පිළිබඳ අධිකාරිය අනුව ඒ ළමයි 4,60,000 ට තමුන්නාන්සේලා මූලික අධ්‍යාපනයක් ලබා දෙන්න ඕනෑ. ධවල පත්‍රිකාවක් එන තුරු බලා ඉන්ට ඕන නැහැ. මා හිතන්නෙ තව එක කරුණකට වඩා මට කියන්ට කාලයක් නැහැ කියායි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩබ්ලිව්. දහනායක මයා.]

අ. භා. 6.45

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විද්‍යා අධ්‍යාපනය අද සකස් වේගෙන යන නමුත් එහි ගමන බොහොම ප්‍රමාදයි. විද්‍යා අංශය දියුණු කිරීමට ගිය අවුරුද්දෙ, එනම් 1962-63 අවුරුද්දෙ, අධ්‍යාපන අමාත්‍යාංශය භාණ්ඩාගාරයෙන් මුදල් ඉල්ලා සිටිය. භාණ්ඩාගාරය දෙන්ට බැරිය කිව්ව. ඒ මුදල් දෙන්ට බැරිය කිව්වේ මන්ද? ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාවේ සඳහන් වී තිබෙනව, මොන අන්දමටද ලංකාවේ විද්‍යා අධ්‍යාපනය දියුණුවී තිබෙන්නෙ කියා. මේ මා කියවන්නෙ ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාවේ සුළු කොටසක් :

"Appendix I shows that in districts like Matara, Galle, Kurunegala, Anuradhapura and Hambantota where the population of Buddhists is round 90 per cent, the provision of schools with University Entrance (Science) classes is extremely inadequate. On the other hand, in Jaffna district which ranks first in this respect the Buddhist population is negligible ; and in the next four districts—Kalutara, Colombo, Matale and Kandy, schools with University Entrance Science classes are provided not in the rural areas where the Buddhist population is predominantly large but in the urban areas which cater for the well-to-do classes of a cosmopolitan population. It is, therefore, abundantly clear that science education is confined to privileged groups and is not easily available to the underprivileged, particularly the Buddhists in the rural areas."

ඒ වාර්තාවේ පෙන්වා දී තිබෙනව, විශ්ව විද්‍යාල ප්‍රවේශ පන්තිවල විද්‍යාව උගන්වන ප්‍රමාණය. මාතර දිස්ත්‍රික්කයේ ශිෂ්‍යයන් ලක්ෂයකට එක පාසැලයි. ගාලු දිස්ත්‍රික්කයේ 1,05,000 කට එක පාසැලයි. කුරුණෑගල දිස්ත්‍රික්කයේ 1,25,000 කට එක පාසැලයි. යාපනය දිස්ත්‍රික්කයෙ 15,000 කට එක පාසැලයි. ගාල්ල දිස්ත්‍රික්කයෙ 1,05,000 ට එක පාසැලයි. බලපිටියේ ගරු මන්ත්‍රීතුමා දන්න පරිදි අපි මේ අවුරුද්දේ ගාල්ලේ කච්චේරියේ පවත්වන ලද දිස්ත්‍රික්ක සම්බන්ධතා කාරක සභාවේදී යෝජනාවක් සම්මත කරගෙන අධ්‍යාපන දෙපාර්තමේන්තුවට එව්ව. ඒ යෝජනාවේ මේ විධියට කියා තිබෙනව :

"As there is a serious lack of places for University Entrance and H. S. C. Science students in the schools of the Galle District, the Committee requests that at least four additional University Entrance and H. S. C. Science locations be established in the schools of the Galle District as from January 1964. The Committee expects a reply to this request by the end of August this year."

ගාලු දිස්ත්‍රික්කයේ තිබෙන්නෙ පාඨශාලා 5 යි, විශ්ව විද්‍යාල ප්‍රවේශ පරීක්ෂණයට විද්‍යාව උගන්වන. අපි තවත් 2 ක් ඉල්ලා සිටියා. 1962-63 මුදල් වර්ෂයේදී විද්‍යා අධ්‍යාපනය දියුණු කරන්ට අධ්‍යාපන අමාත්‍යාංශය ඉල්ලා සිටි මුදල් භාණ්ඩාගාරය ලබා දුන්නෙ නැහැ. වාසනාවකට වගේ දැන් එදා මුදල් ඇමතිව සිටි තැනැත්තාම දැන් අධ්‍යාපන ඇමතිවරයා වී සිටිනවා. මා මීට වඩා කථා කරන්ට අදහස් කරන්නේ නැහැ. සල්ලි හිඟ නම් කිසිම ජාතික අධ්‍යාපනයක් ඇති කළ නොහැකියි. එම නිසා මා ඉතා ඕනෑකමින් ඉල්ලා සිටින්නේ නියම ජාතික අධ්‍යාපනයක් සකස් කිරීම සඳහා වුවමනා තරම් සල්ලි දෙන ලෙසයි. අධ්‍යාපන ධවල පත්‍රිකාව සහ ඊට සම්බන්ධ වැය ශීර්ෂය ගැන සාකච්ඡා කරන විට අපට විස්තර වශයෙන් කරුණු සාකච්ඡා කිරීමට අවස්ථාව සලසා දෙන ලෙස ඉල්ලමින් මගේ වචන කීපය අවසන් කරනවා.

**සිරිසේන මයා.**

*(திரு. சிரிசேன)*

(Mr. Sirisena)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධ්‍යාපන ප්‍රතිපත්තිය පිළිබඳවත්, දැනට පවතින අධ්‍යාපනික අඩුපාඩුකම් පිළිබඳවත් ගරු මන්ත්‍රීවරුන් බොහෝ දෙනකුම නොයෙකුත් අදහස් ඉදිරිපත් කර ඇති අවස්ථාවක වැඩිදුර කථා කරන්ට මගේ බලාපොරොත්තුවක් නැහැ. මා මුලින්ම සඳහන් කරන්ට කැමති කාරණයක් තිබෙනවා. මේ ආණ්ඩුව විසින් කරන ලද කට යුතු අතර ප්‍රධානම කටයුත්ත වන්නේ, කරන ලද සේවා අතර උතුම්ම සේවාව වන්නේ, ආධාර ලබන පාඨශාලා රජයට ගැනීමයි. ඒ උත්කෘෂ්ට සේවය ගැන මේ රජයට අප කවුරුත් ස්තුතිවන්ත විය යුතු බව පවසන අතර, ඇත්ත වශයෙන්ම හිටපු අධ්‍යාපන ඇමතිතුමාට මේ කටයුත්ත ගැන මේ රටේ ජනතාව සදාකාලික වම ණයගැති බව ප්‍රකාශ කරන්ට කැමතියි. අළුත් අධ්‍යාපන ඇමතිතුමාත් ඉතාමත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දක්ෂ එඩිතර කෙනකු නිසා නුදුරු අනාගතයේදීම, රජයට නොගෙන ඉතිරි වී ඇති අනික් පාඨශාලා ටිකද රජයට ගන්නට ක්‍රියා කරනවා ඇතැයි අපි බලාපොරොත්තු වෙනවා.

ජාතික අධ්‍යාපනය ගැන නොයෙක් දෙනා නොයෙකුත් අදහස් ප්‍රකාශ කළා. ඒ පිළිබඳව දීර්ඝ විස්තරයක් කරන්ට මා අදහස් නොකරන්නේ අධ්‍යාපන කටයුතු පිළිබඳව මට විශේෂඥතාවක් නැති නිසයි. මගේ දැනුමේ හැටියට කෙටියෙන් වචන කීපයක් කියන්නම්. ජාතියේ සමගිය ගොඩ නැගෙන ආකාරයට, මේ රටේ මහජනතාව ඒක රාශි වන අන්දමට ජාතික අධ්‍යාපන ක්‍රමයක් බිහි කරන්නට මේ රජය උත්සාහ කරනවා ඇතැයි මා කල්පනා කරනවා. ජාතික අධ්‍යාපනයක මූලික පරමාර්ථය විය යුත්තේ ඒ මගින් ජාතියේ උන්නතිය හා සමගිය ඇති කිරීමයි. දැන් නොයෙකුත් කොටස්වලට බෙදී තිබෙන අපේ ජාතිය ඒක රාශි වන අන්දමට ජාතික අධ්‍යාපනයක් සකස් කළ යුතු බව අප පිළිගන්නවා. දැනට ටික වේලාවකට කලින් කරන ලද දඹදෙනියේ ගරු මන්ත්‍රීතුමාගේ කථාවේ ඇතැම් කොටස් අපද අනුමත කරන බව මතක් කරන්ට කැමතියි. මේ රටේ ජනතාව බලාපොරොත්තු වන්නේ මේ රටේ වැඩි දෙනා වන බෞද්ධයන් ගැන විශේෂ සැලකිල්ලක් දක්වා බෞද්ධ ධර්මයට ගැලපෙන පරිදි අධ්‍යාපන ප්‍රතිපත්තිය සකස් කරනවා ඇත කියලයි.

ඊළඟට මා කියන්ට යන්නේ ශිෂ්‍ය ගුරු පත්වීම් ගැනයි. නව අධ්‍යාපන ඇමතිතුමාගේ ඉතාමත් වැදගත් කටයුත්තක් හැටියට මෙය සලකන්ට පුළුවනි. මේ පිළිබඳව නොයෙකුත් දෙනා නොයෙකුත් අදහස් ප්‍රකාශ කළා. මේ අළුත් ගුරු පත්වීම් නිසා අපේ ගම්බද ප්‍රදේශවල ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට විශාල සේවයක් වෙනවා ඇතැයි අප කල්පනා කරනවා. පත්වීම් ලබා ගන්නා ශිෂ්‍ය ගුරුවරුනුත් මේ රටට වැදගත් සේවාවක් කරන්ට බලාපොරොත්තු වන බවට සැකයක් නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, ජ්‍යෙෂ්ඨ සමතුන් විශාල සංඛ්‍යාවකට ශිෂ්‍ය ගුරු පදවි දීමට ගත් තීරණය සම්බන්ධයෙන් මේ රටේ අන් කිසිම කෙනෙකුට වඩා මම සතුටට පත් වෙනවා. ඊට හේතුව මම කියන්නම්. ජ්‍යෙෂ්ඨ සමතුන්ගේ රැකීරක්ෂා ප්‍රශ්නය විසඳෙන විධියටත්, ගුරු හිඟයක් තිබෙන නිසාත්, අළුත් ක්‍රමයක් අනුව ජ්‍යෙෂ්ඨ සමතුන්ට තාවකාලික ගුරු පත්වීම් දීමේ ක්‍රමයක් සකස් කළ යුතුය කියා 1962 ඔක්තෝබර් මාසයේ මම මේ ගරු සභාවේ න්‍යාය පත්‍රයට යෝජනාවක් ඇතුළත් කළා. ඒ යෝජනාව මේ ගරු සභාවට ඉදිරිපත් කරන්නවත් ඉඩක් නොතබා එවකට අධ්‍යාපන අමාත්‍යාංශයේ පාර්ලිමේන්තු උපදේශක සභාව මේ යෝජනාව පිළි අරගෙන එය ක්‍රියාත්මක කිරීමට සූදානම් වීම ගැන ඇත්ත වශයෙන්ම මම ඉතාමත් සන්තෝෂ වෙනවා.

1962 ඔක්තෝබර් මස 10 වැනි දින න්‍යාය පත්‍රයේ ඒ යෝජනාව තිබුණේ මෙහෙමයි :

"ඩී. ජී. එච්. සිරිසේන මයා.,—ජ්‍යෙෂ්ඨ සමතුන්ට පත්වීම් දීම—ගම්බද පාසැල්වල ගුරු හිඟය තරමකින්වත් මග හරවා ගැනීමේ මූලික පරමාර්ථය ඇතිව, ජ්‍යෙෂ්ඨ සහතිකය ලබා ඇති ගැමි දරුවන්ගේ රැකීරක්ෂා ප්‍රශ්නය සෑහෙන තරමකින්වත් විසඳෙන ලෙසටත්, හොඳ ශරීර සෞඛ්‍යයෙන් යුත්, නිරහංකාරවාත් ගතිපැවතුම් ඇති ජ්‍යෙෂ්ඨ සමතුන්ගෙන් ඉල්ලුම් කැඳවා පළමු අවුරුද්ද අසල පාසැලේ නොමිළයේ ඉගැන්වීමටත්, ඊළඟ අවුරුදු 2ක් ජීවනාධාරයක් පමණක් ලබමින් සේවය කිරීමටත්, මේ ආකාරයට අවුරුදු 3 කට පසුව සතුටුදායක ප්‍රතිඵල පෙන්වූ අයගේ පමණක් සේවය ස්ථිර කරන ගිවිසුමකට බඳවා ජ්‍යෙෂ්ඨ සමතුන් සෑහෙන සංඛ්‍යාවකට පත්වීම් දීමට කටයුතු පිළියෙළ කළ යුතුයැයි මෙම මන්ත්‍රී මණ්ඩලය යෝජනා කරයි."

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, විවාදයකට පවා ඉඩ නොදී මගේ මේ යෝජනාව පිළි අරගෙන එය ක්‍රියාත්මක කරන්ට කටයුතු සැලැස්වීම ගැන අධ්‍යාපන කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමාටත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නිලධාරි මහතුන්ටත් මගේ අවංක ස්තුතිය පුද කරනවා.

අපේ මේ රජය වැඩ කළා මදිය කියා ඇතැම් ගරු මන්ත්‍රීන් චෝදනා කළා. නමුත් පසුගිය කාලය ඇතුළත අප කොතරම් දුරට වැඩ කර තිබෙනවාද යන්න මම තමුන්නාන්සේලාට පෙන්වා දෙන්න සතුටුයි. 1956 වර්ෂයේ මේ රටේ පාඨශාලා තිබුණේ 5,563 යි ; නමුත් ඒ ගණන 1963 වර්ෂය වන විට 8,434 දක්වා මේ රජය විසින් වැඩි කර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සිරිසේන මයා.]

තිබෙනවා. 1956 මහා විද්‍යාල තිබුණේ 647 යි ; 1963 වන විට තිබෙන මහා විද්‍යාල ගණන 985 යි. ඔය එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුව තිබුණු කාලයේදී හිටි ගුරුවරුන් ගණන 51,313 යි ; නමුත් පසු ගිය අවුරුදු අටේ කාලය තුළ ඒ ගණන 82,000 දක්වා වැඩි කර තිබෙනවා. 1956 සිටි පාසැල් ශිෂ්‍යයන් ගණන 11,17,000යි; නමුත් දැන් පාසැල් ශිෂ්‍යයින් සිටිනවා 23,00,000 ක්. මේ තරම් ශිෂ්‍ය සංඛ්‍යාවක් සඳහා අපි සෑහෙන පමණ පාඨශාලා ඇති කර තිබෙනවා. ඉතා ළඟදීම තවත් පාඨශාලා ගණනාවක් ඇති කරන්න අපි බලාපොරොත්තු වෙනව.

අ. භා. 7.

විශ්ව විද්‍යාල කොමිසම පිළිබඳව වචන ස්වල්පයක් කතා කරන්න කැමතියි. විශ්ව විද්‍යාල කොමිසම මගින් ඉදිරිපත් කර තිබෙන වාර්තාවෙ සඳහන් ඇතැම් කොටස් මේ රටේ මහජනතාව පිළිගන්නෙ නැති බව කියන්න සිදුවෙලා තියෙනව. දිවංගත ගරු බණ්ඩාරනායක අගමැතිතුමාණන්ගෙ කාලෙ මේ රටේ පිරිවෙන් විශ්ව විද්‍යාල 2ක් ඇති කළා. මෙම විශ්ව විද්‍යාල දෙකට කුඩම්මාගෙ සැලකිල්ල දක්වා ඇති ආකාර යයි, එම වාර්තාව කියවා බැලුවම පෙනී යන්නෙ. ඒ ගැන අපි කනගාටුව පළ කරනව. මේ වාර්තාවෙ ඇතැම් කොටස් මේ රටේ මහජනයා කිසිසේත් පිළිගන්නෙ නැත කියා මා නැවත වරක් ප්‍රකාශ කරන් කරන්න ඕන. පිරිවෙන් විශ්ව විද්‍යාල වලින් මේ රටට විශාල සේවයක් කෙරී තිබෙනව. වයස් සීමාව ඉක්ම ගිය, පාසල් වලට යන්න බැරි තත්ත්වයක සිටින, අයට මේ පිරිවෙන් විශ්ව විද්‍යාලවලින් ඉක්මන් අධ්‍යාපනයක් ලබාගෙන සතුටුදායක අන්ද මින් විභාගවලින් සමත් වන්න හැකි වී තිබෙනව. එම නිසා මේ පිරිවෙන් විශ්ව විද්‍යාලවලට මීට වඩා සලකන්න වුවමනා බව මතක් කරන්න කැමතියි.

වැඩ බලන මුල් ගුරුවරුන් පිළිබඳ ප්‍රශ්නය අවුරුදු ගණනක් තිස්සෙ සාකච්ඡා වට භාජන වෙලා තියෙනව. ඒ අය පිළිබඳව ගරු ඇමතිතුමා සතුටුදායක ආරංචියක් ප්‍රකාශයට පමුණුවා තිබෙන නිසා මා ඒ ගැන වැඩි දුර කතා කරන්න අදහස් කරන්නෙ නැහැ. කෙසේ වෙතත්, වැඩ බලන මුල් ගුරුවරුන් පිළිබඳ ප්‍රශ්නය හැකි තරම් ඉක්මනින් නිරාකරණය කර ඔවුන්ගෙ තත්ත්වය ස්ථිර කර දෙන හැටි යට මා නැවත වරක් ගරු ඇමතිතුමාට මතක් කරනව.

උපකෘත පාඨශාලා රජයට ගැනීම නිසා ඒවායෙ සේවය කළ ගුරුවරුන්ගෙ දේශ පාලන අයිතිය නැති වී ගියා. සියලුම ගුරු වරුන්ට එම අයිතිය දෙන්නෙ නැති නම් මුලින් එම අයිතිය හිමිව සිටි අයටවත් ඔවුන්ගෙ ඉතිරි සේවා කාලය අවසන් වනතෙක්වත් දේශපාලන අයිතිවාසිකම් ලබා දෙන හැටියට මා ඉල්ලා සිටිනව.

මා මීට වඩා යමක් කියන්න අදහස් කරන්නෙ නැහැ. මේ සුළු කාල සීමාව මට ලබා දීම ගැන තමුන්නාන්සෙට ස්තුති වන්තවෙමින් මගේ වචන සවල්පය අවසාන කරනව.

**එල්. ද එස්. ඒ. ගුණසේකර මයා.** (කලවාන)

*(திரு. எல். டி எஸ். ஏ. குணசேக்கர—களவான)*

(Mr. L. de S. A. Gunasekera--Kalawana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙසේ කතා කරන්න අවස්ථාව ලබා දීම ගැන මා පළමුකොට තමුන්නාන්සෙට ස්තුති වන්ත වෙනව. හැම අවස්ථාවකදිම මට අන්තිම මොහොතේ කතා කරන්න ඉඩ දී විනාඩි 10 කින් කතාව අවසාන කරන් නය කියා ප්‍රකාශ කිරීම ගැන ඒ වාගේම මගේ කනගාටුව ප්‍රකාශ කරනව.

මගේ කොට්ඨාශය තුළ ගුරුවරුන් පත් කිරීම සහ මාරු කිරීම පිළිබඳව පළමුකොට ම ප්‍රකාශ කරන්න ඕන. ගුරුවරුන් මන්ත්‍රී වරුන් සොයාගෙන ශ්‍රාවස්තියටත් පාර්ලිමේන්තුවටත් කායසීලවලටත් පැමිණෙන්නෙ මේ වැඩ පිළිවෙළේ තිබෙන වරද නිසයි. එය මන්ත්‍රීවරුන්ට කරදර යක් වෙලයි තියෙන්නෙ.

**එම්. සිවසිතම්පරම් මයා.** (උඩුප්පිඩ්ඩි)

*(திரு. எம். சிவசிதம்பரம்—உடுப்பிட்டி)*

(Mr. M. Sivasithamparam—Uduppiddi)

Which sex ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**එල්. ද එස්. ඒ. ගුණසේකර මයා.**
*(திரு. எல். டி எஸ். ஏ. குணசேக்கர)*
(Mr. L. de S. A. Gunasekera)

කොයි "සෙක්ස්" එක වුණත් කමක් නැහැ.

**එම්. සිවසිතම්පරම් මයා.**
*(திரு. எம். சிவசிதம்பரம்)*
(Mr. M. Sivasithamparam)

You like it !

**එල්. ද එස්. ඒ. ගුණසේකර මයා.**
*(திரு. எல். டி எஸ். ஏ. குணசேக்கர)*
(Mr. L. de S. A. Gunasekera)

කැමති වුණත් අකමැති වුණත් මේක කරදරයක්. දෙපාර්තමේන්තුවෙ නිල ධාරීන් මෙම චෝදනාව භාර ගන්න ඕන.

මා නියෝජනය කරන කොට්ඨාශයේ පාසල්වල පසුගිය මාසයේදී සිදු වූ ගුරුමාරු හතරක් ගැන කියන්න තිබෙනව. පිටි ගලකන්ද ඉස්කෝලෙ 1960 න් පෙර සිට වැඩ බලමින් හිටපු ගුරුවරයෙකු ගවර ගිරියෙ ඉස්කෝලෙට මාරු කර තිබෙනව. ඒ අතර රක්වාන මැතිවරණ කොට්ඨාශ යේ පාසලක හිටපු මුල්ගුරුවරයෙකු පිටි ගලකන්ද පාසලට මුල්ගුරු වශයෙන් පත් කර එවා සිටිනව. ඔහු විවාහකයෙක්. ඔහු ගේ භාර්යාවත් ගුරුවරියක්. ඇයව මාරු කර තිබෙන්නෙ කුකුලේගම පාසලටයි. ඒ අතර නාවලකන්ද පාසලේ වැඩ බලපු මුල්ගුරුවරයා කුකුලේගම පාසලේ වැඩ බලන මුල්ගුරුවරයා හැටියට මාරු කර එව්වා. ඔහුගේ බිරිය කුකුලේගම පාසලට පත් නොකර නාවලකන්ද පාසලට මාරු කළා. මේ ගුරුමාරු කීපය නිසා සිදු වී තිබෙන තත්ත්වය ගැන මට අමුතුවෙන් පැහැදිලි කරන්න දෙයක් නැහැ. ඒක මා සඳහන් කළ කරුණුවලින්ම තේරුම් ගන්න පුළුවනි. ගුරුවරුන් මාරු කිරීමේදී ස්වාමි පුරුෂයත් භාර්යාවත් දෙන්නම ගුරුවරුන් නම් දෙන්නම එක් පාසලකටම මාරු කිරීම අවශ්‍යයි. එහෙත් ගුරුවරයා එක් පාසලකටත් ඔහුගේ බිරිය වන ගුරු වරිය තවත් පාසලකටත් මාරු කිරීමේ අදහස අපට නම් තේරුම් ගන්න අමාරුයි. මේ පාසල් එකිනෙකට ඒ තරම් ඈත පිහිටි ඒවා නොවන බව මා පිළිගන්නව. ඒ වුණත් මේ විධියට මාරු කර යැව්වෙ මොන හේතුවක් නිසාද කියන්න අපට තේරෙන්නෙ නැහැ. මේ නිසා අද ලොකු කරදරවලට මඟ පෑදෙනව. මෙවැනි අහේතුක වැඩ කරනවිට එයින් කරදරයට පත් වන උදවිය පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා වෙත පැමිණ ඒ ගැන කියනව. එහි වර දක් ඇත කියා මම කියනවා නොවෙයි. එවැනි දේට ඉඩ තියන්න හොඳ නැහැ. "මන්ත්‍රීතුමනි, මෙවැනි අයුක්තියක් අපට කරල තියෙනව; කරුණා කර සොයා බලා අපට සහනයක් ලබා දෙන්න" කියාගෙන ගුරුවරු අප සොයාගෙන එනව. ඉතින් අපට එහි ඇති ආසාධාරණකම පෙනෙන නිසා නිලධාරීන්ට කියනව. අපට නිල ධාරීන්ගෙන් ලැබෙන උත්තරය නම් ඒ ගැන අපට කරන්න දෙයක් නැහැ කියන එකයි. හේතුව දන්නෙ නෑ.

**සිරිසේන මයා.**
*(திரு. சிறிசேன)*
(Mr. Sirisena)

අඹු සැමියන් එකම ඉස්කෝලෙට දාන වට මම නම් කැමති නැහැ. මගෙ කොට්ඨාශයෙ නම් ඔහොම මාරුවක් දුන්නට මම විරුද්ධ වෙන්නෙ නැහැ.

**එල්. ද එස්. ඒ. ගුණසේකර මයා.**
*(திரு. எல். டி எஸ். ஏ. குணசேக்கர)*
(Mr. L. de S. A. Gunasekera)

අකුරණ පළමුවන ගරු මන්ත්‍රීතුමා මොනවා හිතාගෙන ඔහොම කතාවක් කිව්වද කියන්න මම දන්නෙ නැහැ.

**සිරිසේන මයා.**
*(திரு. சிறிசேன)*
(Mr. Sirisena)

මුල් ගුරුවරය ඉන්න ඉස්කෝලෙම උපගුරුවරියක් හැටියට ඔහුගෙ භාර්යා වත් ඉන්නකොට උපගුරුවරිය අනෙකුත් ගුරුවරුන්ටත් ගුරුවරියන්ටත් මුල්ගුරු කම් කරන්න හදනව.

**එල්. ද එස්. ඒ. ගුණසේකර මයා.**
*(திரு. எல். டி எஸ். ஏ. குணசேக்கர)*
(Mr. L. de S. A. Gunasekera)

ඒක ඒ තරම් බරපතල ප්‍රශ්නයක් නොවෙයි. ඒව මඟ හරවගන්න තරම් ශක්තියක් ගුරුවරුන්ට නැති වෙන්න ක්‍රමයක් නැහැ. ඊට වඩා බරපතළ ප්‍රශ්න ඇති වෙන්න ඉඩ තියෙන දෙයක් ගැනයි මම ගරු ඇමතිතුමාගෙ අවධානය යොමු කරන්න යන්නෙ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එල්. ද එස්. ඒ. ගුණසේකර මයා.]

අද ගුරුවරුන් පත් කර යවන ආකාරය සතුටුදායක නැහැ. මහා විද්‍යාලවලට උපාධිධාරී ගුරුවරුන් පත් කර යවනව. සමහර මහා විද්‍යාලවලට උපාධිධාරී ගුරුවරුන් හය දෙනා හත්දෙනා ඉන්න බව පෙනෙනව. බොහෝ විට දකින්න ලැබෙන්නෙ විද්‍යෝදය විශ්ව විද්‍යාලයෙන් හෝ විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයෙන් උපාධි ලබාගත් ගුරුවරුයි. ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයෙන්—පේරාදෙනියෙ විශ්ව විද්‍යාලයෙන්—උපාධි ලත් අය අඩුයි. මුලින් කී විශ්ව විද්‍යාලවලින් උපාධි ලත් බොහෝ ගුරුවරුන් ඉහල පංක්තිවලට උගන්වන්න දන්නෙ සිංහල, පාළි, සංස්කෘත පමණයි. විශ්ව විද්‍යාල ප්‍රවේශ පංක්තිවල සාමාන්‍යයෙන් ශිෂ්‍ය ශිෂ්‍යාවන් තිහ හතළිහ ඉන්නව. ඒ හැම දෙනාම ඉගෙන ගන්නෙ එකම විෂයය නොවෙයි. ඒ අය අතර සිංහල භාෂාව ඇතුළු භාෂාවල් මෙන්න ලංකා ඉතිහාසය, ලෝක ඉතිහාසය, යුරෝපීය ඉතිහාසය, භූගෝල විද්‍යාව, ප්‍රජාපාලන විද්‍යාව, අර්ථ ශාස්ත්‍රය ආදී නොයෙක් විෂයයන් ඉගෙන ගන්න අය ඉන්නව. මුලින් කී විශ්ව විද්‍යාලවලින් උපාධි ලත් ගුරුවරුන් කී දෙනෙක් එක් පාසලකට එව්වත් ඒ හැම දෙනාගෙන්ම විශ්ව විද්‍යාල ප්‍රවේශ පංක්තියේ ඉගෙන ගන්න ළමයින්ට ප්‍රයෝජනයක් ලැබෙන්නෙ නැහැ. ගුරුවරුන් මාරු කිරීමේදී භූගෝල විද්‍යාව උගන්වමින් හිටපු උපාධිධාරී ගුරුවරයෙකු මාරු කර ඒ වෙනුවට ඒ විෂයය උගන්වන්න දන්න ගුරුවරයෙකු එවන්නෙ නැතිව උපාධිධරයකු වුණු නිසාම කවුරුන් හෝ එව්වට වැඩක් නැහැ. අවුරුද්දක් පමණ එක්තරා විෂයයක් ඉගෙන ගත් සිසුන් ඊළඟ අවුරුද්දේ පැවැත්වෙන විභාගයට සූදානම් වෙමින් සිටිද්දී මෙවැනි මාරුවක් ඇති වුණාම ඒ වෙනුවට එන ගුරුවරයට ඒ විෂයය මුලින් සිටි ගුරුවරයා නතර කළ තැන සිට උගන්වන්න බැරිකමක් තියෙනව නම් එයින් කරදරයට පත්වෙන්නෙ ශිෂ්‍යයන් මිස දෙපාර්තමේන්තුවේ නිලධාරීන් නොවෙයි. සමහර අවස්ථාවල උපාධිධාරී ගුරුවරයෙක් එක් පාසලකින් තවත් පාසලකට මාරු කර යැව්වට ඒ වෙනුවට තවත් ගුරුවරයෙකු එවීම කරන්න මාස 11 ක් නැත්නම් අවුරුද්දක් ගත වෙනව. එතකොට ඒ පංක්තියේ ඉගෙන ගත් සිසුන්ගෙ තත්ත්වය මොකක්ද? ඒ අයට එතකොටත් ලැබෙන්නෙ වෙනත් විෂයයන් ඉගෙන ගත් උපාධිධරයන් නම් එතකොට නැවතත් අලුතින් වෙනත් විෂයයක් ඉගෙන විභාගයට පෙනී සිටින්න කල් ඇද්ද?

ඒ මදිවට තවත් භයානක දෙයක් තමයි නියමිත කාල සීමාවක් ඇතුළත විශ්ව විද්‍යාල ප්‍රවේශ පරීක්ෂණයට පෙනී සිටීමට නීතියෙන් කර ඇති නියමය. වරකට හෝ දෙකකට හෝ වැඩිය විභාග්යට පෙනී සිටින්න ඉඩක් ඇත්තෙත් නැහැ. වයස් සීමාව බල පානවා. එතකොට දොට්ට දමනව. කාගෙ වරදින්ද මේ විධියට ශිෂ්‍යයන් අතරමං වෙන්නෙ? නගරබද සිසුන්ට වඩා ලොකු කණස්සල්ලකට මෙය හේතුවක් වෙන්නෙ ගම්බද සිසුන්ටයි. ඊළඟට අවශ්‍ය ප්‍රමාණයට ගුරුවරුන් දෙන්නෙ නැහැ. මගේ කොට්ඨාශයේ සමහර පාසැල්වල මුල්ගුරු පදවිවල වැඩ බලන්නෙ සිංහල හෝ ඉංග්‍රීසි ජ්‍යෙෂ්ඨය සමත් ගුරුවරුන්. මගේ මුළු කොට්ඨාශයේම ඇති පාඨශාලා 64 න් සම්පූර මුල් ගුරුවරුන් පත් කර සිටින්නෙ පාසැල් 7 කට පමණයි. එසේ නම් මේකද ජාතික අධ්‍යාපන්ය කියන්නෙ කියා මම ප්‍රශ්න කරනව. කොළඹ, නුවර ආදී නාගරික ප්‍රදේශවල තිබෙන පාඨශාලාවල ශිෂ්‍යයින්ට දැනට දෙන අධ්‍යාපනයට සමාන අධ්‍යාපනයක් ගම්බද ප්‍රදේශවල තිබෙන පාඨශාලාවල ශිෂ්‍යයින්ටත් දීමට කටයුතු සංවිධානය කරන්න ඕනැ. ජාතික අධ්‍යාපනය කියන්නෙ නගරබද පාඨශාලාවලට පමණක් පහසුකම් සැලසීම නොවන බව අප පිළිගන්න ඕනැ. එම නිසා නගරබද පාඨශාලාවලට සපයා ඇති පහසුකම් ගම්බද පාඨශාලාවටත් සැපයිය යුතු අතර ඒ පාඨශාලාවල උගන්වන ගුරුවරුන් ගම්බද පාඨශාලාවලටත් එවන්න ඕනැ.

රත්නපුර අධ්‍යාපන කාර්යාලය ගැනත් වචනයක් කියන්න ඕනැ. එහි සේව්‍ය කරන නිලධාරී මහත්වරුන්ව ලෙහෙසියෙන් රැවටීමට එහි සේවය කරන ඇතැම් ක්ලාක් මහත්වරුන්ට පුළුවන් බව පෙනී යනව. ගුරුවරුන් මාරු කිරීම පිළිබඳව නොයෙකුත් අන්දමේ ලියකියවිලිවල වැඩ කරන සාමාන්‍ය ලිපිකාර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මහත්වරුන්ට, ඇතැම් අයගෙන් ලාභ ප්‍රයෝජන ලබාගැනීම පිණිසත්, එසේ නැති නම් පගා ලබාගැනීම පිණිසත්, උසස් නිලධාරීන් නොමග යවන්න පුළුවන්කම තිබෙනව. එම නිසා මේ තත්ත්වය ගැන සොයා බලන්න ඕනෑ.

ගම්බද ප්‍රදේශවල ශිෂ්‍ය-ශිෂ්‍යාවන් නැටුම් උගෙනීමට ආශාවක් දක්වනව. බොහෝ පාසැල්වලට නැටුම් උගැන්වීම සඳහා නැටුම් ගුරුවරුන් පත් කරනව. නමුත් බොහෝ අවස්ථාවලදී ශිෂ්‍යාවන්ට නැටුම් උගන්වන්න එවන්නේ නැටුම් ගුරුවරුන්. මේ නිසා ශිෂ්‍යාවන්ට නැටුම් උගන්වන්නට සිදු වෙන්නෙ පිරිමින් නටන ආකාරයටයි. අපට ඇතැම් අවස්ථාවලදී මේ බව පැහැදිලිවම පෙනී ගොස් තිබෙනව. එම නිසා ගැහැණු ළමයින්ට නැටුම් ඉගැන්වීමට නැටුම් ගුරුවරියන් පත් කර එවීමට කට යුතු යොදනවා නම් හොඳ බව මතක් කරන්න කැමතියි. ඒ වාගේම නැටුම් ඉගෙන ගැනීමට ආශාවක් දක්වන ශිෂ්‍යාවන් නැටුම් ගුරුවරුන් වෙත එවීමට දෙමව්පියන් බොහෝ අවස්ථාවලදී මැළි කමක් දක්වනව.

මගේ ප්‍රදේශයේ පාසැල් ගොඩනැගිලි පහක් තැනීම සඳහා ගිය අවුරුද්දෙ රුපියල් පණස් දහසක් වෙන් කර තිබුණා. නමුත් එම ගොඩනැගිලි තැනීමේ කටයුතු කිසිවක් පටන් ගත්තෙ නැති නිසා ඒ මුදල් ආපසු භාණ්ඩාගාරයට යනව. මේ නිසා ලබන අවුරුද්දෙත් මේ කටයුත්ත සඳහා මුදල් වෙන් කරවා ගැනීමට සිදු වෙනව. මේ අන්දමට මේ කාර්යය කර ගන්න පුළුවන් වේයයි මම කල්පනා කරන්නෙ නැහැ.

ලංකාවේ පාඨශාලාවල ගුරුවරුන් 89,000 ක් සේවය කරන බව මට දැනගන්න ලැබී තිබෙනව. ගුරුවරුන් 10 දෙනකු 12 දෙනකු සිටින පාසැල් වල හැමදාම ගුරුවරුන් දෙතුන් දෙනකු නැහැ. 20 ක් 30ක් සිටින පාඨශාලාවල දවසකට ගුරුවරුන් පහක් හයක් නැහැ. මේ අය නිවාඩු ගිහිල්ල. සමහරු ලෙඩ නිවාඩු ගිහිල්ලලු. නැතිනම් අනියම් නිවාඩු අරගෙනලු. එහෙම නිවාඩු අරගෙන සමහර උදවිය, මන්ත්‍රීවරුන් සොයාගෙන ශ්‍රාවස්තියට හෝ මෙම ස්ථානයට එනව. ගුරුවරුන් නියම අන්දමට අද වැඩ කරන්නෙ නැහැ. සතියකට දවස් 5 යි වැඩ කරන්නෙ; එයිනුත් උදේ අටේ සිට සවස එක හමාර පමණ වනතුරුයි වැඩ කරන්නෙ. මෙපමණ නිවාඩු තියෙද්දිත් නොයෙකුත් විධියෙන් නිවාඩු ලබාගෙන යනව. නියමිත නිවාඩු මදිවුණාම පඩි රහිතව නිවාඩු ලබාගෙන යනව. මේ නිසා ඒ ඒ පාඨශාලාවල ඉගෙන ගන්න ශිෂ්‍යයන්ටයි පාඩු සිදු වෙන්නෙ. මේවා ගැන දෙපාර්තමේන්තුව විශෙෂයෙන් පරීක්ෂා කර බලන්න ඕනෑ. අද පාඨශාලාවකට ගිහින් බලන්න, ගුරුවරුන් විශාල සංඛ්‍යාවක් නිවාඩු අරගෙන ගිහින්. ඒ කාලයේ අධ්‍යාපනය ගැන ලොකු උනන්දුවක් ගුරුවරුන් තුළ තිබුණා. විභාගයක් ගැනීමට සූදානම්වන ළමයින්ට ඇතැම් අවස්ථාවලදී සවස් වරුවේ පංක්ති පවත්වා උගැන්නුව. නමුත් ඒ තත්ත්වය අද නැහැ. අද එහෙම උගන්වන්නෙ නැහැ.

අ. භා. 7.15

අද ගුරුවරුන් හැටියට පංක්තිවලට යන්නෙ තමන් උගන්වන්නෙ මොනවද කියා කිසිම දැනීමක් නැතිවයි. ඒ සම්බන්ධයෙන් කිසිම පුහුණුවක් ලබන්නෙ නැහැ. නිකම්ම ගිහින් හුණු කෑල්ලක් අරගෙන කළු ලෑල්ලෙ මොනව හෝ ලියනව. "සී ඒ ටී කැට්," "ආර් ඒ ටී රැට්" කියා හෝ ඔය විධියට වෙන මොනව හෝ කියා දෙනව. නමුත් ඉගැන්වීම ගැන, උගන්වන්නෙ මොනවද යන්න ගැන කිසිම පුහුණුවක් නැහැ. ඒ නිසා අලුත් ක්‍රමයක් උඩ ගුරුවරුන්ට පත්වීම් දීමට යාම ගැන අධ්‍යාපන ඇමතිතුමාටත්, උප ඇමතිතුමාටත් මම ස්තුති වන්ත වෙනව. ඒ මොකද එස්.එස්. සී. පාස් වුණත් බී. ඒ. පාස් වුණත් සැම කෙනෙක්ම ඉගැන්වීමට සුදුස්සන් වශයෙන් ගණන් ගන්න බැහැ. රක්ෂාවක් වශයෙන් ගුරු වෘත්තියට යනව. නමුත් ගිය දවසෙ සිට බලන්නෙ ඊට වඩා උසස් තනතුරක් ගන්නයි. ඒ නිසා ඔවුන් හරි හැටි ඉගැන්වීමේ සේවයේ යෙදෙන්නෙ නැහැ.

අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් අද කරගෙන යන වැඩ නිසා කලවාන වැනි ගම්බද ප්‍රදේශවලවත් ළමයෙක් පාසැලට ඇතුළත් කර ගැනීමට පුළුවන්කමක් නැහැ. දැන් අවුරුදු දෙකකට උඩදී චක්‍ර ලේඛන නිකුත් වුණා, අහවල් වයස් සීමාවෙ ළමයින් පමණයි පාසලට ඇතුළත් කර ගත යුත්තෙ කියා. නමුත් ඒ චක්‍ර ලේඛන අනුව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org
PUBLIC LIBRARY
JAFFNA.

[එල්. ද එස්. ඒ. ගුණසේකර මයා.]

ක්‍රියා කිරීම නිසා වයස් සීමාව උඩ බොහෝ ගම්බද දරුවන්ට පාසල්වලට ඇතුළු වීමට ඉඩක් නැහැ. ඒ පාසල්වල ඕනෑ පමණ ඉඩ තිබෙනව. එසේ ඉඩ තිබෙද්දිත් ඇතුළු කරගන්නෙ නැහැ. දැන් කොළඹ පාසල් ගැන බැලුවත් එසේමයි. කොළඹ ඇති පාසල්වල ඕනෑ තරම් ඉඩ තිබෙනව. මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, හැම කෙනෙකුටම වුවමනා කරන්නෙ සෙන්ට් තෝමස්, රෝයල්, ආනන්ද, නාලන්ද, ශ්‍රීන්ලන්ඩ්ස් වැනි පාසල්වලට ළමයින් ඇතුළු කිරීමටයි. අවුරුදු පහක් කියා සීමා කළ විට, එදාට හරියට අවුරුදු පහක් වී තිබුණේ නැත් නම් දරුවා පාසලට ඇතුළු කිරීම සඳහා තවත් අවුරුද්දක් බලා ඉන්න ඕනෑ. ඔය කොන්දේසි නිසා පසු ගිය අවුරුද්දෙ සෙන්ට් තෝමස් විද්‍යාලයට ඇතුල් කර ගැනීමට බැරි වූ ළමයින් 20 දෙනෙකුගෙන් රුපියල් දාහ බැගින් අරගෙන ඇතුළු කර තිබෙනව. මට ආරංචියි මේ වරත් විද්‍යාලයාධිපතිට රුපියල් දාහක් දුන්නොත් ළමයි ඇතුළු කර ගැනීමට පුළුවන්ය කියා. යම් යම් නීති, කොන්දේසි ආදිය නිසා වෙළෙන්දන් සමහර අවස්ථාවලදී මුදල් හම්බ කර ගන්නා වාගේ අධ්‍යාපන දෙපාර්තමේන්තුව මේ කොන්දේසි දැමීම නිසා සමහර පාලකයො දහස් ගණන් මුදල් හම්බ කරනව.

ඒ වගේම 1961 ගුරු පත්වීම් දීමේ දී, එක් එක් ඡන්ද කොට්ඨාශයකින් 25 දෙනා බැගින් තෝරා ගත් අවස්ථාවේදීත් මේ විධියෙ අක්‍රමිකතා තිබුණා. මූලික වශයෙන් නියම කර තිබුණේ, විභාගය සමත් වී ඇති අවුරුද්ද අනුව පත්වීම් දීමයි. ඒ අවස්ථාවෙදි ඒ කාර්යාලවල ලිපිකරුවන් කෙළේ මොකක්ද? පත් වීම් ලැබෙන අයගේ ලිපින බලාගෙන ඒ අයගේ ගෙදරවලට ගොස්, ස්ථිර වශයෙන්ම පත් වීම් ලබා දෙන බව කියමින්, රුපියල් 750, 1,000 බැගින් ගැනීමයි. ඒ විධියේ සිද්ධීන් මේ වර සිදු නොවන ලෙස වග බලා ගන්නා හැටියට ඉල්ලමින් මගේ කථාව අවසාන කරනව.

**එම්. සිවසිතම්පරම් මයා.**

*(திரு. எம். சிவசிதம்பரம்)*

(Mr. M. Sivasithamparam)

Mr. Chairman, we are not offering an excuse for having always hurled brick-bats, but on this occasion I want to offer one bouquet to the Hon. Minister. I wish to express on behalf of the Tamils, I believe I am expressing the sentiments of all Tamil Members, our gratitude and appreciation of the action of the Hon. Minister and that of the Permanent Secretary, as well as the Additional Director in charge of that aspect of the matter, for having given us 150 Tamil trained teachers who have been on the unemployed list for the last two or three years. For that, on behalf of the Tamil-speaking people, I wish to offer a bouquet to the Education Department. I also wish to say this, that, I think the Education Ministry is the only one of the Ministries which is a little fair in the distribution of the funds available to the Ministry in the matter of putting up buildings. I believe it is the only Ministry which allocates funds on an electoral basis and when they do so they give money even to the electorates that are represented by the Opposition Members in Parliament. For that also I wish to offer a bouquet.

Having offered these bouquets, I now wish to refer to promotions in the inspectorate from Circuit Inspectors to District Inspectors during last month. I am sorry to say, and I wish to put it as strongly as I possibly could, that 25 senior Circuit Inspectors were overlooked for promotion while three officers who were their juniors, both in the matter of service and in the matter of educational qualifications and in practically every other aspect of their work—two of them, I believe, were not even confirmed in their posts as Circuit Inspectors—were given promotions as District Inspectors. I wish to know from the department categorically whether they have given up the policy of giving promotions purely on merit and seniority and is doing something on a racial basis. If that is so, let us have it practically right up to the Director on a racial basis ; let us have a Tamil Director, a Muslim Director, a Sinhalese Director, a Burgher Director, a Timbuctoo

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Director and so many other Directors. Certainly, Sir, we should recognize that promotion should be given only on the basis of merit and seniority.

Here are Circuit Inspectors who have been appointed in 1950 and in 1951, who have served the department for more than thirteen years, being overooked while people appointed in 1960 and 1961 are given promotions as District Inspectors over their seniors. I believe, Sir, that some of these people who have been given promotions as District Inspectors were students who were examined by those who were overlooked for promotion as District Inspectors. I think, this is a matter that the Hon. Minister should look into and see that it is redressed.

The other matter I wish to refer to is this. We all thought that with the introduction of a National System of Education there would be promotion of education in all parts of the country, but unfortunately we are today hearing tales from all parts of the country that one part of the country has too many Grade I schools, too many graduates and teachers, and so on, and so forth. Sir, I wish to know from the department whether in any one part of the country schools have been established outside the Code of Regulations; whether appointments as teachers have been made outside the regulations laid down by the Education Department. If that is so, and if one section of the country had taken advantage of your own rules and regulations, why is it that you are trying now to degrade your schools? I am all for the development of every section of the country, but certainly, Sir, I wish to know from the department whether it is necessary that they should pull down one section in order to upgrade the other section. We have no objection to certain schools standing as they are till others are able to catch up, but, certainly, we strongly object to any degrading or lowering of the standard of any school in any part of the country so as to enable some other school to be upgraded.

In this connection I wish to draw the attention of the Hon. Minister and the Parliamentary Secretary to the fact that there is a proposal to transfer 150 science teachers from the Jaffna Peninsula to other places, the argument being that there is an excess of science teachers in Jaffna. I wish to ask the education authorities whether in any school in Jaffna there is more than the allowed quota of science teachers. If every school in Jaffna has no more than the quota of science graduates that the Education Department itself has allowed, how can anyone be heard to say that there is an excess ?

We are told that a large number of science graduates who are on the waiting list for appointment cannot be enggead because they are unable to tecah in Sinhala. If that is true of appointments, is it not also true of transfers ? How is it that you are able to transfer a science graduate from a Jaffna school who is not capable of teaching in the Sinhala medium when you refuse to make an appointment on the ground that a graduate is unable to teach in Sinhala ?

ගරු මන්ත්‍රීවරයෙක්
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

What about Batticaloa ?

එම්. සිවසිතම්පරම් මයා.
*(திரு. எம். சிவசிதம்பரம்)*
(Mr. M. Sivasithamparam)

I can understand a science graduate being transferred from Jaffna to Batticaloa. But here you are transferring them to schools like Sangamitta, Galle. Should you pull out teachers from one area in this way in order to feed another area ?

In regard to salary anomalies, I have two small matters to deal with. In 1956, I believe, some pundits who had passed the Colombo Oriental Studies Society examination were


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. සිවසිතම්පරම් මයා.]

paid salaries applicable to graduates. At that time an hon. Member representing a Northern constituency raised the question whether pundits who had the equivalent qualification, having passed the Jaffna Oriental Studies Society examination, would also be paid on the same scale. I refer to Vidwans and pundits. The then Minister of Education, the hon. Member for Galle, gave an undertaking on the Floor of the House that if such a pundit does 15 hours' work in the H. S. C. and S. S. C. classes, he would be considered for that salary scale. I am aware of one or two pundits who are today teaching 15 hours per week in Madhya Maha Vidyalayas and Grade I schools in the H. S. C. and S. S. C. classes. The syllabus for the pundit examination is as wide as if not even wider than, the syllabus for the examination for graduates in the matter of Tamil literature, Tamil language and religion. Therefore, it is only fair that if these people are in fact doing 15 hours' work per week in the H. S. C. and S. S. C. classes, they should be given the same salary scale as those pundits who have passed from the Oriental Studies Society, Colombo.

The other matter I want to refer to is in regard to the Teacher's Certificate. Today, the disparity between the salary paid to a trained teacher and a teacher with the Teacher's Certificate is very wide. I believe when the hon. Member for Galle was Minister of Education, he and the then Minister of Finance, Mr. Stanley de Zoysa, had worked out a scheme under which these Certificated Teachers were to be paid a slightly higher scale of salary. I believe the Wilmot Perera Commission also considered this matter and they too decided that the Certificated Teachers should be paid a slightly higher scale of salary. I ask the Hon. Minister to implement the recommendation that has been made so far as the Certificated Teachers are concerned.

විශ්ව විද්‍යාලය වැඩ පටන් ගැනීම වහාම කළ යුතුයි. ඒ බව මම මේ අවස්ථාවේ මතක් කරනව. කාලය නැති නිසා මා දීර්ඝ වශයෙන් කථා කරන්න යන්නෙ නැහැ. මගේ කොට්ඨාශය සම්බන්ධව වචන සවල්පයක් කියන්න ඕනෑ. ගුරු හිඟය සම්බන්ධයෙන් නගරයෙන් පිට පළාත්වල සිට පැමිණෙන ගරු මන්ත්‍රී වරුන් කරුණු කියා සිටිය. ඇත්ත වශයෙන්ම කොළඹ නගරයට ආසන්නව අපේ ප්‍රදේශය පිහිටා තිබුණත්, ගුරු හිඟය ඉතා මත් තදින් බලපවතිනව. අපේ කිසිම පාසලක අවශ්‍ය ප්‍රමාණයට ගුරුවරුන් නැති බව කියන්න පුළුවනි. එම නිසා ගුරු ප්‍රශ්නය විසඳීමේදී ලංකාවේ කොයි පළාතටත් සාධාරණය ඉෂ්ඨ වන විධියෙ වැඩ පිළිවෙළක් ගෙන යනවා නම් හොඳ බව මේ අවස්ථාවේදී මතක් කරනව.

අපේ ප්‍රදේශයේ පාඨශාලා පහක් සම්බන්ධ කර කුඩාබුත්ගමුව මහා විද්‍යාලය කියා පාඨශාලාවක් ගොඩනගා තිබෙනව. ඒ පාඨශාලාවට භාර ගන්නෙ අටවැනි පංක්තිය සමත්වුණු ළමයින් පමණයි. ඒ කියන්නෙ එස්.එස්.සී. පංක්තියට ඉගෙන ගන්න ළමයින් පමණයි. අප විද්‍යාගාරයක් ඉල්ලා සිටිය. අපේ කොට්ඨාශයට විද්‍යාගාරයක් ලැබුණා. එයට මුල් ගල තබා වැඩ පටන් ගන්න යන අවස්ථාවේදී අපට ලිපියක් ලැබුණා, රුපියල් 17,500 ක් අනුමත කර තිබෙනවාය, කුඩා විද්‍යාගාරයක් හදන්නය කියා. මේ නිසා අපට ඒ කටයුතු නවත්වා දමන්න සිදු වුණා.

මේ පාසැලේ ජ්‍යෙෂ්ඨ පංක්තිවල ශිෂ්‍යයින් පන් සියයක් පමණ ඉන්නව. මේ වර්ෂය අවසානයේදී ළමයින් සංඛ්‍යාව දහසක් පමණ වෙතැයි බලාපොරොත්තු වෙනව. එය ස්ථිර වශයෙන්ම අප බලාපොරොත්තු වන සංඛ්‍යාවක්. එම නිසා ළමයින් 30 කට පමණ සෑහෙන කුඩා විද්‍යාගාරයක් කිසිසේත් ප්‍රමාණවත් නැහැ. ඒ කාරණය සථිර ලේකම්තුමාටත් ගරු ඇමතිතුමාටත් ඉදිරිපත් කළා. ගිය වර්ෂයේ විද්‍යා අංශයක් නොතිබීම නිසා ශිෂ්‍යයින්ට වැඩ කටයුතු කරගෙන යන්න බැරි වුණු නිසා ප්‍රමාද නැතුව, ලබන මාසයේ සිට, මෙම විද්‍යා අංශය පිහිටුවීමේ කටයුතු යොදන බවට මට පොරොන්දු වී සිටිනව.

කොලොන්නාව විද්‍යාලය මහා විද්‍යාලයක්. කොළඹට නුදුරුව තිබෙන විශාලම ශිෂ්‍ය සංඛ්‍යාවක් පැමිණෙන විද්‍යාලය මෙය බව කියන්න කැමතියි. පසුගිය අවුරුද්ද තුළදී ඉගෙනීම සම්බන්ධයෙන් සතුටුදායක පියවරක් ගෙන තිබෙනවාය කියන්න පුළුවන් කමක් නැහැ. මන්ද? නොයෙකුත් අන්දමේ කරදර තිබුණා. ගුරුවරුන් අතර දේශපාලන මතභේද තිබුණා. පාසැලට අවශ්‍ය ගොඩනැගිලි තිබුණෙ නැහැ. ගුරු සංඛ්‍යාව අවශ්‍ය ප්‍රමාණයට පිළියෙල කර ගන්න අවස්ථා ලැබුණෙ නැහැ. අදත් ඒ ප්‍රදේශයේ දෙමව්පියන් සහ දරුවන් ඉතාමත් කනගාටුවෙන් සිටිනව, මේ පාසලේ තත්ත්වය දුර්වල නිසා. නොයෙකුත් උත්සාහ දැරීමෙන් පසුව දෙපාර්තමේන්තුව පොරොන්දු වී තිබෙනව, ඇමතිතුමා පොරොන්දු වී තිබෙනව, මේ වර්ෂය තුළදී නව ගොඩනැගිලි තනා විද්‍යාලය උසස් තත්ත්වයකට පත් කරනවාය කියා. ගරු සභාපතිතුමනි, භාර දහසකට කිට්ටු සංඛ්‍යාවක් අධ්‍යාපනය ලබන නිසා මේ පාසැල ඉහළ පංක්තිවල ගැහැණු ළමයින්ට එක පාසැලකුත්, පිරිමි ළමයින්ට තවත් පාසැලකුත් යන ආකාරයෙන් දෙකක් බවට පත් කිරීමට ලබන වර්ෂයේ සිට කටයුතු යෙදීම හොඳ බව ගරු ඇමතිතුමාට මතක් කරන්න කැමතියි. මා එසේ කීවේ පාසැලේ අද තත්ත්වය ගැන කල්පනා කර බැලීමෙන් පසුවයි.

තවත් කාරණයක් මතක් කළ යුතුව තිබෙනව. යම් පාසැලක ගුරුවරුන් දීර්ඝ කාලයක් ඒ පාසැලේම රැඳී සිටිනවා නම්, සමහර ගුරුවරුන් හොඳින් ඉන්න පුළුවන් අතර සමහර ගුරුවරුන් තුළ තමන් සිටින පාසැලට ලැදිව කටයුතු කිරීමේ ආශාව ක්‍රමයෙන් අඩුව යන්න පුළුවන් වෙනව. එම නිසා එම පාසැලේ අධ්‍යාපන තත්ත්වය පහළ බසින්න ඉඩ තිබෙනව. ඒ වාගේම මොන පාසැලකවත් දේශපාලන හෝ පක්ෂභේද හෝ බලාපොරොත්තු වෙන්නෙ නැහැ. එයින් පාසැලේ දියුණුව සම්පූර්ණයෙන් කඩා කප්පල් වෙනවා පමණක් නොවෙයි, පාසැල් ළමයින්ටත් එයින්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. එස්. සමරසිංහ මයා.]

විශාල හානියක් වෙනව. එම නිසා ප්‍රදේශයේ දියුණුව පතන සෑම කෙනෙකුගේම සහයෝගය මේ කාරණය ගැන ලැබෙනවා ඇතැයි මම බලාපොරොත්තු වෙනවා. ඒ අතරම රජයට ළඟදී පවරා ගත් පාසැලක් තිබෙනවා. මාදින්නාගොඩයි ඒ පාසැල තිබෙන්නේ. මේ පාසැල පවත්වාගෙන යන්නෙ විහාරස්ථානයක, ධර්මශාලාවකයි. මා ඉල්ලා සිටින්නෙ මෙයයි. කොළොන්නාවෙ පළාත් ආණ්ඩු සභාව අසල රජයේ ඉඩමක් තිබෙනව. ළමයින් හාරසියයක් පමණ මෙම පාසැලට දිනපතා පැමිණෙන බැවින් මාදින්නාගොඩ විහාරස්ථානයේ කටයුතු කර ගැනීමට පවා අසීරුවක් තිබෙනව. විශේෂයෙන් විහාරස්ථානයට අයත් ධර්මශාලාවෙ පංක්ති පැවැත්වෙන නිසා විහාරස්ථානයේ කටයුතුවලට අවහිරවීම පුදුමයට කාරණයක් නොවෙයි. එම නිසා මේ ඉඩම පාසැල සඳහා ලබාගෙන, ලබන මාසයේ සිටම ගොඩනැගිලි ආදිය තැනීමේ කටයුතු කරගෙන යාමට වැඩ පිළිවෙළ යොදන ලෙස ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනව.

අ. භා. 8.45

ගරු සභාපතිතුමනි, මීට වඩා දීර්ඝ වශයෙන් කථා කිරීමට දැන් අවස්ථාව නොවෙයි. මේ වර්ෂයේදී පොදුවේ කොයි පළාතටත් සෑහෙන සේවයක් කිරීමට අධ්‍යාපන ඇමතිතුමා ඉදිරිපත් වී සිටීම ගැන මම එතුමාට ස්තුතිවන්ත වෙනව. ඒ වාගේම ගොඩනැගිලි අංශය සම්බන්ධයෙන් කරන කටයුතුද හැකි තරම් ඉක්මනින් කිරීමට පියවර ගන්න ලෙස මම ඉල්ලනව. මීට කලින් වර්ෂ ගැන කල්පනා කරන විට පසු ගිය වර්ෂයේදී ගොඩනැගිලි අංශයෙන් සිදු වී ඇති සේවය ඉතාම උසස් බව මට ප්‍රකාශ කරන්න පුළුවන්. ඒ අංශයේ නිලධාරි මහත්වරුන් පසු ගිය අවුරුදු දෙක ඇතුළත හැකි තරම් ඉක්මනින් වැඩ කටයුතු කර තිබෙනව. ඒ නිසා ඒ නිලධාරි මහත්වරුන්ටත් මම ස්තුතිවන්ත වෙනව. අවසාන වශයෙන්, මේ වර අයවැය ලේඛනයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය සඳහා වෙන් කර ඇති මුදල්වලින් කරන වැඩ කටයුතු අප්‍රමාදව මාස කීපයක් ඇතුළත කර දීමට සලස්වනවා ඇත කියා බලාපොරොත්තු වෙමිනුත් එසේ කරන ලෙස ඉල්ලමිනුත් මගේ වචන ස්වල්පය අවසන් කරනව.

**ටී. සිවසිතම්පරම් මයා.**
*(திரு. ரி. சிவசிதம்பரம்)*
(Mr. T. Sivasithamparam)

கௌரவ அக்கிராசனர் அவர்களே, கல்வி இலாகாவின் மானியம் சம்பந்தமாக இந்தச் சபையிலே விவாதிக்கப்படும் பொழுது, கௌரவ அமைச்சர் அவர்களோ, அவருடைய பாராளுமன்றக் காரியதரிசியோ இங்கு இல்லாமலிருப்பதையிட்டு மனவருத்தப்படுகின்றேன்.

ஒரு நாட்டிலே மிக முக்கியமானது கல்வி. மக்களுக்குத் தேவையான மற்ற எதையும் காலந் தாழ்த்தலாம். அவற்றைப் பொறுத்துப் பெறலாம். ஆனால், கல்வியானது குழந்தைகளுக்கு அப் பருவத்திலேயே கொடுக்கப்பட வேண்டிய ஒன்றாகும். ஒரு நாட்டின் முன்னேற்றம் பொருளாதாரத்தில் தங்கியிருந்தாலென்ன, வேறு எந்தத் துறையில் தங்கியிருந்தாலென்ன, அவை அனைத்தும் நாட்டின் கல்வித் தரத்திலே, கல்வி நிலையிலே தான் தங்கியிருக்கின்றன.

இந்நாட்டிலே கல்வி தேசியமயமாக்கப்பட்ட பொழுது, காலஞ் சென்ற பிரதமர் திருவாளர் பண்டாரநாயக்கா அவர்களுடைய கொள்கை, பிரதமரின் மகனும் இருந்தாலென்ன, ரிக்ஷோ வண்டி இழுப்பவனின் மகனும் இருந்தாலென்ன, எல்லோருக்கும் சமமான முறையிலே கல்வி புகட்டப்பட வேண்டும், சமமான முறையிலே கல்வி வசதிகள் அளிக்கப்பட வேண்டும் என்பதாகும். இத்துறையிலே, இம் முற்போக்குப் பாதையிலே, இத் திருப்பத்திலே காலஞ் சென்ற பண்டாரநாயக்கா அவர்களின் கொள்கையைப் பின்பற்றும் இந்த அரசாங்கம், கடந்த சில ஆண்டுகளிலே இத்துறையில் சாதித்தவற்றிற்கு உண்மையில் நாம் நன்றி பாராட்ட வேண்டும். ஆனால், எத்தனையோ ஆண்டு காலமாக வேறொரு கொள்கையில் ஊறித் திளைத்திருந்த இந்நாட்டின் கல்வித் திட்டத்தின் நடைமுறையிலே புதிய திருப்பத்தை ஏற்படுத்தும் பொழுது, தெரிந்தோ தெரியாமலோ அரசாங்கமும் அதற்குப் பொறுப்பான அமைச்சர் அவர்களும் மற்றும் உத்தியோகஸ்தர்களும் தவறுகள் விடுவது வழக்கம். அவற்றைத் தவறு என்று கூறாமல், இன்னும் நீங்கள் குறிக்கோளாகக் கொண்ட தேசிய மயக் கல்வித் திட்டத்தைச் சரியான முறையில் நடாத்துவதற்கு இவையிவை

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

செய்யப்பட வேண்டுமென்று கூற வேண்டியது இச்சபையிலேயுள்ள அங்கத்தவர்கள் ஒவ்வொருவருடைய கடமையுமாகும். கல்வி, சாதி மத அல்லது அரசியற்கட்சி இவை போன்றவைகளின் அடிப்படைகளைக் கவனித்து மக்களுக்குக் கொடுக்கப்பட வேண்டியதல்ல. சாதாரணமாக ஆளப்படுபவர்களும் கல்வி கற்கத்தான் வேண்டும். ஆளுபவர்களும் கல்வி கற்கத்தான் வேண்டும். ஏழையும் கல்வி கற்கத்தான் வேண்டும். பணக்காரனும் கல்வி கற்கத்தான் வேண்டும். ஆகவே, இது எந்தவிதமான பாகுபாடுமற்ற முறையில் சூரியனைப் போன்று, மழையைப் போன்று சகலருக்கும் ஓரளவு பயன்தரக் கூடியதும், பயன்பெற வேண்டியதுமான பொதுச் சொத்தாகும். இந்த நிலையிலே அரசியற் கட்சிகளில் வேறுபட்ட கட்சிகளைச் சேர்ந்தவர்களாக இருந்த போதிலும், சமயம், சமூகம் இவற்றில் மாறுபட்டவர்களாக அல்லது வித்தியாசம் உள்ளவர்களாக இருந்த போதிலும் கூட வடக்கு, கிழக்கு மாகாணங்களிலுள்ள தமிழ் பேசும் மக்களுக்கு இந்த அரசாங்கத்திலிருந்த கௌரவ கல்வி அமைச்சர் அவர்கள் ஒதுக்கிய பணம், அதிகப்படியான உத்தியோகங்களுக்குக் கொடுத்த உத்தியோக வசதிகள் இவைகளை என்னுடைய நண்பன் கௌரவ உடுப்பிட்டிப் பிரதிநிதி (திரு. எம். சிவசிதம்பரம்) அவர்களுடன் சேர்ந்து பாராட்டுவதுடன் நிறுத்தாமல், தனிப்பட்ட முறையிலும் மீண்டுமொரு முறை என்னுடைய பாராட்டுதல்களைத் தெரிவித்துக் கொள்ள வேண்டியது எனது கடமையும் பொறுப்புமாகும்.

கௌரவ அக்கிராசனரவர்களே, இன்று கல்விக்கெனத் தொகுதிவாரியாகப் பணம் ஒதுக்கப்படும் பொழுது சமமாக, ஒவ்வொரு தொகுதிக்கும், ஒவ்வொரு பிரதிநிதிக்கும் குறித்த அளவு தொகை ஒதுக்கப்படுகின்றது. அதை ஒரு கோணத்திலிருந்து பார்த்தால் உண்மையாகச் சரியென்று கருதலாம். இன்னுமொரு கோணத்திலிருந்து நோக்கும் பொழுது ஒவ்வொரு பிரதேசத்திலும், ஒவ்வொரு பாராளுமன்ற உறுப்பினருடைய தொகுதியிலும் கல்வியின் தரம் சமமாக இருந்தால் எல்லாத் தொகுதிகளுக்கும்—எல்லாப் பாராளுமன்ற உறுப்பினர்களுடைய தொகுதிகளுக்கும்—கல்வி முன்னேற்றத்துக்கு அரசாங்கம் சமமான பணம் ஒதுக்க வேண்டும். அப்படியாக சமமான கல்வி நிலை எல்லாத் தொகுதிகளிலும் இருந்திருந்தால் கல்வியை நான் முன்பு குறிப்பிட்டது போல் சகலருக்கும் சரியான முறையில் சகல வசதிகளும் கிடைக்கக் கூடியதாக, தேசிய மயமாக கல்வித் திட்டத்தை ஆக்க வேண்டியேற்பட்டிருக்கிறது. ஆகவே நான் சுட்டிக் காட்ட விரும்புகிறேன், நகரங்களிலும், ஒரு சில தொகுதிகளிலும் தனியார்களுடைய பாடசாலைகள், அரசாங்கத்தினுடைய பாடசாலைகள் என பல்வேறு வசதிகளையுடைய பாடசாலைகள் எத்தனையோ உண்டு என்று. ஆனால் கிராமப் புறங்களிலே—ஏழைப் பாட்டாளி வாழும் தொகுதிகளிலே—நாட்டின் பொருளாதாரத்தின் முதுகெலும்பான தொழிலாளர்கள் வாழும் தொகுதிகளிலே—கல்வி வசதி மிகவும் பின்தங்கிய நிலையிலேயே இருக்கின்றது.

PUBLIC LIBRARY
JAFFNA.

ஆகவே, கல்வியின் முன்னேற்றத்துக்குப் பணமொதுக்கும் பொழுது அவ்வத் தொகுதிகளின் கல்வி நிலையைச் சரியான முறையிலே பரிசிலனை செய்து தான் ஒதுக்க வேண்டும். இதனால் சில சமயம், ஒருசில பாராளுமன்ற அங்கத்தவர்கள் தங்களுடைய தொகுதிக்குத் தந்த பணம் போதாதென்று கூச்சலிடலாம். ஒருசில பாராளுமன்ற அங்கத்தவர்கள் கூடுதல் என்று கூறிப் பெருமிதம் கொள்ளலாம். ஆனால் சரியான முறையில் கல்வி வசதியைக் கொண்டு வர வேண்டுமானால் உண்மையாக கல்வித் தரத்தை—கல்வி நிலையை—தொகுதியின் நிலையை—சரியான பரிசிலனை செய்து, சாதி, சமய, அரசியல் அல்லது வேறெவ்விதமான பாகுபாடுமின்றி கௌரவ அமைச்சரவர்கள் நிதி ஒதுக்க வேண்டும்.

அடுத்தது, குறிப்பாக இச்சந்தர்ப்பத்திலே என்னுடைய தொகுதியை ஓர் உதாரணமாக எடுத்துக் கொள்ள விரும்புகின்றேன். ஏறக்குறைய 68,000 மக்கள் வாழுகின்ற தொகுதி, நிலப்பரப்பிலே 1,500 சதுர மைல் விஸ்தீரணமுள்ள தொகுதி, வடக்குக் கிழக்கையெடுத்துப் பார்த்தால் ஏறக்குறைய 100, 120 மைல் நீளமுள்ள தொகுதி, இங்கே இதுவரை—இந்நாட்டுக்குச் சுதந்திரம் கிடைத்து, இந்நாட்டு மக்களனைவரும் கல்வி கற்கும் சம சந்தர்ப்பத்தைப் பெற வேண்டுமென்ற உண்மையைத் தெள்ளத் தெளிவாக, உள்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වී. සිවසිතම්පරම් මයා.]

எங்கை நெல்லிக்கனிபோல் தெரிந்த பின்னரும்—ஒரேயொரு மத்திய மகா வித்தியாலயந்தானும் இல்லை. எனது தொகுதியிலுள்ள குழந்தைகள் ஏறக்குறைய 120 மைல் தூரத்துக்குச் சென்று, பெருந்தொகையான பணம் செலவழித்து யாழ்ப்பாணத்திலேதான் இது கால வரை படித்து வருகிறார்கள். ஏன்? மதவாச்சி, அநுராதபுரப் பகுதிகளைச் சேர்ந்தவர்கள் கூட—இந்தக் கௌரவ சபையிலேயுள்ள அங்கத்தவர்கள் சிலர் கூட யாழ்ப்பாணத்துக்குத்தான் சென்று கல்வி கற்றார்கள். இந்த நிலைமைதான் இன்றுமிருந்து கொண்டிருக்கின்றது. இந்த நிலையினால் ஒரு பெரிய சிக்கலை இந்த அரசாங்கம் உருவாக்குகின்றதென்பதை மறுக்கவோ மறைக்கவோ முடியாது. பணமுள்ளவர்கள், வசதியுள்ளவர்கள் எவ்வளவு தூரத்துக்கு வேண்டுமானாலும் எவ்வளவு பணம் செலவழித்தென்றாலும் தங்களுடைய குழந்தைகளைக் கற்பிக்க வசதி செய்கிறார்கள். ஆனால், கௌரவ கல்வி அமைச்சரும் கல்வி இலாகாவும் இப்பொழுது கொண்டு வந்திருக்கும், பள்ளிக்கூடங்களில் பிள்ளைகளைச் சேர்க்கும் புதிய திட்டத்திலே ஒரு பாடசாலைக்கு, அப்பாடசாலைக்கு ஒரு மைலுக்குட்பட்ட பிள்ளைகளையும், இன்னுமிடமிருந்தால் அடுத்த இரண்டாவது மைலுக்குட்பட்ட பிள்ளைகளையும், இதே மாதிரி மூன்றாவது மைலுக்குட்பட்ட பிள்ளைகளையும் சேர்ப்பதென்ற முறை அடங்கியிருக்கின்றது. இத்திட்டத்தின் கீழ் பாடசாலைகளில் பிள்ளைகளைச் சேர்ப்பது மிகவும் கஷ்டமாக இருக்கின்றது. இந்த நிலைமையைச் சீர்படுத்த வேண்டும்; எனது தொகுதியிலே விஞ்ஞான கூடம், விடுதி வசதிகளடங்கிய ஒரு மகாவித்தியாலயத்தை நிறுவும் விடயத்தில் கௌரவ அமைச்சர் கவனமெடுக்க வேண்டுமென விசேடமாக நான் இச்சந்தர்ப்பத்தில் கேட்டுக் கொள்ளுகிறேன்.

எனது தொகுதியிலே எத்தனையோ பாடசாலைகளுக்குத் தலைமையாசிரியர் இல்லை பதிலாக, சிரேஷ்ட பாடசாலைத் தராதரமுடைய ஆசிரியர் ஒருவர் இருவருடன் தான் பாடசாலைகள் இயங்கிக்கொண்டிருக்கின்றன. எனது நண்பர் கௌரவ கிளிநொச்சிப் பிரதிநிதி (திரு. ஏ. சிவசுந்தரம்) குறிப்பிட்டதுபோன்று எங்களுடைய பகுதிகளுக்கு ஆசிரியர் வந்து கடமையாற்ற விரும்புகின்றார்களில்லை. ஏனென்றால் ஆசிரியர் அனைவரும் பிரதான வீதிகளிலுள்ள, பிரதான நகரங்களிலுள்ள பாடசாலைகளில்தான் கடமையாற்ற விரும்புகின்றார்கள். இக்குறைபாட்டினால், எங்களுடைய பகுதிகளில் சீரான போக்குவரத்து வசதி இல்லாததனால் ஆசிரியர் அத்தகைய பகுதிகளுக்கு வர மறுக்கிறார்கள். இதனால் என்னுடைய தொகுதியிலே எத்தனையோ பாடசாலைகளில் ஆசிரியர் பற்றாக் குறை இருந்து கொண்டிருக்கின்றது. ஒவ்வொரு பாடசாலையிலும் ஆங்கில ஆசிரியர், உதவியாசிரியர், அல்லது முஸ்லிம் பாடசாலைகளில் மௌலவியாசிரியர் இல்லாமல்தான் காணப்படுகின்றது. இக்குறைபாட்டை உடனடியாகச் சரியான முறையிலே தீர்ப்பதற்கு அரசாங்கம் நடவடிக்கையெடுக்க வேண்டும். தலைமை யாசிரியர் இல்லாமல் என்னுடைய தொகுதியிலிருக்கின்ற பாடசாலைகளுக்குத் தலைமை யாசிரியர்களை நியமிப்பதற்குப் போதிய தலைமையாசிரியர் இல்லாமலிருந்தால் அப்பாடசாலைகளில் சிரேஷ்ட உதவியாசிரியராகக் கடமையாற்றுபவர்களைப் பதில் தலைமையாசிரியர்களாக நியமிக்குமாறு வேண்டிக் கொள்ளுகின்றேன்.

சமீபத்திலே சங்கீத ஆசிரியர்களுக்கான ஒரு பரீட்சை நடைபெற்றது. இந்தப் பரீட்சை முடிவைக் கடந்த பல மாதங்களாக அவர்கள் எதிர்பார்த்துக் கொண்டிருக்கிறார்கள். ஆனால் இது வரையில் எந்த விதமான பதிலும் கிடைக்கவில்லை. இதைக் கௌரவ அமைச்சர் அவர்கள் தமது கவனத்திற்கெடுத்துக் கொள்ள வேண்டும். அடுத்ததாக ஆசிரியர்களின் இடமாற்றங்கள் சம்பந்தமாகச் சில கருத்துக்களைத் தெரிவிக்க விரும்புகிறேன். இவ்விஷயத்தில் சிறு சிறு பிசகுகள் நடைபெற்று வருகின்றன. கலியாணமாகாத ஆசிரியைகளைத் தூர இடங்களுக்கு மாற்றுவது சரியல்ல. இதைக் கௌரவ கல்வி அமைச்சர் அவர்களே ஒப்புக் கொண்டுள்ளார்கள். ஆனால் கலியாணமாகாத ஆசிரியைகள் 25 அல்லது 26 வயதுக்கு மேற்பட்டவர்களாக இருந்தால் அவர்களைத் தூர இடங்களுக்கு மாற்றுகிறார்கள். ஆனால் உண்மையில் இந்தப் பெண்கள் கலியாணஞ் செய்து கொள்வதற்கு விருப்பம் உடையவர்களாகத்தான் இருக்கிறார்கள். துரதிருஷ்டவசமாக அவர்களுக்கு வசதியில்லாமல் இருக்கிறது. இதன் காரணமாக ஆசிரியைகளின் இடமாற்ற விஷயத்தில் பாகுபாடு காட்டக் கூடாது. விவாகமாகாத ஆசிரியைகளில் ஒரு பகுதியினருக்கு ஒரு

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

சட்டம் இன்னொரு பகுதியினருக்கு வேறொரு சட்டம் என்ற பாகுபாடு கூடாது. இதையும் கௌரவ அமைச்சர் அவர்கள் பரிசிலனை செய்ய வேண்டும்.

இறுதியாக ஒன்று கூற விரும்புகிறேன். 10,000 மாணவ ஆசிரியர்களைத் திரட்டக் கௌரவ அமைச்சர் அங்கீகாரமளித்துள்ளார். இதில் ஒரு பகுதியினரைத் தொகுதிவாரியாகத் தமிழ்ப் பிரதேசங்களிலிருந்து தெரிவு செய்யவும் அங்கீகாரம் கொடுக்கப்பட்டிருக்கிறது. என்தொகுதி போன்ற பின்தங்கிய—ஆசிரியர்களுக்குப் பற்றுக்குறையுள்ள பகுதிகளுக்கு இவ்விஷயத்தில் விசேஷ சலுகையளிக்க வேண்டுமென்று கேட்டுக் கொள்ளுகிறேன். தமிழ்ப் பகுதி நியமனங்களில் ஆங்கிலம் தெரிந்தவர்களுக்கு மாத்திரம் சலுகை கொடுத்தலாகாது. [குறுக்கீடு] தமிழில் சிரேஷ்ட பாடசாலைத் தராதரப் பத்திரப் பரீட்சையில் சித்தியெய்தியவர்களுக்கும் இவ்வித சந்தர்ப்பத்தில் பூரண சலுகையளிக்கப்பட வேண்டும். இந்த மாணவ ஆசிரியர்கள் பின் தங்கிய பகுதிகளில் அதிக சேவை செய்ய வசதியளிக்க வேண்டுமென்று கேட்டு எனது பேச்சை முடித்துக் கொள்கிறேன்.

අ. භා. 9

**ඩබ්ලිව්. ජී. එම්. ඇල්බට් සිල්වා මයා.**
(මොනරාගල)

(*திரு. டப்ளியு. ஜீ. எம். அல்பேட் சில்வா—மொனருகல*)

(Mr. W. G. M. Albert Silva—Monaragala)

ගරු සභාපතිතුමනි, මා වැඩි වෙලාවක් ගන්නෙ නැහැ. මට වුවමනා මිනිත්තු තුනයි.

**සභාපතිතුමා**
(*அக்கிராசனர்*)
(The Chairman)

දැන් පමා වුණා වැඩියි.

**රෝයි රාජපක්ෂ මයා.**
(*திரு. ரோய் ராஜபக்ஸ*)
(Mr. Roy Rajapakse)

මේ කාරක සභා සාකච්ඡා අවස්ථාවෙදි එක වචනයක්වත් කථා කිරීමට අපට ඉඩ ලැබුණෙ නැහැ. සියලුම කථා විරුද්ධ පක්ෂයටම දෙනව. ඒ ගැන මගේ විරුද්ධත්වය පළ කරනව.

**ඇල්බට් සිල්වා මයා.**
(*திரு. அல்பேட் சில்வா*)
(Mr. Albert Silva)

කරුණු දෙක තුනක් කෙරෙහි අධ්‍යාපන ඇමතිතුමාගේ අවධානය යොමු කරනව. ගාල්ලෙ ගරු මන්ත්‍රීතුමා අධ්‍යාපන ඇමති වශයෙන් සිටි කාලයේදී ගම්බද පළාත්වලට විශාල සේවයක් සිදු වුණා. අපට ඒ බව අමතක කරන්න බැහැ. ඒ වාගේම අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙ නිලධාරී මහත්වරුන්ටත් මගේ ප්‍රසංශාව හිමි වෙනව. [බාධා කිරීම්.] කරුණු දෙකක් ගැන පමණයි මම කථා කරන්නෙ. විශෙෂයෙන් තමුන්නාන්සෙ දන්නව ඇති බිබිලෙ වැනි නොදියුණු ප්‍රදේශවල පාසල්වලට හැතැප්ම හත අට පයින් යන්න තිබෙන බව. ඒ පළාත්වලට මුල් ගුරුවරුන් පත් කිරීමේදී ජෝඩු ගුරුවරුන් පත් කරන ලෙස මම ඉල්ලා සිටිනව. ඒ මොකද? තනිකඩ ගුරුවරු පත් වී යන අවස්ථාවෙදි නොයෙකුත් අන්දමේ අකට යුතුකම් සිද්ධ වෙනව. මගේ අත්දැකීම් අනුව මට කියන්න පුළුවන් එවැනි අකටයුතුකම් සිදු වී තිබෙන බව. ඒ නිසා ගම්බද පළාත්වල පාසල්වලට මුල් ගුරුවරුන් පත් කිරීමෙදි ගුරු ජෝඩුම පත් කරන ලෙස මම නැවතත් ඉල්ලනව.

ගරු සභාපතිතුමනි, 1959 දී මොනරාගල පිරිවෙනක් ආරම්භ කළා, තණ්හන්කර පිරිවෙන කියා. නමුත් දැන් අවුරුදු හතරක් ගත වී ඇතත් ඒ පිරිවෙන තවම ලියා පදිංචි කිරීමට බැරි වුණා. එම නිසා ඒ පිරිවෙන ඉතාමත් ඉක්මනින් ලියා පදිංචි කර දෙන හැටියට මම ඇමතිතුමාගෙන් ඉල්ලනව. විශෙෂයෙන්ම මොනරාගල වැනි නොදියුණු ප්‍රදේශයක අපි පිරිවෙනක් ආරම්භ කෙළේ අපේ ප්‍රදේශයේ ජනතාවගේ දියුණුව සඳහායි. කුරුණෑගල, කෑගල්ල, මාතර වැනි ප්‍රදේශවල වාගෙ අපට දියුණු පිරිවෙන් නැහැ. අපේ පළාත්වල තිබෙන්නෙ ඉතාම දුප්පත් පිරිවෙන්; ඒ වාගේම ඉතාම දුප්පත් පන්සල්. එම නිසා 1959 ආරම්භ කර ඇති ඒ පිරිවෙන ඉක්මනින්ම ලියා පදිංචි කිරීමට සලස්වන හැටියට මම ඉල්ලනව. කුඩා සාමනේරයන් වහන්සේලාගේ ඉගෙනීමටත් උන් වහන්සේලාගේ අනාගත දියුණුවටත් එයින් විශාල

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඇල්බට් සිල්වා මයා.]
සේවයක් සැලසෙනව ඇති. [බාධාකිරීම්.] එම නිසා එය ලියා පදිංචි කර දෙන හැටියට ඉල්ලමින් මගේ කථාව නවත්වනව.

**යූ. බී. වන්නිනායක මයා.** (යාපහුව)
(திரு. யூ. பி. வன்னிநாயக்க—யாப்பஹுவ)
(Mr. U. B. Wanninayake—Yapahuwa)

සභාපතිතුමනි, ලැබෙන කාලය විනාඩි 10 නිසා දීර්ඝ කථාවක් කිරීමට මෙය අවස්ථාව නොවෙයි. මේ රටේ අවශ්‍යතාවයන් අනුව අධ්‍යාපනය හැඩගැස්විය යුත්තේ කෙසේදැයි සොයා බැලීමට පත් කරන ලද කොමිෂන් සභා දෙකෙහි—කාර්මික අධ්‍යාපනය පිළිබඳ කොමිෂන් සභාවේත්, සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ කොමිෂන් සභාවේත්,—වාර්තාවන් ගෙන් කරන ලද යෝජනා පිළිබඳව නිගමනයන්ට බැස ධවල පත්‍රිකාවක් මේ සභාවට ඉතා ඉක්මනින් ඉදිරිපත් කරනවායයි ගරු ඇමතිතුමා ප්‍රතිඥාවක් දී තිබෙනව. ඒ ධවල පත්‍රිකාව ඉදිරිපත් කොට, සමහර විට ඒ සමගම ආඥාපණතකුත් සකස් කොට ඉදිරිපත් කරන්නට පුළුවනි. ඒ අවස්ථාවේදී අධ්‍යාපනය පිළිබඳව දීර්ඝ වශයෙන් කථා කිරීමට බලාපොරොත්තු වෙමින් දැන් මගේ ආසනයේ ඇති අඩු පාඩුකම් කිහිපයක් ගැන සඳහන් කිරීමට අදහස් කරනව.

තවත් බොහෝ ආසනවල මෙන්ම මගේ ආසනයේද පාසල් මුහුණ පා ඇති ඉතාමත් බැරෑරුම් ප්‍රශ්නය නම් ගුරු හිඟයයි. ඒ පළාතේ පාසල්වල විශාල ගුරු හිඟයක් තිබෙනව. ගුරුවරුන් 10 ක් සිටිය යුතු පාසල්වල සමහර විට සිටින්නේ 4 දෙනෙක් නැති නම් 5 දෙනෙක් පමණයි.

**ගරු පී. බී. ජී. කලුගල්ල** (අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති)
(கௌரவ பீ. பி. ஜீ. கலுகல்ல—கல்வி கலாச்சார விவகார அமைச்சர்)
(The Hon. P. B. G. Kalugalla—Minister of Education and Cultural Affairs)

ඔක්කොම දෙනව, ජනවාරි මාසයේ.

**වන්නිනායක මයා.**
(திரு. வன்னிநாயக்க)
(Mr. Wanninayake)

එයිනුත් එක් කෙනෙක් දෙන්නෙක් නිවාඩු පිට මාතෘ නිවාසවලට ගිහින්. ඊට විරුද්ධවීමට කාටවත් පුළුවන්කමක් ඇත්තේ නැහැ. ඒ නිසා කොයි විධියක අධ්‍යාපනයක් ඇති කළත්—ජාතික අධ්‍යාපනයක් ඇති කළත්, ජාතික නොවන අධ්‍යාපනයක් ඇති කළත්—ගුරුවරුන් නොමැතිව නම් එය ක්‍රියාත්මක කරන්නට ලැබෙන්නෙ නැහැ. කලින් සිටි අධ්‍යාපන ඇමතිතුමා ප්‍රකාශයක් කර තිබුණා, ලංකාවේ සිටින ශිෂ්‍ය සංඛ්‍යාවට අනුව ගුරුවරුන් පත් කරනවා නම් තව ගුරුවරුන් 18,000 ක් වුවමනාය කියා. මේ ඇමතිතුමා තාවකාලික ගුරුවරුන් 10,000 ක් පත් කරන්නට යන බව අපට දැනගන්න තිබෙනව. අපේ පළාත්වල කෙතරම් ගුරු හිඟයක් පවතිදැයි සමහර විට දියුණු පළාත්වල මන්ත්‍රීවරුන්ට අවබෝධ නොවනවා ඇති. අපට අහන්න ලැබී තිබෙනව, සමහර පළාත්වල අවශ්‍ය සංඛ්‍යාවට වඩා ගුරුවරුන් සිටිනවාය කියා. එසේ නම් එය දරුණු අපරාධයක්. නොදියුණු පළාත්වල ඉතා බැරෑරුම් ගුරු හිඟයක් තිබියදී සමහර පළාත්වල වැඩිපුර ගුරුවරු සිටිනවා නම් ඇත්තෙන්ම එය බලවත් අපරාධයක්.

මේ අළුත් ඇමතිතුමා ප්‍රකාශයක් කර තිබුණා, මේ අළුත් තාවකාලික ගුරුවරුන් බඳවා ගැනීමේදී පක්ෂ ක්‍රමයක් අනුගමනය කරනවාය කියා.

**ගරු කලුගල්ල**
(கௌரவ கலுகல்ல)
(The Hon. Kalugalla)

එහෙම කිව්වෙ නැහැ.

**වන්නිනායක මයා.**
(திரு. வன்னிநாயக்க)
(Mr. Wanninayake)

සමහර විට එය වැරදි ප්‍රකාශයක් වෙන්න ඇති. නමුත් මම පුදුම වුණා, ඇමතිවරයෙක් මෙවැනි ප්‍රකාශයක් කර තිබෙන වාද කියා. පත්‍රයේ තිබෙන ප්‍රකාශය බොරු ප්‍රකාශයක් බව ඇසීමට—එවැනි දෙයක් සිදුවන්නෙ නැති බව දැන ගැනීමට—මම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සන්තෝෂයි. අද රටේ සිටින ජ්‍යෝෂ්ඨ සම තුන් අතරෙන් ඉතාමත් දක්ෂ 10,000 තෝරා ගැනීමට පිරිසිදු වැඩ පිළිවෙළක් ක්‍රියාවෙ යොදවනව ඇතැයි අපි සියළු දෙනාම බලාපොරොත්තු වෙනව.

ඒ පළාත්වල පාඨශාලාවලට මුහුණ පෑමට සිදු වී තිබෙන තවත් වැදගත් ප්‍රශ්නයක් තියෙනව. එනම් ඉංග්‍රීසි උප ගුරුවරුන්ගේ හෝ ගුරුවරියන්ගේ ප්‍රශ්නයයි. සමහර පාසල්වල ඉංග්‍රීසි උප ගුරුවර ගුරුවරියන් රාජකාරිය කරමින් සිටිය. නමුත් යම් කිසි විධියකින් මේ ගුරු වරුන් මාරු කරල තියෙනව. සමහර පාසල්වලට ඒ වෙනුවට වෙනත් ඉංග්‍රීසි උප ගුරුවරයන් හෝ ගුරුවරියන් හෝ යවා නැහැ. සමහර පාසල්වල ශිෂ්‍ය ශිෂ්‍යාවන් මුදල් වියදම් කර පොත්පත් අරගෙන ඉංග්‍රීසි ඉගෙන ගැනීමට පටන් අරගෙන, ඉංග්‍රීසි උගැන්වීමට නැවත ගුරුවරුන් එන තුරු දැන් බලාගෙන ඉන්නව. ඒ ශිෂ්‍ය ශිෂ්‍යාවන් තුළ බලාපොරොත්තු ඇති කර ඒ බලාපොරොත්තු කඩ වීමට කරුණු යෙදීම ඉතාමත්ම කනගාටුදායක දෙයක්ය කියා මම හිතනව. ඉංග්‍රීසි භාෂාව අනිවාර්ය වශයෙන් ඉගැන්වීමට බලාපොරොත්තු වෙනව නම් එය ඉගැන් වීමට දක්ෂකම් ඇති ගුරුවරුන් පත් කිරීම ආණ්ඩුවෙ යුතුකමක්. ඉංග්‍රීසි ඉගැන් වීම බොහොමත්ම හොඳයි. ඉංග්‍රීසි භාෂාව දෙවැනි භාෂාවක් වශයෙන් ඉගැන්වීමට විශේෂ පුහුණුවක් ලැබිය යුතු බව විශෙෂඥයන්ගේ අදහසයි. පළමු වැනි භාෂාවක් හැටියට උගන්වන ක්‍රමය අනුවම දෙවැනි භාෂාවක් වශයෙන් උගන් වන්න බැරිය යන අදහසක් විද්‍යාඥයන් තුළ තිබෙනව. පාඨශාලාවල අනිවාර්ය විෂයයක් වශයෙන් ඉංග්‍රීසි ඉගැන්වීමට බලාපොරොත්තු වෙනව නම් ඉංග්‍රීසි භාෂාව දෙවැනි භාෂාවක් වශයෙන් ඉගැන්වීම පිළිබඳව හොඳ පුහුණුවක් දී ඉංග්‍රීසි ගුරුවරුන් යැවිය යුතු බව මම ප්‍රකාශ කරන්න කැමතියි.

තව එක කරුණක් කියන්න තියෙනව. ගැහැණු ළමයින් සහ පිරිමි ළමයින් ඉගෙන ගන්න මිශ්‍ර පාඨශාලා තියෙනව. ඒ සමහර පාසල්වල එකම ගැහැණු ගුරු වරියක්වත් නැහැ. ඒක ඒ තරම් සතුටු දායක තත්ත්වයක් හැටියට අපි කව්රුත් සලකන්නෙ නැහැ. බොහෝ දෙමව්පියෝ මේ සම්බන්ධව දෙපාර්තමේන්තුවේ කන් තෝරුවලට ඇවිත් කරුණු කියනව, ලියුම් ලියනව. මේ නිසා බොහෝ මිශ්‍ර පාඨශාලා වල ඉතාමත් අසතුටුදායක තත්ත්වයක් ඇති වී තිබෙන්නෙ. ගුරු හිඟය නිසයි, ඒ තත්ත්වය ඇති වී තිබෙන්නෙ. මේ ගැන ඒ ඒ පළාත්වල නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂතුමන්ලටත් දොස් කියන්න බැහැ. මාරු කිරීමට සෑහෙන තරම් ගුරුවරු නැහැ. ඒ සමගම මුල් ගුරු තනතුරුවල අවුරුදු 4, 5, 6, 7 වැඩ බැලූ අය ඉන්නව. හැම පාඨශාලාවකටම ස්ථිර මුල් ගුරුවර යකු සිටිය යුතු බව අපි කව්රුත් පිළි ගන්නව. ස්ථිර මුල් ගුරුවරයකු පත් කරන තුරු පාඨශාලාවක වැඩ කටයුතු හරි විධියට කෙරේය කියා හිතන්න අමාරුයි. අවුරුදු 2, 3, 4, 5 ආදි වශයෙන් වැඩ බැලූ මුල් ගුරු මහතුන් හෝ නෝනා මහතුන්, අධ්‍යාපනය පිළිබඳ සුදුසුකම් තියෙනව නම්, ඒ අය ඔවුන්ගෙ රාජකාරිය හොඳට කරල තියෙනව නම්, ඒ අය ස්ථිර කිරීම දෙපාර්තමේන්තුවෙ යුතුකමක්ව තියෙ නව. ඒ ගැනත් ඇමතිතුමාගෙ සැලකිල්ල යොමු කරන ලෙස මම ඉල්ලා සිටිනව.

පාඨශාලා ගොඩනැගිලි ගැනත් කිව යුතුව තිබෙනව. අපේ පළාතෙ සමහර පාඨශාලාවල ගොඩනැගිලි අද කඩා වැටේද, හෙට කඩා වැටේද කියා දන්නෙ නැති තත්ත්වයක තිබෙනව. බොහෝ පාසල්වල දැනට තියෙන ඉඩ කඩ ශිෂ්‍ය සංඛ්‍යාව අනුව කිසිසේත් ප්‍රමාණවත් නැහැ. ඒ දවස්වල ගුරු දෙගුරු සමිති එකතු වෙලා තාවකාලික ගොඩනැගිලි හදා ගත්ත නිසා ඉඩ ප්‍රශ්නය විසඳා ගැනීමට පුළුවන් වුණා. දැන්, කඩා වැටෙන නිසාය කියා, තාවකාලික ගොඩනැගිලි තැනීම තහනම් කරල තිබෙනව දෙපාර්තමේන්තු වෙන්. කොළඹ පළාත්වල නම් එහෙම කැඩෙන්න පුළුවන්. නමුත් වන්නිය පළාත්වල නම් එහෙම කැඩෙන්නෙ නැහැ. ඒවා කඩා නොවැටෙන්නෙ මොකද කිය තොත් ඒ පළාත්වල කැලෑවේ හොඳ ලී වර්ග තිබෙනව. ඒවා කපාගෙන විත් තැනූ විට අවුරුදු 10ක් 12ක් පවතිනව. ඒ නිසා එක්කෝ ඒ තහනම නැති කරන්නට ඕනෑ; නැත්නම් ගොඩනැගිලි සෑහෙන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වන්නිනායක මයා.]

ප්‍රමාණයක් දෙන්ට ඕනෑ. එසේ කරන්ට බැරි නම් තාවකාලික ගොඩනැගිලිවත් සාදා ගැනීමට අවසර දෙන්නට ඕනෑ.

ලී බඩු, උපකරණ පිළිබඳවත් එවැනි තත්ත්වයක් තිබෙනව. මේ අඩු පාඩු සම්පූර්ණ කිරීමට ඇමතිතුමා ක්‍රියා කරනවා ඇතැයි බලාපොරොත්තු වෙමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනව.

අ. භා. 9.15

**රාසමාණික්කම් මයා.**
*(திரு. இராசமாணிக்கம்)*
(Mr. Rasamanickam)

கௌரவ தலைவர் அவர்களே! நான் அதிக நேரத்தை இந்த விவாதத்திலே எடுக்க விரும்பவில்லை. கௌரவ அமைச்சர் அவர்கள் கல்வி இலாகாவைப் பொறுப்பெடுத்த சிறிது காலத்திற்குள் அதிக முன்னேற்றத்தை ஏற்படுத்தியிருப்பார் என்று நாம் எதிர்பார்க்க முடியாது. சிங்கள பாஷையில் தேர்ச்சியெய்திய சுமார் பத்தாயிரம் ஆசிரியர்களைத் திரட்டப் போவதாக அரசாங்கம் விடுத்த அறிவித்தலை அண்மையில் கண்ணுற்ற போது அது சம்பந்தமாக நாம் கல்வியமைச்சர் அவர்களைச் சந்தித்து எமது ஆலோசனைகளையும் கூறினோம். அதன் பின் கௌரவ அமைச்சர் அவர்கள் ஆங்கிலத்தில் சித்தியெய்திய தமிழ் மாணவர்களையும் ஆசிரியர்களாகத் திரட்டுவதாக இணக்கந் தெரிவித்தமைக்கு நான் அவருக்கு முதலில் நன்றி கூறுகிறேன்.

இரண்டாவதாக, பல ஆண்டுகளாகப் பயிற்சி பெற்று நியமனங்கள் இல்லாமல் மிகவும் கஷ்டப்பட்டுக் கொண்டிருந்த சுமார் 168 தமிழாசிரியர்களுக்கு உடனடியாக நியமனம் கொடுக்க அவர் எற்ற நடவடிக்கைகள் எடுத்துள்ளமைக்காகவும் நான் அவருக்கு மீண்டும் எனது நன்றியைத் தெரிவித்துக் கொள்ளுகிறேன்.

இன்று ஆசிரிய பயிற்சிக் கல்லூரிகளுக்கு பயிற்சியாளர்களைத் தெரிவு செய்யும்போது ஆசிரியர்களாகக் கடமையாற்றுபவர்களுக்கு மட்டுமே சலுகை கொடுக்கப்படுகின்றது. இது விஷயமாக எனது ஆலோசனையொன்றையும் சமர்ப்பிக்க விரும்புகிறேன். சாதாரணமாக இப்பொழுதெல்லாம் சிரேஷ்ட பாடசாலைத் தராதரப் பரீட்சையில் சித்தியெய்தியவர்கள் ஆசிரிய பயிற்சிக் கலாசாலைப் பிரவேசப் பரீட்சைக்குத் தோற்ற முடியாது. சிரேஷ்ட பாடசாலைத் தராதரப் பத்திரத்துடன் ஆசிரியர்களாகக் கடமையாற்றுபவர்கள் மாத்திரமே தற்பொழுது ஆசிரிய பயிற்சிக் கல்லூரிகளுக்குத் தெரிந்தெடுக்கப்படுகிறார்கள். ஆசிரிய பயிற்சிக் கல்லூரிகளுக்கு பயிற்சியாளர்களைத் திரட்டும் விஷயத்தில் ஆசிரியர்களுக்கு ஐம்பது சதவிகித இடமும் சாதாரணமாக சிரேஷ்ட பாடசாலைத் தராதரப் பத்திரப் பரீட்சையில் சித்தியெய்தி வேலையில்லாமல் இருப்பவர்களுக்கு ஐம்பது சதவிகித இடத்தையும் ஒதுக்க வேண்டுமென்று கேட்டுக் கொள்ள விரும்புகிறேன்.

விஞ்ஞானத்திலும் ஏனைய கலைப் பாடங்களிலும் சித்தியெய்திய ஏராளமான பட்டதாரிகள் இன்று வடக்குக் கிழக்கு மாகாணங்களில் இருக்கிறார்கள். இவர்கள் பல ஆண்டுகளாக வேலை வசதிகளின்றி இருக்கிறார்கள். இவர்களுக்கு மகா வித்தியாலயங்களிலும் ஏனைய பாடசாலைகளிலும் நியமனங்கள் கொடுக்க அரசாங்கம் நடவடிக்கை எடுக்க வேண்டும். இவர்களது ஆற்றல்களை அரசாங்கம் பயன்படுத்த வேண்டும்.

மேலும் ஒரு விஷயம் பற்றி இங்கு குறிப்பிட விரும்புகிறேன். பாடசாலைகளை அரசாங்கம் பொறுப்பெடுத்தபொழுது பாடசாலைகள் அரசாங்க பாடசாலைகள் என்றும் வித்தியாதிபதியின் முகாமையின் கீழுள்ள பாடசாலைகள் என்றும் இரண்டு பிரிவுகளாக இருந்தன. Government Schools and Director-managed Schools. வித்தியாதிபதியின் முகாமையின் கீழிருந்த பாடசாலைகளை அரசாங்கம் இன்று கையேற்றிருக்கிறது. Director-managed Schools have been taken over. இன்று இந்தப் பாடசாலைகளுக்கிடையில் அரசாங்கமும் கல்வி இலாகாவும் ஒரு பிரிவினையை ஏற்படுத்தி இருக்கின்றன. ஒரு artificial division ஏற்படுத்தப்பட்டுள்ளது. இந்தப் பிரிவினையை எவ்வளவு விரைவாக மாற்ற முடியுமோ அவ்வளவு விரைவாக மாற்ற நடவடிக்கைகள் எடுக்கப்பட வேண்டும். அரசாங்கம் எடுத்த உதவி நன்கொடை பெறும் பாடசாலைகளும் அரசாங்க பாடசாலைகளும் நிருவாகம் சம்பந்தப்பட்டவரையிலே ஒரே தரத்தில் வைத்துக் கவனிக்கப்படவேண்டியனவாக இருக்கின்றன. இப்பிரிவினையை இன்னும் தொடர்ந்து வைத்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

திருப்பதற்கு எந்த விதமான காரணமுமில்லை. அரசாங்கம் எடுத்த உதவி நன்கொடை பெறும் பாடசாலைகளில் கடமை புரியும் ஆசிரியர்களை அரசாங்க பாடசாலைகளுக்கு மாற்றுமலும் அரசாங்க பாடசாலைகளில் கடமை புரியும் ஆசிரியர்களை, அரசாங்கம் தனது நேரடி ஆதிக்கத்தின் கீழ்க் கொண்டு வந்துள்ள முன்னைய உதவி நன்கொடை பெறும் பாடசாலைகளுக்கு மாற்றுமலும் அரசாங்கம் இப் பாடசாலைகளுக்கிடையே ஒரு பிரிவினையை ஏற்படுத்திக்கொண்டிருக்கின்றது. இதற்கு ஒரேயொரு காரணந்தான் உண்டு. அரசாங்கமெடுத்த உதவி நன்கொடை பெறும் பாடசாலைகளில் ஆசிரியர்களாகக் கடமையாற்றியவர்களுக்கு உரிய காலத்தில் உயர்ச்சிகள் கொடுக்காத காரணத்தினுல் இன்று அவர்கள் அரசாங்க பாடசாலைகளுக்கு மாற்றப்படுவதை எதிர்த்து நிற்கின்றுர்கள். ஆகையால், அவர்களில் தலைமையாசிரியர்களாக வரத் தகுதியுடையவர்களுக்குத் தலைமையாசிரியர் பதவிகளையும் சிரேஷ்ட உதவியாசிரியர்களாக நியமனம் பெறத் தகுதியுடையவர்களுக்கு அப்பதவிகளையும் உடனடியாகக் கொடுத்து இவ்விருவித பாடசாலைகளுக்குமிடையே உள்ள வித்தியாசத்தை அடியோடு அகற்றி விட்டு, எல்லாப் பாடசாலைகளும் அரசாங்க பாடசாலைகள் என்ற கொள்கையை நடைமுறையிற் கொண்டுவர வேண்டும்.

இன்று நாட்டில் எத்தனையோ மகாவித்தியாலயங்கள் இருக்கின்றன. அவைகளையிட்டு அனேக அங்கத்தவர்கள் பேசினுர்கள். கௌரவ ஊவ பரனகம அங்கத்தவர் (திருமதி குஸுமா ராஜரத்ன) அவர்கள் பேசும் பொழுது, பெயர்ப்பலகையில் மாத்திரம் தான் அவைகள் மகாவித்தியாலயங்களாக இருக்கின்றன என்று குறிப்பிட்டார். பல மகா வித்தியாலயங்கள் உபகரணங்கள், ஆசிரியர்கள், போதிய இடவசதிகள் இல்லாமல் திண்டாடுகின்றன. எனவே, அடுத்த நிதி வருடத்திலாவது ஒவ்வொரு தொகுதியிலுமுள்ள மகா விதித்யாலயங்கள் ஒன்றுக்கோ, அல்லது இரண்டிற்கோ விஞ்ஞான கூடங்களைக் கொடுத்து, அப்பகுதியிலுள்ளோர் உயர்தரக் கல்வியை எதுவித கஷ்டமுமின்றிப் பெறுவதற்கு அவைகளை நல்ல நிலைக்குக் கொண்டு வருவதோடு, அப்பாடசாலைகளுக்கு இடவசதியை அமைத்துக் கொடுத்து, தகுந்த ஆசிரியர்களையும் நியமிக்க வேண்டுமென்று கேட்டுக் கொள்கின்றேன். ஒவ்வொரு பாராளுமன்ற உறுப்பினர் தொகுதியிலும் பாடசாலைகள் ஒன்றையோ, அல்லது இரண்டையோ இவ்விதம் நன்னிலைக்குக் கொண்டு வந்தால் அங்குள்ள மாணவர்கள் அப்பாடசாலைகளுக்குச் சென்று சிறந்த கல்வியைப் பெறக் கூடியதாக இருக்கும். சாதாரண கிராமிய மக்கள் நகரங்களுக்குப் போய், விடுதிக்குப் பணம் கட்டி கல்வி பெறக்கூடிய நிலையிலில்லை. எனவே, ஒவ்வொரு தொகுதியிலும் நான் முன் கூறியது போன்று ஓரிரு பாடசாலைகளைச் சிறந்த விஞ்ஞான ஆய்கூட வசதிகளுடன் அமைத்தால் கிராமிய மக்கள் அதனுற் பெரிதும் பயனடைவார்கள். ஆகையால், அவ்வித பாடசாலைகளை ஒவ்வொரு தொகுதிக்கும் ஆக்கிக் கொடுக்க வேண்டுமென்று நான் அரசாங்கத்தைக் கேட்டுக் கொள்கின்றேன்.

இன்னும் பேச அதிக விஷயங்கள் இருந்த போதிலும் நேரம் காணுததால் நான் பேச விரும்பவில்லை. கனம் அமைச்சர் அவர்களுக்குச் சுருக்கமாகவே விஷயங்களைக் கூறினேன். எனவே, அடுத்த ஆண்டில் பாடசாலைகளுக்குக் கட்டடங்களும் உபகரணங்களும், விசேஷமாக விளையாட்டு மைதானங்களும் கொடுக்கப்படும் பொழுது, அரசாங்கக் கட்சி அங்கத்தவர்களின் தொகுதியாயிருந்தாலென்ன, எதிர்க்கட்சி அங்கத்தினர்களின் தொகுதியாயிருந்தாலென்ன, எல்லாத் தொகுதிகளையும் சமமாகப் பாவித்து, நாட்டின் முன்னேற்றத்துக்கு அமைச்சர் அவர்கள் வழிவகுக்க வேண்டுமென்று கூறி எனது பேச்சை முடித்துக் கொள்ளுகின்றேன்.

**කේ. බී. රත්නායක මයා.** (අනුරාධපුර)
(திரு. கே. பி. ரத்ணுயக்க—அனுராதபுரம்)
(Mr. K. B. Ratnayake—Anuradhapura)

ගරු සභාපතිතුමනි, අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ වචනයක් දෙකක් කියන්ට ලැබීම ගැන මා සන්තෝෂ වෙනව. බණ්ඩාරනායක රජය බලයට පත් වූවාට පසුව මහජනයාගේ පොදු යහපත සඳහා කළ වැඩ සියල්ලම ගැන කල්පනා කරන විට, අධ්‍යාපනය අතින් විශේෂයෙන්ම නොදියුණු පළාත් වලට විශේෂ සේවයක් සිදු වී තිබෙනවාය කියා අපට සැකයක් නැතිව කියන්න පුළුවන්. 1956 අවුරුද්දට පෙර තිබුණු අධ්‍යාපන තත්ත්වය ගැනත් දැනට තිබෙන අධ්‍යාපන තත්ත්වය ගැනත් කල්පනා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කේ. බී. රත්නායක මයා.]

කරන විට විශේෂයෙන්ම නොදියුණු පළාත්වලින් එන මන්ත්‍රීවරුන් හැටියට දැන් තිබෙන සතුටුදායක තත්ත්වය ගැන අපට සන්තෝෂ වෙන්න පුළුවන්. 1956 ට කලින් අපේ ප්‍රදේශවලට අවශ්‍ය පාසැල් තිබුණේ නැහැ. ගුරුවරුන් සිටියෙත් නැහැ. නමුත් ඊට පසුව ඇති වූ වෙනස්කම නිසාම දැන් හැතැප්මෙන් හැතැප්මට නැතිනම් හැතැප්ම දෙකෙන් දෙකට වගේ පාසැල් තිබෙනව. එමෙන්ම ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට නිසියාකාර උසස් අධ්‍යාපනය ලබා ගැනීමට අවසථාව ලබා දී තිබෙනව. ඒ ගැන රජයට ස්තුතිවන්ත වෙනව.

එමෙන්ම විද්‍යා ගුරුවරුන් ගැන කථා කරන විට, අපට විද්‍යා ගුරුවරුන්ගේ අඩු පාඩුවක් තිබෙන බව පෙනී යනව. ඒ ගැන කල්පනා කරන විට, උතුරු මැද පළාත වැනි නොදියුණු පළාත්වල සිටින විද්‍යා ගුරුවරුන්ගේ සංඛ්‍යාව අඩු බව පෙනෙනව. ඒ නිසා විද්‍යා ගුරුවරුන් පත් කරන අවසථාවලදී නොදියුණු පළාත්වලට විද්‍යා ගුරුවරුන් වැඩි දෙනෙක් පත් කරන ලෙස ඉල්ලනව.

මේ දවස්වල මේ ගරු සභාවේ නොයෙකුත් මන්ත්‍රීවරුන් ගුරු මාරුකිරීම් ගැන සඳහන් කළා. ඇතැම් ගරු මන්ත්‍රීවරුන් නිකරුණේ දෙපාර්තමේන්තුවට චෝදනා නැඟුව. ආණ්ඩුවේ තිබෙන දෙපාර්තමේන්තු ගැන කල්පනා කරන විට, ඉතාම වැඩි සේවක පිරිසක් සිටින දෙපාර්තමේන්තුව අධ්‍යාපන දෙපාර්තමේන්තුව බව පෙනෙනව. ඒ නිසා සියළු දෙනාගේම සිත් සතුටු කළ හැකි වැඩ පිළිවෙලක් ගත නොහැකි බව කල්පනා කරන්ට ඕනෑ. මම එක කරුණක් දෙපාර්තමේන්තුවේ සැලකිල්ලට යොමු කරන්ට ඕනෑ. එය මතක් කරන්නේ චෝදනාවක් වශයෙන් නොවෙයි. දැනට අවුරුදු දෙකකට පමණ උඩදී වන තුරුම දෙපාර්තමේන්තුවේ කටයුතු සියල්ලක්ම පාහේ සිදුවුනේ කොළඹිනුයි. නමුත් දැන් අවුරුදු දෙකක පමණ කාලයක සිට නොයෙක් නොයෙක් ප්‍රදේශවලට වෙන් වෙන් වශයෙන් උප අධ්‍යක්ෂවරු පත්කර කටයුතු කරගෙන යනව. දැන් ගුරු මාරුවීම් ඒ උප අධ්‍යක්ෂවරුන්ට බාර දී තිබෙනව. උතුරු-මැද පළාතේ අධ්‍යාපන උප අධ්‍යක්ෂතුමිය යම් යම් ගුරු මාරුවීම් කළ විට, ගුරු පිරිස් කොළඹ අධ්‍යාපන කාර්යාලයට පැමිණ ඊට විරුද්ධව පැමිණිලි කළාම සමහර අවසථාවල ඒ මාරුවීම් වෙනස් කරන අවසථා ඇතිවී තිබෙනව. එසේ වෙනස් කිරීම ගැන මා දෙපාතීමේන්තුවට දොස් කියන්නෙ නැහැ. එහෙත් මා ඉල්ලා සිටින්නෙ, එවැනි වෙනසක් කරන විට ඒ ඒ ප්‍රදේශ භාරව සිටින අධ්‍යාපන උප අධ්‍යක්ෂවරන්ගෙන් විමසා බලන ලෙසයි. මා ඒ ඉල්ලීම කරන්නෙ, පළාත් භාරව සිටින අධ්‍යාපන උප අධ්‍යක්ෂවරුන් විසින් කරනු ලබන මාරුවීම් කොළඹ කාර්යාලය මගින් වෙනස් කරනව නම් විනයානුකූලව ඒ පළාත් භාර අධ්‍යාපන උප අධ්‍යක්ෂවරුන්ට රාජකාරි කිරීම අපහසු වන නිසයි. කාලය සීමා කර තිබෙන නිසා තවත් ඉතා වැදගත් කාරණයක් දෙකක් පමණයි ගරු ඇමතිතුමාගෙ අවධානයට යොමු කරන්ට අදහස් කරන්නෙ.

ගරු ඇමතිතුමා දන්නව, උතුරු-මැද පළාත විශාල ප්‍රදේශයක් බව. එහෙත් උතුරු-මැද පළාතෙ අධ්‍යාපන කාර්යාලය සඳහා සුදුසු ගොඩනැගිලි නැහැ. ඒ වගේම අධ්‍යාපන උප අධ්‍යක්ෂට පදිංචි වන්ට සුදුසු නිවාසයක් නැහැ. පොදුවේ බලන විට නම් අනුරාධපුරයේ නිවාස ප්‍රශ්නය උග්‍රයි. විශාල ප්‍රදේශයක් භාරව තිබෙන උතුරු-මැද පළාතේ අධ්‍යාපන උප අධ්‍යක්ෂ කාර්යාලය සඳහා ඉඩකඩ ඇති ගොඩනැගිල්ලකුත් අධ්‍යාපන උප අධ්‍යක්ෂ නිවාසය සඳහා සුදුසු ගොඩනැගිල්ලකුත් ලබන මුදල් වර්ෂයේදීවත් ආරම්භ කරනවා ඇතැයි මා බලා පොරොත්තු වෙනව. සාමාන්‍යයෙන් එය රජය භාරගත යුතු කටයුත්තක්. රජයේ වගකිය යුතු නිලධාරීන් යම් යම් පුද්ගලයන්ට අයිති නිවාසවල පදිංචි වීමේදී ඒ නිලධාරීන්ට තමන්ගෙ රාජකාරි නිසියාකාර කරන්ට නොහැකි බව ප්‍රකාශ කරන්ට කැමතියි. ඒ නිසා අනුරාධපුර අධ්‍යාපන කාර්යාලය සඳහා සුදුසු කොඩනැගිල්ලකුත් අධ්‍යාපන උප අධ්‍යක්ෂ වෙනුවෙන් සුදුසු නිවාසයකුත් තනා දෙන මෙන් මා ඉල්ලා සිටිනව.

අ. භා. 9.30

ඊළඟ කාරණය, තමුන්නාන්සෙ දන්නව ඇති, පාඨශාලා පරීක්ෂකවරුන්ට යම් යම් අඩුපාඩු රාශියක් තිබෙන බව. සවභාෂා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගුරුවරුන්ට දැනට අවුරුදු 4 කට 5 කට උඩදී පටන් පාඨශාලා පරීක්ෂක තනතුරු දීම සම්බන්ධයෙන් රජයට අපි ස්තුති වන්ත වෙනව. එහෙත් සවභාෂා පරීක්ෂක වරුන්ගෙත්, ඉංග්‍රීසි උගත් පාඨශාලා පරීක්ෂකවරුන්ගෙත් පඩි අතර විශාල පර තරයක් තිබෙනව. සවභාෂා පාඨශාලා පරීක්ෂකවරුන්ගෙ නියෝජිත පිරිසක් සමග හිටපු ඇමතිතුමා වෙත ගොස් මාත් මේ කාරණය ගැන වරක් සාකච්ඡා කළා. මේ දක්වා ඒ කාරණය ඉෂ්ට වුනේ නැහැ. එම නිසා ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනව, මේ ප්‍රශ්නය පිළිබඳව ගරු ඇමති තුමාගෙ අවධානය යොමු කර, භාණ්ඩාගාර යේත් සහාය ඇතුව මේ ප්‍රශ්නය විසඳන්න කියා.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ පාඨශාලා පරීක්ෂකවරුන්ගේ කොට්ඨාශ විශාලයි. සමහර පාඨශාලා පරීක්ෂකවරුන්ට පාඨශාලා 80 ටත් 90 ටත් අතර ගණනක් තිබෙනව. මගේ හැඟීම නම් පරීක්ෂක වරුන්ට පාඨශාලා විශාල ගණනක සේවය කරන්ට භාර දීමෙන් ඔවුන්ගේ රාජකාරිය නිසියාකාර ඉෂ්ට කරන්ට පුළුවන්කමක් ලැබෙන්නෙ නැහැ කියන එකයි. එම නිසා මා දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා සිටිනව, වැඩිම වුනොත් එක පරීක්ෂකවරයකුට පාඨ ශාලා 30 ක් පමණ සීමා කර, උතුරු-මැද පළාතේ පරීක්ෂකවරුන්ගෙ සංඛ්‍යාව වැඩි කර ඒ උදවියගෙන් නියම සේවයක් ලබා ගන්න කටයුතු යොදන්න කියා. මන්ත්‍රී වරුන් හැම පැත්තෙන්ම කෑ ගහන නිසා මා මීට වැඩිය කථා කරන්ට යන්නෙ නැහැ. මේ අවසථාව ලබා දීම ගැන තමුන්නාන් සෙට ස්තුති කරමින් මගේ වචන සවල්පය මෙයින් අවසාන කරනව.

**ලක්ෂ්මන් ද සිල්වා මයා.** (බලපිටිය)
*(திரு. லக்ஷ்மன் டி சில்வா—பலப்பிட்டிய)*
(Mr. Lakshman de Silva—Balapitiya)

ගරු සභාපතිතුමනි, අධ්‍යාපන දෙපාර්ත මේන්තුවේ වැය ශීර්ෂය යටතේ මටත් වචන සවල්පයක් කථා කරන්ට අවසථා වක් ලැබීම ගැන මා සන්තෝෂ වෙනව. ලංකාවේ තිබෙන දෙපාර්තමේන්තුවලින් වැඩ වර්ජනය නොකළ එකම දෙපාර්ත මේන්තුව අධ්‍යාපන දෙපාර්තමේන්තුව නිසා විශේෂයෙන්ම හිටපු අධ්‍යාපන ඇමතිතුමා ටත්, නව අධ්‍යාපන ඇමතිතුමාටත්, ඒ දෙපාර්තමේන්තුවේ සෑම නිලධාරි මහත්ම යෙකුටමත් බලපිටි ජනතාව වෙනුවෙන් මා ස්තුති කරනව. එකම වැඩ වර්ජනයක්වත් නොකළ අධ්‍යාපන දෙපාර්තමේන්තුව ගැන අපි සන්තෝෂ වන්ට ඕනැ.

සභාපතිතුමනි, මා ඊළඟට මගේ ඡන්ද කොට්ඨාශයේ පවතින අඩුපාඩු කීපයක් තමුන්නාන්සේට මතක් කරන්ටත් කැමතියි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

ලනුවක්.

**ලක්ෂ්මන් ද සිල්වා මයා.**
*(திரு. லக்ஷ்மன் டி சில்வா)*
(Mr. Lakshman de Silva)

සභාපතිතුමනි, මා ළඟ ඔය ලනු මොක වත් නැහැ. මා කීවේ ඇත්ත. ඕනෑ තැනක ගිහින් කියන්ට පුළුවන් වැදගත් කරුණක් මම කිව්වෙ. කොයිම ගරු මන්ත්‍රීවරයෙක් වත් ඉදිරිපත් නොකළ කරුණක් මම කිව්වෙ. හැම දෙපාර්තමේන්තුවකම වගේ ඔය තුන් හවුල්කාරයන්ගේ අවවාද උඩ වැඩ වර්ජන කර තිබෙනව. එහෙත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට ශක්තියක් තිබුණා, අධ්‍යාපන දෙපාර්තමේන්තුව නිසා හොඳ අධ්‍යාපනයක් ලැබූ හොඳ නිලධාරි මහත්වරු පිරිසක් එහි සිටින නිසා උන්නැහෙලාගෙ ඒ යටි කුට්ටු වැඩවලට අසු නොවී රාජකාරි කරන්න.

අධ්‍යාපන අමාත්‍යාංශයේ සථිර ලේකම් ජිනදාස මහතා මෙන්ම, ගුරුගේ, තුරේ සිංහම්, ටෙරන්ස් සිල්වා යන හොඳ නිල ධාරි පිරිසක් සිටීම ගැන අප බොහොම සන්තෝෂයි. අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ වැඩ හොඳින් කෙරීගෙන යන්නේ මේ නිල ධාරීන් සිටින නිසයි. අධ්‍යාපන දෙපාර්ත මේන්තුවේ සිටින නරක නිලධාරියා ඩබ්ලිව්. එම්. ඒ. වර්ණසූරිය මහතායයි මා විශ්වාස කරනවා. [බාධා කිරීම්] ඔහු කඩාකප්පල් කාරී වැඩ පිළිවෙළක් ගෙන ගිය නිලධාරි යෙක්. [බාධා කිරීම්] ඔහු ප්‍රතිගාමී නිලධාරි යෙක්. ඔහු අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙහි සිටීම ගැන මගේ විරුද්ධත්වය ප්‍රකාශ කරනවා. ඔහු ගාල්ලෙදි කඩාකප්පල්කාරී ව්‍යාපාරයක් ගෙන ගියා. [බාධා කිරීම්.]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**පර්සි වික්‍රමසිංහ මයා.**
(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)
(Mr. Percy Wickremasinghe)

ඒ මහත්මයා බොහොම හොඳ කෙනෙක්. තමුන්නාන්සෙ කියන්නෙ අමූලික බොරුවක්.

**ලක්ෂ්මන් ද සිල්වා මයා.**
(திரு. லக்ஷ்மன் டி சில்வா)
(Mr. Lakshman de Silva)

කඹුරුපිටියේ ගරු මන්ත්‍රීතුමා කථා කරන්නෙ උන්නැහේගෙ නියමිත ආසනයේ සිට නොවෙයි. යම් කෙනෙක් මගේ කථාවට බාධා කළ තරමට මගේ කථාව දික් වෙනවා. ඕනෑම ප්‍රශ්නයකට උත්තර දෙන්න මා ලෑස්තියි. අප ප්‍රශ්න වලට උත්තර නොදී සැඟවෙන ජාතියේ අය නොවෙයි.

වර්ණසූරිය කියන තැනැත්තා හිතුවක්කාර යටිකුට්ටුකාරයකු බව මා නොබියව මේ ගරු සභාවේදී කියන්ට කැමතියි. [බාධා කිරීම්] අනික් කාරණය නම් උන්නැහේ ඔය තුන්හවුල්කාරයන්ගෙ යටිකුට්ටු ව්‍යාපාරයට අසු වුණු නිසා තමයි, ගාල්ලෙන් මාරු වෙන්ට සිදු වුණෙත්. [බාධා කිරීමක්] මගේ කථාවට බාධා කරන්ට කරන්ට මගේ කථාව දික් වෙන බව නැවතත් කියන්ට කැමතියි. ඔය බාධා කිරීම්වලට මා භය වෙන්නෙ නැහැ.

මිළඟට මා නියෝජනය කරන කොට්ඨාශයේ තිබෙන අඩුපාඩු කීපයක් ගැන මතක් කරන්ට කැමතියි. ගාලු දිස්ත්‍රික්කයෙහි විද්‍යාව ඉගැන්වීම සඳහා තිබෙන්නේ පාඨශාලා 5 ක් පමණක් බව මීට ටික වේලාවකට පෙර කථා කළ ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා විසින් කියන්ට යෙදුණා. එතුමාගේ ඒ ප්‍රකාශය ගැන මා සියයට සියයක්ම එකඟ වෙනවා. මේ කාරණය පිළිබඳව ගාල්ලේ දිස්ත්‍රික් සම්බන්ධතා කාරක සභාවේදීත් අප සාකච්ඡා කොට අධ්‍යාපන දෙපාර්තමේන්තුවට දන්වා යැව්වා. අළුත් අධ්‍යාපන ඇමතිතුමා මේ තත්ත්වය ගැන කල්පනා කර බලා ක්‍රියා කරනවා ඇතැයි අප විශ්වාස කරනවා. අපේ අළුත් අධ්‍යාපන ඇමතිතුමා වෙස්සන්තර කෙනෙකු වගෙයි. ඉල්ලන්ට ඉල්ලන්ට එතුමාගෙන් ලැබෙනවා. "හිතුව, පැතුව, ලැබුණා" යයි කියන්ට පුළුවන් අවසථා තිබෙන බව මතක් කරන්නේ අළුත් අධ්‍යාපන ඇමතිතුමාට ගෞරවයක් වශයෙනුයි.

**සභාපතිතුමා**
(அக்கிராசனர்)
(The Chairman)

ගරු මන්ත්‍රීතුමා කරුණා කර කථාව කෙටි කරන්න.

**ලක්ෂ්මන් ද සිල්වා මයා.**
(திரு. லக்ஷ்மன் டி சில்வா)
(Mr. Lakshman de Silva)

ගරු සභාපතිතුමනි, මා තවත් ටිකක් කථා කරන්න ඕනෑ. මුලදී මගේ කථාවට බාධා කළ නිසා මගේ කථාව දික් කරන්නටත් සිදු වුණා. හොඳයි, මා පුළුවන් තරම් කෙටියෙන් කියා ඉවර කරන්නම්. රේවත මහා විද්‍යාලයේ විද්‍යා පන්ති පැවැත්වීම සඳහා හිටපු අධ්‍යාපන ඇමතිතුමා විසින් අවසරයක් දෙන්ට යෙදුණා. සිද්ධාර්ත මහා විද්‍යාලයටත් ඒ වරප්‍රසාදය දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

මා මේ අවසාථාවේදී විශේෂයෙන්ම මතක් කළ යුතු කාරණයක් නම්, අධ්‍යාපනය අතින් අවුරුදු 20 ක් තුළදී බලපිටිය ප්‍රදේශයට නොකෙරුණු වැඩ පසුගිය සුළු කාලයේදී කිරීම ගැන මා මේ රජයට ස්තුතිවන්ත වෙනවා. බලපිටි ප්‍රදේශය 1947 සිටම අමතක කර දමලයි, තිබුණේ. ඒ ප්‍රදේශයට අධ්‍යාපනය අතින් සිදු වූ වැඩ ගැන කල්පනා කරන විට "හිතුව, පැතුව, ලැබුණා" වැනි යයි නැවත වරක් ගෞරවයෙන් මතක් කරනවා. දැනට තිබෙන සුළු සුළු අඩුපාඩුත් ඉදිරිපත් කළ විට ඒවා ගැනත් කරුණාවෙන් සලකා බලා ඒවා ඉෂ්ට කර දෙන ලෙස මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඇත්තෙන්ම එතුමා වෙස්සන්තර කෙනෙක්. මෑතක දීත් ඒ ප්‍රදේශයට ගොස් යම් යම් ඒව දීලා ආවා.

විශ්ව විද්‍යාල ගැනත් වචනයක් කියන්ට කැමතියි. ගැහැණු ළමයින් සඳහා වෙනම විශ්ව විද්‍යාලයක් පිහිටුවුවහොත් හොඳ බව මගේ පෞද්ගලික අදහසක් වශයෙන් ඉදිරිපත් කරන්ට කැමතියි. ඒ වගේම අපේ සංඝයා වහන්සේලා සඳහාත් වෙනම විශ්ව විද්‍යාලයක් තිබෙනවා නම් ඉතාමත් සුදුසු බවයි, මගේ හැඟීම.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගැහැණු ළමයින් සමග කලවමේ ස්වාමින් වහන්සේලාත් ඉගෙන ගන්න විට නොයෙකුත් කරදර බාධා ඇති වෙන්නට ඉඩ තිබෙනවා. එය අපට පළපුරුද්දෙන් පෙනී ගොස් තිබෙනවා. එම නිසා වෙන් වශයෙන් විශ්ව විද්‍යාල තුනක් තිබෙනවා නම් හොඳ බව මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**මුණවීර මයා.**
*(திரு. முனவீர)*
(Mr. Munaweera)

ගරු සභාපතිතුමනි, මම මේ අවස්ථාවේ ගරු ඇමතිතුමාට ස්තුති කරන්ට අදහස් කරන්නෙ නැහැ. එතුමාට මගේ ගෞරවය කවදත් හිමි වෙනවා.

දැන් මා ඉදිරිපත් කරන ප්‍රශ්නය අහක දැමිය යුතු ප්‍රශ්නයක් නොවෙයි. ගරු ඇමතිතුමාත් දන්නව ඇති, උඩරට ජීවත් වන මිනිසුන් හැටියට අද අපට ඉතාම විශාල ප්‍රශ්නයකට මුහුණ පාන්නට සිද්ධ වී තිබෙනවා. මේ ප්‍රශ්නය ගැන අවුරුදු 10ක 15ක පමණ කාලයක් තිස්සේ අපි අධ්‍යාපන දෙපාර්තමේන්තුවට මතක් කර තිබෙනවා. අපේ පාඨශාලාවලට, විශේෂයෙන් උඩරට ප්‍රදේශවල සෑම පාඨශාලාවකටම වගේ, ලාංකික නොවන ළමයින් ඇතුළත් කර ගැනීමට ඒ පාඨශාලාවල මුල් ගුරුවරුන් කටයුතු කරනවා. නිදර්ශනයක් වශයෙන් මම එක පාඨශාලාවක් ගැන පමණක් සඳහන් කරනවා. රත්තොට නගරයේ තිබෙන ද්‍රවිඩ පාඨශාලාවේ පමණක් අද ලාංකික නොවන ළමයින් 249ක් ඉන්නවා. මේ ප්‍රශ්නය ගැන සොයා බැලුවාම එක්සත් ජාතීන්ගෙ මණ්ඩලයේ ප්‍රඥප්තිය අනුව කල්පනා කරනවාය කියා ලාංකික නොවූ ඕනෑම ශිෂ්‍යයෙක් යම් පාඨශාලාවකට ඇතුළත් වීමට පැමිණියොත් ඔවුන් සියලු දෙනාම ඒ පාඨශාලාවේ ශිෂ්‍යයන් හැටියට බඳවා ගැනීමට මේ පාඨශාලා ප්‍රධානීන් කැමැත්තෙන් කටයුතු කරනවාය යන තත්ත්වයක් අපට දැනගන්නට ලැබී තිබෙනවා. පෙඩරල් පක්ෂයත් තොන්ඩමන් පක්ෂයත් මේ රටේ බෞද්ධ සිංහල බලය වළලන තුරු බලා සිටින්නට අපි ලෑස්තිද? මේ රටේ ප්‍රධාන ජාතියේ භාෂාව භාර ගන්නට ලාංකික නොවන ශිෂ්‍යයන්ට පුළුවන්කම ලැබෙන්ට පෙර ඒ ශිෂ්‍යයන් අපේ පාඨශාලාවලට ඇතුළත් කර ගැනීමෙන් අපේ පාඨශාලාවල ඉඩකඩ ප්‍රශ්නය, ගොඩනැගිලි ප්‍රශ්නය, උපකරණ ප්‍රශ්නය, යන මේවා ගැන කථා කරන්නෙ කොහොමද? මේ ගැන තීරණයක් කරන වාද කියා මම ප්‍රශ්න කරනවා. මේක ඉතාම වැදගත් ප්‍රශ්නයක්. අපේ ළමයි පාඨශාලාවලට ඇතුළත් කරන්න ගියාම ඉඩ නැත කියා ආපසු යවනවා. නමුත් වතුවල රක්ෂාව කරන ඒ කුලීකරුවන්ගෙන් මසකට වරක් රුපියල් 10, 15, 20 බැගින් අය කරගෙන පාඨශාලා ප්‍රධානීන් ලාංකික නොවන ළමයින් තම පාඨශාලාවලට ඇතුළත් කර ගන්නවා. දැනට වතුවල ද්‍රවිඩ පාඨශාලා 789 ක් පමණ තිබෙනවා. නමුත් මේවායේ සිංහල ළමයින්ට සිංහල ඉගෙන ගන්න කිසිම ඉඩක් නැහැ. අපේ නව අධ්‍යාපන ඇමතිතුමාට හැමෝම ස්තුති කළා. ඒ තරම් සත්ගුණවත් හැම වැඩක්ම කරන්ට පුළුවන් කෙනෙක් එතුමා. ඒ වගේම අපේ බදිඋද්දීන් හිටපු අධ්‍යාපන ඇමතිතුමාත් අමාරුකම් රාශියක් මධ්‍යයේ භය නැතුව මේ රටේ විප්ලවයට තුඩු දුන් මූලික ප්‍රශ්නයට අත ගැසුවා. එතුමාටත් අප ස්තුතිවන්ත වෙනවා. මේ වැඩ කිරීමට අපේ නව අධ්‍යාපන ඇමතිතුමාට දේවාශීර්වාදය ලැබේවා යයි අපි ප්‍රාර්ථනා කරනවා. වහාම මේ ලාංකික නොවන ශිෂ්‍යයන් අපේ පාඨශාලාවලට ඇතුළත් වීම වළක්වා අපේ දරුවන්ට ඉඩකඩ සලසා දෙන්න. අපේ භාෂාව භාර ගැනීමට ලාංකික නොවන මේ අය සූදානම් නැත් නම් ඔවුන් කිසිම පාඨශාලාවකට ඇතුළත් කර ගැනීම නීතියෙන් තහනම් කරන්න. එසේ කිරීමේදී අපට පාර්ලිමේන්තුව අතහැර ගෙදර යන්නට සිදු වුවත් කමක් නැහැ. එක 'පාඨශාලාවක පමණක්, රත්තොට ද්‍රවිඩ පාඨශාලාවේ පමණක්, ලාංකික නොවූ ළමයින් 249 දෙනෙක් ඉගෙන ගන්නවා නම්, මොකක්ද ඒ පාඨශාලාවෙ තත්ත්වය? අපේ භාෂාව භාර නොගන්නා ලාංකික නොවන ශිෂ්‍යයකු කිසිම පාඨශාලාවකට ඇතුළත් කර ගැනීමට නොහැකි වන සේ නීතියක් පණවන මෙන් මම නිර්භයව ඉල්ලා සිටිනවා.

ඊළඟට අපේ පෙඩරල් පක්ෂයේ ගරු මන්ත්‍රීන් කියනවා, උතුරු ප්‍රදේශයේ ද්‍රවිඩ ගුරුවරුන් අඩුය කියා. නමුත් මාතලේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මුණසිංහ මයා.]

සිට උතුරට ඇති පාඨශාලාවල හැම එකකම වාගේ ඒ පාඨශාලාවල ඉගෙන ගන්න ද්‍රවිඩ ශිෂ්‍ය සංඛ්‍යාවට වඩා ද්‍රවිඩ ගුරුවරුන් දැනට සිටිනවා. වහාම, ජනවාරි 1 වැනිදා සිටම, ඒ වැඩිපුර සිටින සියලුම ද්‍රවිඩ ගුරුවරුන් ඒ පාඨශාලාවලින් ඉවත් කරන මෙන් මා ඉල්ලා සිටිනවා.

අ. භා. 9.45

මේ ද්‍රවිඩ ගුරුවරුන් මේ රටේ සමාජවාදි ප්‍රතිපත්තිවලට විරුද්ධව, ප්‍රගතියට විරුද්ධව, පෙඩරල් පක්ෂය සමග එකතු වී, හැම අවස්ථාවකදීම වැඩ කටයුතු අවුල් කිරීමේ අදහසින් ක්‍රියා කරන නිසා මා බය නැතුව ප්‍රකාශ කරනව. මාතලේ විජය විද්‍යාලය, සෙන්ට් තෝමස් විද්‍යාලය, ක්‍රයිස්ට්චර්ච් විද්‍යාලය වැනි විද්‍යාලවල ද්‍රවිඩ ළමයින්ට වඩා ද්‍රවිඩ ගුරුවරුන් සිටිනවා. එම නිසා මෙම කාරණය අමාත්‍යාංශයේ දැඩි කල්පනාවට භාජන කරන්න ඕන. අධ්‍යාපන අමාත්‍යාංශයේ සහ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සිටින සියලුම නිලධාරීන්ට අපගේ ස්තුතිය පුද කරනවා. ඒ වාගේම ගරු අධ්‍යාපන ඇමතිතුමාටත් පාර්ලිමේන්තු ලේකම්තුමාටත් අපේ මේ ප්‍රශ්න සියල්ලක්ම නිරාකරණය කර ගැනීමට පුළුවන්කම ලැබේවා, කියා ප්‍රාර්ථනය කරමින් මගේ වචන ස්වල්පය අවසාන කරනව.

**ගරු කළුගල්ල**
*(கௌரவ கலுகல்ல)*
(The Hon. Kalugalla)

ගරු සභාපතිතුමනි——

**රෝයි රාජපක්ෂ මයා.**
*(திரு. ரோய் ராஜபக்ஸ)*
(Mr. Roy Rajapakse)

අපටත් කතා කරන්න තියෙනව.

**ගරු කළුගල්ල**
*(கௌரவ கலுகல்ல)*
(The Hon. Kalugalla)

ගරු සභාපතිතුමනි, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයට අයිති වැය ශීර්ෂය යටතේ ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් මෙන්ම විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන්ද කථා කළා. ඒ හැම මන්ත්‍රීවරයකුගේම කථාවලට සවන් දීමට මට නුපුළුවන් වීම ගැන මගේ කනගාටුව පළකරනව. අද භාර ගන්නා ලද උත්සව තුනකට සහභාගි වීමට මට සිදු වී තිබුණු නිසා මගේ පාර්ලිමේන්තු ලේකම් තුමාට මේ ගරු මන්ත්‍රීවරුන් ප්‍රකාශ කරන අදහස් සහ අසන ප්‍රශ්න සටහන් කරගන්නය කියලයි මා ගියෙ. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් සහ විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් වැඩි විවේචන ඉදිරිපත් නොකළ බවත්, වැලිමඩ ගරු මන්ත්‍රීතුමා (කේ. එම්. පි. රාජරත්න මයා.) සංස්කෘතික අංශය විශෙෂයෙන් විවේචනය කළ බවත්, පාර්ලිමේන්තු ලේකම්තුමා සහ නිලධාරි මහත්වරුන් මට කීවා.

අධ්‍යාපන අංශය පිළිබඳව කර තිබුණු විවේචන පිළිබඳව විනාඩි 5 කින් පමණ අදහස් ස්වල්පයක් ඉදිරිපත් කරන්න මා බලාපොරොත්තු වෙනව. ශිෂ්‍ය ගුරුවරුන් 10,000 ක් පමණ බඳවා ගන්නට යාම පිළිබඳව හැම මන්ත්‍රීවරයෙක්ම වාගේ අදහස් ප්‍රකාශ කර තිබුණා. මෙම තනතුරු සඳහා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට අයිති උදවිය පත් කර ගනීවිය කියා සමහර ගරු මන්ත්‍රීවරුන්ගෙ බියක් තිබුණා.

**රෝයි රාජපක්ෂ මයා.**
*(திரு. ரோய் ராஜபக்ஸ)*
(Mr. Roy Rajapakse)

ගන්න තිබුණෙ එහෙමයි.

**ගරු කළුගල්ල**
*(கௌரவ கலுகல்ல)*
(The Hon. Kalugalla)

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ලැදි අය මේ තනතුරු සඳහා පත් කර ගනීවිය කියා බොහෝ දෙනා කල්පනා කළා. එම විභාගය සම්බන්ධයෙන් අපි ගිය සිකුරාදා ගැසට් නිවේදනයක් කළා. ඒ ඒ දිස්ත්‍රික්ක අනුව තරඟ විභාගයක් පවත්වා එම ශිෂ්‍ය ගුරුවරුන් බඳවා ගන්න යන බව එයින්ම පෙනී යන්න ඇති. අප බලාපොරොත්තු වන්නෙ නියම සුදුස්සන් තෝරා පත් කර ගන්නයි. ඇඟිලි ගැසීම්වලින් තොරව, පක්ෂ භේදවලින් ඈත්ව, සාධාරණ ආකාරයට, යුක්ති සහගත ලෙස මෙම පරීක්ෂණය පවත්වා සුදුස්සාට නියම තැන දීමටයි අප කටයුතු කරන්නෙ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු සභාපතිතුමනි, අද ජ්‍යෙෂ්ඨය සමත් ඇතැම් අය ඇමතිවරුන් සහ මන්ත්‍රීවරුන් පස්සෙ යන බව පේනව, මෙම පත්වීම් ලැබේවිය කියන බලාපොරොත්තුවෙන්. කිසිම ඇමතිවරයකු ළඟට හෝ කිසිම මන්ත්‍රීවරයකු ළඟට හෝ ගිය පලියට පත්වීම් නොලැබෙන බවත්, තම තමන්ගේ දක්ෂතාවන් අනුව පත්වීම් ලැබෙන බවත්, මේ අවස්ථාවේදි මතක් කරන්න කැමතියි.

ලංකා ඉතිහාසයෙහි කුමන අවුරුද්දකදී වත් 10,000 කට එක වර රක්ෂා දුන්නාය කියා සඳහන් වෙලා නැහැ. මෙම කටයුත්ත පිළිබඳව ක්‍රියා කරන භාණ්ඩාගාරයේ දක්ෂ තරුණ නිලධාරි මහත්වරුන්ටත් රටට හිතැතිව රටේ අනාගතය සඳහා වැඩ කරන ගරු මුදල් ඇමතිතුමාටත් මගේ ස්තුතිය පුද කරනව.

ශිෂ්‍ය ගුරුවරුන් දහ දාහක් පත් කර ගැනීමට රුපියල් අනූ ලක්ෂයක් වෙන් කිරීම ගැන ගරු මුදල් ඇමතිතුමාට මම ස්තුතිවන්ත වෙනව. මගේ කල්පනාවෙ හැටියට එතුමගෙ අදහස අනුව මේ අවුරුද් දෙ පමණක් නොව ලබන අවුරුද්දෙත් ශිෂ්‍ය ගුරුවරුන් දහ දාහක් ගන්න මුදල් දෙන්න බලාපොරොත්තු වෙනව. මේ රජය ගැන එදාට වඩා අද රටේ මහජන ප්‍රසාදයක් තිබෙනව. මේ රජය රටේ වැඩි දෙනාගෙ යහපත සඳහා අපක්ෂපාතව වැඩ කරගෙන යනව. මේ දහදාහ බඳවා ගන්න ඉක්මනින්ම අපි බලාපොරොත්තු වෙනව. මේ දහදාහ බඳවාගෙන ඒ ඒ ඡන්දදායක කොට්ඨාශ අනුව අපි විශේෂ පුහුණුවක් දෙන්න බලාපොරොත්තු වෙනව. එකක් කියන්න කැමතියි. විශේෂ යෙන්ම ජාතික හැඟීමක් ඇතිව මේ ආණ්ඩුවට සහයෝගය දෙන වැඩ පිළිවෙලක් ඇතිව ඒ ඒ උදවියට නියම පුහුණුවක් දී රටට ප්‍රයෝජනවත් වන දාහදාහක් ඇති කිරීමේ බලාපොරොත්තුවක් මේ අධ්‍යාපන ඇමතිවරයට තිබෙනව.

ඒ වගේම කියන්න කැමතියි, නොයෙක් ගරු මන්ත්‍රීවරුන් නොයෙක් අන්දමේ භේද ඇති කරන්න උත්සාහ කළා මේ ශිෂ්‍ය ගුරුවරුන්ට ගෙවන්න බලාපොරොත්තුවන දීමනාව වන රුපියල් සියය මදිය කියා. කවදාත් මම ගරු මන්ත්‍රී වරුන්ට ඉතා හොඳින් සලකනව. එතුමන් ලා කියන දේ ගැන හොඳට කල්පනාවෙන් සිත යොමු කරනව. මේ දීමනාව මදි නිසා හෝ මේ ක්‍රමය හරි නැත කියා හෝ වෙන මොන කාරණයක් නිසා හෝ කොයිම ගරු මන්ත්‍රීවරයෙක් හෝ කිව්වොත්, ඒ කොට් ඨාශයෙන් ගන්න එපාය කියල, එතකොට මට නියෝගයක් කරන්න පුළුවනි ඒ ඡන්ද කොට්ඨාශයෙන් ගන්න එපයි කියල. මම හැමදාම ගරු මන්ත්‍රීවරුන්ට ගරු කරන කෙනෙක්. සලකන කෙනෙක්. අද මොනම මන්ත්‍රීවරයෙක්වත් මට කිව් වොත් ඒ ගන්න උදවියට රුපියල් සිය යක් මදිය කියා, මට හෙට නියෝග කරන්න පුළුවනි, අසුවල් මන්ත්‍රීවරයා කියනව මේ දෙන රුපියල් සියය මදිය කියා, ඒ නිසා ඒ ඡන්ද කොට්ඨාශයෙන් ගන්න එපා කියා. මේ ඇමතිතුමා යමක් කිව්වොත් ඒක කරනව. කියන එකක් කරන ඇමතිවරයෙක් තමයි මේ. කියන එකක් කරනව, කරන එකක් කියනව. කරන එක කියන්න බයක් ඇති ඇමති වරයෙක් නොවන බව කියන්න කැමතියි.

**රෝයි රාජපක්ෂ මයා.**
*(திரு. ரோய் ராஜபக்ஸ)*
(Mr. Roy Rajapakse)
ඒ නිසයි ඔබතුමාට අපි ආදරේ.

**ගරු කලුගල්ල**
*(கௌரவ கலுகல்ல)*
(The Hon. Kalugalla)
ගරු සභාපතිතුමනි, මේ ඇමතිතුමා නම් නොකළ හැකි දෙයක් කරනවය කියන් නෙ නැහැ. ඕනෑම කෙනෙකුට තමන් කැමති දේශපාලන පක්ෂයකට ඇල්ම දක්වන්න පුළුවනි. ඒ අයට ඕනෑම පක්ෂ යක් පිළිගන්න පුළුවනි. යූ. එන්. පී. පක්ෂය, කොමියුනිස්ට් පක්ෂය, සමසමාජ පක්ෂය, පෙඩරල් පක්ෂය ආදි ඕනෑම පක්ෂයකට හිත ඇති අය වෙන්න පුළු වනි. ඒ කොයි හැටි වෙතත් මේ ශිෂ්‍ය ගුරුවරුන් ආණ්ඩුවට පක්ෂපාත වෙන්න ඕනෑ සියේට සියයක්ම. විශෙෂයෙන්ම මේවා තාවකාලික පත්වීම් නිසා ආණ්ඩු විරෝධි වැඩ පිළිවෙලක් ගෙන යන්න වුන් ගුරුවරුන් හැටියට තබා ගැනීමට මේ ඇමතිවරයා සූදානම් නැති බව කියන්න

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු කලුගල්ල]

කැමතියි. මා නැවත වරක් ගරු මුදල් ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනව ලංකා ඉතිහාසයේ වාර්තාවක් පිහිටුවමින් ශිෂ්‍ය ගුරුවරුන් දාහදාහක් ගැනීම සඳහා රුපියල් ලක්ෂ අනූවක් වෙන් කළාට.

වැලිමඩ ගරු මන්ත්‍රීතුමා (කේ. එම්. පී. රාජරත්න මයා.) සංස්කෘතික අංශය ගැන විශේෂයෙන් කරුණු කියා සිටියා. ඒ මන්ත්‍රීවරයා කළ විවේචන එතුමගෙ කථාවෙන් බලාගෙන ඒ අනුව සාකච්ඡා පවත්වා විශේෂ වැඩ පිළිවෙලක් ඇති කරන්න බලාපොරොත්තු වන බව මම මේ අවස්ථාවේ විශෙෂයෙන් ප්‍රකාශ කරන්න කැමතියි. සංස්කෘතික දෙපාර්තමේන්තුව ගැන නොයෙක් උදවිය නොයෙක් විධියට විවේචන ඉදිරිපත් කළා. ඒවා ගැන මම ඉතාම පරෙස්සමින් සොයා බලනව. සමහර විට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් සෑදුණු කොමිටියක් පවා පත් කරන්න කැමැත්ත දෙන්න මම බලාපොරොත්තු වෙනව. උතුරෙන් නැගෙනහිර පළාතෙන් ද්‍රවිඩ මුස්ලිම් මන්ත්‍රීවරුන් අධ්‍යාපන වැඩ පිළිවෙල ගැන ප්‍රශංසා කිරීම ගැන මම සන්තෝෂ වෙනව. එයින්ම පෙනී යනව, අප ජාති භේදයෙන් තොරව හැමෝටම එක සමානව වැඩ කරන බව. 1958 සහ 1959 අවුරුදුවල උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවල ඇති අභ්‍යාස විද්‍යාලවලට ඇතුළු වී රජයේ වියදමින් ඉගෙන ගත් ද්‍රවිඩ උදවිය, පුහුණුව ලැබීමෙන් පසු අභ්‍යාස විද්‍යාලවලින් පිට වුණා. නමුත් අවුරුදු පහක් හයක් තිස්සේම පුහුණු වූ ගුරුවරුන් වශයෙන් සමත්වූ මේ අය රැකියාවක් නැතුව දුක් වින්දා. මට පෙනී ගියා මේ ගුරුවරුන්ට රක්ෂා දිය යුතු බව. මම විශෙෂයෙන් පෙරේදා නියෝග කළා, රක්ෂාවක් නොමැතිව සිටින පුහුණු වු ද්‍රවිඩ ගුරුවරුන් 150 දෙනා ගුරු වෘත්තියට පත්කර ගන්නය කියා. එය සාධාරණ ඉටු කිරීමක්. ද්‍රවිඩ හෝ වේවා මුස්ලිම් හෝ වේවා සිංහල හෝ වේවා සාධාරණය ඉටු කිරීම සෑම රජයකම යුතුකමක්. එම නිසා අපේ ගරු මුස්ලිම් මන්ත්‍රීවරුන් සහ ද්‍රවිඩ මන්ත්‍රීවරුන් මෙන්ම ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුනුත් ඒ ගත් වැඩ පිළිවෙල ගැන ප්‍රශංසා කිරීම ගැන විශෙෂයෙන්ම සන්තෝෂ වෙනව; ස්තුතිවන්ත වෙනව.

